# ගෝඨාභය රාජපක්ෂගේ යුදකාලීන භූමිකාව

ජනවාරි 2024



INTERNATIONAL TRUTH AND JUSTICE PROJECT

# ලුතිතන් කර්නල් (විශ්‍රාමික) නන්දසේන ගෝඨාභය රාජපක්ෂ

'මට ඇත්තේ කණ්ඩායම් දෙකක් පමණයි-ත්‍රස්තවාදයට එරෙහිව සටන් කරන කණ්ඩායම සහ ත්‍රස්තවාදීන්.'

ගෝඨාභය රාජපක්ෂ[1]

1. http://news.bbc.co.uk/2/hi/south_asia/7866253.stm

# සුචිය


හැඳින්වීම පිටු 5-6

1. බලතල පිටු 7 - 30


ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධය පැවති කාලයේදී ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් ධුරය දරමින් ගෝඨාභය රාජපක්ෂ ඉටුකළ කාර්යභාරය මෙම කොටසින් විස්තර කරනු ලැබේ. නීති ප්‍රකාර විධාන ව්‍යූහයේ සහ ඒකකවල ඔහු ගේ භූමිකාව සහ ඔහුගේ පාලනය යටතේ මතු වූ ගැටළු පිළිබඳව මෙමගින් විමසා බලනු ලැබේ. තමාගේ සහෝදරයා වන ජනාධිපති සමඟ ඔහුට පැවති සම්බන්ධය නිසා ගෝඨාභය රාජපක්ෂ ඔහුගේ පූර්වගාමීන්ට සහ අනුප්‍රාප්තිකයන්ට වඩා බෙහෙවින් බලසම්පන්න ආරක්ෂක ලේකම්වරයකු වූ බවට තර්කයක් ගොඩනගා තිබේ. කලින් සිටි හමුදා නිලධාරියකු වශයෙන්, ගෝඨාභය හමුදා උපාය මාර්ගය සකස්කිරීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදී, වැඩිපුර සම්පත් ලබාගැනීමේ හැකියාවක් සහ ඔහුගේ සැලසුම් ක්‍රියාත්මක කිරීමට ඔහුට අවශ්‍ය ඕනෑම කෙනකු පත්කිරීමට බලතල ඇති ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කළේය. ඇත්ත වශයෙන්ම සිවිල් සේවකයකු වූවත්, ඇතැම් අමාත්‍යාංශ ඔහුගේ නොවූවත් සැබවින්ම එම අමාත්‍යාංශ බාර අමාත්‍යවරුන්ට වඩා ඒවායේ වැඩි පාලනයක් පවත්වාගෙන යාමට හැකිවන තරම් ඇතැම් අවස්ථාවලදී ඔහු බලවත් තැනැත්තෙක් විය.


2. අවසන් යුද්ධයේදී විශේෂ සිදුවීම් පිටු 31 - 66


මෙම කොටසින් අවධානය යොමුකරනු ලබන්නේ යුද්ධය අවසානයේදී ඇතිවූ නිශ්චිත සිදුවීම්වලදී ගෝඨාභය රාජපක්ෂ ඉටුකළ කාර්යභාරය සහ ඔහුගේ විධානය අනුව කටයුතු කළ ආරක්ෂක හමුදා විසින් ජාත්‍යන්තර මානුෂවාදී නීතිය සහ ජාත්‍යන්තර අපරාධ නීතිය උල්ලංඝනය කිරීම් පිළිබඳ ඔහුගේ දැනුවත්කම කෙරෙහිය. ඉහතින් සුළුවෙන් දැක්වූ පරිදි, සම්ප්‍රදායික ධුරාවලිය ගර්භාවට ලක්කරමින්, යුදබිමේ ආඥාපතිවරුන්ට කෙළින්ම නියෝග නිකුත් කිරීමට රාජපක්ෂ කටයුතු කළේය. දහස් ගණනක් මරණවලට හේතුවූ මානුෂවාදී අර්බුදය - හාමතය සහ ඔවුන්ගේ දිවිපැවැත්මට අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ලබානොදීම ඇතුළු වන්නියේ සිවිල් ජනතාවට ආහාර සහ බෙහෙත් නොමැතිවීම- පිළිබඳව ඔහු ඉතා හොඳින් දැන සිටියේය. වාර්තා සඳහන් කරන්නේ තවත් සැපයුම් යැවීම වළක්වමින් තිබූ අවහිරතාවයක් වූයේ ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිව ලබාගැනීම අවශ්‍යව තිබීමය - අනුමැතිය දීම ගෝඨාභය රාජපක්ෂ ගේ බලතලවලට අයත් විය. 2008 සැප්තැම්බර් මාසයේදී යුද කාලපයෙන් ඉවත්වන ලෙස එක්සත් ජාතීන්ගේ නියෝජිතායතනවලට සහ ආධාර සැපයීමේ යෙදී සිටි කාර්ය මණ්ඩලවලට නියෝගකිරීමේ මතභේදාත්මක තීන්දුව ගෝඨාභය රාජපක්ෂ විසින් ගන්නා ලද දෙයක් පමණක් නොව, එය ලිඛිතව සහ වාචිකව රාජ්‍ය නොවන සංවිධානවලට සහ එක්සත් ජාතීන්ට සන්නිවේදනයද කරන ලදී. එක්සත් ජාතීන්ගේ සංවිධාන සහ ආධාර සැපයීමේ යෙදී සිටි සේවකයන් බැහැර කිරීමෙන් සිදුවූයේ ස්වාධීන ජාත්‍යන්තර අධීක්ෂණය සහ විමර්ශන සඳහා ලබාගැනීම හැකියාව එකවර ඉවත් කරමින් විශාල ලෙස කෲරකම් කිරීමට මුල පිරීමය.


3. විමර්ශනයට අසමත්වීම පිටු 67 - 74


මෙම කොටසින් විමසුමට ලක්කරන්නේ, එම අවස්ථාවේදී . ආරක්ෂක ලේකම් වූ ගෝඨාභය රාජපක්ෂ ගේ අවධානයට යොමුකරන ලද කවුරුත් දන්නා මානව හිමිකම් උල්ලංඝනය කිරීමේ සිද්ධි ගැන චෝදනා කෙරෙහි ය. ක්‍රියාකිරීමට නීතිමය වශයෙන් වගකීමක් තිබුණද ගෝඨාභය ඊට ප්‍රතිචාර දැක්වීමට අසමත්විය; ක්‍රියාකිරීමට සහ ස්වකීය වගකීම ඉටුකිරීමට හැකියාව තිබූ අතර; ක්‍රියාකිරීමට අසමත්වීම නිසා අත්විය හැකි ඵලවිපාක සහ සිදුවිය හැකි හානිය ගැන ඔහු ඉතා හොඳින් දැන සිටියේය. මෙම මානව හිමිකම් උල්ලංඝන කිරීම් ඔහුගේ අවධානයට යොමුකළ විට, ඔහු විමර්ශනය කිරීම එකහෙළා ප්‍රතික්ෂේප කිරීම හෝ කිසිම වරදක් සිදුවී නැති බව පවසමින් තීන්දුව කල් තියාම නිගමනය කළේය; සිද්ධි ගණනාවකදී ඔහු විමර්ශන කිරීම් අවහිර කිරීම හෝ විමර්ශන සිදුකිරීමට ඔහුගේ මිතුරන් පත්කොට, ඔහුගේ දේශපාලන ප්‍රතිවාදීන් ගැන පමණක් පරීක්ෂා කොට ඔහුගේ හිතවතුන් සම්බන්ධ විමර්ශන ඔවුන් වින්දිතයන් බවට පත්කිරීමේ දේශපාලන අවශ්‍යතා අනුව සිදුකළ ඒවා බවට ප්‍රකාශ කළේය.

**4. නෛතික විශ්ලේෂණ පිටු - 75 - 97**

මෙම නෛතික විශ්ලේෂණය අවධානය යොමුකරන්නේ 2009 මැයි මාසයේදී අවසන් වූ ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධයේදී සිදුකරන ලද අපරාධ සහ එහි විපාක සම්බන්ධයෙන් ගෝඨාභය රාජපක්ෂගේ විධාන වගකීම කෙරෙහි ය. ඊට ඇතුළත් වන ඔහුගේ අණකිරීම සහ පාලනය යටතේ ක්‍රියාකරමින් යටත් නිලධාරීන් විසින් සිදුකරන ලද අන්තර් ජාතික අපරාධ හා සම්බන්ධ බෙහෙවින් වැදගත් නිදසුන් විධානයේ සහ උත්තරීතර වගකීමේ මූලධර්මය යටතේ, ගෝඨාභය රාජපක්ෂට ආරෝපණය කළ හැකිය.

**ඇමුණුම 1 : ගෝඨාභය රාජපක්ෂගේ වෘත්තිය ඉතිහාසය - පිටු 99 - 100**

**ඇමුණුම 2: මාධ්‍ය වාර්තා - පිටු 101 - 103**

# හැඳින්වීම

මෙම වාර්තාව මාතලේ 1989 දී බලහත්කාරයෙන් සමූහ පුද්ගල අතුරුදහන්කිරීම්වලට ගෝඨාභය රාජපක්ෂගේ දුස්සහාය පිළිබඳ චෝදනා ගැන විමර්ශනය කළ 2022 ITJP වාර්තාවට අනුබද්ධයකි[1]. එම වාර්තාවෙන් පසුව, එක්සත් ජාතීන් ගේ විශේෂඥයන් කණ්ඩායමක් 2022 දී ශ්‍රී ලංකා ආණ්ඩුවට ලිපියක් ලියමින් අණ්ඩුව ගත් ක්‍රියාමාර්ග කවරේදැයි විමසීය. ඊට පිළිතුරක් නොලැබුන විට ඔවුහු ඔවුන්ගේ සන්දේශනය ප්‍රසිද්ධ කළහ[3].

එක්සත් ජාතීන් විශේෂඥයන් කණ්ඩායමේ ලිපියට ආණ්ඩුව මේ දක්වා පිළිතුරු සපයා නැති හෙයින් සත්‍ය සෙවීමේ කොමිසමක් පිහිටුවීමට වත්මන් රජය ඉදිරිපත්කර ඇති යෝජනාව කෙරෙහි මහත් සැලකිල්ලක් යොමු වෙයි. ගෝඨාභය රාජපක්ෂ සිංහල සහ දමිළ ජීවිත විනාශ කළ 1980 අගභාගයේදී සහ 2009 දී නිමවූ සිවිල් යුද්ධයේදී යන ප්‍රචණ්ඩත්වයන් දෙකේදීම වඩාත් කුප්‍රකට අපරාධ සිදුකළ බවට චෝදනා ලබන තැනැත්තා බවට තර්ක කළ හැකිය.

2009 රටේ සිවිල් යුද්ධයේ අවසන් අදියරේදී යුද අපරාධ සහ මනුෂ්‍යත්වයට එරෙහි  අපරාධ සිදු කළ බවට සැලකිය හැකි තරමේ ජාත්‍යන්තර මානුෂවාදී නීතිය සහ ජාත්‍යන්තර අපරාධ නීතිය බහුවිධ ආකාරයෙන් උල්ලංඝනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂට විධානයේ සහ උත්තරීතර වගකීමක් පැවති බවට නඩුකරයක් මෙම දෙවැනි වාර්තාව මගින් සකස් කෙරේ. හිතාමතා සහ වගවිභාගයක් නැතිව රෝහල්වලට සහ සිවිල් වැසියන් රැඳීසිටි කඳවුරුවලට වෙඩිප්‍රහාර එල්ලකිරීමෙන් අනීතික ලෙස මිනිස් ඝාතන සිදු කිරීම්, වදහිංසාවන්ට ලක්කිරීම හා ලිංගික ප්‍රචණ්ඩත්වය, සටන්කරුවන්යැයි සැකකළ සියගණනක් යුද්ධය අවසානයේදී සැලසුම් සහගතව බලහත්කාරයෙන් අතුරුදහන්කිරීම, සිවිල් වැසියන් හිතාමතා හාමතේ තැබීම, සහ ඔවුන්ගේ සුබසිද්ධියට අවශ්‍ය බෙහෙත් ද්‍රව්‍ය සහ වස්තූන් රඳවාගැනීම, මෙම උල්ලංඝනය කිරීම් පිළිබඳ චෝදනා විමර්ශනය කිරීමට අසමත්වීම මෙන්ම ප්‍රතිවාදීන් අනීතික ලෙස පැහැරගැනීම් සහ රඳවාගැනීම් මෙම අපරාධවලට ඇතුළත් වෙයි.

ඔහු විසින් යුදබිමේ ආඥාපතිවරුන්ට දෙන ලද නියෝගවලට හිටපු ආරක්ෂක ලේකම් සම්බන්ධ කෙරෙන  සවිස්තරාත්මක සාක්ෂි මෙම වාර්තාවෙන් ඉදිරිපත් කෙරේ. සිදු කෙරෙමින් පැවති ජාත්‍යන්තර මානුෂවාදී නීතිය සහ ජාත්‍යන්තර අපරාධ නීතිය උල්ලංඝන ගැන ඔහුට සමකාලීන දැනුමක් තිබූ බව ඉන් පෙන්නුම් කෙරේ. එපමණක්ද නොව, යුද්ධය අවසන්වීමෙන් පසුව, බරපතල මානව හිමිකම් උල්ලංඝනය කිරීම් ගැන නැගෙන චෝදනා විමර්ශනය කිරීමට සහ අභිචෝදනා ගොණුකිරීමටත් විශ්වාස කටයුතු විමර්ශන සඳහා මුලපිරීමටත් ඔහුට සහ ශ්‍රී ලංකාවේ වරින්වර බලයට පත් ආණ්ඩුවලට අප්‍රමාණ අවස්ථා තිබුණි. එහෙත් සත්‍ය හෙළිදරව්වීමට ඉඩදීම වෙනුවට ගෝඨාභය සහ ඔහුගේ අනුප්‍රාප්තිකයන් කළේ  මෙම උල්ලංඝන කිරීම්වල ආරක්ෂක හමුදා දුස්සහාය ප්‍රතික්ෂේප කිරීම චිරස්ථායීකර, අපරාධ සිදුකළ බව කියන තැනැත්තන්ට වරදාන ලබාදීම සහ ඔවුන් ආරක්ෂාකිරීමයි.

1989 සිට 2009 හරහා  අද දක්වාත් සෘජු දණ්ඩ මුක්තියක්  බල පවත්වයි. 1989 දී මාතලේ දිස්ත්‍රික්කයේ තරුණ හමුදා අණදෙන නිලධාරියකු වශයෙන් ගෝඨාභය රාජපක්ෂ අණදීමේ සහ පාලනයේ යෙදී සිටියදී ඔහුගේ රැකවල යටතේ 700 කට වැඩි පිරිසක් අතුරුදහන්විය. ඔහුට මෙන්ම එම කාල පරිච්ඡේදයේ ඔහු යටතේ සේවය කළ අයට උසස්වීම් ලබාදුන් අතර 2009 ගැටුමේදී ඔවුහු ප්‍රමුඛ කාර්යභාරයක් ඉටුකළහ. උදාහරණයක් ලෙස ශවේන්ද්‍ර සිල්වා වර්තමානයේ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානියා ලෙස පත්කරනු ලැබ ඇත.[4]

---

2. https://itjpsl.com/reports/gotabaya-rajapaksa-the-sri-lankan-presidents-role-in-1989-mass-atrocities
3. බලාත්කාරයෙන් හෝ ස්වකැමැත්තෙන් නොවන අතුරුදහන්කිරීම් පිළිබඳ ක්‍රියාකාරි කණ්ඩායම; අත්තනෝමතික ලෙස රඳවා ගැනීම පිළිබඳ ක්‍රියාකාරි කණ්ඩායම; අධිකරණ-බාහ්‍ය, සංක්ෂේපණීය හෝ අත්තනෝමතික ලෙස මරණයට පත්කිරීම් පිළිබඳ විශේෂ නියෝජිත සහ සත්‍ය,යුක්තිය, හානිපූරණය ප්‍රවර්ධන සහනැවත සිදුනොවන බව ට වගකීම පිළිබඳ විශේෂ නියෝජිත
https://itjpsl.com/reports/gotabaya-rajapaksa-the-sri-lankan-presidents-role-in-1989-mass-atrocities
4. ශවේන්ද්‍ර සිල්වා මානව හිමිකම් උල්ලංඝනය කිරීමේදී ඉටුකළැයි කියන භූමිකාව සම්බන්ධයෙන් ඇමරිකාවේදී නම් කිරීමට ලක්විය.
Gross Violations of Human Rights, of Shavendra Silva of Sri Lanka Under Section 7031(c) of the Department of State, Foreign Operations, and Related Programs Appropriations Act, 14 Feb. 2020, https://2017-2021.state.gov/public-designation-due-to-gross-violations-of-human-rights-of-shavendra-silva-of-sri-lanka-under-section-7031c-of-the-department-of-state-foreign-operations-and-related-programs-appropriations-a/
ශවේන්ද්‍ර සිල්වා ගැන ITJP ලේඛන ගොනුව: at https://itjpsl.com/reports/shavendra-silva

2015 -2019 කාලයේදී රාජපක්ෂ පවුලට බලය අහිමිවූ විට, ගෝඨාභය රාජපක්ෂට ප්‍රධාන වශයෙන් ආර්ථික අපරාධ සහ මානව හිමිකම් අපහරණය සම්බන්ධයෙන් දේශීය උසාවි නඩු පටන්ගත් නමුත් 2019 දී ඔහු ජනාධිපති ධුරයට පත්වූ විට ඒවා අත්හරින ලදී. වධහිංසාවන්ට ලක්කිරීම ගැන වින්දිතයන් 11 දෙනකුට වන්දි ලබාගැනීම සම්බන්ධයෙන් ITJP විසින් ඇමරිකාවේ හවුස්ෆෙල්ඩ් (Hausfeld) ජාත්‍යන්තර නීතිඥ ආයතනය සමඟ එක්වී ගෝඨාභය රාජපක්ෂට එරෙහිව සිවිල් නඩුවක් කැලිෆෝර්නියාවේදී ගොනුකිරීමට කටයුතු කළේය. එසේවූවත් ගෝඨාභය ජනාධිපතිවරණයෙන් ලැබූ ජයග්‍රහණය නිසා ඔහුට රාජ්‍ය නායක මුක්තිය ලැබීම හේතුවෙන් එම නඩුව ඉදිරියට පවත්වාගෙන යාම වැළකිණ.

2022 දී ගෝඨාභය රාජපක්ෂ දැවැන්ත මහජන විරෝධයක් මත ජනාධිපති ධුරයෙන් බලයෙන් ඉවත්කරන ලදී. ඔහු මාලදිවයිනට පලාගිය අතර ඊළඟට සිංගප්පූරුව කරා පැමිණි අතර එහිදී ITJP සංවිධානය ඔහුට එරෙහිව[5], අපරාධ පැමිණිල්ලක් භාරදුන්නේය. අවසානයේ ඔහු ශ්‍රී ලංකාවට පැමිණීමට පෙර තායිලන්තය බලා ගියේය.

1989 දී හෝ සිවිල් යුද්ධය කාලයේදී හෝ ඔහු විසින් සිදුකරන ලද බවට චෝදනා කෙරෙන බරපතල කෲරකම් සම්බන්ධයෙන් ගෝඨාභය රාජපක්ෂ වගඋත්තරදායක කිරීමට ශ්‍රී ලංකාව මේ දක්වා කිසිම උත්සාහයක් දරා නැත. මෙම ලේඛන ගොනුව මගින් ගෝඨාභය රාජපක්ෂ 2009 දී ආරක්ෂක ලේකම් ලෙස ඉටු කළ කාර්යභාරයේදී බරපතල ජාත්‍යන්තර අපරාධකිරීම සම්බන්ධයෙන් ඔහුට එදිරිව කෙතරම් බරපතල නඩුවක් පැවරීමට හැකියාව තිබේදැයි පෙන්නුම් කරයි.

කැනඩාව ගෝඨාභය රාජපක්ෂට[6] එරෙහිව සම්බාධක පනවා ඇති අතර සෙසු රටවල්ද ඒ අනුව ක්‍රියා කළ යුතුව ඇත - ශ්‍රී ලංකාවේ වග උත්තරදායකවීම සම්බන්ධයෙන් කටයුතු කිරීමට ස්වාධීන යාන්ත්‍රණයක් පිහිටුවීමට එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේදී ඡන්දය දුන් රටවල් එහිදී විශේෂිත ය.

5. https://itjpsl.com/press-releases/itjp-files-criminal-complaint-against-gotabaya-rajapaksa-in-singapore

6. https://www.canada.ca/en/global-affairs/news/2023/01/sanctions-imposed-on-sri-lankan-state-officials.html

# 1. බලතල

‘ත්‍රස්තවාදය සමඟ සටන්කරන විට සාමාන්‍ය පටිපාටියට හිරවී සිටිය නොහැකියි’

*ගෝඨාභය රාජපක්ෂ*[7]



ජනාධිපති මහින්ද රාජපක්ෂ, ආරක්ෂක ලේකම් අගෝඨාභය රාජපක්ෂ සහ හමුදාපති ලුතිනන් ජෙනරාල් සරත් ෆොන්සේකා සමග ආරක්ෂක කවුන්සිල රුස්වීමක්දී

ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධය පැවති කාලයේදී ආරක්ෂක අමාත්‍යාංශ ලේකම් ධුරය දරමින් ගෝඨාභය රාජපක්ෂ ඉටුකළ කාර්යභාරය මෙම කොටසින් විස්තර කරනු ලැබේ. නීතිප්‍රකාර විධාන ව්‍යුහයේ සහ ඒකකවල ඔහු ගේ භූමිකාව සහ ඔහු ගේ පාලනය යටතේ මතුවූ ගැටළු පිළිබඳව මෙමගින් විමසා බලනු ලැබේ. තමාගේ සහෝදරයා වන ජනාධිපති සමඟ ඔහුට පැවති සම්බන්ධය නිසා ගෝඨාභය රාජපක්ෂ ඔහුගේ පූර්වගාමීන්ට සහ අනුප්‍රාප්තිකයන්ට වඩා බෙහෙවින් බලසම්පන්න ආරක්ෂක ලේකම්වරයකු වූ බවට තර්කයක් ගොඩනගා තිබේ. කලින් සිටි හමුදා නිලධාරියකු වශයෙන්, ගෝඨාභය හමුදා උපාය මාර්ගය සකස්කිරීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදී, වැඩිපුර සම්පත් ලබාගැනීමේ හැකියාවක් සහ ඔහුගේ සැලසුම් ක්‍රියාත්මක කිරීමට ඔහුට අවශ්‍ය ඕනෑම කෙනකු පත්කිරීමට බලතල ඇති ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කළේය. ඇත්ත වශයෙන්ම සිවිල් සේවකයකු වූවත්, ඇතැම් අමාත්‍යාංශ ඔහුගේ නොවූවත් සැබවින්ම එම අමාත්‍යාංශ භාර අමාත්‍යවරුන්ට වඩා ඒවායේ වැඩි පාලනයක් පවත්වාගෙන යාමට හැකිවන තරම් ඇතැම් අවස්ථාවලදී ඔහු බලවත් තැනැත්තෙක් විය.

## A ආරක්ෂක ලේකම් භූමිකාව

2005 නොවැම්බර් 25 - 2015 ජනවාරි 9 කාලයේදී ගෝඨාභය රාජපක්ෂ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙස සේවය කළේය[8]. මෙම තනතුරේ සිටියදී ඔහු ශ්‍රී ලංකාවේ යුද්ධ හමුදාවේ සියලු ඒකක සහ සියලු බුද්ධි සේවා බලකායන් 2005 - 2015 දක්වා පාලනය කළේය. අලුතින් පිහිටුවූ නීතිය හා සාමය අමාත්‍යාංශය යටතට පොලීසිය පත්කරන තුරු ඔහු 2005 - 2013 අගෝස්තු දක්වා පොලීසියද පාලනය කළේය.

ආරක්ෂක ලේකම් වශයෙන්, ගෝඨාභයට නීති දෙකක්[9] යටතේ අතිවිශේෂ හදිසි බලතල තිබූ අතර, එක්සත් ජාතීන් එය විස්තර කර ඇත්තේ ‘අත්අඩංගුවට ගැනීමට සහ රඳවාගැනීමට නියෝගකිරීමේ අධිකතර බලතල සහිත’ ලෙසයි. එකක් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ය. එය අහෝසිකරන බවට දශක කිහිපයක සිට පොරොන්දු වී ඇතත් එම පනත අදටත් බලාත්මකව පවතී. මෙම නීතියෙන් ‘ත්‍රස්තවාදය’ට ඇත්තේ අතිශයින් පුළුල් අර්ථනිරූපනයකි. එම පනතින් බලධාරීන්ට දෙමළ ඊළම් විමුක්ති කොටි සංවිධානය සමඟ සම්බන්ධකම්

7. How can there be freedom without discipline ? – Gotabaya, , 12 Feb. 2019, Daily Mirror, http://www.dailymirror.lk/article/How-can-there-be-freedom-without-discipline-Gotabaya-162220.html

8. සේයාරුව: Troops capture Pooneryn: 16 Nov 2008, Daily News, ගොණුගත ලේඛන දිනය ආරක්ෂක අමාත්‍යාංශ වෙබ් අඩවියෙනි. ගොණුගත ලේඛන, ref B.

9. §108, OISL, 2015 "මහජන ආරක්ෂක ආඥා පනතේ 2005 අගෝස්තු 13 දා ගැසට්කරන ලද, හදිසි අවස්ථා රෙගුලාසි යටතේ (පරිච්ඡේදය 40 ) 'වෙනත් කරුණු අතර ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් සහ, 2006 සිට ඉදිරියට, ත්‍රස්තවාදය සම්බන්ධයෙන් ,' ඔහුගේ මතයී අත්අඩංගුවට ගැනීම අවශ්‍ය බව නම් අත්අඩංගුවට ගැනීම් සහ රඳවාගැනීමට නියෝග කිරීමට ආරක්ෂක ලේකම්වරයාට පුළුල් බලතල ලබාදී ඇත.

පැවති බවට යම් තැනැත්තකු සැකයට භාජනය කර (අත්තනෝමතිකව) අත්අඩංගුවට ගැනීමට, අධිකරණ පුනරීක්ෂණයකින් තොරව දිගුකලක් රඳවාගැනීමට සහ පාපොච්චාරණ - සාමාන්‍යයෙන් වදහිංසාවන්ට ලක්කර ලබාගන්නා - පාදක කරගෙන සැකකරුවකු චූදිතයකු කිරීමට අවසර ලැබෙයි. දෙවැන්න - 2005 දී පනවා 2011 දී ඉවත්කරන ලද - හදිසි අවස්ථා රෙගුලාසි වන අතර ඒවායින් චෝදනා ඉදිරිපත් කිරීමකින් තොරව කාල නියමයකින් තොරව රඳවාතැබීමට පදනමක් සලසා තිබුණි. ආරක්ෂක අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ සමකාලීන සංස්කරණවලින් පැහැදිලිව ප්‍රකාශ කරන්නේ අමාත්‍යාංශයේ අරමුණ වන්නේ '1982 අංක 10 පනතින් සංශෝධනය කරන ලද පරිදි 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම' බවයි[10].

## සන්නද්ධ හමුදා පාලනය

ආරක්ෂක අමාත්‍යාංශය ශ්‍රී ලංකාවේ යුද, නාවික සහ ගුවන් හමුදා පරිපාලනය කරයි.[11] සියලු පත්කිරීම්, උසස්කිරීම් සහ විනය කරුණු සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙස ගෝඨාභය රාජපක්ෂට බලය තිබූ අතර ඒවාට ඔහුගේ සොහොයුරු ජනාධිපති විසින් පිහිටුවන ලද යුද්ධ හමුදා උසාවියකදී වරදකරුවකුට අභිචෝදනා ගොණුකිරීමේ බලයද ඇතුළත් ය[12]. පශ්චාත් යුද සමයේ ඇති කළ තනතුරක් වන ආරක්ෂක හමුදාවල ජ්‍යෙෂ්ඨතම නිලධාරියා වන, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානියා අභිබවා යන බලයක් ද ඔහුට තිබුණි[13]. ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී තනතුර 2009 දී ඇති කිරීමට පෙර මෙම කාර්යය ඉටුකරන ලද්දේ ඒකාබද්ධ මෙහෙයුම් මූලස්ථානය ඇතුළත වූ මෙම තනතුරුනාමය සහිත තැනැත්තකු විසිනි. 2006-9 දක්වා ඒකාබද්ධ මෙහෙයුම් මූලස්ථානය සඳහා ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී වූයේ ඩොනල්ඩ් පෙරේරා[14]ය. ඔහු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂට වගකිය යුතු විය.[15] බීබීසි සේවය මෙය විස්තර කළේ පසුව 2009 ඇති කළ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී තනතුරට වඩා අඩු බලතල ඇති තනතුරක් ලෙසය[16].

## බුද්ධි අංශ පාලනය

ආරක්ෂක අමාත්‍යාංශය අභ්‍යන්තර සහ විදේශ බුද්ධි සේවාද පාලනය කළ අතර, එයට යුද්ධ හමුදාවේ බුද්ධි බලකාය සහ රාජ්‍ය බුද්ධි සේවයද (SIS) ඇතුළත්ය.[17] කොපමණ රාජකාරි තිබුණත්, සෑම අඟහරුවාදා දිනකම බුද්ධි අංශ ප්‍රධානීන්ට ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ[18] මුලසුන හෙබවූ රැස්වීමක් තිබුණි.

එම කාලයේ යුද හමුදාවේ එක් බලසේනාවක

10. ගොණුගත ලේඛන - Ref A.

11."ගොඩබිම හමුදාවලට ආධාර කිරීමෙන් සහ එල්ටීටීඊයේ පුහුණුකිරීමේ සහ හමුදා කඳවුරුවලට, ඔවුන්ගේ සැපයුම් සේවා ස්ථානවලට සහ ඔවුන්ගේ නායකත්වයට එරෙහිව ස්වාධීනව මර්දන මෙහෙයුම් සිදුකරමින් ප්‍රධාන කාර්යභාරයක් ඉටුකළ ශ්‍රී ලංකා ගුවන් හමුදාව ඊයේ ගුවන් මෙහෙයුම්වල කූටප්‍රාප්තිය ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂගේ අධීක්ෂණය යටතේ කටුනායක ගුවන් හමුදා කඳවුරේදී සනිටුහන් කරගත්තේය". - ජුනි 12, ඩේලි නිවුස්

12. 2008 ආරක්ෂක අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළකළ සම්මුඛ සාකච්ඡාවකදී ගෝඨාභය රාජපක්ෂ ප්‍රකාශ කළේ 'අමාත්‍යාංශයේ ලේකම් ප්‍රධාන ගණන්දීමේ නිලධාරි මෙන්ම රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ වගකීම දරන තැනැත්තා වන බව අපගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම දක්වා ඇත. සත්‍ය වශයෙන්ම මගේ වගකීම එයයි. මම ගතවූ වසර දෙක පුරා කරගෙන යන්නේ එයයි.ඇත්ත වශයෙන්ම ත්‍රිවිධ හමුදාපතිවරුන් ගේ ආධාරය ඇතිව ආරක්ෂක ඇමතිවරයාට ප්‍රතිපත්ති සම්පාදනය පිණිස සාහායවීම ද මගේ වගකීමක්. මා එය ඉටු කළා. මා තනතුරට පත්කළ විට කළ පළමුවැනි දෙය වූයේ රටේ සමස්ත ආරක්ෂක තත්වය තක්සේරුකිරීම සහ එම පදනම් කරගෙන ප්‍රතිපත්තිය සම්පාදනය කිරීම. ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම මගේ වගකීමයි."
https://web.archive.org/web/20080923065349/http://www.defence.lk/new.asp?fname=20080919_05

13. 'ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ මෙහෙයවීම, පාලනය සහ අධීක්ෂණය යටතේ ක්‍රියා කරනු ඇත.' *ඩේලි නිවුස් , 2009 ජුනි 12 - නව ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි තනතුර ගැන*

14. මිග් ගුවන්යානා ගනුදෙනුව සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ මූල්‍ය වංචා විමර්ශන කොට්ඨාසය විසින් ඔහුගෙන් ප්‍රශ්න කරන ලදී.
- මිග් ගුවන්යානා ගනුදෙනුව සම්බන්ධයෙන් හිටපු ගුවන් හමුදාපතිගෙන් ප්‍රශ්න කිරීම, 2015 අප්‍රියෙල් 2. - http://www.ft.lk/article/402905/Former-Air-Chief-Marshal-Donald-Perera-questioned-over-MiG-aircraft-transaction

15. එක්සත් ජාතීන් (දී112) පවසන්නේ 'ඒකාබද්ධ මෙහෙයුම් මූලස්ථානය ආරක්ෂක ලේකම්ට වගකියන ප්‍රධාන ආරක්ෂක මාණ්ඩලික ගේ විධානය යටතේ පවතී.'

16. නව හමුදා තනතුරු ඇතිකිරීම, ජූලි 12, 2009, https://www.bbc.com/sinhala/news/story/2009/07/printable/090712_military_new.shtml

17. "Administration of the Directorate of Foreign Intelligence & the Directorate of Internal Intelligence." Stated on MOD website 2008, accessed at: https://web.archive.org/web/20081218215747/http://www.defence.lk/main_abt.asp?fname=resp_functons also in more detail at: https://web.archive.org/web/20081216074101/http://www.defence.lk/main_abt.asp?fname=orgstr
ON SIS - REGISTRATION OF SUPPLIERS / CONTRACTORS FOR YEAR 2012 (on file) cites SIS as coming under the purview of the MOD. Likewise this report in the Media - https://www.pressreader.com/sri-lanka/sunday-times-sri-lanka/20200913/281522228502926 based on Kamal Gunaratne's book.

18. කමල් ගුණරත්නගේ 'ගෝඨා' සිංහල කෘතියෙනි. picked up and translated in How Gotabaya directed intelligence, Sunday Times, 13 Sep 2020, https://www.pressreader.com/sri-lanka/sunday-times-sri-lanka/20200913/281522228502926
In Aug 2009 එක් මාධ්‍ය වාර්තාවක් එල්ටීටීඊයේ ප්‍රධාන අවි ගනුදෙනුකරු කේ පී අල්ලාගැනීමේ ගෞරවය ගෝඨාභය රාජපක්ෂට සහ කපිල හෙන්දවිතාරණට (ඔහුගේ බුද්ධි ප්‍රධානි) https://lrrp.wordpress.com/2009/08/09/state-intelligence-wins-at-hide-and-seek-with-kp/
එමෙන්ම ITJP සාක්ෂිකරු W272 මෙසේ කියා සිටියි: 'බුද්ධි තොරතුරු රැස්කිරීමේ සහ විශ්ලේෂණය කිරීමේ කේන්ද්‍රය වූයේ විශේෂ කාර්ය බලකායේ බුද්ධි මූලස්ථානයයි; සෑම සතියකම අඟහරුවාදා ආරක්ෂක අමාත්‍යාංශයේදී ජනාධිපති, ආරක්ෂක ලේකම්, ත්‍රිවිධ හමුදාපතිවරුන් සම්බන්ධවෙමින් විශේෂ කාර්ය බලකාය, පොලිස් කොමාන්ඩෝ සමගින් පැවැත්වූ අතර එය ප්‍රධාන වශයෙන් යුද හා නාවික බුද්ධි සේවා, විශේෂ කාර්ය බලකායේ, ගුවන් හමුදාවේ, පොලිස් බුද්ධි සේවයේ සහ ජාතික බුද්ධි තොරතුරු කාර්යාංශයේ, සිවිල් බුද්ධි තොරතුරුවල සහාය ඇතිව තොරතුරු හුවමාරුවක් විය. එක් එක් සේවාව ඔවුන්ගේ අදාල විෂය කාර්ය පථය ගැන විස්තර දක්වමින් තම විධාන පද්ධතියෙන් සහ ප්‍රාදේශීය මෙහෙයුම් කලාපවලින් ලබාගත් තොරතුරු හුවමාරු

ආඥාපතිවූ, කමල් ගුණරත්න පවසන පරිදි "මෙම රැස්වීම ඉතා වැදගත් වූ අතර ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, ත්‍රිවිධ හමුදාපතිවරු සහ පොලිස්පති[19] ඊට සහභාගිවීම පුරුද්දක් කරගෙන සිටියහ[20]. ඔහු පවසන පරිදි, ගෝඨාභය, 'නොවරදවා' මෙම සතිපතා රැස්වීමට සහභාගි විය[21].

යුද්ධයේ අවසාන කාලයේදී හමුදා බුද්ධි අංශය මේජර් කපිල හෙන්දවිතාරණ ගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක වූ අතර ඔහු ගෝඨාභය රාජපක්ෂ සහ යුද හමුදාපතිගේ[22] අණදීම යටතේ විශේෂ බුද්ධි කණ්ඩායම් පවත්වාගෙන ගිය බවට විකිලීක්ස් ටෙලෙක්ස් මගින් චෝදනා කරන ලදී. පසුව ශ්‍රීලංකා පොලීසියේ මූල්‍ය අපරාධ විමර්ශන අංශය විසින් ඔහුගෙන්[23] ප්‍රශ්න කරන ලදී. බුද්ධි ඒකක හෙන්දවිතාරණ යටතේ එක්කිරීමට ගෝඨාභය ''නියෝග" කළේය[24]. සමහර විටක ගෝඨාභය අතිරේක බුද්ධි තොරතුරු රැස්වීම් කැඳවූ බව ඔහුගේ හමුදා සගයන් පවසන අතර ඒවා අභ්‍යන්තර කවයේ අයට සීමා විය:

"ඊළඟ අඟහරුවාදා වන තෙක් නොසිට විශේෂ හදිසි රැස්වීමක් සඳහා අවශ්‍ය පුද්ගලයන් වහාම කැඳවන ලෙස ගෝඨාභය කපිල හෙන්දවිතාරණ ට උපදෙස්දී තිබුණි. ඒ අනුව, සියල්ලන් සමඟම සාකච්ඡා කළ යුතුව තිබූ කරුණු සියල්ලන් සමඟ සාකච්ඡා කළ අතර අධි සංවේදී බුද්ධි තොරතුරු සාකච්ඡා කරන ලද්දේ අත්‍යවශ්‍ය අය සමඟ පමණි"[25].

රාජ්‍ය බුද්ධි සේවය ආරක්ෂක ලේකම්ට වාර්තා කළේය[26]. සන්නද්ධ ගැටුමේ අවසන් අදියරවලදී ක්‍රියාත්මක වූ බුද්ධි සේවා ගණනාවකින් එකක් වන රාජ්‍ය බුද්ධි සේවය අදත් ක්‍රියාත්මකයි. 2009 අප්‍රියෙල් මාසයේදී Business Today සමඟ පැවති සම්මුඛ සාකච්ඡාවකදී , එම කාලයේ ශ්‍රී ලංකාවේ පොලිස්පති සහ අපරාධ විමර්ශන කොට්ඨාසයේ නියෝජ්‍ය පොලිස්පති යන දෙදෙනාම එල්ටීටීඊ සංවිධානය ගැන තොරතුරු හුවමාරුකරගැනීමට ආරක්ෂක ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පවත්වන සතිපතා රැස්වීම් ඇතුළු, රාජ්‍ය බුද්ධි සේවය, පොලිස් බුද්ධි ඒකක සහ යුද හමුදා බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුළු විවිධ බුද්ධි සේවා අතර සමීප සම්බන්ධීකරණය විස්තර කළහ.[27]

එපමණක්ද නොව ශ්‍රී ලංකාවේ බුද්ධි සේවාවන්වල කාර්යයන් ප්‍රතිසංවිධානය කිරීමේ ගෞරවය ඔහු පෞද්ගලිකව ලබා ගෙන ඇති බව ඔහුගේ ලිඛිත නිල චරිතාපදානයෙන් උපුටා දැක්විය හැකිය[28]:

"රටේ සියලුම බුද්ධි ඒකක, ත්‍රිවිධ හමුදාවල,

---

කරගත්තේය. යුද හමුදා බුද්ධි සේවය මූලික ආයතනය වූ අතර බුද්ධි සේවා සම්බන්ධීකරණයේද මූලික කාර්යභාරයක් ඊට ඇත. නිතිපතා රුැස්වීම්වලදී වැදගත් තොරතුරු ලබාදීමක් තිබුණද කෙළින් කළ ඉල්ලීම්ද තිබුණි.
'මෙම අඟහරුවාදා දිනවල රැස්වීම් ආරම්භකරන විට නිශ්චිත දිනයක් නොතිබුණ නමුත් කමල් ගුණරත්නගේ පොත කියවීමේදී පෙනෙන්ට ඇත්තේ 2005 දී ගෝඨාභය තනතුර බාරගැනීමෙන් පසුව සහ 2006 වන විට බුද්ධි සේවා ප්‍රතිව්‍යුහගතකිරීමක් සිදුවූ බව සහ ඔහු ඒවා සම්බන්ධීකරණයට දැනටමත් කපිල හෙන්දවිතාරණ පත්කර ඇති බවත් ය. (see Kapila referenced here: https://www.colombotelegraph.com/index.php/exclusive-gotas-intelligence-czar-caught-red-handed-as-chinese-mole/ and in action by 2007 according to this: https://lrrp.wordpress.com/2007/01/05/athurugiriya-safe-house-—-unp-explains/) සහ ප්‍රතිව්‍යුහගතකරණය 2006 දී සිදුවූ අතර 2009 අප්‍රියෙල් මාසයේදී කතා කළ පොලීසියේ ප්‍රධාන තනතුරක් දැරූ නිලධාරියෙකුට අනුව '2006 වසර තුළ අපට විශාල වගකීමක් දුන්නා. ඒ වේලාවේ අප සියල්ලන්ම එක කණ්ඩායමක් බවට වුනා.අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව,ත්‍රස්ත විමර්ශන කොට්ඨාසය,යුද හමුදා සහ පොලිස් බුද්ධි ඒකක - සියල්ල එකක් වුනා.ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ ඒකට මුලපිරුවා.අප නිතිපතා ඔවුන් සමග සන්නිවේදනයේ යෙදුන අතර ආරක්ෂක ලේකම් මුලසුන දරන සම්බන්ධීකරණ රුැස්වීම්ද පැවැත්වූවා. මෙම රැස්වීමේදී මනා සංවරණයක් හා තුලනයක් සිදු කෙරිණි.' (https://businesstoday.lk/senior-superintendent-of-police-c-n-wakishta/) එහෙයින් මෙම රැස්වීම් 2008 අගදී යුද්ධය උත්සන්නවීමත් සමඟම ඉතා හොඳින් පැවති බව විශ්වාස කිරීම සාධාරණය.'

19. යුද්ධයෙන් පසු පත් කෙරුණු පොලිස්පතිවරයා 1989 ගෝඨාභයගේ විධානය යටතේ මාතලේ පොලිස් අධිකාරි ධුරය දැරූ පුද්ගලයාවීම අවධානය යොමුකිරීමට වැදගත් වන අතර ඉන් පෙන්නුම් කරන්නේ ඔහු ගේ අතීත මිතුරන් රටේ ආරක්ෂක ආයතනවල ඉහළම තනතුරුවලට ඉහළ ගිය ආකාරයයි.

20. ගුණරත්න කමල්, ගෝඨාභය, පිටු131-2

21. එම - පිටුව 131, 'ඒ අනුව .රාජ්‍ය බුද්ධී සේවාව ලෙස සියලුඋ බුද්ධි සේවාවන්ගේ ප්‍රධානීන්ට, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, ත්‍රස්ත විමර්ශන කොට්ඨාසය, සුවිශේෂ ශාඛාව, විශේෂ කාර්ය බලකාය, බස්නාහිර පළාත් බුද්ධි සේවය, යුද හමුදා, නාවික හමුදා, ගුවන් හමුදා බුද්ධි සේවාවන්,සහ පොලිස් බුද්ධි ඒකකවල ප්‍රධානීන්ට ගෝඨාභය විසින් සෑම අඟහරුවාදා දිනකම කැඳවන ලද බුද්ධි අංශ ප්‍රධානීන්ගේ රැස්වීමට සහභාගිවීමට සිදුවිය. ගෝඨාභය රාජපක්ෂ සෙසු වැඩ සියල්ල පසෙකලා නොවරදවාම මෙම රැස්වීමට සහභාගිවීමට පියවර ගත්තේය.

22. https://wikileaks.org/plusd/cables/09COLOMBO47_a.html

23. https://www.dailymirror.lk/breaking_news/Maj-Gen-Hendawitharana-at-FCID/108-130951
Exclusive: Gota’s Intelligence Czar Caught Red Handed As Chinese Mole:Ó https://www.colombotelegraph.com/index.php/exclusive-gotas-intelligence-czar-caught-red-handed-as-chinese-mole/
MILLIONS CREDITED TO EX-INTELLIGENCE CHIEF MAJ. GEN. KAPILA HENDAWITHARANA’S ACCOUNT.25 Feb 2017, https://srilankabrief.org/2017/02/millions-credited-to-ex-intelligence-chief-maj-gen-kapila-hendawitharanas-account/
https://economictimes.indiatimes.com/news/defence/sri-lanka-blasts-rajapaksas-close-aide-allegedly-trying-to-hinder-probe/articleshow/69155353.cms?from=mdr

24. එම.

25. ගුණරත්න කමල්, ගෝඨාභය, පිටුව 131-2 (සිංහලෙන් පරිවර්තනය කරන ලදී)

26. §127, OISL, 2015

27. www.businesstoday.lk archive, April 2009.

28. 'වෙනස් බුද්ධි සේවාවන් සම්බන්ධීකරණයෙන් යුත් එක් විධානයක් යටතට ගෙනඒම ගෝඨාගේ කාර්යයන්හි තවත් වැදගත් අංගයකි. කතුවරයා මේ ගැන පිටු 356 හි සහ 357 හිදී කතාකරයි. 2006 දී යුද්ධය ආරම්භවීමෙන් පසුව, ගෝඨා වෙනස් බුද්ධි සේවාවන් සම්බන්ධීකරණයෙන් යුත් එක් විධානයක් යටතට ගෙන ආවේය. අතීත අත්දැකීම්වලින් පෙන්නුම් කළේ බුද්ධි සේවාවන් තොරතුරු ස්වල්පයක් හුවමාරුකරගනිමින් හෝ නැතිව වැසූ කාමරවලවල සිට වැඩකිරීමේ නැඹුරුවක් පැවතීමය. මෙයින් ත්‍රස්තවාදය මැඩලීමේ ප්‍රයත්න බෙලහීන කිරීමේ විපාක ගෙනදුනි. ත්‍රස්තවාදය පරීක්ෂණ අංශය, ත්‍රස්ත විමර්ශන කොට්ඨාසය, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව,කොළඹ අපරාධ කොට්ඨාසය, රාජ්‍ය බුද්ධි සේවය, පොලිස් සුවිශේෂ ශාඛාව, බස්නාහිර

පොලීසියේ, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ, ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයේ, කොළඹ අපරාධ කොට්ඨාශයේ සහ ජාතික බුද්ධි සේවයේ ඒකක එකට එක් කර අපේ රටට මනා බුද්ධි සේවා ආවරණයක් සැපයුවෙමු[29]."


2019 දී දිවයින තුළට අන්තරායකර ඖෂධ ගෙන ඒම නතර කළ හැක්කේ කෙසේදැයි ප්‍රශ්න කළ අවස්ථාවේදී, ගෝඨාභය රාජපක්ෂ බුද්ධි සේවාවන් ඔහුගේ පාලනය යටතේ පවතින බව පවසා අවම වශයෙන් රටට හොරබඩු ගෙන ඒම නතර කළේ තමන් බව කියා පෑවේය.[30]

## පොලීසියේ පාලනය

2013 වනතුරු පොලිසියේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, ත්‍රස්ත විමර්ශන කොට්ඨාසය, විශේෂ කාර්ය බලකාය (STF)[31], කොළඹ අපරාධ කොට්ඨාසය යන ඒකක ඇතුළු සියලුම අංශ බාරව කටයුතු කළේද ආරක්ෂක අමාත්‍යාංශයයි. එම ඒකක තහවුරු කරන ලද වදහිංසා පැමිණවීම්වලට සම්බන්ධ බව එක්සත් ජාතීන් පවසා තිබුණි. ආරක්ෂක ලේකම්වරයා වශයෙන් ගෝඨාභය රාජපක්ෂ, ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරුන්, පොලිස්පති, නියෝජ්‍ය පොලිස්පති ඇතුළත් විධාන දාමයක් ඔස්සේ එම ඒකකවල මෙහෙයුම් පාලනය සිදුකළේය. 2010 වන විට ජාත්‍යන්තර අර්බුද කණ්ඩායම (ICG) සංවිධානය කනස්සල්ල පළකරමින් පොලිස් හමුදාව රාජපක්ෂ සහෝදරයන්ගේ පාලනය යටතේ පවතින බවත් සුරක්ෂාවන් නොමැති බවත් ප්‍රකාශ කළේය.[32]:

"පොලීසිය, ගෝඨාභය රාජපක්ෂ ප්‍රධානියාව සිටින ආරක්ෂක අමාත්‍යාංශයේ පාලනය යටතේ පවතින අතර, පොලීසියේ ජ්‍යෙෂ්ඨ පත්වීම්- ව්‍යවස්ථාවෙන් කිරීමට අවශ්‍යව ඇති පරිදි ජාතික පොලිස් කොමිසම විසින් නොව - ජනාධිපතිවරයා සිදුකරන නිසාත් - කෙළින්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරමින් පොලීසිය ජනාධිපතිවරයාගේ සහ ඔහුගේ සහෝදරයාගේ සෘජු පාලනය යටතේ පවතී. එය ''සෘජුවම දේශපාලනීකරණය වූ පොලීසියකි."

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය විසින් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් කළ විමර්ශනකින් (OISL) ලබාගත් විධාන ව්‍යුහය වගුවකින් පහත දක්වා ඇති අතර එයින් පෙන්නුම් කරන්නේ ආරක්ෂක ලේකම්වරයා මුදුනෙහි සිට පාලනය කරන බවයි.[33]:




රූපසටහන 3: ශ්‍රී ලංකා පොලිසියේ සංවිධාන ව්‍යුහය

පළාත් බුද්ධි කොට්ඨාසය , , අධ්‍යක්ෂ -හමුදා බුද්ධි සේවය, අධ්‍යක්ෂ නාවික බුද්ධි සේවය, අධ්‍යක්ෂ ගුවන් හමුදා බුද්ධි සේවාව, ස්වාධීනව වැඩකරමින් සිටියේය. ජාතික බුද්ධි ප්‍රධානි තනතුර ඇති කළ ගෝඨා එයට මේජර් ජෙනරාල් කපිල හෙන්දවිතාරණ පත්කළේය.මෙම සියළුව බුද්ධිසේවා සම්බන්ධයෙන් සෘජු රේඛීය අධිකාරයක් සහිතව කැබිනට් අනුමැතිය ලත් තනතුරකි' මම හිතන්නෙ මෙයින් බුද්ධි සේවය වැඩකළ ක්‍රමයේ දැඩි වෙනසක්ඇති කළ බවයි. ඒ නිසයි , බොහෝ මිනිසුන් ත්‍රස්තවාදය පරදවා ජයලැබීමට බුද්ධි සේවාවන් මනා සම්බන්ධීකරණයක් කළ බව පවසන්නේ'. ලලිත් වීරතුංග ,ජනාධිපති ලේකම්- 'ගෝඨාගේ යුද්ධය' එළිදැක්වීමේ කතාව,
Business Today, June 2012, https://businesstoday.lk/category/june-2012

29. 2019 ඔක්තෝබර් 19 මැතිවරණ ප්‍රචාරක රැළිය දිවුලපිටිය. https://www.youtube.com/watch?v=8NWmtUdee24&t=218s, 2'00" - 6'19"

30. 'අපට වෙරළ ආරක්ෂකයන් ඉන්නවා; අපට නේවි එක තියෙනව. ඔවුන් බෝට්ටුවලින් පැමිණීම නැවැත්වීමට අපි ඔවුන් යොදා ගත යුතුයි. එය එතනින් ආරම්භ කළ යුතුය. ඊළඟට .. අපි..මගේ කාලයේදී මම කළා, මේවා කරන මිනිස්සු ලුහු බැඳීමට බුද්ධි සේවය යොදාගනිමින්. ගිහින් ඔවුන් අල්ලා ගැනීමට. අප, මෙය බොහෝ දුරට පාලනය කළා. ඇතමුන් රටින් පලා ගියා. එය ක්‍රියාත්මක කළ යුතුයි. ජනප්‍රිය ගායක සහ youtuber Iraj සමඟ සම්මුඛ සාකච්ඡාවකදී කළ මෙම අදහස් දැක්වීම 2019 නොවැම්බර් 14. on You tube, ගොනුව 34'03'' - 35'48"

31. 'විශේෂ කාර්ය බලකාය 2006 අගෝස්තු 1 දා සිට ආරක්ෂක, නීතිය හා සාමය අමාත්‍යාංශය යටතට පත්කර ඇත. විශේෂ කාර්ය බලකායේ සියලු කටයුතු එදින සිට දැන් මෙහෙයවනු ලබන්නේ පොලිස් කොට්ඨාසය විසිනි' - ගොණුගත ලේඛණ, ආරක්ෂක අමාත්‍යාංශ වෙබ් පිටුවෙනි. Ref MOD D. - 'විශේෂ කාර්ය බලකාය ගෝඨාභයගේ නියෝග මත පමණක් ක්‍රියාත්මක වෙයි." - ITJP සාක්ෂිකරුවෙක්.

32. A Bitter Peace, ICG. January 2010.

33. OISL.

ඔහු යටතේ සිටි නිලධාරියකු වන කමල් ගුණරත්නට අනුව, වැදගත් දෙයක් වන්නේ, ගෝඨාභය රාජපක්ෂ ආරක්ෂක ලේකම්වරයා වශයෙන් පොලිස් බුද්ධි අංශ තනතුරක් ජාතික බුද්ධි ප්‍රධානි යනුවෙන් හමුදාකරණය කිරීමයි[34].

## B. යුද ජයග්‍රහණයේ ගෝඨාභය රාජපක්ෂගේ සුවිශේෂතාව

*හමුදා මෙහෙයුම් සැලසුම්කිරීම සහ සම්බන්ධීකරණය*

මෙහෙයුම්වලට නායකත්වයදීමේ දී සහ සැලසුම්කිරීමේදී තමා ට ඉටුකිරීමට ප්‍රධාන කාර්යභාරයක් තිබූ බව ගෝඨාභය රාජපක්ෂ විසින්ම පිළිගෙන ඇතඃ

"ආරක්ෂක ලේකම් ලෙස කටයුතු කරන අතරම ශ්‍රී ලංකාවේ ජයග්‍රාහී සන්නද්ධ හමුදාවලට නායකත්වය දීමට, අභිප්‍රේරණය කිරීමට සහ ප්‍රවර්ධන සහාය ලබාදීමට මට භාග්‍යය තිබුණි.[35]"

යුද්ධයෙන් පසුව, මෙරට පරීක්ෂණ කොමිසමක් වූ ශ්‍රී ලංකාවේ 'උගත් පාඩම් සහ සංහිඳියාව පිළිබඳ කොමිසම' හමුවේ දී සිවිල් යුද්ධයේ අවසන් අදියරේ හමුදා මෙහෙයුම සැලසුම් කිරීමේදී සහ සම්බන්ධීකරණයේදී ඔහුගේ භූමිකාව පිළිබඳව ගෝඨාභය සාක්ෂි දුන්නේය. 'අපි හමුදා මෙහෙයුම් ව්‍යාපාරය සැලසුම් කරද්දී' 'අප හමුදා මෙහෙයුම සැලසුම් කළේ කෙසේදැයි තොරතුරු කොමිසමට ඉදිරිපත් කිරීමට විශේෂයෙන් කැමතියි' කියමින් ඔහු අයිතිය ලබා ගත්තේය"[36]. යුද්ධය සුවිශේෂී තත්වයක් වූ බවට ඔහු තර්ක කළේයඃ

"යුද්ධය නිමා කිරීමට සියල්ලන්ටම අවශ්‍යව තිබූ වේලාවක මම ආරක්ෂක ලේකම්වරයා වීමි. ඒ සම්බන්ධයෙන් මම ක්‍රියාත්මක වුනෙමි. දමිළ ප්‍රජාවට එරෙහිව මට කිසිම දෙයක් තිබුණෙ නැහැ. අවාසනාවකට මෙන් එල්ටීටීඊයේ 99% ක්ම ද්‍රවිඩ ජාතිකයන් වුණා. ත්‍රස්තවාදය මැඩලීමට අපට යම් යම් දේවල් කරන්න සිද්ධවුනා. ...යුද තත්වයක් පවතින විට අප කළ යුතුම ඇතැම් දේවල් තියෙනවා. යුද්ධය අවසන් වුනාම අපට ඒවා නැවත කරන්න අවශ්‍ය නැහැ. රජය විසින් මට යම් යම් වගකීම් පැවරුවා. ඒ අනුව මම ක්‍රියා කළා[37].''

### ප්‍රතිසංවිධානය

ආරක්ෂක හමුදා ප්‍රතිසංවිධානයේදී, සතිපතා රැස්වීම්වලට සහභාගීවෙමින් සහ සවිස්තරාත්මකව කටයුතුවල නිරතවීමෙන් ගෝඨාභය රාජපක්ෂ තීරණාත්මක වූයේ කෙසේදැයි යුද්ධ කාලයේ 53 බලසේනා ආඥාපති, මේජර් ජෙනරාල් කමල් ගුණරත්න පැහැදිලි කළේය. ශ්‍රී ලංකාවේ බුද්ධි සේවා කටයුතු පිළිබඳ විශේෂඥයකු වන මහාචාර්ය රොහාන් ගුණරත්න මෙය සනාථ කළේයඃ

"කළින් සිටි ආරක්ෂක ලේකම්වරුන් මෙන් නොව, ගෝඨාභය රාජපක්ෂ සියල්ලන් සමඟ වැඩකිරීමේ වැදගත්කම අවබෝධ කරගෙන සිටි තැනැත්තෙක්. ඔහු යුද හමුදාවෙන්, නාවික හමුදාවෙන්, ගුවන් හමුදාවෙන්, බුද්ධි සේවාවලින්, පොලීසියෙන්, විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් සහ රජයේ වෙනත් ආයතනවලින් නායකයන් ලබාගනිමින් පළමු පංතියේ කණ්ඩායමක් ගොඩනගා ගෙන ඔවුන්ට එකට එක්ව වැඩකිරීමට සැලැස්වීය.'

යුද්ධයෙන් පසුව සහ ගෝඨාභය රාජපක්ෂ සහ සරත් ෆොන්සේකා අතර සට්ටනය උච්චව තිබූ අවස්ථාවේ ෆොන්සේකා 'යුද්ධය අවසන්කිරීමට උවමනාකර තිබූ ආධාර ලබාදීම' සම්බන්ධයෙන් ගෝඨාභය රාජපක්ෂට ස්තුතිය පළ කළේය. යුද්ධයේ අවසන් අදියර මෙහෙයවීමේදී ගෝඨාභය ඉටුකළ ප්‍රමුඛ කාර්යභාරයට ගෞරව කිරීමක් එයින් සිදුනොවූ හෙයින් 'එය විශාල අසාධාරණයක්' බව ශ්‍රී ලංකාවේ පුවත්පතක විවේචකයෙක් පැවසීය.

34. 'එකිනෙකා අතර සම්බන්ධයක් හෝ සම්බන්ධීකරණයක් නොමැතිව ඔවුන්ට අවශ්‍ය පරිදි ක්‍රියාකිරීම ගැන ඔහු බුද්ධි සංවිධානවලට සිය අප්‍රසාදය පළ කළේය... ඒවායේ සම්බන්ධයක් හෝ සම්බන්ධීකරණයක් නොමැති නිසා මෙම ඒකක සම්බන්ධයෙන් විශේෂ උනන්දුවක් දැක්වූ ගෝඨාභය අවුරුදු 55 න් මේජර් ජෙනරාල් කපිල හෙන්දවිතාරණ විශ්‍රාම ගත් වහාම ඔහු රාජ්‍ය බුද්ධි සේවයේ ප්‍රධානියා ලෙස පත්කිරීමට ඔහු කැබිනට් අනුමැතිය ලබාගත්තේය. මේ සඳහා කාර්ය මණ්ඩලයටද අනුමැතිය ලබා ගත් අතර එම අනුමැතිය ප්‍රකාරව අනිවාර්යයෙන්ම ජාතික බුද්ධි සේවා ප්‍රධානි තනතුරට හමුදා නිලධාරියෙකු පත් කළ යුතු වූ බව පවසා ඇත. (CNI)."
කමල් ගුණරත්න, පිටුව 130, 'ගෝඨාභය' (සිංහල පරිවර්තනය).

35. https://www.facebook.com/437355006429820/posts/1275498389282140?sfns=mo His Facebook page.
This is corroborated by Gota's War page 291, 'ගෝඨා සරත් ෆොන්සේකාට අවස්ථාවදීමට තීරණය කර තිබුණි.'

36. - LLRC හමුවේ ගෝඨාභය රාජපක්ෂගේ ප්‍රකාශයේ පිටපත්කරය

37. විනයක් නැතිව මොන නිදහසක්ද ? ගෝඨාභය,
12 පෙබරවාරි 2019, Daily Mirror,
http://www.dailymirror.lk/article/How-can-there-be-freedom-without-discipline-Gotabaya-162220.html

38. ආරක්ෂක ලේකම්වරයාව සිටියදී ගෝඨාභය රාජපක්ෂ මහතා රටේ බුද්ධි අංශය ප්‍රතිසංවිධානය කිරිමට දැවැන්ත පියවර ගත්තේය. ඊළඟට ඔහු බුද්ධි සේවාවන් අතර මනා සම්බන්ධීකරණයක් ඇති කළේය. කෙතරම් වැඩරාජකාරි තිබුණත් ඔහු සෑම අඟරුවාදාකම බුද්ධි සේවයේ සෑම අංශයක්ම මුණගැසුණේය. ඔහු බුද්ධි සේවයේ තොරතුරු සුළුකොට නොතැකීය. ඔහු ඒවා ගැන බැරෑරුම් ලෙස අවධානය යොමු කළේය.."ගොනුවෙහි - දිවයින පුවත් පතේ මනෝජ් අබේදීර සමඟ පැවති සම්මුඛ සාකච්ඡාව 2019 දෙසැම්බර් 1 දා පළ කරන ලදී.

39. යttps://lrrp.wordpress.com/2009/03/08/gotabhaya-rajapakse-is-the-key-behind-current-military-success-says-global-terror-expert/

40. 'ඔහු ලුතිතන් කර්නල් රත්නායක (විශ්‍රාමික) ගැන කී දෙය සහ ඔහු (ආරක්ෂක ලේකම්) කළ දෙය අතර සමානකම ඉතා දුරයි. ඇතැම් කරුණු ඉතා ප්‍රකටයි. සමහර දේවල් එසේ නොවේ. ජනාධිපති රාජපක්ෂට, ධුරයේ පළමු වසරේදී ෆොන්සේකා වෙනුවට වෙනත් කෙනෙකු පත්කිරීමට අවශ්‍යවී ඇත. දැඩි පීඩනයක් මධ්‍යයේ වුවත් ඔහුට සේවා දිගුවක් ලබාදීමට දැඩි වෙහෙසක් දැරුවේ ආරක්ෂක ලේකම්වරයාය. සිය සහෝදරයා බැසිල් රාජපක්ෂ ගේ සහාය ඇතිව ඉන්දියාව සම්බන්ධ කටයුතු කරගැනීමට සහ

## නැවත යුද්ධායුධ ලබාදීම

රටට විශාල වියදමක් දැරීමට සිදුවූවත්, ජයග්‍රහණය කිරීම සඳහා යුද්ධ හමුදාවට නැවත යුද්ධායුධ ලබාදීමේදී ගෝඨාභය රාජපක්ෂ ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කළේය. එල්ටීටීඊ අවිවලට ළඟා විය නොහැකි පරාසයක සිට ප්‍රහාර එල්ල කිරීමට මිසයිල ලබාදෙන ලෙස යුද හමුදාපති ඉල්ලා සිටි අවස්ථාවේදී, ගෝඨාභය ඒවා සැපයූ බව වාර්තා වෙයි.[41] 'බොඩි ආමර්' මිලදී ගැනීම පිණිස තවත් මුදල් ලබාදෙන ලෙස කරන ලද ඉල්ලීමක් සම්බන්ධයෙන්ද ගෝඨාභය කටයුතු කර ඇත. ඊට අමතරව 'සතුරු ඉලක්ක සමතලා කිරීමට' යුද්ධ හමුදාවට ගෝඨාභය රාජපක්ෂ ලේසර් නියාමන අවි මිලදී ගත් බවත් 'එයට හේතුව ඔහු ලේසර් මගින් පාලනය වන බෝම්බවල මිල ගැන වාදකරමින් කාලය නාස්ති නොකර සුදුසු අවස්ථාවේදී ඒවා ලබාගත් බවත්' කමල් ගුණරත්න ලියා ඇත. කමල් ගුණරත්න පවසන්නේ ගෝඨාභයගේ උපදේශ වාක්‍ය වූයේ 'කෙටි කලකින් යුද්ධය අවසන් කිරීමට අතිරේක මුදලක් වැයකර අනාගතය වෙනුවෙන් මහා මුදල් සම්භාරයක් ඉතිරි කරමු'යන්න බවය[42]. තම සහෝදරයා වූ මහින්ද මුදල් ඇමති වූ හෙයින්ද, රාජපක්ෂවාදියකු වූ පී.බී. ජයසුන්දර 2004-8 සහ 2009-15 දක්වා මුදල් අමාත්‍යාංශයේ සහ මහා භාණ්ඩාගාරයේ ලේකම්වූ හෙයින්ද මේ සම්බන්ධයෙන් ගෝඨාභයට භාණ්ඩාගාරයේ තීරණය අභිබවා යාමේ හැකියාවක් තිබුණි. ගෝඨාභය ජනාධිපති වූ පසු පී.බී. ජයසුන්දර ජනාධිපති ලේකම් ධුරයට පත්කර ගන්නා ලදී[43].

## දේශපාලන අධිකාරය සහ හමුදාව අතර සම්බන්ධතාව ලෙස ක්‍රියාකිරීම

හිටපු හමුදා නිලධාරියෙකු වන බැවින්, ගෝඨාභය යුද්ධ හමුදාවේ සහ පොලිස් බලකායේ එදිනෙදා කටයුතුවලදී විශාල ලෙස සම්බන්ධවූ නායකයෙක් විය. ජනාධිපති වූ ඔහුගේ සහෝදරයා සමඟ පැවති සම්බන්ධතාවය නිසා ගෝඨාභය රාජපක්ෂ දේශපාලන සහ හමුදා නායකත්වය අතර සම්බන්ධීකරණය පිණිස සුවිශේෂී තත්වයක පසුවිය.[44] මේ සම්බන්ධයෙන් ඔහුගේ වැදගත් භූමිකාව ගෙනහැර දක්වමින් ඔහුගේ නිල චරිතාපදානය ලියූ සී. ඒ. චන්ද්‍රප්‍රේමද,[45] ඔහු රන්ජන් විජේරත්නට සමාන කර ඇත. රන්ජන් විජේරත්නද දහස් ගණනක් ඔහුගේ විරුද්ධවාදීන් මැරීම සම්බන්ධයෙන් වගකිය යුතු බව චෝදනා ලබන්නෙකි:

> *'ජනතා විමුක්ති පෙරමුණේ දෙවැනි කැරැල්ල ගන්න, රංජන් විජේරත්න නොසිටියා නම් මොකුත් සිද්ධ නොවන්න තිබුණා. මෙතැනත් එහෙමයි. එයට හේතුව, ඔබ දන්නවා , දේශපාලන අධිකාරයට තීරණයක් ගන්න පුළුවන්, ඒත් එය ක්‍රියාවට නැංවිය යුත්තේ භූමියේදී. ඒවගේම සමස්ත ක්‍රියාවලියම සම්බන්ධීකරණය කළ යුතුව ඇත. උදාහරණයක් ගනිමු, හමුදාව සහ දේශපාලන අධිකාරය අතර සම්බන්ධීකාරක ලෙස වැඩකළේ රංජන් විජේරත්න. මෙහිදීත් "හමුදාව සහ දේශපාලන අධිකාරය අතර සම්බන්ධය" ලෙස කටයුතු කළේ ගෝඨාභය රාජපක්ෂයි. ඇත්ත වශයෙන්ම, ජනාධිපතිවරයාගේ සහෝදරයා වීමේ වාසිය තිබූ ඔහු එයින්*

---

කළමනාකරණය පිණිස කණ්ඩායමක් එකට එක්කිරීමට කටයුතු කළේ ආරක්ෂක ලේකම්ය. සන්නද්ධ සේවාවන්හි සේනාධිනායක සමඟ ඍජුව සම්බන්ධවීමට සහ හමුදාවලවල පිරිස් සංඛ්‍යාව දෙගුණයකින් පමණ වැඩිකිරීම ඇතුළු අවශ්‍යතා ඉල්ලා සිටීමට ඔහුට හැකියාව තිබුණි. බාහිර පීඩනයේදී ජනාධිපතිවරයාට නොනැමී සිටීමට පිණිස ඔහු අචලව සිටියේය. යුද්ධය අවසන්කිරීමට ආරක්ෂක ලේකම් 'අවශ්‍ය සහාය'දුන් බව පැවසීම දැඩි අසාධාරණයකි. ඔහු තවත් බොහෝ දෙවල් කළ බව ප්‍රකටය. යුද්ධයේදී මිනිස් බලය සහ ද්‍රව්‍ය ලබාගැනීමට අවශ්‍ය මිල මුදල් ආදිය ආරක්ෂක ලේකම් විසින් සම්පූර්ණයෙන්ම සපයන ලදී. ජනාධිපතිගේ සහෝදරයා වශයෙන් ඔහුගේ බලය නිසා මෙරට මෙන්ම පිටරට දොරවල් ඔහුට විවෘත විය. යුද්ධයට අවශ්‍ය සැපයුම් අඛණ්ඩව ලබාගැනීම සහතික කිරීමට ඔහු රහසිගතව කිහිපවතාවක් විදේශ ගමන්වල යෙදුණේය. මැදිහත් නොවී නොසිට බෙදුම්වාදයට එරෙහිව සටන් නොකළා නම් මේ යුද්ධය ජයගැනීමට නොහැකි වනු ඇත. ගරිල්ලා සටන්කරුවන් යුදමය වශයෙන් පරාජය කිරීමේ දී ඉටුකළ කාර්යභාරය වෙනුවෙන් සන්නද්ධ හමුදා ආඥාපතිවරුන්ට පරිදාන පිරිනැමීමට මූලිකවී ක්‍රියාකළේ ඔහුය.ග

41. වෙළඳපොළ මිලගණන් අනුව මිසයිල මිල අධික වූවත්, යුද පෙරමුණේ අවශ්‍යතාවලට ප්‍රමුඛත්වය දී තිබූ ගෝඨාභය හමුදාවට පාකිස්ථානයෙන් Bhakthar Shikan මිසයිල සහ චීනයෙන් Green Arrow මිසයිල අතරමැදියන්ගේ සහභාගිත්වයකින් තොරව සැපයීය.." කමල් ගුණරත්නගේ ගෝඨාභය පොතෙන් - පිටුව 83 පරිවර්තනය

42. එම - පිටුව. 11

43. කොළඹ වරාය පුළුල්කිරීමේ විශාල කොන්ත්‍රාත්තුවක් පිරිනැමීමේදී පටිපාටිය උල්ලංඝනය කිරීමේ සිද්ධියක් සම්බන්ධයෙන් 2008 දී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඔහු වැරදිකරු කරන ලදී. රජයේ කිසිම තනතුරක් දැරීමෙන් ඔහු වළක්වන ලදී. 2009 දී ජනාධිපති මහින්ද රාජපක්ෂ යළිත් භාණ්ඩාගාර ලේකම් ධුරය බාරගන්න ලෙස පී.බී. ජයසුන්දරට ආරාධනය කළ විට, ඔහු මුල් තීරණයට විරෝධය පළකරමින් ශ්‍රේෂ්ඨාධිකරණයට මූලික අයිතිවාසිකම් පෙත්සමක් ඉදිරිපත් කළ අතර අලුතින් පත්කරන ලද අගවිනිසුරුවරයා එය විභාග කොට කළින් තීරණය ඉවතලා ජයසුන්දර භාණ්ඩාගාර ලේකම් ලෙස නැවත සේවයෙහි පිහිටුවීමට අවසර දුන්නේය. 2015 ජනාධිපතිවරණයේදී මහින්ද රාජපක්ෂ පරාජය වූ අතර ඡන්ද දිනයට පෙරදින ඔහු සිංගප්පූරුව බලා ගියේය.2008-9 ජයසුන්දර වෙනුවට පත් කරන ලද සුමිත් අබේසිංහ දැන් රාජ්‍ය ව්‍යාපාරවලට, රාජ්‍ය ආයතනවලට, සහ රජයට අයත් වාණිජ ආයතනවලට සුදුස්සන් නිර්දේශ කිරීමේ කමිටුවේ සභාපති ධුරය දරයි. https://itjpsl.com/assets/press/Chandraprema-PRESS-RELEASE-english.pdf https://en.wikipedia.org/wiki/P._B._Jayasundera#cite_note-5 and https://books.google.co.uk/books?id=TJ1mpwPqZmcC&pg=PA5#v=onepage&q&f=false 'Reports of corruption, mismanagement, errors of omission and commission are currently erupting like mushrooms', https://www.nation.lk/2006/12/31/busi6.htm

44. ජනාධිපතිගේ තත්වය ශක්තිමත් කළ ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ ඒකාබද්ධ ආරක්ෂක හමුදා නිසිමාවතේ තබා ගැනීමට දැඩි උත්සාහයක් දැරීය. මෙම ගජබා රෙජිමේන්තු ප්‍රවීණයාට හමුදා නායකත්වය සහ ජනාධිපති අතර ප්‍රබල සම්බන්ධතාවක් පවත්වාගෙනයාමේ දුෂ්කර කාර්යයක් ඇත. http://slwaronterror.blogspot.com/2012/11/tigers-lose-balraj-as-army-makes.html, The Island, 17 Nov 2012

45. https://itjpsl.com/assets/press/Chandraprema-PRESS-RELEASE-english.pdf

*දේශපාලන අධිකාරයේ සමීපත්වයට පත්ව සිටි අතර එය නිසැකවම සියලු දෙයටම උපකාරයක් සහ පහසුකම් සැලසීමට හේතු විය.*[46]

ගෝඨාභය රාජපක්ෂගේ පත්වීම යුද ජයග්‍රහණයට මුලස්තම්භ වූ පවසන ආචාර්ය රොහාන් ගුණරත්න 'දැඩි අධිෂ්ඨානයකින් සහ කැපවීමෙන් යුත් වෘත්තීය සටන්කරුවකු' ලෙස ඔහු අගය කරයි. කලින් හමුදා සේවයෙන් ලබා තිබූ අත්දැකීම් යුද හමුදාව, පොලීසිය සහ බුද්ධිසේවා සම්බන්ධීකරණයට උපකාර වූ බවද ඔහු තවදුරටත් ප්‍රකාශ කරයි.[47] විශේෂයෙන් සඳහන් කළ යුත්තේ 1980 ගණන්වල ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ සටන්වල යෙදීමෙන් ගෝඨාභය රාජපක්ෂයට එම පළාත ගැන මනා දැනීමක් තිබීමයි. ගෝඨාභය යටතේ 2009 යුද හමුදාපති වූ සරත් ෆොන්සේකාද ඔහුගේ කැපවීම සහ දැනුම ජයග්‍රණයට මූලික වූ බව පවසයි[48].

ඔහුගේ සාර්ථකත්වයේ කොටසක් වන්නේ මෙම යුද්ධය දිනිය නොහැකි යුද්ධයක් බව වසර ගණනාවක් මුළුල්ලේ විශ්වාකරගෙන සිටි ආරක්ෂක හමුදාවල චිත්ත ධෛර්යය නංවාලීමයි. සන්නද්ධ හමුදා ප්‍රතිසංවිධානය කිරීමෙන් ඔහු ඉටුකළ කාර්යභාරය ගැන 2007 දී ආරක්ෂක අමාත්‍යාංශය ගෝඨාභයට ගෞරව දැක්වීය:

*'තනතුරේ වැඩ භාරගත් දා සිට පසුගිය මාස කිහිපය තුළ ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදාවල චිත්ත ධෛර්යයේ මහත් සේ ඉහල නැංවූ ගෝඨාභය රාජපක්ෂ එල්ටීටීඊය මහත් බියට පත් සතුරායි. ත්‍රස්තවාදය මැඩලීමට නිර්භීත ලෙස ක්‍රියාමාර්ග ගත් වත්මන් ආරක්ෂක ලේකම්වරයා ආරක්ෂක හමුදාවලට නව පණක් දී ඇත. මෑතකදී ලබාගත් හමුදා සාර්ථකත්වයට ජාතියේ වීරවරයන් ලෙස සොල්දාදුවන් යළි දිනාගත් ගෞරවය සහ අභිමානය හේතුවූ බව බොහෝ හමුදා විශ්ලේෂකයෝ පවසති.'*[49]

**ප්‍රශස්ත බුද්ධි සේවයක්, ආවේක්ෂණ සහ ගැටුමේ ඡායාරූප ලබාගැනීම පිණිස නැවත උපකරණ ලබාදීම**

ආවේක්ෂණය දියුණු කිරීම සහ තථ්‍ය කාල ඩ්‍රෝන දර්ශන ලබාගැනීම සංවිධානය කිරීම සහ යුද්ධයේ භූමියේ මෙහෙයුම් ආඥාපතිවරුන්ට ඒවා ලබාදීම සම්බන්ධයෙන් ගෝඨාභය රාජපක්ෂට ගෞරවය ලබා සිටී. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිසමේ ඇමුණුම 2 හි 2009 ජනවාරි 1 දා සිට මැයි 27 දක්වා ආවේක්ෂණ දර්ශන ලබාගත් පැය ගණනේ ලැයිස්තුවක් සහිත ගුවන් හමුදාවෙන් ලැබුණු ලිපියක් ඇති අතර එය දින 147 ක් පුරා පැය 2334 ක් නැත්නම් දිනකට සාමාන්‍යයෙන් පැය 16 ක් වෙයි.

| Type of Aircraft | Operational Hours |
|---|---|
| Searcher MK II UAV | 681.55 Hrs |
| Blue Horizon II UAV | 525.00 Hrs |
| B 200 Beechcraft | 1128.53 Hrs |

'තථ්‍ය කාල' බුද්ධි තොරතුරු ලබාගතහැකිවීම ගැන අදහස් පළකරමින් යුද්ධය පැවති කාලයේ ගුවන් හමුදාපති වූ එයාර් චීෆ් මාර්ෂල් ගුණතිලක පවසා ඇත්තේ :

'හතරවැනි ඊලාම් යුද්ධයේදී ,ආරක්ෂක ලේකම්වරයාගේ උපදෙස් මත, අපි භූමියේ ආඥාපතිවරුන්ට 'තථ්‍ය කාල' බුද්ධි තොරතුරු ලබා දීමට යාන්ත්‍රණයක් පිහිටුවීමු. භූමියේ ආඥාපතිවරුන්ට අවශ්‍ය පරිදි අවශ්‍ය වේලාවට ගුවන් සහ කාලතුවක්කු ප්‍රහාර එල්ල කිරීමට ඉල්ලා සිටීමට මෙම 'තථ්‍ය කාල' බුද්ධි තොරතුරු පිටිවහලක් විය[50].'

ඉහළ පෙළේ යුද හමුදා ආඥාපතිවරයකුද ප්‍රකාශ කළේ තමා වැනි බලසේනා ආඥාපතිවරුන්ට එම දර්ශන ලබා ගැනීමේ හැකියාව ගෝඨාභය රාජපක්ෂ විසින් සහතික කරන ලද බවයි:

'යුද්ධය මෙහෙයවීමේ යෙදී සිටි යුද හමුදාපතිවරයාට සහ බලසේනා ආඥාපතිවරුන්ට නියමුවන් නොමැති යානාවලින් ලබාගත් දර්ශන සජීවී ලෙස දැකගැනීමේ හැකියාව ඇතිකරන පහසුකම් ගෝඨාභය විසින් සපයන ලදී. ගුවන් හමුදාවේ සංග්‍රාම විධාන මධ්‍යස්ථානය දැනටමත් භාවිත කරන එම පහසුකම් ශ්‍රී ලංකා ගුවන් හමුදාපති එයාර් මාර්ෂල් රොෂාන් ගුණතිලක විසින් ගෝඨාභයට පෙන්වන ලදී. ගෝඨාභය අවශ්‍ය උසස් තාක්ෂණ උපකරණ සැපයීමට

46. https://www.colombotelegraph.com/index.php/the-author-on-gotas-war/

47. 'තවත් අංගයක් වන්නේ ගෝඨාභය රාජපක්ෂ (ආරක්ෂක ලේකම්) පෙර සටන්වලදී අණදී ඇති ඒවාට සහභාගිවී ඇති ජොෂ්ඨ හමුදා නිලධාරියෙක්වීමය. මෙය පළවා හැරීමට දුෂ්කරබව ඔප්පු කළහැකි මනා සංයෝජනයකි. https://lrrp.wordpress.com/2009/08/

48. ...එල්ටීටීඊය මැඩලිය හැක්කේ කෙසේද යන්න පිළිබඳව එම කැපවීම සහ දැනුම තිබූ වත්මන් ලේකම් ගෝඨාභය රාජපක්ෂ වැනි වෙනත් ආරක්ෂක ලේකම්වරයෙකු සිට නැත".

http://www.indiandefencereview.com/spotlights/lessons-from-the-war-in-sri-lanka/2/

49. MOD site, 7 Jan 2007, *War veteran survives the suicide attack: The Army Commandos foil LTTE's cowardly attempt on the Secretary Defence*

50. 18 Sep 2012, RG on SLAF's pivotal role in Eelam War IV with strap line SLAF Chief steps down after illustrious career-The Island Feb 25, 2011, http://slwaronterror.blogspot.com/2012/09/a-delayed-build-up-of-lethal-offensive.html

විධිවිධාන යෙදීය[51].

කමල් ගුණරත්න පවසන පරිදි, අවසන් යුද්ධයේදී ගුවන් හමුදාව ආවේක්ෂණ ගුවන් යානා ඉල්ලා සිටි අතර ඔවුන්ට ඒවා ලබාදීම ගෝඨාභය විසින් සහතික කරන ලදී[52]. බලසේනා ආඥාපතිවරුන් සහ යුද හමුදාපති සරත් ෆොන්සේකාද මෙම ආවේක්ෂණ දර්ශන නැරඹූ බව නිසැක යඃ

*පෙරමුණෙහි සිදුවන්නේ කුමක්දැයි යුද හමුදා මූලස්ථානයේ ඔහුගේ කාර්යාලයේ සිට නිරීක්ෂණය කිරීමටත් කරුණු පැනනගින විට බලසේනා ආඥාපතිවරුන් සමග ඒවා සාකච්ඡා කිරීමටත් ලුතිනන් ජෙනරාල් සරත් ෆොන්සේකාට අවස්ථාව තිබුණි.ඊට පසුව යුද්ධය මෙහෙයවන බලසේනාපතිවරුන්ට එම පහසුකම සැපයීම නිසා සටන් සිදුවන ප්‍රදේශවල සිදුවන හැම දෙයක්ම නිරීක්ෂණය කිරීමට ඔවුන්ට හැකියාව ඇතිවූ නිසා ප්‍රශ්නයක් පැනනැගුන විට හෝ පැනනැගීමට ආසන්නව ඇතිවිට කාලෝචිතව අවශ්‍ය පියවර ගැනීමට හැකිවිය. ඊට අමතරව,මෙහි සුවිශේෂී ප්‍රතිලාභය වූයේ සිවිල් වැසියන් සිටින ප්‍රදේශ සත්‍ය වශයෙන්ම නිරීක්ෂණය කිරීමට හැකිවීමයි[53].*

ගෝඨාභය ලබාගත් තථ්‍ය කාල සජීවී දර්ශන සෑම විටම සහතික කළේ බෝම්බ හෙලන සහ කාලතුවක්කු ප්‍රහාර එල්ල කරන භූමි ප්‍රදේශවල සිවිල් වැසියන් සිටින බව පිළිබඳව ආඥාපතිවරුන්ට අවබෝධයක් තිබූ බවයි.

## C. තත්වාකාර විධාන ව්‍යුහය

ගෝඨාභය රාජක්ෂ හමුදා මෙහෙයුම් පැවරීමේ සහ අධීක්ෂණයේදී සහ පොලිස් විමර්ශනවලදී පෞද්ගලිකව තමාම සම්බන්ධවෙමින් බලය සහ පාලනය පවත්වාගෙන ගියේය. සේවා ලබාගැනීම් සහ බඳවා ගැනීම් අධීක්ෂණය කළ ඔහු පක්ෂපාතී නැතැයි සැකකළ නිලධාරීන් ඉවත් කොට දඬුවම් පැනවීය. නිතරම නිලධාරීන්ගේ අතරමැදියන් මගහරිමින් ඔහු අභ්‍යන්තර කවය සමග වැඩකිරීමට පක්ෂපාතී අය සමග ඍජු සම්බන්ධයක් පවත්වාගෙන ගියේය.

## අනික් ලේකම්වරුන්ට වඩා බලගතුයි

කලින් සිටි හෝ පසුව පැමිණි ආරක්ෂක ලේකම්වරුන්ට වඩා වැඩි බලයක් ගෝඨාභය රාජපක්ෂට තිබුණි. කමල් ගුණරත්න විසින් ලියූ ඔහුගේ චරිතාපදානය වන 'ගෝඨාභය' හි මේ ගැන දක්වා තිබූ අතර 20002 සිට නෝර්වේ මැදිහත්වීමෙන් සාම සාකච්ඡා පැවති කාලයේදී (වෘත්තියෙන් සිවිල් සේවකයෙකු වූ ඔස්ටින් ප්‍රනාන්දු ආරක්ෂක ලේකම් වූ කාලයේදී) ආරක්ෂක හමුදා පපහත හෙළා තිබූ බව ද ඔහු ලියයිඃ

*මෙතෙක් කල් තනතුර දැරූ කිසිම ආරක්ෂක ලේකම්වරයකු හමුදා සාමාජිකයන් වෙනුවෙන් කතාකර නැති බව මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුතුය. එපමණක් නොව, ඔවුන්ට තනතුරේ බලය යොදාගැනීමට යම් අධිකාරයක් ඇති බව විදහා දැක්වීමක් හෝ එම තනතුර දැරූවද කිසිම පිළිගැනීමක් ඔවුන්ට නොතිබීම නිසා ඔවුන්ට දෝෂාරෝපණය කිරීමටද නොහැකිය. කලින් සිටි ආරක්ෂක ලේකම්වරුන්ට නොතිබූ බලයක් ඔහු පෙන්නුම් කළ හෙයින්ද, ඔහු තනතුරට ඇති බලය හමුදාවට නායකත්වය සැපයීම සඳහා පරිසරයක් නිර්මාණය කිරීමට යොදාගත් හෙයින්ද යුද හමුදාවේ සෑම සාමාජිකයකුම සතුටට පත්වී සිටියේය.[54]*

## ඔහුගේ ප්‍රධාන භූමිකාවට තිබුණු ප්‍රසිද්ධ පිළිගැනීම

යුද ජයග්‍රහණය සාධනය කරගැනීමේදී ගෝඨාභය රාජපක්ෂ වැදගත්වූ ආකාරය 2009 දී ඔහු පෙරටු කොටගෙන සේවාවන්හි අණදෙන නිලධාරීන් යුද්ධයේ ජයග්‍රහණය ඔහුගේ සහෝදරයා වන ජනාධිපති වෙත නිල වශයෙන් දැනුම්දීම පිණිස ගිය අවස්ථාවේදී හෙළි විය[55]. රටේ ඉතාමත් වැදගත් හමුදා තැනැත්තා ඔහු වශයෙන් ප්‍රසිද්ධියේ සිදුවූ මෙම පිළිගැනීමෙන්, කලින් ආරක්ෂක ලේකම් ධුරය දැරූ වෘත්තීය සිවිල් සේවකයන්ගෙන් සම්පූර්ණයෙන්ම වෙනස් තත්වයකට ඔහු පත්කිරීමක් සිදුවී ඇත.[56]

51. කමල් ගුණරත්නගේ 'ගෝඨා' සිංහල කෘතියෙනි. පිටුව 110,

52. මෙම ගැටළුව ගැන අවධානය යොමු කළ ගෝඨාභය, පැය පහකට වඩා ගුවනේ අඛණ්ඩය රැඳී සිටිය හැකි Beechcraft aircrafts යොදාගැනීමට ආධාර කරමින් ගුවන් හමුදාවේ අවශ්‍යතා සපුරාලීමට පියවර ගත්තේය. ගුවන් හමුදාව සතුව තිබූ Beechcraft aircrafts දෙකක් අලුත්වැඩියා කර ආපසු සේවයේ යෙදවීය. තවත් එකක් අලුතින් මිලදී ගන්නා ලදී. ඒ නිසා ගුවන් හමුදාවට සංග්‍රාම භූමියේ තත්වය සතුටුදායක නොවූ හෝ සටන් ආරම්භවීමට පෙර ඉහළ ක්‍රියාකාරිත්වයකින් යුත්, අඩි 25,000 ක් උස සිට රූ ගත කළ හැකි කැමරාවක් සවිකර තිබූ මෙම ගුවන්යානා පියාසර කරමින් යථාකාල බුද්ධි තොරතුරු යුදහමුදාවට සැපයීමට හැකිවිය. මෙම ගුවන්යානාවලට පැය පහකට වඩා ගුවනේ අඛණ්ඩය රැඳී සිටිය හැකිවීම විශාල උපකාරයක් විය'. පිටුව 110, ගෝඨාභය ගැන කමල් ගුණරත්නගේ පොත (සිංහලෙන් පලකළ)

53. එම - පිටුව 110

54. එම - පිටුව 69

55. 'සවස 6.35 ට ත්‍රිවිධ හමුදාපතිවරුන් සමග පැමිණි ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ එල්ටීටීඊය පරාජයට පත්කර එල්ටීටීඊ ත්‍රස්තවාදී කණ්ඩායමට එරෙහි අවසන් හමුදා ක්‍රියාන්විතය නිමකළ බව ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා වෙත සැලකළේය.'
මෙහෙවර සපුරාගැනේ, - Daily News" 19 May 2009" On file'

56. එම



ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී එයාර් චීෆ් මාර්ෂල් ඩොනල්ඩ් පෙරේරා, යුද හමුදාපති ජෙනරාල් සරත් ෆොන්සේකා, නාවුක හමුදාපති අද්මිරාල් වසන්ත කරන්නාගොඩ, ගුවන් හමුදාපති එයාර් චීෆ් මාර්ෂල් රොෂාන් ගුණතිලක, පොලිස්පති ජයන්ත වික්‍රමරත්න සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල් රියර් අද්මිරාල් සරත් වීරසේකර ත්‍රස්තවාදය අතුගා දැමීමේ කර්තව්‍යය සාර්ථකව නිමකළ බව සේනාධිනායක, ජනාධිපති මහින්ද රාජපක්ෂට දැනුම් දුන් අවස්ථාව. / සේයාː සුදත් සිල්වා සහ ප්‍රංශ පුවත් සේවය

ශ්‍රී ලංකාවේ පුවත්පතක් යුද්ධයේ අවසන් අදියරේදී ආරක්ෂක ලේකම්ට ප්‍රතිපක්ෂව යුද හමුදාපතිට හිමි විධාන වගකීම ගැන එම දෙදෙනාගෙන් ලබාගත් සම්මුඛ සාකච්ඡාවක් මගින් විමසා තිබුණි (අවධාරණය ඇඳිණි)ː

*'ෆොන්සේකා විශේෂයෙන් කියා සිටියේ රාජපක්ෂ සඳහන් කළ සතිපතා පැවැත්වූ ආරක්ෂක බුද්ධි අංශ රැස්වීම ආරක්ෂක අමාත්‍යාංශයේ සිට කොළඹ සහ අවට සියලු බුද්ධි සේවා අධීක්ෂණය පිණිස, ත්‍රිවිධ හමුදාවල සහ පොලීසියේ සාමාන්‍ය ආයතනික ව්‍යුහයන් මගහැරයමින් පක්ෂපාතී අයගෙන් සැදුම්ලත් වෙනම ජාලයක් යොදාගත් බවයි. කලින් සිටි යුද හමුදාපතිවරයාට අනුව, ප්‍රධාන පෙළේ ප්‍රහාර, පැහැරගෙනයාම් සහ මාධ්‍යවේදීන් සහ වෙනත් අය ඝාතනය පිණිස එම ඉලක්ක ජාතික ආරක්ෂාවට තර්ජනයක් යන මතය යටතේ මෙම කණ්ඩායම සහ හිටපු එල්ටීටීඊ සාමාජිකයන් පවා යොදාගෙන රාජපක්ෂ විසින් කණ්ඩායමක් පිහිටුවන ලදී. 'යුද හමුදා බුද්ධි සේවාව සෘජුවම යුද හමුදාපතිවරයා යටතේ පැවතියද, ආරක්ෂක ලේකම්වරයා ආරක්ෂක අමාත්‍යාංශයේ සිට නොනිල වශයෙන් කොළඹ බුද්ධි මෙහෙයුම් මෙහෙයවීය. ඔවුන් සුදු වෑන් සංස්කෘතිය ඇතුළු විවිධ දුෂ්ට ක්‍රියාවන්ට සම්බන්ධ විය,'යි ෆොන්සේකා පැවසීය. රාජපක්ෂ සහ හෙන්දවිතාරණ ඇතුළු ආරක්ෂක නිලධාරීන් විසින් විශේෂයෙන් කොළඹ පිහිටි බුද්ධි ඒකකවලට, නියෝග නිකුත් කළ හැකි අඳුරු කලාපයක් තිබූ බවට ඇති පිළිගැනීම දැනට සේවයේ සිටින සහ කලින් සිටි ආරක්ෂක නිලධාරීන් කිහිපදනෙක් තහවුරු කරති.* [57]

යුද හමුදා බුද්ධි සේවාව සෘජුවම යුද හමුදාපති සරත් ෆොන්සේකා යටතේ පැවතියද, ෆොන්සේකා කියාසිටින්නේ ගෝඨාභය රාජපක්ෂ 'ආරක්ෂක අමාත්‍යාංශයේ සිට නොනිල වශයෙන් කොළඹ බුද්ධි මෙහෙයුම්' සිදුකළ බවත් රාජපක්ෂ පැහැරගැනීම්වලට සම්බන්ධ බවත් ය. ගෝඨාභය එම චෝදනා ප්‍රතික්ෂේප කරයි[58].

## පත්කිරීම් සම්බන්ධයෙන් තිබූ බලය

පත්වීම් සම්බන්ධයෙන් පැවති ගෝඨාභය රාජපක්ෂගේ බලපෑම පෙන්නුම් කරමින්, ඔහු 1980 ගණන්වල යාපනයේ සිය හමුදා මිතුරකු වූ සරත් ෆොන්සේකා 2005 යුද්ධයෙන් පසුව යුද හමුදාපති වශයෙන් පත්කිරීම පිණිස තම සහෝදර ජනාධිපති මහින්දට පැවසූ ආකාරය විස්තර කර ඇත[59]. එමෙන්ම ජගත් ඩයස් (57 සේනාංකය)[60] ශවේන්ද්‍ර සිල්වා (58 සේනාංකය)[61] වැනි අතීතයේදී තමා සමඟ එකට සටන්වල නිරත වූ සහ ඔහුට දැඩි පක්ෂපාතීත්වයක් දැක්වූ නිලධාරීන්ට උසස්වීම් පිරිනැමීමට ද ඔහු වගබලා ගත්තේය. මෙම නිලධාරීන්ගෙන් බොහෝ දෙනකු ජනතා විමුක්ති පෙරමුණේ නැගිටීම සිදුවූ කාලයේදී ඔවුහු මාතලේ කෘර මෙහෙයුමක් සිදුකළ අවස්ථාවේදී ගෝඨාභය සමඟ සිටි අතර එහිදී මනුෂ්‍ය ඝාතන සහ විශාල වශයෙන් බලාත්කාරයෙන් අතුරුදහන් කිරීම් සිදුවී ඇති[62] අතර වන්නි ගොඩබිමේ හමුදා මෙහෙයුම්

57. http://www.dailymirror.lk/expose/Gota-and-Fonseka-trade-charges-on-who-attacked-Lasantha-and-Keith/333-

58. http://www.dailymirror.lk/expose/Gota-and-Fonseka-trade-charges-on-who-attacked-Lasantha-and-Keith/333-

59. Ceylon Week සම්මුඛ සාකච්ඡාවෙනිː
'ජනාධිපතිවරණ ඡන්ද ව්‍යාපාරය ඉදිරියට යන විට සරත් මගෙන් ඒ ගැන විස්තර ඉල්ලාසිටියේය. අප ජයගත් පසුව (ජනාධිපතිවරණය) සරත්ට විශ්‍රාමයාට ඉතිරිය තිබුණේ සති දෙකක් පමණයි.මම ආරක්ෂක ලේකම්ධුරයට පත්වූවා.සරත් සැමතිස්සෙම මට කරදර කරමින් ගෝඨා ශාන්තව මාරු කරල මට ඒ ජොබ් එක දෙන්න කියලා. මම මහින්ද අයියා හමුවෙලා' දැන් අපි යුද්ධෙට යන්න අවශ්‍ය බවත්, සරත් ෆොන්සේකා ඒකට හොඳම තැනැත්තා බවත් කීවා. අපි ඔහු හමුදාපති තනතුරට පත්කරමු කියා මා යෝජනා කළා. ශාන්ත කෝට්ටෙගොඩට තව අවුරුදු එකහමාරක් සේවය කරන්න තියෙන බව මහින්ද අයියා කීවා. හේතුවක් නැතිව ඔහු ඉවත් කරන්න යන්නේ කොහොමද? ජනාධිපති ලෙස මහින්ද අයියට තිබුණේ ලොකු අභියෝගයක්. මම මෙය කරන්න අවශ්‍ය බවට පීඩනයක් ඇති කළා.'

60. https://itjpsl.com/reports/jagath-dias

61. https://itjpsl.com/reports/shavendra-silva

62. GOTABAYA RAJAPAKSA'S ROLE IN 1989 MASS ATROCITIES. ITJP, 10 May 2022,https://itjpsl.com/reports/gotabaya-rajapaksa-the-sri-lankan-presidents-role-in-1989-mass-atrocities
බලහත්කාරයෙන් හෝ ස්වකැමැත්තෙන්තොර අතුරුදහන්කිරීම්; අත්තනෝමතික ලෙස රඳවාගැනීම පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම; බහිර් අධිකරණ, සංක්ෂේපණීය හෝ බලහත්කාර ලෙස මරණයටපත්කිරීම් පිළිබඳ විශේෂ නියෝජිත; ශක්තිය, යුක්තිය, හානිපූරණය සහ යළි

සඳහා ඔහු විසින් ඔවුන් තෝරා ගැනීම අහම්බයෙන් සිදුවූවක් නොවෙයි. හමුදා නිලධාරියකු ITJP සංවිධානයට විස්තර කළ පරිදි එයින් අදහස් වූයේ ගෝඨාභයගෙන් ලැබෙන නියෝග අනීතික වූවත් ඔවුන් ඒ ගැන ප්‍රශ්න නොකරන බවයි:

*'ගෝඨාභය සහ ඩයස් සහ සිල්වා ඔහු යුද හමුදාවේ සිටි අවදියේදී ඔහුට සමීපව සිටියා. ගෝඨාභයට නිලධාරීන්ගේ අනාගතය ගැන තීරණය කරන්න හැකිවූ අතර යුද අපරාධ ලෙස සැලකිය හැකි තරමේ නියෝගයක් ගෝඨාභය දුන්නත් ඩයස් සහ සිල්වා ඒ ගැන ප්‍රශ්න කරන්නෙ නැහැ.'*[63]

### බඳවාගැනීම්වලදී සම්බන්ධවීම

සිවිල් යුද්ධයේ අවසන් අදියරේදී සටන් කිරීම පිණිස යුද හමුදාවට 300,000 ක් බඳවා ගැනීම ගැන ගෝඨාභය රාජපක්ෂ ගෞරවය ලබාගෙන ඇත[64]. මෙම බඳවා ගැනීම මාර්ගයෙන් හමුදාවේ මිනිස් බලය වසර තුනක කාලයක් තුළදී තෙගුණයකින් වැඩි විය[65]. 2010 අප්‍රියෙල් මාසයේදී පළකළ සම්මුඛ සාකච්ඡාවකදී , ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ පැවසුවේ 2005 දී 125,000 පැවති යුද, නාවික සහ ගුවන් හමුදාවල ඒකාබද්ධ ශක්තිය 2009 දී 450,000 දක්වා වැඩි කළ බවයි. යුද හමුදාවේ පිරිස් බලය 300,000 ක් විය[66]. ඊට අමතරව ඔහුගේ අධීක්ෂණය යටතේ හමුදාවේ වැටුප් වැඩිකරන ලදී[67]. හමුදා පිරිස් බලය වැඩිකිරීම ගෝඨාභයගේ අදහසක් බව මාධ්‍ය පැහැදිලිව පවසා ඇත[68].

කමල් ගුණරත්න ඔහුගේ 'ගෝඨාභය' නම් පොතෙහි ලියා ඇත්තේ සටන් කිරීම පිණිස වඩාත් පළපුරුදු නාවික නිලධාරීන් නිදහස් කිරීමට හැකිවන ලෙස නාවික හමුදාවට අලුතින් දස දහසක් බඳවා ගැනීම ආරක්ෂක ලේකම්වරයාගේ සැලැස්ම වූ බවත් මේ අනුව ක්‍රියාකරන ලෙසත් ඔහුද සම්බන්ධවෙමින් ඔවුන් සේවා ස්ථානවල යෙදවීමට විස්තර දක්වන ලෙසත් ගෝඨාභය නාවික හමුදාපතිවරයාට නියෝග කළ බවත් ය[69]. යුද හමුදාවේ පිරිස් බලය වැඩිකිරීමේදී ගෝඨාභය සතු සුවිශේෂී බලතල මූලාශ්‍ර නිසා ඔහුට වෙනස්කම් සිදුකිරීමට හැකියාව ලැබුණු බව කමල් ගුණරත්න පවසයි:

*නව බලඇණි, සේනාංක සහ බලසේනා වශයෙන් වශයෙන් හට පිරිස් සංවිධානය කළ යුතුව තිබුණි. එම කාලයේදී එක් බලඇණියක් සකස්කිරීම වුවත් විශාල කාලයක් ගතවන කාර්යයක් විය. විවිධ අංශවලින් අවසරය ලබාගත යුතු හෙයින් මෙම කාර්යයට වැයවන විශාල කාලය ගැන මනා අවබෝධයෙන් සිටි ගෝඨාභය නව බලඇණි පිහිටුවීමට යුද හමුදාපතිවරයාට විධානය කර අවශ්‍ය අවසරය ලබාගැනීම පිණිස පසුව තමාට දැනුම් දෙන ලෙස දන්වා ඇත. මේ නිසා යුද හමුදාවට 70 කට වැඩි බලඇණි සංඛ්‍යාවක් පිහිටුවීමට හැකිවිය.*[70]

### එක් එක් නිලධාරින් අනුයුක්ත කිරීම පාලනය කිරීම

සිවිල් ආරක්ෂක බලකාය (ග්‍රාමාරක්ෂක) මුළුමනින්ම ප්‍රතිසංවිධානය කිරීමට ගෝඨාභය තීරණය කළ වේලාවේදී, නාවික හමුදා කාර්ය මණ්ඩල ප්‍රධානි, සරත් වීරසේකර[71] ගැන තීරණය කර එම තනතුරට පත්කර එම තනතුර බාර ගැනීමට ඔහුට දැන්වීය[72]. සිවිල් ආරක්ෂක බලකායේ හිටපු අධ්‍යක්ෂ ජනරාල්, රියර් අද්මිරාල් ආනන්ද පිරිස් 2012 දී ගෝඨාභය රාජපක්ෂ යළි සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව පවරා ගත්තේ කෙසේදැයි විස්තර කරයි. දිවයිනේ

---

සිදුනොවන බවට සහතිකවීම් පිළිබඳ විශේෂ නියෝජිත යන්ට අදාළ එක්සත් ජාතීන්ගේ විධිනියෝග
Ref.: AL LKA 3/2022 https://spcommreports.ohchr.org/TMResultsBase/DownLoadPublicCommunicationFile?gId=27621

63. ගොණුගත සාක්ෂි ප්‍රකාශය

64. 'ජනාධිපති (මහින්ද) 300.000 දක්වා හට පිරිස් සංඛ්‍යාව ඉහළ නැංවීමට මට බලය දුන්නා.යුද්ධය දිනීමට හට පිරිස් සංඛ්‍යාව වැඩි කළ යුතු බව ජනාධිපතිතුමාට පෙන්නා දුන්නා. ජනාධිපති එක පාරටම කිව්වේ එම සංඛ්‍යාව වැඩි කළ යුතු බවයි.' - On file

65. §170 පරණගම වාර්තාව

66. V.K. Shashikumar, "Winning wars: political will is the key", Indian Defence Review 25, no. 2 (April-June 2010). ICG

67. 'හමුදාවේ වැටුප් ඉහළ නංවන බව ආරක්ෂක අමාත්‍යාංශය සහතික වූ අතර මේවා දෙගුණ කළ අතරනව උපකරණ සපයාදීමටද අලුතින් සම්පත් ලබාදෙන ලදී.' - පිට 171, පරණගම වාර්ත

68. The Island" 28 Aug. 2012 'යුද හමුදාව පුළුල්කිරීම දේශපාලන තීරණයක් බව ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ දි අයිලන්ඩ් පුවත්පතට පැවසීය. නිලධාරීන්ගෙන් සහ සෙසු නිලයන්ගෙන් හමුදාවේ සංඛ්‍යාව ලක්ෂයකින් වැඩිකිරීමට ජනාධිපතිගේ අවසරය ලැබීම අපගේ ජයග්‍රහණයට මූලික කරුණ විය...ගජබා රෙජිමේන්තු ප්‍රවීණයා පැවසීය. ..ගෝඨාභය රාජපක්ෂ නොසිටියේ නම් මෙහෙයුම පීල්ලෙන් පිටපැනීමට ඉඩතිබුණා.'

69. 'මෙම කාර්යයට නාවික හමුදාපති වයිස් අද්මිරාල් වසන්ත කරන්නාගොඩ විරුද්ධ වෙමින් 10,000 ක් අලුථතින් බඳවා ගැනීමට නාවික හමුදාවේ පුරප්පාඩු නැති බවත්,තමා සියලුථ පුරප්පාඩු පුරවා ඇති බවත්, එනිසා. නාවික හමුදාවට ආධුනිකයන් ගැනීම ප්‍රායෝගික නොවන බවත් පැවසීය. වහා ක්‍රියාත්මක වූ ගෝඨාභය 10,000 බඳවා ගන්නා ලෙස නාවික හමුදාපති වයිස් අද්මිරාල් වසන්ත කරන්නාගොඩ ට පවසා අවශ්‍ය සංඛ්‍යාව නාවික හමුදාවේ රඳවා ගෙන ඉතිරි පිරිස තව කාර්යයන් සඳහා තමාට බාරදෙන ලෙසත් දැන්වීය. ඔහුට අවශ්‍ය වූයේ ඔවුන් යුද හමුදාවට බාරදී උතුරු නැගෙනහිර ආරක්ෂාව සපයමින් එහි ආරක්ෂාව සපයමින් සිටි පළපුරුදු සොල්දාදුවන් සටන සඳහා නිදහස් කිරීමයි.'
පිටුව 75 , ගෝඨාභය , කමල් ගුණරත්න

70. කමල් ගුණරත්නගේ 'ගෝඨා' සිංහල කෘතියෙනි.

71. Dossier on him at https://sangam.org/wp-content/uploads/2020/12/rear-admiral-sarath-weerasekera.pdf - මෙම කාර්ය සපුරාලීමට වඩාත් සුදුසු පුද්ගලයා ලෙස

72. 'මෙම කාර්ය සපුරාලීමට වඩාත් සුදුසු පුද්ගලයා ලෙස සරත් වීරසේකර තෝරාගත් ගෝඨාභය. තනතුර බාරගන්නා ලෙස ඔහුට

උතුරු ප්‍රදේශයට යටිතල පහසුකම් සපයන ලෙසත් හිටපු එල්ටීටීඊ සාමාජිකයන් පුනරුත්ථානය කරන ලෙසත් ගෝඨාභය තමාට උපදෙස් දුන් බවත් ඔහු පවසයි[73]. හමුදාවට ආධාර කිරීමට දෙමළ ජාතිකයන් බඳවා ගැනීමේ ප්‍රශ්නයට මුහුණදුන් විට තමාට උදව් කිරීමට විශේෂ නිලධාරියකු අනුයුක්ත කරන ලෙස තමා ගෝඨාභය රාජපක්ෂගෙන් ඉල්ලා සිටි බව ඔහු පවසයි.[74] ගෝඨාභය රාජපක්ෂ සතුව පැවති බලයත් එය ඉතා සියුම් මට්ටමින් යොදාගත් ආකාරයත් මෙයින් පැහැදිලි වේ.

2009 සංග්‍රාමවලදී සටන් කිරීමට ප්‍රවේශමෙන් රෙජිමේන්තු නිලධාරීන් තෝරා ගත්තේ යැයි ගෝඨාභය තමාට පැහැදිලි කළ බව ඉන්දීය හමුදා විශ්ලේෂකයකු වාර්තා කර ඇති අතර ඉන් පෙන්නුම් කෙරෙන්නේ සිවිල් සේවකයකු වශයෙන් ඔහුගේ කාර්යයන්ගෙන් ඔබ්බට ගිය මෙහෙයුම් පාලන මාර්ගයක් ඔහුට තිබුණ බවයි:

*'මම මෙම නිලධාරීන් තරුණ වූ පලියට තෝරා ගත්තේ නැහැ. එහෙත් යුද්ධය මෙහෙයවීමට හොඳම පිරිස ඔවුන් බව මට හිතුන නිසා ඔවුන් පත්කරනු ලැබුවා. මම පෙරමුණුවලට ගොස් දක්ෂතා ඇති තැනැත්තන් තෝරා ගත්තා. සටන ඉදිරියට මෙහෙයවීමට අඩු ධාරිතාවක් ඇති අය අත හැරීමට සිදුවුනා. ඉන් ඇතැම් අය පරිපාලනය වැනි වෙනත් කාර්යයන් සඳහා සුදුස්සන් වුනා. ඒ නිසා සටන මෙහෙයවීමට හොඳම ආඥාපතිවරුන් ඒ සඳහා තෝරා ගත්තා. ඔවුන්ට නිසි පරිදි සොල්දාදුවන්ට අණදීමට නොහැකි නම් ජ්‍යෙෂ්ඨත්වයෙන් එලක් නැති බව මා සිතුවා.'*[75]

ආරක්ෂක ලේකම් සමහර විට නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨත්වය නොසලකා යුද්ධය මෙහෙයවීමට නිලධාරීන් තෝරා ගත් බවත් කමල් ගුණරත්න ඔහුගේ 'ගෝඨාභය' පොතෙහි සනාථ කර ඇත[76].

**ඔහුගේ අමාත්‍යාංශයෙන් ඔබ්බට බලය පෑම - රාජ්‍ය තාන්ත්‍රික තනතුරු පිරිනැමීම**

විදේශ අමාත්‍යවරයා නොවූවත්, ගෝඨාභය රාජපක්ෂටද මේජර් ප්‍රභාත් බුලත්වත්ත නම් හමුදා බුද්ධි නිලධාරියා ඇතුළු විදේශ රටවල රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන් යෙදවීම පිළිබඳව තත්වාකාර පාලනයක් තිබුණි. බුලත්වත්ත ප්‍රවීන ජනමාධ්‍යවේදී ලසන්ත වික්‍රමතුංග ඝාතනයේ කළින් සිටි චූදිතයෙකි. 2019 අප්‍රියෙල් මාසයේදී ඇමරිකානු අධිකරණයක දී මේ සිද්ධිය සම්බන්ධයෙන් ගොනුකළ නඩුවක ගෝඨාභය රාජපක්ෂටද චෝදනා කර තිබුණි.

2010 දෙසැම්බර් මාසයේදී පොලීසිය ජනමාධ්‍යවේදී ලසන්ත වික්‍රමතුංග ඝාතනයේ සැකකරුවන් ඉලක්ක කරගෙන තිබුණි. ඉන් අනතුරු, මෙම නඩුකරය වෙනත් පොලිස් ඒකකයකට බාරදී තිබූ අතර මැතිවරණයෙන් ආණ්ඩු වෙනසක් සිදුවෙතැයි බියෙන්, තායිලන්තයේ බැංකොක්හි තානාපති කාර්ය තනතුරක් සැකකාර මේජර් බුලත්වත්තට ලබාදෙන ලෙස[77] ගෝඨාභය රාජපක්ෂ විදේශ කටයුතු අමාත්‍යාංශයට නියෝග කළේය. 2010 ජනවාරි 26 දා මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරණයෙන් ජය ලැබීමෙන් පසු එම තනතුර පිරිනැමීම අවලංගු කරන ලද[78] අතර බුලත්වත්ත 2019 දී යළි සේවයෙහි පිහිටුවනු ලැබීය.[79]

---

ආරාධනය කළේය. ඒත් සරත් වීරසේකර මුලදී සිතුවේ එය ගෝඨාභය නිත්‍ය නාවික මාවතින් ඉවත්කිරීමේ ක්‍රමයක් ලෙස ය. එනිසා ඔහු එය අනුමත නොකරන බව කීය. එසේවූවත් පලක් නැති ග්‍රාමාරක්ෂක බලකාය සක්‍රීය ලෙස යුද්ධ දායක කරගැනීම මේ අවස්ථාවේ ඇති අවශ්‍යතාවය බව ගෝඨාභය විස්තර කළ විට එය පිළිගත් ඔහු (සරත් වීරසේකර) එකඟත්වය පළ කළේය. එවන් තනතුරකට ත්‍රිවිධ හමුදාවෙන් යම් ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කිරීමට ආරක්ෂක ලේකම්ට බලතල තිබුණ නමුත්, ඔවුන්ගේ කැමැත්තෙන් තොරව යම් තැනැත්තෙකු පත්කිරීමෙන් තමාගේ අරමුණ සපුරාගත නොහැකි බව ගෝඨාභය දැනසිටියේය'. පිටුව 130 , 'ගෝඨාභය', කමල් ගුණරත්න (සිංහලෙන් පරිවර්තනය කරන ලද)

73. *'පුනරුත්ථාපනය කරන ලද අය සහ උතුරේ සංවර්ධන කටයුතුවල යෙදී නොසිටින අය යොදා ගනිමින් අනාගතයේදී ප්‍රශ්නයක් ඇති නොවන ආකාරයත් එය කරන ලෙස ගෝඨාභය සර් අපට උපදෙස් දුන්නා.'* - ගෝඨාභයට පක්ෂ ෆෙස්බුක් අඩවියක 2018 ජූනි 24 පළ කළ මව්බිම පුවත්පතේ ප්‍රගීත් සම්පත් කරුණාතිලක සමඟ සම්මුඛ සාකච්ඡාවකදී

74. *'වැඩසටහන අසාර්ථක නිසා, මම බුද්ධිමත් නිලධාරියෙකු ගෝඨාභය සර්ගෙන් ඉල්ලුවා. මට ලැබුණ බුද්ධිමත් නිලධාරියා ලුතිතන් කර්නල් රත්නප්‍රිය. ඔහු ගල්කිරියාගම CDF අභ්‍යාස විද්‍යාලයේ පුහුණුකිරීමේ නිලධාරියෙකු වශයෙන් අම්පාර කිට්ටුව කඳවුරකයි සිටියෙ.හපනෙක් වන ඔහු මෙවැනි වැඩ කරල නැහැ.*
***සම්මුඛ සාකච්ඡා ප්‍රශ්නයඃ මේ වැඩේට ලුතිතන් කර්නල් රත්නප්‍රිය යොදා ගත්තෙ කොහොමද; ඔහුට සැලැස්මක් දුන්නද නැත්නම් ඔහු ස්වාධීනව වැඩකළාද?***
*නැහැ. පළමුවෙන්, යුද හමුදාව ඔහුව CDF එකට මාරුකර එවන්න කැමති වුනේ නැහැ. එතකොට මම ගෝඨාභය සර්ට කතා කරල මෙම බුද්ධිමත් නිලධාරියා ලබාදෙන ලෙස ඉල්ලුවා. ගෝඨාභය සර් එම නිලධාරියා මට ලබාදුන්නා...ඒක තමා ගෝඨාභය සර්ගෙ සාර්ථකකම. තනතුරුවලට පත්කරන්න අය ඔහු තේරුවා...පුද්ගලයෙකුගෙ ඇතුළ දකින්න ගෝඨාභය සර්ට පුළුවන්. ගෝඨාභය සර් දන්නවා මේ පුද්ගලයාට වැඩක් දුන්නොත් ඔහු ඒක නියම විදියට කරන බව.'*
*දමිළ ජනතාව සමඟ මනා සබඳතාවක් ගොඩනැගූ බවට පසුව ප්‍රශංසා කළා.-* - http://archives1.sundayobserver.lk/2018/06/17/news-features/behind-fond-farewell-vishwamadu

75. http://www.indiandefencereview.com/spotlights/lessons-from-the-war-in-sri-lanka/2/

76. 'යුද්ධය කරගෙනයාමට සෑම අංශයකම මනා නායකත්වයක් අවශ්‍ය බව තීරණය කළ ආරක්ෂක ලේකම්වරයා සහ යුදහමුදාපතිවරයා, ජ්‍යෙෂ්ඨයන්ගේ ලැයිස්තුව නොසලකා දක්ෂකම් ඇති නිලධාරීන් තෝරා ගැනීමේ ක්‍රියාවලියක් ආරම්භ කළා' - පිටුව 78, 'ගෝඨාභය', කමල් ගුණරත්න විසින්.

77. අහිංසා වික්‍රමතුංග විසින් එක්සත් ජනපදයේ ගොණුකළ පැමිණිල්ලෙහි දක්වා තිබේ.

78. https://www.ft.lk/news/Alleged-death-squad-leaderreinstated-in-special-team-under-Army-Chief/56-678065

79. Sri Lankan army defends rehiring major amid outcry from rights groups, 16 May 2019, https://www.reuters.com/article/us-sri-lanka-blasts-army/sri-lankan-army-defends-rehiring-major-amid-outcry-from-rights-groups-idUSKCN1SM1UY

2018 සම්මුඛ සාකච්ඡාවකදී 'තමා ධුරය දැරූ කාලයේදී රැස්කළ සාක්ෂිවලින් මේජර් බුලත්වත්තගේ කණ්ඩායම කෙළින් වරදෙහි පැටලවීමක් සිදුවූ බවක් ඔහුගේ මතකයට නොනැගෙන බව' ගෝඨාභය රාජපක්ෂ සම්මුඛ සාකච්ඡාවකදී ප්‍රකාශ කර ඇත.[80] ගෝඨාභය රාජපක්ෂ 2019 ජනාධිපතිවරණය ජයගැනීමෙන් මසකට පසුව, 2014 ජූලි 15 දා සිට ක්‍රියාත්මක වන පරිදි මේජර් බුලත්වත්ත වසර 5 ක පසුගිය වැටුප සඳහා ද සුදුස්සකු කරමින් ලුතිතන් කර්නල් නිලයට උසස් කර ඇත[81]. මෙය සිදුවූයේ 2008 දී තවත් ජනමාධ්‍යවේදියකු වූ කීත් නොයාර් ට පහරදීමේ සිද්ධියේ එක් සැකකරුවකු ලෙස 2017 පෙබරවාරි 18 දින බුලත්වත්ත අත්අඩංගුවට ගැනීමක් සිදුවී තිබියදීය[82]. ඇමරිකානු රජය 2022 දී බුලත්වත්ත කීත් නොයාර් ට වධහිංසා කිරීම සහ/ හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත ලෙස සැලකීම හෝ දඬුවම් කිරීම මගින් මානව හිමිකම් දැඩි ලෙස උල්ලංඝනය කළ අයකු ලෙස නම් කළේය[82].

යුද හමුදාවේ ඔහුගේ විරුද්ධවාදීන් ඉවත්කිරීමට තරම් සෑහෙන බලයක් ඇති තැනැත්තකු ලෙස ගෝඨාභය සලකන ලදී. විකිලීකීක්ස් විසින් හෙළිකරන ලද ඇමරිකානු තානාපති කාර්යාලයෙන් පිටවුණු ටෙලෙක්ස් පණිවුඩයක දක්වා තිබුණේ 2010 දී ජෙනරාල් සරත් ෆොන්සේකා ගේ භේදයෙන් පසුව ගෝඨාභය යුද හමුදාවේ ඇතැම් අය ඉවත්කිරීමක් ඇරඹිය හැකි බවට බියක් පැවති බවකි. -නීති ප්‍රකාරව ඔහු යටතේ නොතිබුනත් විදේශ කටයුතු අමාත්‍යාංශයේත් එවැන්නක් සිදු විය හැකි බවට කුතුහලයක් පැවතිණ.[84]

ඊට අමතරව, ඔවුන්ට ජනාධිපති සමග තිබූ සම්බන්ධතාව නිසා, ගෝඨාභය රාජපක්ෂ සහ ඔහුගේ සහෝදරයකු වන බැසිල්, ඔවුන්ට අතිරේක දේශපාලන බලතල එක්කරගනිමින්, සාමාන්‍යයෙන් විදේශ කටයුතු අමාත්‍යවරයාට අයත්විය යුතුව ඇති ඉතා සංවේදී විදේශ රාජ්‍ය තාන්ත්‍රික ගමන්වල පවා යෙදුනහ[85]. තමා සමග දීර්ඝ කාලයක් හමුදාවේ සිටි ශවේන්ද්‍ර සිල්වා නිව්යෝර්ක් හි නියෝජ්‍ය නියෝජිත ලෙස පත්කිරීමට ක්‍රියා කළ අය අතර ගෝඨාභයද සිටි බව මාධ්‍ය වාර්තාවල දැක් වේ.[86]

*'ආරක්ෂක ලේකම්වරයා ලෙස ගෝඨාභය රාජපක්ෂ ඉතා බලවත් වූ බවත් ඔහු මානව හිමිකම් ඇමති මහින්ද සමරසිංහට උපදෙස් දුන් බවත් විකිලීක්ස් හෙළිකළ එක්සත් ජනපද ආණ්ඩුවේ ටෙලෙක්ස් පණිවුඩ පැහැදිලි කරයි[87].*

*සිවිල් සේවකයකු වූවත්, හමුදාව සම්බන්ධයෙන් රජයේ ඇමතිවරයෙකු පවා භුක්ති නොවින්ද බලයක් ඔහු භුක්තිවින්ද බව, ඔහු අණදුන් හමුදා නිලධාරීන්ට අනුව පෙනේ:*

*ගෝඨාභය රාජපක්ෂ ආරක්ෂක ලේකම් ධුරය දරද්දී, ඔහු කිසිවකුට ආරක්ෂක හමුදාවලට අතපෙවීමට ඉඩනොදුන්නේය. රජයේ බලගතු*

80. Gota and Fonseka trade charges on who attacked Lasantha and Keith, 10 May 2018,
http://www.dailymirror.lk/expose/Gota-and-Fonseka-trade-charges-on-who-attacked-Lasantha-and-Keith/333-149720

81. https://archives1.dailynews.lk/2019/12/17/local/205909/promotions-63-army-officers
BWDMRPSSBD Bulathwaththa RSP Isc MI (064206)

82. https://www.colombotelegraph.com/index.php/sri-lankan-army-reinstates-official-suspected-in-lasantha-murder-and-other-attacks-rights-groups-condemn/
https://reliefweb.int/sites/reliefweb.int/files/resources/CPA_Criminal-Justice.pdf

83. ගෝලීය දූෂණය සහ මානව හිමිකම් අපහරණය මැඩලීම , ඇමරිකා රාජ්‍ය දෙපාර්තමේන්තුව,2022 දෙසැම්බර් 9,
https://www.state.gov/combating-global-corruption-and-human-rights-abuses/

84. 'ජනවාරි 12 ජනාධිපති වරණය ඉතා කිට්ටුව තිබයදී ජනාධිපති මහින්ද රාජපක්ෂ සහ ආරක්ෂක ලේකම්වරයා (ජනාධිපතිගේ සොහොයුරු) සහ යුද හමුදාපතිවරයා ෆොන්සේකාට පක්ෂපාතී ලෙස දුටු ජ්‍යෙෂ්ඨ හමුදා නිලධාරීන් හිටපු තනතුරුවලට වෙනත් නිලධාරීන් පත්කිරීමට ක්‍රියා කළා... ඡන්ද විමසීම නිසා ආණ්ඩුව ජ්‍යෙෂ්ඨ හමුදා නිලධාරීන් 14 දෙනෙකුට විශ්‍රාම යාමට සැලැස්සුව. මෙම ඉවත්කිරීම රාජ්‍ය බුද්ධි සේවය සහ ජාතික බුද්ධි සේවයේ ප්‍රධානියා වූ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයෙකුගේ ප්‍රධානත්වයෙන් සිදුවූ බව පවසනු ලැබේ. 150 කට වැඩි ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් සංඛ්‍යාවක් ස්ථානමරුවීම් කර ඇති බව මාධ්‍යයද වාර්තා කළ අතර, ෆොන්සේකාට පක්ෂපාතී ලෙස දුටු හෝ රාජපක්ෂගේ මැතිවරණ ව්‍යාපාරයේදී නිෂේධනය කළ මැතිවරණ නීති බලාත්මක කිරීමට අඩු කැමැත්තක් දැක්වූ ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් ස්ථාන මැරුකිරීම් හෝ පැත්තකට කර තැබීම් කළ බව දේශීය ආරක්ෂක විමර්ශක ස්ථිර කළේය. පෙබරවාරි 2 දා වන විට, රජයට පක්ෂපාතී නැතැයි කියන නිලධාරීන් ඉවත්කිරීම ආරක්ෂක හමුදාවලින් ඔබ්බට ව්‍යාප්ත වන බවට ලකුණු තිබුණු අතර එක් ජ්‍යෙෂ්ඨ MFA නිලධාරියෙකු ඔහුගේ තනතුර අහිමිවීමක් සිදුවිය හැකි බවට කණස්සල්ලෙන් පසුවූ අතර සංචාරක මණ්ඩලයේ නිලධාරියෙක් අපැහැදිලි තත්වයන් යටතේ හිටිඅඩියේ ඉල්ලා අස්විය.'
https://wikileaks.org/plusd/cables/10COLOMBO81_a.html

85. 'ඉන්දියාවේ නිල සංචාරයක යෙදී සිටින ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක පාර්ලිමේන්තු මන්ත්‍රී බැසිල් රාජපක්ෂ, ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග, ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ යන අයගෙන් සමන්විත ශ්‍රී ලංකා නියෝජිත පිරිස එරට විදේශ කටයුතු ඇමති එස් .එම්. ක්‍රිෂ්ණා ,ජාතික ආරක්ෂක උපදේශක එම්. කේ. නාරායන්, විදේශ ලේකම් ශිවසංකර් මෙනන් සහ ආරක්ෂක ලේකම් විජේ සිං හමුවූ බව වාර්තා වෙයි.' 27 June 2009, https://lrrp.wordpress.com/2009/06/27/many-want-to-emulate-lanka's-success-story-against-terrorism/

86. http://www.salem-news.com/articles/january302012/lanka-war-crim.php
Alleged War Criminal Appointment - a Ministerial Power Struggle 30 Jan 2012.

87. 'ග්‍රීන් ඕෂන් නෞකාව සේවයෙහි යොදා ගැනීම එක් දිනකින් ප්‍රමාදවුවහොත් සිදුවිය හැකි මානුෂවාදී විපාක සම්බන්ධයෙන්අවධානය යොමුකිරීම පිණිස මැයි 13 (2009) උදේ ආපදා කළමනාකරණ සහ මානව හිමිකම් ඇමති මහින්ද සමරසිංහට චාගි කතා කළේය.හමුදාවෙන් ෂෙල් ප්‍රහාර එල්ලවීමක් සිදුනොවන නිසා බෝට්ටුවෙන් ආහාර ගොබෑමටත් මගීන් එයට නංවාගැනීමටත් හැකි බවට ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ දූත මණ්ඩල ප්‍රධානි පෝල් කැස්ටෙලාට සහතික වන්නැයි ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ අද උදේ (ඔහු ආරක්ෂක මණ්ඩලය් රැස්වීමකට සහභාගිවෙමින් සිටියේය)තමාට උපදෙස් දුන් බව සමරසිංහ පැවසීය. රාජපක්ෂ සහ කැස්ටෙලා අතර හෙට උදේ ,මැයි 14, හමුවක් පවත්වන්නේ නම් ප්‍රයෝජනවත් වන බව සමරසිංහ යෝජනා කළේය.'
https://wikileaks.org/plusd/cables/09COLOMBO522_a.html
09COLOMBO522_a

*ඇමතිවරුන්ට පවා ආරක්ෂක හමුදාවලට උපදෙස්දීමට හෝ ඔවුන් වෙනත් යම් කාර්යයක යෙදවීමට නොහැකිවිය. ඇතැම් බලගතු ඇමතිවරුන් මේ සම්බන්ධයෙන් ඔහු සමඟ හරහට හිටියත් එයින් ගෝඨාභයගේ කිසිම වෙනසක් නොවීය.[88]*

*ඉන්දීය හමුදා කටයුතු විචාරකයකුට අනුව, ගෝඨාභය රජය සහ හමුදාව අතර සම්බන්ධකය විය. ආරක්ෂක ලේකම් ධුරය දැරූ වෙනත් බොහෝ සිවිල් සේවකයන් මෙන් නොව සේවා සැපයුම් ලබාදීමට ඔහු සමත් විය:*

*…තත්‍ය වශයෙන්ම කොහේවත් නොසිටි ගෝඨාභය දේශපාලන ව්‍යුහයට එක්වුවත්, ඔහු හනික ජනාධිපති රාජපක්ෂගේ ආණ්ඩුව සහ හමුදාව අතර සම්බන්ධකය බවට පත්විය. රාජපක්ෂ සහෝදරවරු කලින් සැලසුම් කළ හමුදා අභිමතාර්ථයක් ඒකාබද්ධ කළහ. හමුදාව විසින් වැළඳගෙන පිළිගන්නා ලද ඔහු (ගෝඨාභය) ගේ හඬ හමුදාවේ නීත්‍යානුකූල හඬක් විය' යනුවෙන් ජනාධිපති කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් පැවසීය. පිරිස්, ද්‍රව්‍ය,අවි ආදී හමුදාවේ අවශ්‍යතා ගෝඨාභය රජයට සන්නිවේදනය කළේය.[89]*

## D. ඔහුගේ බලය පාවිච්චි කිරීම

සාධක ගණනාවක මනා සංයෝගය හේතුකොට ගෙන ගෝඨාභය රාජපක්ෂට 2009 දී යුද කලාපයේ බ්‍රිගේඩියර්වරුන්ට කෙළින්ම නියෝග නිකුත් කළ හැකිවිය:

(a) ඔහු ප්‍රධාන අණදෙන නිලධාරි වූ ජනාධිපතිගේ සහෝදරයා වීම[90];

(b) කමල් ගුණරත්නට අනුව, 'ආරක්ෂාව පිළිබඳ කරුණු සම්බන්ධ ඔහුගේ බලතල ජනාධිපති මහින්ද රාජපක්ෂ විසින් පවරාදී තිබීම.' ගෝඨාභය ආරක්ෂක ලේකම් තනතුර බාරගැනීමෙන් පසුව, ජනාධිපති මහින්ද රාජපක්ෂ ආරක්ෂක ඇමති වශයෙන්, ඔහුගේ බලතල ක්‍රියාත්මක කිරීමේ සහ තීරණගැනීමේ අයිතිය ගෝඨාභයට බාරදී තිබුණි.[91]

(c) වසර 20 ක පළපුරුද්දක්[92] 'භූමිය ගැන ප්‍රත්‍යක්ෂ දැනුමක් ඇති'[93] හිටපු හමුදා ආඥාපතිවරයකු වූ ඔහු, යළි ආරම්භ කළ ප්‍රහාරය සැලසුම් කළ තැනැත්තා වූ අතර ජයග්‍රහණය අත්කරගැනීම පිණිස හමුදාව ප්‍රතිසංවිධානය කළ පුද්ගලයාද විය. (ඉහත බලන්න) එමෙන්ම කොළඹ මෙහෙයුම් මැදිරියේ සිට ඔහු නිතරම වර්ධනයන් නිරීක්ෂණය කරමින් සම්බන්ධීකරණය කළේය[94];

(d) කමල් ගුණරත්න, ජගත් ඩයස්, ශවේන්ද්‍ර සිල්වා සහ සරත් ෆොන්සේකා වැනි ඔහු සමඟ 1980 ගණන්වල සටන් බිමේ සිටි ඉහළ ආඥාපතිවරුන් සමඟ ඔහුට පෞද්ගලික සම්බන්ධතා තිබුණි. සිල්වා, ගුණරත්න සහ ඩයස් ඔහුට වඩා කනිෂ්ඨ නිලධාරීන් වූ අතර ඔහු නියෝගදීමට කතාකිරීමේදී ඔවුන්ට මුල් නමෙන් ආමන්ත්‍රණය කළේය;

(e) නිලධාරීන් මාරුකිරීම, උසස්කිරීම සහ විනය කටයුතු ඇතුළු හමුදාවේ පත්කිරීම් (ඉහත බලන්න) පාලනය කළ ආරක්ෂක ලේකම්වරයා විය;

(f) ඔහුගේ මනාපය පරිදි යුද සමයේ යුද හමුදාපති ධුරයට සරත් ෆොන්සේකා උසස් කිරීමට ඔහු කටයුතු කළ අතර (යුද්ධයෙන් පසුව ඔවුන් විරසක වූවත්) ඉන් ෆොන්සේකා ඔහුට බරපතල අන්දමින් ණයගැති බවට පත්කිරීමක් විය;

(g) රාජපක්ෂ පවුලේ තවත් සාමාජිකයන් ගණනාවක් ආණ්ඩුව තුළ ප්‍රධාන තනතුරු දැරීමෙන් එය තත්‍ය ලෙස පවුලේ ව්‍යාපාරයක් කිරීමක් විය[95]; එම කාලයේ රජයේ අයවැයෙන් 75% කට රාජපක්ෂ පවුල යටතේ පැවති බව බීබීසිය කියා තිබුණි.[96]

---

88. කමල් ගුණරත්නගේ 'ගෝඨා' සිංහල කෘතියෙනි. - පිටුව 243

89. http://www.indiandefencereview.com/spotlights/lessons-from-the-war-in-sri-lanka/2/

90. 'පසුගිය ඉරිදා සම්මුඛ සාකච්ඡාවේදී ඔහු, ඔහු විසින්ම තමා තත්වයෙන් වඩා උසස් සුපිරි ලේකම්වරයෙකු බවත් සොහොයුරා වශයෙන් ඕනෑම අවස්ථාවක ජනාධිපතිට ප්‍රවේශයක් තිබූ බවත් පැවසීය. ඔහුට පමණක්, තුවලකරුවන් හෝ වෙනත් ආරක්ෂක කරුණක් සම්බන්ධයෙන් යථා තත්වය දැන්වීමට හෝ සාකච්ඡා කිරීමට මධ්‍ය රාත්‍රි 12 ට වුවත් ජනාධිපතිට ඇමතීමට තමන්ට හැකියාව ඇති බව පවසා ඇත.' - ගොණුගත ලේඛන

91. කමල් ගුණරත්නගේ 'ගෝඨා' සිංහල කෘතියෙනි. පිටුව 66

92. ඉන්දීය විස්තර ප්‍රචාරකයෙක් පවසා ඇත:ි ෆොන්සේකා හමුවූ ගෝඨාභය 'ඔබට ජයග්‍රහණයක් කරා යන්න පුළුවන්ද?' ඇසීය, සංග්‍රාමයේ යෙදී සිටි මෙම යුද ප්‍රවීණයා පැවසුවේ, 'ඔව්, හබැයි මට මගේ කණ්ඩායම තෝරා ගන්න ඔබ අවසර දිය යුතුයි.' ගෝඨාභය සහ මහින්ද ඊට එකඟ වූහ." අපි බලකොටුව දේශපාලනිකව අල්ලා තබාගනිමින්, අපි හමුදාවට එම වැඩේ කරන්න ඉඩදෙනවා'යි ඔවුන් ෆොන්සේකට කිව්වා. මෙම දක්ෂ දේශපාලන විධිවිධානය හොඳින් ප්‍රතිඵල ගෙනදුන්නා. මොකද ගෝඨාභයත්, ෆොන්සේකාත් යන දෙදෙනාම එකම වෙලාවෙ හමුදාවට බඳවා ගෙන අධිකාරි ලත් නිලධාරීන් ලෙස පත් කරනු ලැබීම. http://www.indiandefencereview.com/spotlights/lessons-from-the-war-in-sri-lanka/2/

93. ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග - ගොණුගත ලේඛන

94. 2009 ජූනි මාසයේදී මෙම Business Weekly සම්මුඛ සාකච්ඡාවේදී භූමියේ ආඥාපතිවරුන්ට කතා කළ බව ඔහු පිළිගත්තේය. Interview in June 2009 '...I spoke to the ground Commanders…˜

95. බලන්න ප්‍රස්තාරික තොරතුරු සටහන,
The Rajapaksas: keeping it in the family at https://www.colombotelegraph.com/index.php/infographic-rajapaksa-family-and-nepotism

තවද 'රටේ ආර්ථිකයෙන් සියයට 80ක් පාලනය කරමින් සහෝදරයන් සිව් දෙනා රජයේ ප්‍රධාන තනතුරු දැරූ අතර, ජනාධිපති ලේකම් කාර්යාලයේ සහ වෙනත් වැදගත් දෙපාර්තමේන්තුවල ප්‍රධාන තනතුරුවලට ඥාතීන් 128 දෙනෙකුට වඩා පත්කර මහජන මුදල්වලින් වැටුප් ගෙවා ඇත."

96. https://www.youtube.com/watch?v=rouIimgl-Wc, BBC

(h) ආඥාපතිවරුන්ට අවශ්‍යව ඇති  අතිරේක හටපිරිස්, ඩ්‍රෝන, ගුවන් හමුදා සහාය සහ ඔවුන්ට අවශ්‍යවන උපකරණ යැවීමට ගෝඨාභයට ප්‍රත්‍යක්ෂ හැකියාවත් තිබුණි[97];

(i) විවිධ ආරක්ෂක ඒකකවල මුදල් සම්බන්ධයෙන් ඔහුට සම්පූර්ණ පාලනයක් තිබුණි; ඔහුට අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලයට බලය යෙදවීමේ හැකියාවක් තිබූ අතර ඉන් ඇතැමකුට පසුව දූෂණ චෝදනා එල්ල විය..

(j) ඔහුට බියෙන් පසුවූ අතර එයට හේතුව ඔහු මිනීමරු කල්ලි මෙහෙය වූයේ යැයි කියන චෝදනා ය[98];

(k) විරුද්ධවාදීන්ට සහ අභ්‍යන්තර තොරතුරු දන්නා අය අවමානයට හා තර්ජනයට ලක් කළ හැකි පරිද්දෙන් ඔහු විරුද්ධ මතධාරීන්ගේ ලිපි ගොනු තබාගෙන සිටි බව කියන බුද්ධි සේවාවන් පාලනය කළේය[99].

97. යුද පෙරමුණේ සටන්කරන සොල්දාදුවන්ගේ සෑම අවශ්‍යතාවයක්ම සපුරාලීමට ගෝඨාභය පියවර ගත්තේය. ලොකුම ප්‍රශ්නය වූයේ අවි ආයුධ සහ උපකරණ මිලදී ගැනීමට භාණ්ඩාගාරයෙන් මුදල් වෙන්කර ගැනීමයි. ගෝඨාභය භාණ්ඩාගාර ලේකම් ආචාර්ය පී.බී. ජයසුන්දර හමුවීමට පියවර ගත් අතර එය බෙහෙවින් ඵලදායි විය.ආරක්ෂක මණ්ඩලයේදී සාකච්ඡා කළ විවිධ විවිධ ප්‍රශ්න සහ හමුදාව මුහුණ දෙන බරපතල තත්වය හොඳින් දැනසිටි පී.බී. ජන්සුන්දර  මෙම ගැටළු සමග හැප්පෙන විට ආරක්ෂක ලේකම්ගේ අවශ්‍යතා සපුරාලීමට මුදල් ලබාදීමට පූර්ණ ලෙස විධිවිධාන යෙදීමට කැපවීමෙන් කටයුතු කළේය. ඊට අමතරව. බරපතල ප්‍රශ්න පැනනැගුන විට සියලු අවශ්‍යතා සපුරාලීමට ජනාධිපති මහින්ද රාජපක්ෂ පී.බී. ජයසුන්දර යොමුකිරීමවිශාල ආශිර්වාදයක් විය. ඊට අමතරව ගෝඨාභය හමුදාපතිවරුන් සමග ආචාර්ය පී.බී. ජයසුන්දර හමුවීමට ගිය විට හිස් අතින් ආපසු ඒමක් නොවීය.තමාගේ යෝධ කාර්යභාරය සපුරාලීම පිණිස උදව්කිරීම සම්බන්ධයෙන් අද පවා ගෝඨාභය පී.බී. ජයසුන්දරට ගරුකරමින් ඔහුව අගය කරයි.

මෙම කාර්ය කඩිනමින් සපුරාලීමට අවි සහ උපකරණ මිලදී ගැනීම කඩිනමින් සිදුවූ අතර  සහ  මෙම ගනුදෙනුවලදී 'අතරමැදියන්' සම්බන්ධවීම ඉවත්කිරීමට ගෝඨාභයට අවශ්‍ය විය. ජනාධිපතිගේ සහ කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ඇතිව ‘Lanka Logistics and Technologies’ ආයතනය පිහිටුවමින් . අතරමැදියන්ගේ අතට පත්වීමට ඉඩතිබූ මහා ධනස්කන්ධයක් ඉතිරිකිරීමට සහ යුද්ධය සඳහා තව තවත් අවි සහ උපකරණ මිලදී ගැනීමට ගෝඨාභයට හැකිවිය.’ - කමල් ගුණරත්න ලියූ  'ගෝඨාභය', පිටු 80 - 81.

98. https://www.aljazeera.com/news/2017/3/20/ex-leaders-brother-led-death-squad-in-sri-lanka

99. 'බුද්ධි තොරතුරු රැස්කිරීම විශේෂ කාර්ය බලකායේ එක් කාර්යයක් වූ අතර ගෝඨාභය ගේ  විධානය අනුව ඔවුහු එය ඉටු කළහ.  විශේෂ කාර්ය බලකාය සහ ජාතික බුද්ධි කාර්යාංශය වැනි වෙනත් කණ්ඩායම් පුද්ගලයන් එනම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ ජාත්‍යන්තරය ගැන තොරතුරු රැස්කරන අතර ,ඔවුන් රජයට ප්‍රශ්න ඇති කළහොත් ඔවුන්ට එරෙහිව උත්තෝලනය යෙදීමට ඒවා යොදා ගැනීමේ හැකියාව ඇත. මා දන්නව ෦෦෦ (සංස්කරණ කරන ලදී)  ගණිකාවන් වැනි කාන්තාවන් සමඟ ප්‍රශ්න ඇතිකරගෙන තිබූ න බව සහ රජයේ අපේක්ෂාවන්ට අනුව ඔහු කටයුතු නොකරන්නේ නම් මේ  තොරතුරු හෙළිකරන බවට ඔහුට තර්ජනය කර තිබූ බව.” - ITJP සාක්ෂිකරුවෙක්

# 2009 ශ්‍රී ලංකා යුද හමුදා වන්නි යුද ක්‍රියාන්විතයේ සටන් විධාන සැකැස්ම [1]

- ඒකාබද්ධ හමුදා මූලස්ථානය (කොළඹ) — ඩොනල්ඩ් පෙරේරා 2006-9 [2]
  - ආරක්ෂක සේනා මූලස්ථානය යාපනය — මේජර් ජෙනරාල් ජී.ඒ. චන්ද්‍රසිරි 2005-9 [3]
    - 53 සේනාංකය — බ්‍රිගේඩියර් කමල් ගුණරත්න
      - ගුවන් සංක්‍රමික බලසේනාව — ලුතිනන් කර්නල් තිලක් සන්ගලිපොල [8]
      - යාන්ත්‍රික පාබල බලසේනාව — බ්‍රිගේඩියර් ඒ.ඒම්.එස්.බී. අතපත්තු [9]
      - 53.3 බලසේනාව — කර්නල් ජයනාත් ජයවීර [10]
    - 55 සේනාංකය — බ්‍රිගේඩියර් ප්‍රසන්න ද සිල්වා [11]
      - 55.1 බලසේනාව — ලුතිනන් කර්නල් වසන්ත ආබෲ [12]
      - 55.2 බලසේනාව — කර්නල් කපිල උදලුපොල [13]
      - 55.3 බලසේනාව — ලුතිනන් කර්නල් මහින්ද වීරසූරිය [14]
  - කොමාන්ඩෝ රෙජිමේන්තුව — කර්නල් රැල්ෆ් නුගේරා [4]
  - කාලතුවක්කු බලකාය — බ්‍රිගේඩියර් ප්‍රියන්ත නාපාගොඩ [5]
  - විශේෂ බලකා රෙජිමේන්තුව — කර්නල් අතුල කොඩිප්පිලි [6]
  - ආරක්ෂක සේනා මූලස්ථානය වන්නි — මේජර් ජෙනරාල් ජගත් ජයසූරිය [7]
    - 57 සේනාංකය — මේජර් ජෙනරාල් ජගත් ඩයස් [15]
      - 57.1 බලසේනාව — ලුතිනන් කර්නල් හරේන්ද්‍ර රණසිංහ/ [16] කර්නල් අරුණ විජේවික්‍රම [17]
      - 57.2 බලසේනාව — කර්නල් ඩබ්.ජී.එච්.ඒ. සෙනරත් බණ්ඩාර [18]
      - 57.3 බලසේනාව — ලුතිනන් කර්නල් ඩබ්.පී.ඒ.කේ. තිලකරත්න [19]
      - 57.4 බලසේනාව — ලුතිනන් කර්නල් සේනක විජේසූරිය [20]
    - 58 සේනාංකය — බ්‍රිගේඩියර් ශවේන්ද්‍ර සිල්වා
      - 58.1 බලසේනාව — කර්නල් අනුර දේශප්‍රිය ගුණවර්ධන [21]
      - 58.2 බලසේනාව — කර්නල් සන්ජය වනිගසිංහ [22]
      - 58.3 බලසේනාව — ලුතිනන් කර්නල් රමේෂ් ප්‍රනාන්දු [23]
    - 59 සේනාංකය — මේජර් ජෙනරාල් නන්දන උඩවත්ත සහ 2009 මැයි 10න් පසු බ්‍රිගේඩියර් චාගි ගාල්ලගේ [24]
      - 59.1 බලසේනාව — ලුතිනන් කර්නල් අරුණ ආරියසිංහ [25]
      - 59.2 බලසේනාව — ලුතිනන් කර්නල් එච්. මතීෂ පීටර් ද සිල්වා [26]
      - 59.3 බලසේනාව — ලුතිනන් කර්නල් සුජීව සෙනරත් යාපා [27]
      - 59.4 බලසේනාව — කර්නල් ජාලිය සේනාරත්න* [28]
    - තාවකාලික කාර්ය සාධක බලකායන්
      - කා.සා.බ. 1 පසුව 58 සේනාංකය
      - කා.සා.බ. 2 — බ්‍රිගේඩියර් රෝහණ බණ්ඩාර
      - කා.සා.බ. 3 — බ්‍රිගේඩියර් සත්‍යප්‍රිය ලියනගේ
      - කා.සා.බ. 4 — කර්නල් නිශාන්ත වන්නිආරච්චි
      - කා.සා.බ. 8 — කර්නල් ජී.වී.රවිප්‍රිය [29]

OISL සටහන මත පදනම්වය.

* එක්සත් ජාතීන්ගේ සටහනේ නොමැත

1. OISL

2. ඒකාබද්ධ මෙහෙයුම් මූලස්ථානයට අණදෙන ලද්දේ ආරක්ෂක ලේකම්වරයාට වගකියන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානියා විසිනි. (OISL §111-112)

3. https://alt.army.lk/sfhqj/past-commanders
සහ Unprecedented Glorious Victory, Daily News, 3 June 2009, http://archives.dailynews.lk/2009/06/03/supstory.asp?id=s01
The valiant men who led ground troops, 15 May 2009, Sunday Observer,
http://archives.sundayobserver.lk/2011/05/15/victory.asp?id=s06

4. එම

5. එම

6. එම

7. OISL § 115

8. Army at doorstep of last Tiger stronghold, reported
https://web.archive.org/web/20090516024456/http://www.thebottomline.lk/2009/05/13/defence_col.htm
ආණ්ඩුවට අයත් Daily News පුවත්පතේ Miracle workers ග්‍රැෆික් සටහන:
https://web.archive.org/web/20090516024456/http://www.thebottomline.lk/2009/05/13/defence_col.htm

9. https://alt.army.lk/mech/former-brigade-commander
(2009 පෙබරවාරි සිට)

10. MOD Situation Report on 16 February 2009, Situation Reports on 17th Feb, 2009;
https://blacklightarrow.wordpress.com/2009/01/14/an-incomplete-sl-army-order-of-battle-for-mullaitivu/

11. The valiant men who led ground troops, 15 May 2009, Sunday Observer
https://alt.army.lk/sfhqj/55-division;
http://archives.sundayobserver.lk/2011/05/15/victory.asp?id=s06
බලන්න, http://archives.dailynews.lk/2009/01/17/fea04.asp
"The 53 Division was comprised of three Brigades under the command of General Officer Commanding Brigadier Kamal Gunarathne - i.e. the 533 Brigade commanded by Lieutenant Colonel Jayanath Jayaweera, the Air Mobile Brigade commanded by Shantha Dissanayake and the recently formed Mechanized Infantry Brigade commanded by Lieutenant Colonel Lalantha Gamage."

12. ආණ්ඩුවට අයත් Daily News පුවත්පතේ Miracle workers ග්‍රැෆික් සටහන:
Jan 2009 Daily News - "With the support of a 8 man team of the Special Forces (SF) Divers' team of SF 2nd Battalion, a team of 1st Battalion of the Commandos landed at Mamunai which was South of Nagar Kovil while the 1st battalion of the Sri Lanka Light Infantry attached
to the 551 Brigade commanded by Lieutenant Colonel Wasantha Abrew launched their operation parallel to the Pallai - Soranpaththu capture in state run newspaper
http://archives.dailynews.lk/2009/01/17/fea04.as

13. ආණ්ඩුවට අයත් Daily News පුවත්පතේ Miracle workers ග්‍රැෆික් සටහන:
"552 Brigade led by Col. Kapila Udalupola, captured the last remaining stretch of the Jaffna district border.."
https://prasannadesilva.wordpress.com/2009/06/21/ltte-plays-its-final trump

14. http://archives.sundayobserver.lk/2009/02/08/sec04.asp
"553 Brigade under Col. Mahinda Weerasuriya.."
https://prasannadesilva.wordpress.com/2009/06/21/ltte-plays-its-final-trump/

15. Unprecedented Glorious Victory, Daily News, 3 June 2009,
http://archives.dailynews.lk/2009/06/03/supstory.asp?id=s01;
The valiant men who led ground troops, 15 May 2009, Sunday Observer,
http://archives.sundayobserver.lk/2011/05/15/victory.asp?id=s06

16. ආණ්ඩුවට අයත් Daily News පුවත්පතේ Miracle workers ග්‍රැෆික් සටහන,
And https://alt.army.lk/sfhqmlt/571-brigade ;
Photo in Daily News 5 January 2009, He says he was abroad from 10 of April to 18 May 2009. There is no information on who took his place during this crucial period in the war.
https://www.youtube.com/watch?v=W6kJGPwZOKU ;
After the war Aruna S. Wijewickrema (Armoured Corp) was appointed to an Army Court of Inquiry to investigate Channel 4 allegations about the war
https://www.army.lk/news/army-court-inquiry-channel-4-allegations-referred-llrc-report-submits-its-findings-commander

17. ආණ්ඩුවට අයත් Daily News පුවත්පතේ Miracle workers ග්‍රැෆික් සටහන,
https://alt.army.lk/sfhqmlt/571-brigade ;
Photo in Daily News 5 January 2009,
තමන් 2009 අප්‍රේල් 10 වැනිදා සිට මැයි 18 වැනිදා දක්වා විදෙස්ගතව සිටි බව ඔහු කියයි. යුද්ධයේ මෙම තීරණාත්මක මොහොතේදී ඔහුගේ වගකීම භාරගත අයෙක් පිළිබඳ තොරතුරක් නොමැත.
https://www.youtube.com/watch?v=W6kJGPwZOKU
යුද්ධයෙන් පසුව, යුද වකවානුව පිළිබඳව චැනල් 4 විසින් එල්ල කළ චෝදනා විමර්ශනයට පත් කළ හමුදා විමර්ශන අධිකරණයට, අරුණ එස්. විජේවික්‍රම (සන්නාහ සන්නද්ධ බලකාය) පත්කරනු ලැබුණි.
https://www.army.lk/news/army-court-inquiry-channel-4-allegations-referred-llrc-report-submits-its-findings-commander.

18. ආණ්ඩුවට අයත් Daily News පුවත්පතේ Miracle workers ග්‍රැෆික් සටහන,
https://archives.sundayobserver.lk/2008/09/21/sec01.asp;
VIPs advised to strictly adhere to security measures
https://web.archive.org/web/20090210090937/http://www.sundayobserver.lk/2008/10/12/sec03.asp
https://prasannadesilva.wordpress.com/2009/

06/21/ltte-plays-its-final trump/
බලන්න, https://alt.army.lk/sfhqmlt/572-brigade from 22 Feb 2009. Before that Lieutenant Colonel APGN JAYASUNDARA RWP RSP MIR

19. ආණ්ඩුවට අයත් Daily News පුවත්පතේ Miracle workers ග්‍රැෆික් සටහන,
තවද, https://prasannadesilva.wordpress.com/2009/06

20. ආණ්ඩුවට අයත් Daily News පුවත්පතේ Miracle workers ග්‍රැෆික් සටහන,
https://archives.sundayobserver.lk/2008/09/21/sec01.asp;
http://archives.dailynews. lk/2009/06/19/sec03.asp
http://www.srilankaguardian.org/2008/12/wanni-army-graveyard.html
574 වැනි බලසේනාව කොකාවිල් ප්‍රදේශයේදී මුල්වරට ස්ථාපිත කරන ලද්දේ තුන්වැනි කාර්ය සාධක බලකාය යටතේ 2009 මාර්තු 13 වැනිදා ය. 2009 අගෝස්තු 12 වැනිදා එය, 632 බලසේනාව වශයෙන් යළිත් නම්කරන ලදී.
http://archives.dailynews.lk/2008/12/02/sec01.asp
ලුතිනන් කර්නල් සේනක විජේසූරිය යටතේ අභිනවයෙන් පිහිටුවන ලද 574 බලසේනාව හා ලුතිනන් කර්නල් ප්‍රතාප් තිලකරත්නගේ අණදීම යටතේ ක්‍රියාත්මක 573 බලසේනාව, ඉරණමඩු ප්‍රදේශයෙන් දකුණු දිග මාන්කුලම් සිට මුරිකණ්ඩි දක්වා යාපනය-ඒ 9 මාර්ගයට ප්‍රත්‍යන්ත භූමි භාගය අල්ලාගෙන සිටිති.
https://web.archive.org/web/20081013203125/http://www.dailynews.lk/2008/10/10/fea03.asp
2009 මැයි වන විට ඔහු හඳුන්වා දී ඇත්තේ 592 බලසේනාව යටතේ ය.
http://archives.sundayobserver.lk/2009/05/24/imp10.asp
https://archives.sundayobserver.lk/2011/06/12/fea02.asp

21. https://web.archive.org/web/20090516024456/http://www.thebottomline.lk/2009/05/13/defence_col.htm;
ආණ්ඩුවට අයත් Daily News පුවත්පතේ Miracle workers ග්‍රැෆික් සටහන,; කමල් ගුණරත්නගේ කෘතිය ; 2009 අප්‍රේල් 26 වැනිදා නේෂන් පත්‍රය මගින්ද ඔහු නම්කොට තිබුණි.

22. L A N S Wanigasinghe named in
http://archives.sundayobserver.lk/2009/03/08/sec03.asp
https://web.archive.org/web/20090516024456/http://www.thebottomline.lk/2009/05/13/defence_col.htm
සහ කමල් ගුණරත්නගේ කෘතිය

23. ආණ්ඩුවට අයත් Daily News පුවත්පතේ Miracle workers ග්‍රැෆික් සටහන,
http://twonationsoneisland.blogspot.com/2012/02/extermination-of-eelam-tamils-of-vanni.html
SECURITY FORCES POISED FOR VICTORY By
Tissa Ravindra Perera , The Nation,
https://atrocityarchives.weebly.com/uploads/1/2/0/7/120745407/na tion-2009-05-17-security_forces_poised_for_victory.pdf
http://www.warwithoutwitness.com/journalist-name-command-officers-in volved-in-killing-surrendering-combatants-in-sri-lanka/
Photo at http://archives.dailynews.lk/2009/05/01/sec03.asp

24. OISL § 116; The valiant men who led ground troops, 15 May 2009, Sunday Observer,
http://archives.sundayobserver.lk/2011/05/15/victory.asp?id=s06 ,
7 May-20 July 2009 according to
http://slwaronterror.blogspot.com/2018/09/chagie-im-designated-as-war-criminal.html

25. ආණ්ඩුවට අයත් Daily News පුවත්පතේ Miracle workers ග්‍රැෆික් සටහන,
තවද, TENURES OF BRIGADE COMMANDERS says from 24 Nov. 2007 until 26 Oct 2010 in charge,
http://archives.dailynews.lk/2008/06/13/fea03.asp
https://alt.army.lk/sfhqmlt/591-brigade Retired 2020, Sri Lanka Artillery Regiment
https://www.army.lk/news/artillery-regiment-bids-farewell-major-general-aruna-ariyasingha
http://archives.dailynews.lk/2009/06/19/sec03.asp

26. ආණ්ඩුවට අයත් Daily News පුවත්පතේ Miracle workers ග්‍රැෆික් සටහන: තවද, ගොණුගත ලේඛනවල අඩංගු TENURES OF GENERAL OFFICERS COMMANDING අනුව, ධ/ 60633 කර්නල් එච්එම්පී ද සිල්වා පළමු බලසේනාවේ අණදෙන නිලධාරී වශයෙන් 2007 දෙසැම්බර් 29
සිට 2010 පෙබරවාරි 28 ක්‍රියාකර තිබේ.https://alt.army.lk/sfhqmlt/592-brigade

27. 592 Brigade Commander - හමුදා වෙබ් අඩවිය කියා සිටින්නේ ලුතිනන් කර්නල් ඩීජීඑස් සෙනරත් යාපා 2009 පෙබරවාරි 15 සිට 2010 ඔක්තෝබර් 15 තෙක් අණදෙන්නා ලෙස ක්‍රියාකළ බව ය. Army at doorstep of last Tiger strong-hold, The Nation,
https://web.archive.org/web/20090516024456/http://www.thebottomline.lk/2009/05/13/defence_col.htm
which says he had with three battalions under his command, 11 (GR) com-manded by Major W.M.D.S.Gunawardane, 4 (SR) Sinha Regiment com manded by Major I.K. Lokukatagoda, 16 (SLLI) commanded by Major B.J. Lekamge. Miracle workers graphic from state run paper. He is in video from May 2009
https://www.youtube.com/watch?v=zO3G7__fV8k
2022 appointed Deputy Chief of Staff, Gajaba Regiment, https://www.army.lk/news/major-general-sujeewa-senarath-yapa-new-deputy-chief-staff-takes-over-duties

28. *එක්සත් ජාතීන්ගේ සටහනේ දක්වා නොමැත. ආණ්ඩුවට අයත් Daily News පුවත්පතේ Miracle workers ග්‍රැෆික් සටහන, Acting commander in 2008 according to http://archives.dailynews.lk/2008/06/13/fea03.asp;
Gajaba Regiment
https://alt.army.lk/gajabaregiment/content/brigadier-wmjrk-senaratne-appointed-new-centre-commandant-gajaba-regimental-centre

29. OISL § 119, The valiant men who led ground troops, 15 May 2009, Sunday Observer,
http://archives.sundayobserver.lk/2011/05/15/victory.asp?id=s06

# 2009




| | ජවිපෙ විරෝධී මෙහෙයුම් | 80 දශකයේ යාපනයේ සටන්කිරීම් | ගජබා රෙජිමේන්තුව | ආනන්ද විද්‍යාලය | රජරට රයිෆල්ස් |
|---|---|---|---|---|---|
|  | X | X | X | X | X |
|  | X | X | X | | |
|  | * | X | X | X | X |
|  | X | X | X | X | |
|  | X | X | X | | X |
|  | X | X | X | | |
|  | X | X | | X | |
|  | | X | | X | |
|  | X | X | X | X | |
|  | X | X | | | |

* සම්බන්ධය තහවුරු කිරීමට ප්‍රමාණවත් තොරතුරු නොමැත

## වර්තමානය

හිටපු ජනාධිපති
ගෝඨාභය රාජපක්ෂ

ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී
ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා

ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්
ජෙනරාල් කමල් ගුණරත්න

විශ්‍රාමිකව හිටපු ජනපතිගේ වියත්මග ව්‍යාපාරයට
මේජර් ජනරාල් චාගි ගාල්ලගේ

2019-21 කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්
මේජර් ජෙනරාල් ඒ.කේ. සුමේධ පෙරේරා

විශ්‍රාමික
මේජර් ජෙනරාල්
උදය (GVDU) පෙරේරා

විශ්‍රාමිකව දේශපාලන දිවියට
ෆීල්ඩ් මාර්ෂල්
සරත් ෆොන්සේකා

විශ්‍රාමිකව දේශපාලන දිවියට
රියර් අද්මිරාල්
සරත් වීරසේකර

විශ්‍රාමිකව දේශපාලන දිවියට
මේජර් ජෙනරාල්
ජගත් සී. ඩයස්

විශ්‍රාමික
මේජර් ජෙනරාල්
රැල්ෆ් නුගේරා

1. https://slasc.blog/uniforms-and-equipment-throughout-the-ages/

2. https://www.ft.lk/Opinion-and-Issues/Tribute-to-a-legendary-comrade-in arms/14-662363
https://www.sundaytimes.lk/180902/sunday-times-2/tribute-to-a-legendary-comrade-in-arms-309551.html
https://island.lk/chagie-issues-dire-warning-as-country-celebrates-independence/

3. https://slasc.blog/uniforms-and-equipment-throughout-the-ages/

4. ගනේගම විතානගේ දොන් උදය ඇනස්ලි පෙරේරා

5. https://alt.army.lk/gajabaregiment/content/major-general-gvdua-perera-rwp-rsp-vsv-usp-usawc-psc-accorded-military-salute

6. එම

7. "1996 සිට 1998 දක්වා ගජබා රෙජිමේන්තුවේ තුවන බලඇණියට පුරෝගාමී වූ ඔහු කෘතහස්ත පාබල හමුදා සාමාජිකයකු විය." https://alt.army.lk/gajabaregiment/content/major-general-gvdua-perera-rwp-rsp-vsv-usp-usawc-psc-accorded-military-salute

8. සිංහ රෙජිමේන්තුව

9. Commando Regiment
https://www.army.lk/news/army-chief-hails-commandos%C3%A2%E2%82%AC%E2%84%A2-unmatched-sacrifices-cr-headquarters

10. https://alt.army.lk/gajabaregiment/10-gajaba-regiment

11. https://www.sundaytimes.lk/200705/sunday-times-2/tribute-to-intake-21-of-sri-lanka-army-as-they-cherish-35-years-of-service-to-the-nation-408217.html
St. Peter's college/SL Light Infantry – Retired April 2019

12. SLLI
https://www.army.lk/news/major-general-ralf-nugera-relinquishes-duties-sfhq-kln

13. Disappeared: SPA Priyantha (9458) M/C Matara B823/99
Disappeared: Sunil Santha AAH (file number 9555) MC Matara Case 109/98
Disappeared: AP Jagath Chaminda (2304) Matara High Court 171/98
Disappeared Sepala SH (8050) HC Matara – no ref

14. බලවේගය මෙහෙයුම 1

15. 1993දී කපිතාන්වරයකු වශයෙන් හමුදා බුද්ධි අංශයට බැඳී අඛණ්ඩවම එහි රාජකාරී කළේය. (පාස්කු ප්‍රහාරය පිළිබඳ ජනාධිපති විමර්ශන කොමිසමේ සාක්ෂි ප්‍රකාශය - https://shorturl.at/hv458

16. ඔහු, 1986දී යාපනයේ සිට කොළඹට මාරු කර යවනු ලැබීය.

**සෘජුව නිකුත් කළ නියෝග පිළිපැද ඇත**

ගෝඨාභය වන්නියේ ඔහුගේ ක්ෂේත්‍ර ආඥාපතිවරුන් සමග කෙළින්ම සන්නිවේදනයේ යෙදී ඇති බවත් සාමාන්‍ය පිලිවෙත අනුගමනය කිරීමෙන් බැහැරවෙමින් ඔවුන්ට අණ දී ඇති බවත් දි අයිලන්ඩ් පුවත්පතෙහි හමුදා වාර්තාකරු ෂමින්ද්‍ර ප්‍රනාන්දු වැනි හමුදා තොරතුරු විශ්ලේෂකයන් සනාථ කර ඇත.[100] තමන් හමුදාව මෙහෙයවමින් සහ යුද්ධය කළ යුතු ආකාරය ගැන නියෝග දෙමින් අණදීමේ සහ පාලනයේ යෙදී සිටි බව ගෝඨාභය ම පෙන්වා දී ඇත.[101] යුද්ධ කාලයේ තමා කියූ දේ යුද, ගුවන් හා නාවික හමුදාපතිවරුන් කළ බව ඔහු ප්‍රකාශ කර ඇත.[102]

2009 වන්නි මෙහෙයුම් ආඥාපති ලුතිතන් ජෙනරාල් ජගත් ජයසූරියද[103], ගෝඨාභය නිකුත් කළ විධානවලට ක්ෂේත්‍ර නිලධාරීන් අවනත වූ පවසා ඇතඃ

> *සංග්‍රාම භූමියේදී ලත් පළපුරුද්දක් ඇතිව සිටි ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂට, ඔහු සැපයූ මගපෙන්වීම ගැන අපි ආචාරය පුදකරමු. ඔහු නිකුත් කළ විධානයන් අපට අමතක කළ නොහැකි අතර එම විධානයන් ක්ෂේත්‍රයේ කාර්යක්ෂම නිලධාරීන් මාර්ගයෙන් ක්‍රියාත්මක කරන ලදී.[104]*

දෛනික පදනමින් - ඔහුට භූමියේ මෙහෙයුම් පිළිබඳ සවිස්තරාත්මක දැනුමක් තිබුණි.

2006 දී ඔහු ඝාතනය කිරීමේ උත්සාහය ගැන කතාකරමින් , සාම්ප්‍රදායික ධුරාවලිය[105] මගහරිමින් ක්ෂේත්‍රයේ පැවති ගැටළු සම්බන්ධයෙන් දෛනික පදනමින් යුද්ධයේ මුල් දිනවල සිට ආඥාපතිවරුන් තමන්ට කෙළින්ම වාර්තා කළ බව ගෝඨාභය ස්ථිරකළේය[105]. මෙම ප්‍රවේශය යුද්ධයෙන් පසුවද දිගටම ක්‍රියාත්මක වූ බව ගෝඨාභය පවසා ඇත ඃ

> *කිසිවෙක් මා වගේ සාකච්ඡා පවත්වා නැහැ. නාගරික සංවර්ධනය පිළිබඳ සතිපතා රැස්වීමේදී මම වාස්තු විද්‍යාංඥයන්ට, ඉංජිනේරුවන්ට, අධ්‍යක්ෂවරුන්ට සහ පහළ නිලධාරීන්ට පවා කතා කළා. මම මගේ නියෝග නිකුත්නොකර සාමූහික ප්‍රවේශයක් ලබාගැනීම පිණිස ඔවුන්ගේ මතවලට සහ ප්‍රගති වාර්තාවලට සවන් දුන්නා. යුද්ධයේදී, කිසිවෙක් මා වගේ සම්බන්ධීකරණයක් ,විශේෂයෙන් බුද්ධි සේවාවන් සමගින්, කළේ නැහැ. පළමු වතාවට මම ආරක්ෂක හමුදාවල බුද්ධිසේවා ඒකක එකට සම්බන්ධ කළා. ක්‍රියා මාර්ග ගැනීමට පෙර හැම වේලාවකදීම ඔවුන්ට සවන්දෙමින් භූමියේ යතාර්ථය ගැන ඔවුන්ගේ මත එකතු කරගත්තා. කොළඹ ආරක්ෂාව උදාහරණයට ගන්න. යුද,නාවික, ගුවන් හමුදා සමග සහ සිවිල් ආරක්ෂක බලකාය සම්බන්ධීකරණය කළ මම ඔවුන් සමග නිතිපතා රැස්වීම පැවැත්වූවා. මම හැම අවස්ථාවකදීම මගේ නියෝගදීමට පෙර ඔවුන්ට සවන් දෙමින් සාකච්ඡා කළා. මම හිතන්නනෙ නැහැ වෙනත් කිසිම රජයේ සේවකයෙක් එම කාර්ය මේවගේ ඉටු කළ බව’ [106].*

ගෝඨාභය උපාය මාර්ග සම්බන්ධීකරණය කිරීමට, සැලසුම් ක්‍රියාත්මක කිරීමට, සහ වාර්තා ලබාගැනීමට ඔහුගේ යටතේ සිටි නිලධාරීන් සමග නිතිපතා රැස්වීම් පැවැත්වූ බව ඔහුගේ සගයෝ සහතික කළහ[107]. 2009 මැයි 6 දා පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවකදී කොළඹ ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියකු

---

100. ‘සමහර විට ඉතාම වැදගත් සාධකය වූයේ මෙම ව්‍යාපාරය මුළුල්ලේම තදින් කතාකරන ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ ඉටුකළ කාර්යභාරයයි. ඔහුගේ පූර්ව ප්‍රාප්තිකයන් මෙන් නොව මෙම ගජබා රෙජිමේන්තු ප්‍රවීණයා. වැදගත් අවස්ථාවලදී එකිනෙකාට උපකාරකිරීම පිණිස ත්‍රිවිධ හමුදාවට පහසුකම් සැපයීම පිණිස කඩිනමින් සහ තීරණාත්මක ලෙස ක්‍රියා කළේය. සහෝදර සේවාවකින් ආධාරයක් අවශ්‍ය වූ විට යම් හමුදාවක් ආරක්ෂක ලේකම්ගේ මැදිහත්වීම ලබාගැනීමට ඉදිරිපත්වීම එක් සිද්ධියක් ලෙස දැක්විය හැකිය. වන්නි පෙරමුණේ ක්ෂේත්‍ර අණදෙන නිලධාරියෙකුට සාමාන්‍ය ධූරාවලිය අනුගමනය නොකර කෙළින්ම තමාට කතාකිරීමට ඉඩදීමට තරම් දුරකට ආරක්ෂක ලේකම් කටයුතු කර තිබුණි’ http://slwaronterror.blogspot.com/2012/09/fac-role-in-battle-off-mullaitivu.html

101. ‘ආපසු බලන විට, ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා මට පැවරූ සෑම වගකීමක්ම මම මාගේ රට වෙනුවෙන් 100% ක්ම ඉටු කර ඇත.ඔබ දන්නවා, ආරක්ෂක ලේකම් වශයෙන්, පළමුවෙන් මට වසර දෙක හමාරක තුළ ත්‍රස්තවාදය අවසන් කිරීමට ත්‍රිවිධ හමුදාව සහ බුද්ධි සේවා මෙහෙයවීමට මට හැකිවූවා. 2019 ඔක්තෝබර් 19 ,බෙලිඅත්තේ ඡන්ද ව්‍යාපාරයේ රැස්වීමක යෙදී සිටියදී,’ https://www.youtube.com/watch?v=BdtQ-E5sBPw 10’47"-11’37.

102. ‘ඔහු (සරත් ෆොන්සේකා) ඔහුගෙන් බලාපොරොත්තු වූ ආකාරයෙන් වැඩකටයුතු ඉටුකළා. ඔහු පමණක් නොවෙයි, වසන්ත කරන්ගොඩ සහ රොෂාන් ගුණතිලක (2009 යුද්ධයේදී නාවික සහ ගුවන් හමුදාපතිවරුන් ) මට ආධාර කළා. එවන් ක්‍රමයකිනුයි එවන් ජයක් අපට අත්කර ගන්න හැකිවුනෙ.’ (CEYLON WEEK සම්මුඛ සාකච්ඡාව).

103. 2017දී ඔහුට එරෙහිව සංවිධානය විසින් ලතින් ඇමරිකාවේ නඩුකර ගොණුකරන ලදී. https://itjpsl.com/reports/the-case-against-jagath-jayasuriya

104. https://lrrp.wordpress.com/2009/10/

105. ‘මෙම පහරදීම සිද්ධවුනේ 2006 දෙසැම්බර් 1 දා.කළින් දවසේ මම හිටියෙ අසනීපෙන්. ඒ හින්ද මම එදින වැඩට ගියේ නැහැ. නමුත්, 1 දා මම සුපුරුදු පරිදි වැඩට යන්න වේලාසනින් සූදානම් වුනා. මම උදේ වේලාසනින් සූදානම් වුවත්, ගෙදරින් පිටත්වන්න 10.30 දක්වා කල්ගතවුනා. මට ඒ දවස හොඳට මතකයි. යුද්ධය ආරම්භවී තිබුණ නිසා මට ඇමතුම් රැසක් ලැබුණ. හමුදාපතිවරුන් කතා කරල ප්‍රශ්න ගණනාවක් ගැන කීවා’. (ලංකාදීප සම්මුඛ සාකච්ඡාව - 16 දෙසැම්බර් 2012)

106. 21 May 2015 Interview with Shanika Sriyananda, http://www.ft.lk/article/423001/FT-EXCLUSIVE--%E2%80%9CI-am-a-very-religious-person--the-truth-will-prevail%E2%80%9D--Gotabaya

107. බලන්න Business Today, Deputy Inspector General of Police – Sisira Mendis [Interview], April 28, 2009, http://www.businesstoday.lk/printarticle.php?articleid=23.

ආරක්ෂක හමුදා අධීක්ෂණය සම්බන්ධයෙන් ගෝඨාභයගේ ප්‍රධාන කාර්යභාරය විස්තර කර ඇත.[108] පැයක් පාසා සංග්‍රාම භූමියෙන් ලැබෙන තොරතුරු ගෝඨාභය නිරීක්ෂණය කළ ආකාරය ඉන්දියානු විස්තර විශ්ලේෂකයකු සඳහන් කර ඇත:

> *(ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදා -යුද, නාවික සහ ගුවන් හමුදාවල ) ප්‍රධානීන් සමඟ දිනපතා සෑම පැයකදීම යුද මෙහෙයුම් 'කියවා' විශ්ලේෂණය කළ බව ගෝඨාභය පැවසුවේය. 'අවශ්‍යතාවන් සහ වුවමනාවන් අවබෝධ කරගැනීමට සහ තරම දැනගැනීමට මට හැකිවුනා. ඕනෑම හමුදා ආඥාපතිවරයකු හැමදේම - ලබාදිය හැකි සෑම අවියක්ම බඩු වට්ටෝරු - ඉල්ලනවා,. මගේ කාර්ය පුමුඛතා අවබෝධකර ගෙන, ජයග්‍රහණය ලබාගැනීම උදෙසා සැබවින්ම අවශ්‍ය එම ප්‍රමුඛතා තාර්කිකව සංවිධානය කිරීම සහ අපගේ අරමුණට කිසිසේත් අදාළ නොවන වුවමනාවන් සහ අවශ්‍යතා ඉවත දැමීමයි.'*[109]

එම කාලයේ භූමියේ සිටි ශ්‍රී ලංකාවේ හමුදා නිලධාරීන්ද මෙය සනාථ කළ අතර ඔවුන් පැවසුවේ "ගෝඨාභය සංග්‍රාම සැලසුම්වලදී සක්‍රීය වූ අතර ඔහු යුද්ධය පෙරට ගෙන යාමට ක්‍රියාශීලීව සම්බන්ධ වූ බවයි."[110]

යුද්ධ කාලයේදී මෙහෙයුමක් ක්‍රියාත්මක කළ යුතුදැයි උසස් නිලධාරීන් දෙදෙනකු අතර වාදයක් පැවති අවස්ථාවකදී ඔහු භූමියේ සිටි බව ඇසින් දුටුවෙක් පැවසීය. ගෝඨාභයට සමීපයැයි ප්‍රකටව සිටි එක් නිලධාරියෙක් අවධාරණය කළේ 'තමන්ට ගෝඨාභයගෙන් නියෝගයක් ලැබී ඇති බවත් ඔවුන් සියල්ලන්ම එකම ආණ්ඩුවකට සේවය කරන බවත්ය, සියල්ලන් ඉදිරිපිට ගෝඨාභයට කතාකරමින් මහා රඟපෑමක් කළ ඔහු ප්‍රශ්නයට පාත්‍රවී ඇති ඒකකය එය කිරීම ප්‍රතික්ෂේප කරන බව' පැවසීය. සම්ප්‍රදායික විධාන ව්‍යූහය මගහරිමින් ක්ෂේත්‍ර ආඥාපතිවරුන් සෘජුවම ආරක්ෂක ලේකම්ට වාර්තා කළ බව මෙයින් පෙන්නුම් කරයි. ඔහුගේ සගයන් ප්‍රසිද්ධියේ කළ ප්‍රකාශ අනුව ගෝඨාභය උපාය මාර්ග සම්බන්ධීකරණයට, මෙහෙයුම් සැලසුම් කිරීමට සහ වාර්තා ලබාගැනීමට ඔහුගේ යටතේ සිටි නිලධාරීන් සමඟ නිතිපතා රැස්වීම් පැවැත්වීය[111]. 2009 මැයි 6 දා පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවකදී කොළඹ ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියකු ආරක්ෂක හමුදා අධීක්ෂණය සම්බන්ධයෙන් ගෝඨාභයගේ කාර්යභාරය විස්තර කළේය[112].

## රළු ක්‍රියාවලට සම්බන්ධ පාලනය

ගෝඨාභය රාජපක්ෂ ප්‍රහාර නිකම්ම සම්බන්ධීකරණය නොකළ නමුත් විශේෂ සටන් හෝ මෙහෙයුම්වල ප්‍රතිඵලට අදාළ විශේෂ නියෝග නිකුත් කළ බව මාධ්‍ය වාර්තා පෙන්වා දෙයි..

වාර්තා කළ එක් අවස්ථාවකදී ,ගෝඨාභය ඩ්‍රෝන යානයක් එය මෙහෙයුමට යොදා ගන්නා පැය ගණන ඉවරවී තිබියදීත් තවදුරටත් ක්‍රියාත්මක කිරීමට ගුවන් හමුදාවට නියෝගකරමින් බිම් මෙහෙයුම් විස්තර වල පවා යෙදුණු ආකාරය පෙන්නුම් කළේය.

> *එක් අවස්ථාවකදී ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ නියමුවන් රහිත අගනා නියමුවන් රහිත ගුවන් යානයක් (UAV) අහිමිවීමේ අවදානම පවා නොතකා ඔවුන්ගේ අරමුණ ඉටුකර ගැනීම පිණිස පාබල හමුදාවල සහායට ක්‍රියාත්මක කරන ලෙස ගුවන් හමුදාවට අවධාරණය කළේය.*[113]

*ගෝඨාභය රාජපක්ෂ ළඟින් පහළින් සිටි නිලධාරියා වන සරත් ෆොන්සේකා පාර්ලිමේන්තුවේදී පැවසූවේ*

---

108. 'ඇත්ත වශයෙන්ම, කොළඹ ආරක්ෂාව තහවුරු කිරීම ගැන වගකීම දැරූ ප්‍රධාන තැනැත්තා ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ ය. අපට අපගේ ප්‍රගතිය සතිපතා ඔහුට වාර්තාකිරීමට තිබුණා. තවද. පරික්ෂණ ගැන දෛනිකව දැනුම්දෙමින් පොලිස්පතිද නිරතුරුව දැනුවත් කළා. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිමල් මැදිවක ද ඔහුගේ පූර්ණ සහාය දෙනවා. ආරක්ෂක ලේකම් තමා අපගේ ශක්තිය; අප සියල්ලන්ම එක් කණ්ඩායමක් ලෙස එකට එක්කිරීමට ඔහු සමත්වුනා. අපගේ විමර්ශනවල සාර්ථකත්වය එහි ප්‍රතිඵලය වුණා.' Business Today, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති - අනුර සේනානායක සම්මුඛ සාකච්ඡාව, මැයි 6, 2009, https://businesstoday.lk/senior-superintendent-of-policeanura-senanayake/ Defense Secretary Gotabaya Rajapaksa: The Will [Interview], 2 May 2010, http://www.businesstoday.lk/printarticle.php?articleid=2434.

109. "Winning wars: political will is the key", cit. V.K. Shashikumar, "Lessons from the War in Sri Lanka", Indian Defence Review 24, No. 3, July-Sept 2009

110. ගොණුගත ලේඛන

111. බලන්න Business Today, 28 Apr 2009, https://businesstoday.lk/the-eye-on-colombo-inspector-general-of-police-jayantha-wickramaratna

112. 'ඇත්ත වශයෙන්ම, කොළඹ ආරක්ෂාව තහවුරු කිරීම ගැන වගකීම දැරූ ප්‍රධාන තැනැත්තා ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ ය. අපට අපගේ ප්‍රගතිය සතිපතා ඔහුට වාර්තාකිරීමට තිබුණ. තවද. පරික්ෂණ ගැන දෛනිකව දැනුම්දෙමින් පොලිස්පතිද නිරතුරුව දැනුවත් කළා. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිමල් මැදිවක ද ඔහුගේ පූර්ණ සහාය දෙනව.ආරක්ෂක ලේකම් තමා අපගේ ශක්තිය; අප සියල්ලන්ම එක් කණ්ඩායමක් ලෙස එකට එක්කිරීමට ඔහු සමත්වුනා. එය අපගේ විමර්ශනවල සාර්ථකත්වය එහි ප්‍රතිඵලය විය.' Business Today" ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති - අනුර සේනානායක - සම්මුඛ සාකච්ඡාව, මැයි 6, 2009, https://businesstoday.lk/senior-superintendent-of-policeanura-senanayake/
Business Today: Defense Secretary Gotabaya Rajapaksa: The Will [Interview], 2 May 2010, http://www.businesstoday.lk/printarticle.php?articleid=2434.

113. The Island, 24 Dec 2012, http://slwaronterror.blogspot.com/2012/12/lttecheckmated.html

*2006 ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ මාවිල්ආරු ප්‍රහාරය විනාඩි දෙකක් ඇතුළත අනුමත කළ බවයි:*[114]

> *'මම ගෝඨාභය අමතා ඒ (මාවිල් ආරු) ගැන ඇසුවා.(එල්ටීටීඊය විසින්) මාවිල්ආරු අවහිර කර ඇති බව ඔහු පැවසුවා.. අපි ප්‍රහාර එල්ලකිරීමට සූදානම් බව මම පැවසුව. විනාඩි දෙකකින් ආපසු කතා කරන බව ඔහු කීවා.මහින්ද රාජපක්ෂට කතා කළ ඔහු ඉදිරියට යන ලෙස මට දැන්වූවා[115].'*

ඊට අමතරව 2007 තරම් අතීතයේදී, එල්ටීටීඊ දේශපාලන අංශ නායක තමිල් සෙල්වම් සහ ඔහුගේ පුද්ගලික ආරක්ෂකයන් කිලිනොච්චියේදී ඝාතනයට ලක්කෙරුණු ගුවන් ප්‍රහාරය ගැන අදහස් දක්වමින්, අනික් එල්ටීටීඊ නායකයන් සිටින ස්ථාන ගැන පුළුල් දැනුමක් ඇති බව ගෝඨාභය රාජපක්ෂ ප්‍රකාශ කළේය:

> *'මෙය නිකම් පණිවුඩයක් පමණයි. අප දන්නවා ඔවුන්ගේ නායකයන් ඉන්න තැන්. සේරම නායකයන් ඉන්න ස්ථාන මම දන්නවා. අවශ්‍ය නම් අපට ඉන් එක එකා බැගින් අල්ල ගන්න පුළුවන්. ඒ හින්ද ඔවුන් ඔවුන්ගේ සැගවී සිටින තැන් මාරු කළ යුතුයි.' ඔහු රොයිටර් සේවයට ප්‍රකාශ කළේය. 'වෙලාව ආපුවහම පමණක් ඔවුන් එකා බැගින් අල්ලා ගන්නම්.'*[116]

ගෝඨාභයගේ නිල චරිතාපදාන රචක සී.ඒ. චන්ද්‍රප්‍රේම ලියා ඇත්තේ ඔහු පවතින යුද්ධ උපකරණ ප්‍රමාණය ගැන පවා දැනසිටි බවයි:

> *'යුද්ධය පැවති කාලයේදී, යුද හමුදාවේ මෙහෙයුම් අධ්‍යක්ෂ උදය පෙරේරා නිරතුරුව ගෝඨා (ගෝඨාභය රාජපක්ෂ) සමග සම්බන්ධවෙමින් පවතින යුද්ධෝපකරණ ප්‍රමාණය සම්බන්ධයෙන් ඔහුව යාවත්කාලීන කළා.'*[117]

## E. ප්‍රචාරණ යුද්ධයත් පාලනය කිරීම

විශ්ලේෂකයන් විශ්වාස කරන්නේ ගෝඨාභයගේ උපාය මාර්ගය වූයේ යුද හමුදාවට නිදහස් ආධිපත්‍යයක් ලබාදීම, ජාත්‍යන්තර ප්‍රජාවගෙන් එල්ලවන පීඩනයට ප්‍රතිරෝධය දැක්වීම, යුද්ධය නැවැත්වීම හෝ සාකච්ඡා කිරීම ප්‍රතික්ෂේප කිරීම[118] සහ මාධ්‍ය පාලනය කිරීමයි. (එසේ නැත්නම් ඔහු කියන පරිදි, 'ගැටුමේ තොරතුරු එක දිසාවකට පමණක් ගලා යාම සහතික කිරීමයි'). යුද්ධය සම්බන්ධයෙන් ප්‍රචාරණය හෝ ප්‍රසිද්ධිය හෝ පිළිබඳ කාර්යභාරයක් ගෝඨාභය බාරගත් අතර එය ප්‍රහාර නතරකිරීමට අන්තර්ජාතික ප්‍රජාවගෙන් ඇති වන පීඩනයට ප්‍රතිරෝධය දැක්වීමට අත්‍යවශ්‍ය විය. එම කාලයේ ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග ප්‍රකාශ කළේ:

> *'රජයේ ප්‍රචාරක විශේෂඥයන්ගේ රාජකාරිය ගෝඨා බාරගත්තා. මට හිතාගන්නත් බැහැ රජයේ සේවකයෙක් මෙන්ම හමුදා නිලධාරියෙක් මෙතරම් හොඳට එය ඉටුකිරීම ගැන.'*[119]

එල්ටීටීඊය සමග සටන් විරාමයක් ඇතිකර ගන්නා ලෙසට කෙරුණු ඉල්ලීමට ගෝඨාභය රාජපක්ෂ ප්‍රතිරෝධය දැක්වීමේදී අති සමර්ථ වූ අතර එවැන්නකින් ඔවුන්ට නව පණක් ලබාදීම සහ ඔවුන්ගේ පරාජය දිග්ගැස්සීමක් විය හැකි බවට බියක් තිබුණි.

2009 පෙබරවාරි මාසයේදී, ඔහු කොළඹ තානාපතිවරුන්ට, විශේෂයෙන් ජර්මන් සහ ස්විට්සර්ලන්ත තානාපතිවරුන්ට, සහ ප්‍රධාන ප්‍රවෘත්ති සමාගම්වලට ඔවුන් සිය වාර්තාකරණයේදී වගකීම් විරහිත ආකාරයෙන් ක්‍රියා කළහොත් ඇතිවිය හැකි දරුණු ප්‍රතිවිපාක ගැන අනතුරු ඇඟවීය[120]. අප්‍රියෙල් අගභාගයේදී, ඔහු සටන් විරාමක් පිළිබඳ අදහස විහිළුවක් බව පැවසීය.[121] මානුෂවාදී කනස්සල්ල

---

114. '2006 ජූලි මාසයේදී, ත්‍රිකුණාමලයෙන් ඊසාන දෙස මාවිල්ආරු ප්‍රදේශය එල්ටීටීඊ ය විසින් අල්ලා ගෙන නැගෙනහිර පළාතට ජලය සපයන ප්‍රධාන ජලාශයේ සොරොව්ව වසන ලදී. ත්‍රිකුණාමලයේ නාවික කඳවුරටද ප්‍රහාර එල්ල කරන ලදී මෙය නැගෙනහිර අවසන් සටනේ ආම්භය සනිටුහන් කළේය.' §66, OISl, 2015.

115. 5 April 2019 (පාර්ලිමේන්තුවේ කතා කළ දිනය තහවුරු කරගත යුතු ය) https://newstube.lk/news/6001-2019-04-05-08-29-12

116. https://jp.reuters.com/article/us-srilanka-rebel/tamiltiger-political-head-killed-in-sri-lanka-raididUSCOL2465122007l102/

117. Gota's War. පිටුව 219

118. 'එල්ටීටීඊය. නමුත් සාර්ථකත්වය සමීපයේ පවතින විට, මානුෂවාදී අර්බුදය සහ සිවිල් වැසියන්ට සිදුවන හානි සම්බන්ධයෙන් ජාත්‍යන්තර ප්‍රජාව දක්වන කණස්සල්ල නිසා ක්‍රියාන්විතවලින් පසුබැසීමට ඔවුන් නියෝග අවලංගු කර පස්සට එන ලෙස ආරක්ෂක හමුදාවලට උපදෙස් දී ඇත.මේ නිසා අපට මාධ්‍ය නියාමනයක්සහතික කිරීමට තිබුණි. ජාත්‍යන්තර ප්‍රජාවගෙන් අපට සාම සාකච්ඡාවලට බලකිරීමක් අවශ්‍ය නොවීයි නිර්නාමිකව සිටීමට රිසි ජනාධිපති කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් පැවසීය.' - http://www.indiandefencereview.com/spotlights/lessons-from-the-war-in-sri-lanka/2/

119. ගොණුගත ලේඛන.

120. 1 පෙබරවාරි 2009: ගෝඨාභය රාජපක්ෂ: 'වගකීමෙන් තොරව වැඩකළහොත්' භයානක විපාක' ඇතිවන බවට තානාපතිවරුන්ට, ප්‍රවෘත්ති ඒජන්සිවලට සහ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානවලට අනතුරු හැඟවීමක් කළේය.' ආරක්ෂක හමුදා මහත් කැපවීමක් කරමින් ඔවුන් මාරක ප්‍රහාරයක යෙදී සිටින වෙලාවක, එල්ටීටීඊ ත්‍රස්තවාදීන්ට යළි හුස්මක් ලබාදීමට උත්සාහ කරන්නේ නම් ඔවුන් එළවනවා' ඔහු පැවසීය. ඇතැම් තානාපතිවරුන්, විශේෂයෙන් ජර්මන් සහ ස්විට්සර්ලන්ත, සහ ඇතැම් ප්‍රවෘත්ති ඒජන්සි වගකීමෙන් තොරව හැසිරෙන බව ගෝඨාභය තවදුරටත් කීවේය. CNN, Al-Jazeera and the BBC වගකීමෙන් තොරව කටයුතු කරන බව ට නම් කළ ඔහු වගකීමෙන් කටයුතු කරන ලෙසත් කීවේය. Act responsibly or be chased out,'' Gota tells BBC & envoys, The Island, 1 Feb 2009 file

121. 26 අප්‍රියෙල් 2009: Reuters සේවයට කතා කළ, ගෝඨාභය රාජපක්ෂ සටන් විරාමයක් ගැන අදහසට සිනාසුනේය. 'ඒක විහිළුවක්. ඔවුන් අප සමඟ සටන් කරන්නේ නැහැ. ඔවුන් අප දැක දුවනවා. සටන් විරාමයක අවශ්‍යතාවයක් නැහැ. ඔවුන් බාරවිය යුතුයි." https://www.reuters.com/article/us-srilanka-war/sri-lanka-rejects-tamil-tiger-ceasefire-idUSTRE53P0RV20090426/

එල්ටීටීඊ නායකයන් බේරාගැනීමේ උපක්‍රමයක් ලෙස හැඳින්වීය.[122] ....2009 මැයි මස වන විට සටන් විරාමයක් ගැන අදහස ප්‍රතික්ෂේප කළ අතර කතා කළේ භාරවීමක් ගැන පමණක් වූ අතර එයද යම් තුන්වැනි පාර්ශයක් ඉදිරියේ පෙනී නොසිටිමින් බවද කීය. එය එල්ටීටීඊ දේශපාලන අංශය අධිකරණ පටිපාටියකින් බැහැරව මරණයට පත්කිරීම ඇතුළු යුද්ධය අවසානයේ සිදු වූ මානව අයිතීන් උල්ලංඝනය කිරීම්වලට තර්කානුකූලව මාර්ගය සකස් කිරීමක් විය.[123] කතා ගෙතීමට සහ 'මානව ව්‍යසනයක දර්ශනයක්' ප්‍රබන්ධ කිරීමට විදේශ මාධ්‍ය ඇතුළු අන්තර් ජාතික සංවිධානවලට එල්ටීටීඊය රිංගාගෙන ඇති බවට චෝදනා කිරීමට පවා ගෝඨාභය රාජපක්ෂ කටයුතු කළේය'[124].

**ප්‍රතික්ෂේපකිරීම: සිවිල් වැසියන්ට හානි සිදුවීම ශූන්‍යයි**

ශ්‍රී ලංකාවේ ආණ්ඩුව අදහස් කළ බව සහ සත්‍ය වශයෙන්ම පවත්වාගෙන යාමට හැකිවූ බව කියන, මෑත අවුරුදුවල සිදුවූ එක් කෲරතම යුද්ධයකදී 'මානුෂවාදී බේරාගැනීමේ මෙහෙයුමක් සිදුකිරීම ඇතුළු' සිවිල් වැසියන්ට හානිසිදුවීම තුරන්කිරීමේ' ප්‍රතිපත්තිය විශ්වාස කිරීමට අපහසු වුවත් සහතික වශයෙන් පැවසීම[125] රාජපක්ෂ ප්‍රචාරණ උපාය මාර්ගයේ විමතිය ඇතිකරන සාර්ථක අංගයකි. ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ ප්‍රවෘත්ති සාකච්ඡාවකදී පැවසූයේ 'සිවිල් වැසියන්ට හානිසිදුවීම තුරන්කිරීම' අරමුණ වූ බවයි.[126] මෙම ඉන්දියානු විශ්ලේෂකට අනුව සත්‍යවශයෙන් සිදුවූයේ එහි සම්පූර්ණ ප්‍රතිවිරුද්ධයයි;

"සිවිල් වැසියන්ට හානිසිදුවීමේ හැකියාව පිළිගත් කාරණාවක් වන අතර එම අපවාදය බාරගැනීමට රාජපක්ෂ සූදානමින් සිටියේය. එය හමුදාවට මහත් චිත්ත ශක්තියක් ගෙනදුන්නේය. එය ආරක්ෂක හමුදාවලට ලබාගැනීමට හැකි හොඳම චිත්ත ධෛර්ය උත්තේජකය විය" යැයි මෙම ප්‍රකාශය නිර්නාමිකව තබාගන්නා ලෙස ඉල්ලා සිටි ශ්‍රී ලංකාවේ අමාත්‍යවරයෙක් පැවසීය[127].

අන්තර්ජාතික ප්‍රජාව මෙවැනි නිහීන ප්‍රතික්ෂේප කිරීම් අභියෝගයට ලක්කිරීමට මගක් නොදැන සිටි බවක් දක්නට ඇත. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ චාල්ස් පෙට්‍රී ගේ අභ්‍යන්තර සමාලෝචන වාර්තාව විස්තර කරන පරිදි:

එක්සත් ජාතීන්ගේ ලියුම්වලට රජයෙන් දැක්වූ ප්‍රතිචාර ස්වල්පයක් වූ අතර නිතරම සිවිල් වැසියන් මැරීම සම්බන්ධයෙන් වන යම් යොමුකිරීමක් බොරුබව ඔප්පුකිරීමට අවධානය යොමු කළේය. මාර්තු 13 දා , USG-OCHA සංවිධානය ජනාධිපති රාජපක්ෂ වෙත එවූ ලිපියකට ප්‍රතිචාර දක්වමින් ආපදා කළමනාකරණ සහ මානව හිමිකම් අමාත්‍යවරයා ලියා ඇත්තේ, 'ආරක්ෂක ලේකම්වරයා ඔබට පැහැදිලිව කියා ඇති ප්‍රතිපත්තිය වන , අපගේ ආරක්ෂක හමුදා ආරක්ෂක කලාපවලට වෙඩිතැබීම නොකරන බව සහ සිවිල් වැසියන් වාසය කරන ප්‍රදේශවල බර අවි භාවිත නොකරන බව ඔබට යළිත් දැනුම්දීමට කැමැත්තෙමි'[128] යනුවෙනි.

සිවිල් වැසියන්ට වන හානි වාර්තා කළ ජනමාධ්‍යවේදීන් සහ වෛද්‍ය කාර්ය මණ්ඩල ප්‍රහාරවලට ලක්විය. එක් උදාහරණයක් ගෙනහැර දක්වන්නේ නම් , සිවිල් වැසියන්ට හානි සිදුවීම් පිළිබඳ විස්තර පළ නොකරන ලෙස රජයෙන් නියෝග ලැබුණේයැයි වාර්තා කිරීමෙන් පසු 2009 මාර්තු මාසයේදී, යාපනයේ උදයන් පුවත්පත් කාර්යාලයට ග්‍රෙනේඩ් ප්‍රහාරයක් එල්ල විය[129].

122. දේශීය පුවත්පතකට කතා කරමින් 'ආරක්ෂක ලේකම් ඔහුගේ වචන වෙනස් කළේ නැත. ගැටුමෙන් විනාශ වී සිටින්නේ ශ්‍රී ලංකාවෙ හට පිරිස් සහ සිවිල් ජනතාව නිසා එල්ටීටීඊය අවසන්කර දැමීමට ආණ්ඩුව අධිෂ්ඨාන කර තිබෙනවා. මානුෂවාදී ප්‍රශ්න හුවාදැක්වීම ප්‍රභාකරන් සහ ඔහුගේ ප්‍රධාන නායකයන් ඔවුන් වැටී සිටින අවුලින් නිදහස්කරගැනීමට යොදා ගත් කූටෝපායක් පමණයි.' -
ප්‍රභාකරන් පණපිටින් හෝ මරණයට පත්කර අල්ලාගන්නා තෙක් යුද්ධය නතරකරන්නෙ නැහැ' ගෝඨා මිලිබෑන්ඩ් සහ කුෂ්නර්ට කියයි https://www.army.lk/news/war-wont-stop-until-prabhakaran-taken-dead-or-alive-gota-tells-miliband-and-kouchner

123. 1 මැයි 2009: '..මෙම අවස්ථාවේදී සිවිල් ජනයා මුදාගැනීම පිණිස සටන් විරාමයකට යාමේ අවශ්‍යතාවක් නැති බව ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ පැවසීය. ..ඇමරිකාව කළ එම යෝජනාව මුළුමනින්ම ප්‍රතික්ෂේප කළ ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ එල්ටීටීඊය යම් බාරවීමක් කරන්නේ නම්, එය ආරක්ෂක හමුදාවලට බාරවීමක් විය යුතු බවත් යම් තුන්වන පාර්ශවයකට නොවිය යුතු බවත් කීය.' - එල්ටීටීඊය බෙදෙයි, බහුතරය භාරවීමට - සුළුතරය සටන් කිරීමට . 1 May 2009" Daily News

124. 'ආණ්ඩුව සහ ආරක්ෂක හමුදා අවමානයට ලක්කරමින් සටන් විරාමයක් ප්‍රකාශයට පත්කිරීමට ආණ්ඩුවට බලකිරීම පිණිස කාලයක සිට ජාත්‍යන්තර සංවිධානවලට සහ මාධ්‍ය ආයතනවලට රිංගාගෙන සිටි එල්ටීටීඊ ඒජන්තවරුන් ගෙනගිය සංවිධානාත්මක ව්‍යාපාරයක් තිබුණි..මානව ව්‍යසනයක දර්ශනයක් නිර්මාණය කිරීමට සහ ව්‍යාජ තොරතුරු ප්‍රචාරණය පිණිස එල්ටීටීඊයේ වැටුප් ලේඛනවල සිටි තැනැත්තන් කතා ගෙතූ බව ආරක්ෂක ලේකම් කීවේය' Plight of Civilians:Tell the whole truth - Defence Secretary
ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන ප්‍රධාන තොරතුරු නොසැඟවියයුතුය..එල්ටීටීඊය සිවිල් ජනයා ප්‍රාණ ඇපයට ගෙන තිබීම, 7 FEB 2009, DAILY NEWS.
http://archives.dailynews.lk/2009/02/07/sec01.asp

125. https://itjpsl.com/reports/war
'සිවිල් වැසියන්ට එරෙහි යුද්ධය' මැයෙන් ITJP සංවිධානය විසින් 2009 යුද්ධයට අදාළව සිදුකළ සේයා රූ ප්‍රදර්ශනය

126. https://lrrp2.wordpress.com/2008/08/31/human-suffering-looms-large-in-the-wanni/

127. http://www.indiandefencereview.com/spotlights/lessons-from-the-war-in-sri-lanka/2/

128. පෙට්රි වාර්තාව, පිටුව 34
https://digitallibrary.un.org/record/737299?ln=en

129. https://www.tamilnet.com/art.html?catid=13&artid=28822
TamilNet, Tuesday, 24 March 2009,
'අඟහරුවාදා රාත්‍රී 11:10 ට පමණ යාපනයේ උදයන් දිනපතා පුවත්පතේ ප්‍රධාන කාර්යාලයට ග්‍රෙනේඩ් ප්‍රහාරයක් එල්ල වූ බව එම පුවත්පතේ පරිපාලනය කොළඹදී මාධ්‍යයට පැවසීය. දමිළ මාධ්‍ය කව තවදුරටත්

## බර අවි භාවිතය ප්‍රතික්ෂේප කිරීම

බහුලව සිවිල් වැසියන් සිටින ප්‍රදේශවල තවමත් යුදහමුදාව බර අවි යොදා ගන්නා බව පෙනෙන්ට වූ විට සිවිල්වැසියන්ට වන හානි තුරන්කිරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කරන බවට වූ ප්‍රචාරය පවත්වාගෙන යාමට ආණ්ඩුවට බෙහෙවින් දුෂ්කර විය. ආරක්ෂක හමුදා බර අවි භාවිත කරන බවට කරන ප්‍රකාශ ප්‍රතික්ෂේප කිරීමේ ප්‍රචාරයේ කේන්ද්‍රිය කාර්යභාරයක් ගෝඨාභය රාජපක්ෂ ඉටු කළ අතර, පසුව දේශීය වශයෙන් පත්කළ උගත් පාඩම් සහ ප්‍රතිසංධානය පිළිබඳ කොමිසම හමුයේ සාක්ෂි දෙමින්:

> *'මා සිතන ඊ ළඟ වැදගත් දෙය බර අවි භාවිතය සීමා කිරීමයි. පසුව ඇරඹූ අදියරවලදී සිවිල් වැසියන් සහ ඉතා කුඩා ප්‍රදේශවූ ප්‍රදේශවල සීමාවන් නිසා අප වක්‍ර ලෙස වෙඩිතැබීම, කාලතුවක්කු, මෝටාර් සහ ගුවන් ප්‍රහාර යොදාගැනීම සීමා කළ යුතු බවට ජනාධිපතිවරයා තීරණය කළ අතර හට පිරිස්වලට ඉලක්ක හඳුනාගෙන වෙඩිතැබීමටත් පෞද්ගලික අවි පමණක් භාවිත කිරීමටත් සිදුවිය. එසේ කිරීමෙන් අපගේ පාර්ශවයට හානි සිදුවූ බව මා පැවසිය යුතු ය.'*

ඔහු පවසා ඇත්තේ දෙමළ සිවිල් වැසියන්ට තුවාල සිදුවීම වැළැක්වීමට ඔවුන් දැරූ උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙස යුද හමුදාවට හානි සිදු වූ බවයි[130].

එසේවුවත් රජය බර අවි යොදා නොගන්නා බව පවසන විට එක්සත් ජාතීන්ගේ විශේෂඥ කණ්ඩායම නිතර ඒවා යොදාගන්නා අවස්ථා දෙකක් පෙන්වා දී ඇත[131]. 2015 එක්සත් ජාතීන්ගේ වාර්තාවද 2009 අප්‍රියෙල් අගභාගයේ තවමත් බරඅවි පාවිච්චි කරන බව වාර්තා කළේය[132]. හියුමන් රයිට්ස් වොච් සංවිධානයද 2009 මැයි මාසයේදී දිගටම බරඅවි පාවිච්චි කිරීමක් වාර්තා කළේය[133]. 2009 මාර්තු[134], අප්‍රියෙල් සහ මැයි[135] යන මාසවලදී ඇමරිකානු රජයද එය රජයටද දන්වා තිබෙන බව විකිලීක්ස් හෙළිකළ ටෙලෙස් පණිවුඩයක දැක්වෙයි[136]. මීට අමතරව, මාස ගණනක් බර අවිවලින් වෙඩි එල්ලවීම් මධ්‍යයේ සිට දිවිගලවාගත් අයගෙන් ITJP සංවිධානය ලබාගත් සාක්ෂි විශාල ප්‍රමාණය අනුව යුද්ධයේ අවසන් දින කිහිපයේදී තරම් පසු අවස්ථාවලදී ඉතා කුඩා ප්‍රදේශයක විශාල ලෙස සිවිල් වැසියන් රැඳී සිටින බව දන්නා හමුදාව ඔවුන්ට එදිරිව මල්ටි බැරල් රොකට් භාවිතයෙන් විශාල පිරිකට හානි සිදුවන්නට ඇත.

---

ප්‍රකාශ කළේ රාජපක්ෂ ආණ්ඩුවේ ඉහළම නිලධාරීන් වන්නියේ සිවිල් ජනයාට සිදුවන හානි ගැන කතා පළ නොකරන ලෙසටත්, ප්‍රවෘත්ති ඒජන්සිවලට සහ මාධ්‍යයට එල්ටීටීඊ නිලධාරීන් දෙන සම්මුඛ සාකච්ඡාවල අන්තර්ගතය නැවත පළනොකරන ලෙසටත් වාචිකව උපදෙස්දීමෙන් පසුව බවයි. උදයන් සහ වාලම්පුරි පුවත්පත් වන්නියේ 'ආරක්ෂිත කලාප' ඇතුළතදී ශ්‍රී ලංකාවේ ප්‍රහාරවලින් ළමයින් මරණයට පත්කිරීමේ ඡායාරූප පළ කරතිබුණි.

130. UNPOE, para 101, PRIU උපුටා දක්වමින්

131. 25 පෙබරවාරි සහ 27 අප්‍රේල් 2009 පිළිබඳ 101 ඡේදය

132. 'අප්‍රියෙල් 27 දා යුද සටන් ඒවාය් නිමාවට ලඟාවී ඇති බවත්' සිවිල් වැසියන්ට හානි සිදුවිය හැකි බර අවි වර්ගයේ අවි, ප්‍රහාරක ගුවන්යානා, සහ ගුවන් අවි භාවිතය අවසන් කරන ලෙස ආරක්ෂක හමුදාවලට උපදෙස්දී ඇති බවත් ආණ්ඩුව නිවේදනය කළේය...එසේවුවත් ෂෙල් ප්‍රහාර නතර කර නැති අතර ඇතැම් මූලාශ්‍ර පැවසුවේ තවත් වැඩි කිරීම් කරන්නට ඇති බවයි.' 91 ඡේදය

133. https://www.hrw.org/news/2009/05/12/sri-lanka-satellite-images-witnesses-show-shelling-continues

134. ආරක්ෂිත කලාපයන්ට ෂෙල් ප්‍රහාර එල්ල කිරීම ගැන විරෝධය කිරීම සඳහා තානාපතිවරයා මාර්තු 12 වැනිදා ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ හමුවීමට නියමිත ය.
https://wikileaks.org/plusd/cables/09COLOMBO277_a.html

135. මැයි 9 සහ 10 ගැටුම් කලාපවල දැඩි ෂෙල් ප්‍රහාරවලින් සිවිල් වැසියන් සිය ගණනක් මිය යන්නට ඇති බවයි. 'දවසේ මුලින් මානුෂවාදී ආහාර පිළිබඳ උපදේශක කාරක සභාවේ රැස්වීමක් ආපදා කළනාකරණ සහ මානව හිමිකම් ඇමති මහින්ද සමරසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් පැවති අතර, ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ සහ ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක බැසිල් රාජපක්ෂද සහභාගිවූ මෙම රැස්වීමේදී, සටන්වලින් උද්ගත වියහැකි මානුෂවාදී විපාක සහ ආරක්ෂිත කලාපයේදී සිවිල් වැසියන්ට විශාල ලෙස හානි සිදුවන බවට පළවී ඇති බවට ඇමරිකාව දක්වන කණස්සල්ල කෙරෙහි අවධානය යොමු කෙරිණ. එය සත්‍ය නම් බර අවි භාවිත කර ඇතැයි කියන කියාපෑම ජනාධිපතිවරයා මැයි 7 දා තානාපති ප්‍රජාවට දුන් ප්‍රතිඥාවඋල්ලංඝනය කිරීමක් බව ඔහු සඳහන් කළේය. ආරක්ෂිත කලාපයේ ආණ්ඩුව බර අවි භාවිත කරන බව සමරසිංහ එකහෙළා ප්‍රතික්ෂේප කළේය'. - https://wikileaks.org/plusd/cables/09COLOMBO514_a.html

136. https://wikileaks.org/plusd/cables/09USUNNEWYORK494_a.html
අප්‍රියෙල් මාසයේදීමඃ 'ආරක්ෂිත කලාපයේ දෙපාර්ශවයම බර අවි භාවිත කරන බවට කැළඹීම් සිදුවන වාර්තා දිගටම තානාපති කාර්යාලයට ලැබෙමින් පවතින බවත්, අප්‍රියෙල් 22 දි උදේ යුද මුක්ත කලාපයේ දකුණු අර්ධයේ ඉහළ කොටසේ දැඩි ලෙස ෂෙල් ප්‍රහාර සිදුවන බවට වාර්තා වූ බවත් තානාපති පැවසීය.'
https://search.wikileaks.org/plusd/cables/09COLOMBO454_a.html
https://wikileaks.org/plusd/cables/09COLOMBO479_a.html

# 2. අවසන් යුද්ධයේ විශේෂ සිදුවීම්

මෙම කොටසින් අවධානය යොමුකරනු ලබන්නේ යුද්ධය අවසානයේදී ඇතිවූ නිශ්චිත සිදුවීම්වලදී ගෝඨාභය රාජපක්ෂ ඉටුකළ කාර්යභාරය සහ ඔහුගේ විධානය අනුව කටයුතු කළ ආරක්ෂක හමුදා විසින් ජාත්‍යන්තර මානුෂවාදී නීතිය සහ ජාත්‍යන්තර අපරාධ නීතිය උල්ලංඝනය කිරීම් ගැන ඔහුගේ දැනුවත්කම කෙරෙහිය. ඉහතින් සුළුවෙන් දැක්වූ පරිදි, සම්ප්‍රදායීය ධුරාවලිය ගර්භාවට ලක්කරමින්, යුදබිමේ ආඥාපතිවරුන්ට කෙළින්ම නියෝග නිකුත්කිරීමට රාජපක්ෂ කටයුතු කළේය. දහස් ගණනක් මරණවලට හේතුවූ මානුෂවාදී අර්බුදය - හාමතය සහ ඔවුන්ගේ දිවිපැවැත්මට අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ලබානොදීම ඇතුළු වන්නියේ සිවිල් ජනතාවට ආහාර සහ බෙහෙත් නොමැතිවීම- පිළිබඳව ඔහු ඉතා හොඳින් දැනසිටියේය. වාර්තා සඳහන් කරන්නේ තවත් සැපයුම් යැවීම වළක්වමින් තිබූ අවහිරතාවයක් වූයේ ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිව ලබාගැනීම අවශ්‍යව තිබීමය- අනුමැතියදීම ගෝඨාභය රාජපක්ෂ ගේ බලතලවලට අයත්විය. 2008 සැප්තැම්බර් මාසයේදී යුද කාලපයෙන් ඉවත්වන ලෙස එක්සත් ජාතීන්ගේ නියෝජිතායතනවලට සහ ආධාර සැපයීමේ යෙදීසිටි කාර්ය මණ්ඩලවලට නියෝගකිරීමේ මතභේදාත්මක තීන්දුව ගෝඨාභය රාජපක්ෂ විසින් ගන්නා ලද දෙයක් පමණක් නොව එය ලිඛිතව සහ වාචිකව රාජ්‍ය නොවන සංවිධානවලට සහ එක්සත් ජාතීන්ට සන්නිවේදනයද කරන ලදී. එක්සත් ජාතීන්ගේ සංවිධාන සහ ආධාර සැපයීමේ යෙදී සිටි සේවකයන් බැහැර කිරීමෙන් සිදුවූයේ ස්වාධීන ජාත්‍යන්තර අධීක්ෂණය සහ විමර්ශන සඳහා ලබාගැනීම හැකියාව එකවර ඉවත්කරමින් විශාල ලෙස ක්‍රෑරකම් කිරීමට මුල පිරීම ය.

### නැගෙනහිර

ගෝඨාභය රාජපක්ෂ ආරක්ෂක ලේකම්වරයාව සිටියදී පළමුවෙන් නැවත යුද්ධය ආරම්භවූයේ ශ්‍රී ලංකාවේ නැගෙනහිරිනි. 2006 දී ඔහු වැඩ බාරගෙන කෙටි දිනකින් නෝර්වේ සටන්විරාම මැදිගත්කරුවන් ගෝඨාභය මුණගැසුණු අතර, මෙම හමුවේ වාර්තා පෙන්නුම් කළේ ඔහු දැනටමත් හමුදා විසඳුමකට සූදානම් වන බවයි[137]. නැගෙනහිර සටන් කිරීම 2008-9[138] උතුරේ හමුදා මෙහෙයුම සඳහා පෙර පුහුණුවක් වූ අතර ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට අන්තර්ජාතික වශයෙන් විශාල විවේචනයක් නොතිබිණ. නැගෙනහිර කඳවුරුවල සහ රෝහල්වල සිටි සිවිල්වැසියන්ට[139] හමුදාව විසින් වෙඩිතැබීම[140] 2009 උතුරේ ප්‍රහාරවලට පූර්ව නිමිත්තක් විය. වාකරෙයි යුද්ධය පිළිබඳව ලියූ ජේ.එස්. තිස්සනායගම් වැනි මාධ්‍යවේදීන් පසුව රඳවාගෙන ඒ සම්බන්ධයෙන් ඔවුන් ලියූ දේවල් ගැන චෝදනා ඉදිරිපත් කරන ලදී[141]. 'සිවිල්වැසියන්ට හානි සිදුවීම තුරන්කිරීම' සටන්පාඨය හමුදාව විසින් පළමුවෙන් නැගෙනහිර[142] කළ යෙදුමක් වූ අතර එය අභියෝගයට ලක්නොවී

137. '2006 අප්‍රියෙල් 6 දා , හැන්සන් බවර් සහ බ්‍රැට්ස්කර් යන දෙදෙනා ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ සමඟ උණුසුම් අදහස්වීමක් පැවැත්වූහ. ශ්‍රී ලංකාවේ වාර්ගික සහ දේශපාලන ප්‍රශ්න හමුදා ක්‍රියාමාර්ගවලින් විසඳිය හැකිදැයි නැගූ ප්‍රශ්නයට ගෝඨාභයගේ පිළිතුර ද වූයේ 'ඔව්' යන්නයි.
https://www.oecd.org/countries/srilanka/49035074.pdf

138. 'නැගෙනහිර අල්ලා ගනිමින් උගත් පාඩම් පසුව උතුරු මෙහෙයුම ගැඩගස්වා ගැනීමට උපකාරී වූ අතර එයින් හමුදාවේ සාර්ථකත්වය ගැන හමුදා ආඥාවන්ට මහා විශ්වාසයක් ගෙන දුන්නේය. උතුරු මෙහෙයුමේදී සිදුවිය යුතු ආකාරයට, ආණ්ඩුව නැගෙනහිර මෙහෙයුම මානුෂවාදී ක්‍රියාන්විතයක් ලෙස ඉදිරිපත් කර සිවිල් ජනයාට වන හානි වැළැක්වීමට හමුදා සැලසුම් සකස්කර ඇතැයි දැඩි ලෙස ප්‍රකාශ කළේය'. §69 OISL එසේවුවත් ජනතාවට වන හානි අඩු මට්ටමක තබාගැනීම සම්බන්ධයෙන් ඇමරිකානු රජය හමුදාව පැසසුමට ලක්කළේය. එය උතුරේදී මහා පරිමාණයෙන් එම උපක්‍රමම නැවත කිරීමට රිට් ආඥාවකට මගපෑදීය. 'තානාපතිවරයා ආරම්භක ෂෙල් ප්‍රහාරයෙන් පසුව එවන් අඩු සිවිල් ජනයාට හානියක් වන අයුරින් සාර්ථක මෙහෙයුමක් කිරීම ගැන ලේකම්වරයාට ප්‍රශංසා කළේය.'
https://wikileaks.org/plusd/cables/07COLOMBO214_a.html

139. https://reliefweb.int/report/sri-lanka/over-100-civilians-dead-and-injured-school-and-hospital-hit-sri-lankan-army-attack

140. 'මෙම ප්‍රහාරය සම්බන්ධයෙන් Human Rights Watch සංවිධානය සාක්ෂිකරුවන් 12 දෙනෙකු සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීය. අනතුරු පූර්ව හැඟවීමකින් තොරව ෂෙල් වෙඩි පතිත වූ බව පැවසූ අතර එල්ටීටීර්ය නිතරම එම ප්‍රදේශයේ සැරිසරුවත්, ප්‍රහාරය එල්ලකරන විට හෝ ඊට පෙර අභ්‍යන්තර සරණාගතයන්ගේ කඳවුරු ඇතුළත හෝ ආසන්නයේ එල්ටීටීර් සටන්කරුවෝ නොවූහ. කඳවුරු ප්‍රදේශයෙ එල්ටීටීර් කාවල් තිබුණද එය අවතැන්වූවන්ගේ යාම ඊම නිරීක්ෂණයට විය හැකි බව ඔවුන් කීවද, එල්ටීටීර්යේ ළඟම හමුදා කඳවුර කිලෝ මීටර් දෙකක් පමණ ඇතින් වෙරලේ පිහිටි සින්නකාන්ගයි කදවුර විය. එදින වේලාසනින් මෙම ප්‍රදේශයේ සිට පිටතට ෂෙල් ප්‍රහාර එල්ලකිරීමක් සම්මුඛ සාකච්ඡාවට එක්වූ කිසිවෙකු දැක හෝ අසා නැත."
https://www.hrw.org/reports/2007/srilanka0807/4.htm

141. 'තිස්සෙයිනායගම්ට එරෙහි චෝදනාවල කොටසක් වන්නේ නැගෙනහිර පළාතේ වාහරෙයි හමුදා මෙහෙයුම ගැන 2006 නොවැම්බර් මාසයේ ලියූ ලිපියක් ඇතුළත්විය. එම ලිපියෙන් පවසා ඇත්තේ 'වාහරෙයි ජනතාව ඉන් පිටතට පළවා හැර එය ජනතාව නැති ප්‍රදේශයක් බවට පත්කිරීමේ අපේක්ෂාවෙන් ජනතාවට ආහාර, බෙහෙත් මෙන්ම ඉන්ධන නොසපයා ඔවුන් හාමතේ තැබීමේ උත්සාහයන්ද මෙවැනි සිවිල් ජනතාවට එරෙහි ආක්‍රමණවල සමඟ ඇත යනුවෙනි'. මෙම කතාව ලියන විට වාහරෙයි තිව්‍ර කාලකුවක්කු සහ ගුවන් ප්‍රහාරවලට ලක්වෙමින් තිබිණි.'
https://www.hrw.org/news/2009/01/22/letter-president-mahinda-rajapakse-sri-lanka-free-journalists-unfairly-held

142. අපට කරුණු ඉදිරිපත් කළ, බ්‍රිගේඩියර් ජෙනරාල් ආර්.එම්.ඩී. රත්නායක, යුද හමුදාවේ 23 බලසේනාපති, අවධාරණය කළේ හමුදාවේ අරමුණ 'සිවිල් ජනයාට වන හානි තුරන්කිරීම' බවයි. '(සටහන: තානාපතිවරයා ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ සමඟ ශ්‍රී ලංකා රජය නොබෝදා යෙදුණු සෙසු ක්‍රියාන්විතවලදී අඩුකර තිබූ සිවිල්

ගියේය.

එවකට සිටි නාවික හමුදාපති වසන්ත කරන්නාගොඩ ලියූ පොතක් අනුව, 2006 අගෝස්තු - සැප්තැම්බර්වලදී නැගෙනහිර සාම්පූර් (සටන්විරාමය නොසලකා බියසැක නැතිව[143]) ප්‍රහාරයට අණ දුන්නේ ගෝඨාභය රාජපක්ෂ ය. ආණ්ඩුවේ විශ්වාසය වූයේ සාම්පූර් එල්ටීටීඊ පාලනයේ පැවතීම රටේ ඉතා වැදගත්ම නාවික කඳවුරට අනතුරුදායක බවයි. 2006 දී සාම්පූර්වලට ප්‍රහාර එල්ල කිරීමට එල්ටීටීඊයෙන් කැඩීගිය කරුණා යටතේ වූ අතුරු සන්නද්ධ කණ්ඩායම් යොදාගන්න ලෙස ගෝඨාභය රාජපක්ෂගෙන් නියෝග ලැබුණ බව සිහිකරන කරන්නාගොඩ යුද හමුදාවේ 22 බලසේනාවේ ආඥාපතිටද ගෝඨාභය කෙළින්ම නියෝග නිකුත් කළ බව ද පවසයි.[144]

## උතුර

### මන්නාරම දිස්ත්‍රික්කයේ මඩු

2006 මැයි මාසයේදී, ගෝඨාභය රාජපක්ෂ වෙත ලියමින් කතෝලික සභාව හමුදාවේ දිගු දුර විහිදුම් ඒකක (ාeep penetration units) බටහිර වෙරළේ රටේ ඉතා පූජනීය කතෝලික දේවස්ථානය පිහිටි මඩු ප්‍රදේශයේ සිවිල් ජනතාවට ක්ලේමෝ යොදා ගනිමින් ප්‍රහාර එල්ල කිරීම ගැන ඔහුට අනතුරු අඟවා සිටියේය.[145] මෙම අනතුරු ඇඟවීම් කළත්, මන්නාරම දිස්ත්‍රික්කයේ සිවිල් සහ එල්ටීටීඊ ඉලක්ක වෙත නිරන්තර ප්‍රහාර එල්ල වීම සිදුවිය.[146] මෙම ප්‍රහාර ශ්‍රී ලංකා යුද හමුදාවේ උතුරේ සටන්වල ආරම්භයේදී සිදුවී ඇති නිසා ඒ එකක් ගැනවත් විමර්ශන කර නැති අතර අද දක්වා ජාත්‍යන්තර පරීක්ෂණවල අවධානය යොමු වී ඇත්තේ 2009 ක්‍රෑර අවසන් මාස වෙත ය.

572 සේනාංකයට[147] එම කාලයේ කර්නල් ජී.වී. රවිප්‍රිය නායකත්වය දුන් 571 සේනාංකයේ සහාය ඇතිව මන්නාරම දිස්ත්‍රික්කයේ මඩු[148] අල්ලාගැනීමේ කාර්ය පැවරුබව වාර්තා විය. මෙම සේනාංක දෙකේ අණදෙන නිලධාරීන් කෙළින්ම ජගත් ඩයස්ට වාර්තා

---

ජනයාට වන හානි වැළැක්වීමට මෙහිදීද විශේෂ ක්‍රියා මාර්ග ගන්නා ලෙස ඉල්ලා සිටීමට වාහරෙයි ක්‍රියාන්විතය කාලයේදී වෙන වෙනම අවස්ථා තුනකදී තත්වය විමසා බැලූ වේය.'
https://wikileaks.org/plusd/cables/07COLOMBO302_a.html

143. Sri Lanka: LTTE's moment of truth at Sampur - Update 101, South Asia Analysis Group, By Col R Hariharan (retd.) 1987-90 ශ්‍රී ලංකාවේ රැඳී සිටි ඉන්දීය සාම සාධක හමුදාවේ බුද්ධි සේවා ප්‍රධානියා වශයෙන් කටයුතු කලේ මෙකී කර්නල් හරිහරන් ය.
https://web.archive.org/web/20070706090043/http://www.saag.org//notes4/note331.html

144. 'ඊ ළඟ දවසේ මම ආරක්ෂක ලේකම් හමුවෙන්න ගියා.
'සර් සාම්පූර්වලට බෝම්බ දැමීම නිසා සුළු ප්‍රශ්නයක් තියෙනවා.'
'ඔබ නොවේද සාම්පූර්වලට බෝම්බ දමන්න කියූ පුද්ගලයා.?'
'සර් එල්ටීටීඊය දන්වා, යුද්ධය ආරම්භ කළොත් අපි පළමුවෙන් සාම්පූර්වලට පහරදෙන බව. ඒ නිසා ප්‍රදේශයේ තත්ත්වය තහවුරුකරගැනීමට ඔවුන් උත්සාහ කරයි. සර් මට අවසර දෙනවා නම්, මට ත්‍රිකුණාමලයට ගොස්, එල්ටීටීඊයට සාම්පූර් අස්ථායි කරන්න එල්ටීටීඊයෙන් කැඩුනු අපේ මිතුරන් යොදා ගන්න පුළුවන්.'
'වසන්ත, ඔබේ යෝජනාව හොඳයි. ඒක කරන්න. ඔබට අවශ්‍ය සහාය දෙන්නැයි මම ත්‍රිකුණාමලයේ 22 වැනි බලසේනාවේ අණදෙන නිලධාරිට ( 22 බලසේනාවේ ආඥාපතිට) කියන්නම්'.
'ස්තුතියි සර්'.
- පිටුව 279, අධිෂ්ඨානය (Adhishtanaya) අද්මිරාල් වසන්ත කරන්නාගොඩලියූ මතකයන්.

145. https://lrrp2.wordpress.com/2006/05/31/stop-madhu-attacks-mannar-bishop/
'ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ ට ලියූ රායප්පු ජෝශප් රදගුරුතුමා සිවිල් වැසියන් මරණයට පත්කරමින් කැලෑ ප්‍රදේශයේ සිට ක්ලේමෝ බෝම්බ ප්‍රහාර සිදුකර ඇතැයි පැවසීය.ගතවූ සතිය තුළ ක්ලේමෝ ප්‍රහාර වලින් සිවිල් වැසියන් 6 දෙනෙකු මියගොස් ඇති බව රදගුරුතුමා පැවසීය.' රක්ෂිත ප්‍රදේශයේ මිලිටරි ප්‍රහාර සිදුනොවන බවට වගබලා ගන්නා ලෙස මම ආරක්ෂක ලේකම්වරයාගෙන් ඉල්ලීමක් කළා, රායප්පු ජෝශප් රදගුරුතුමා කීවේය.
**දිගදුර විහිදුම්:** ශුද්ධ භූමියක් ලෙස සලකන මඩු දේවස්ථානයට වසර පුරා බොහෝ වන්දනාකරුවෝ පැමිණෙති. එල්ටීටීඊය ක්ලේමෝ ප්‍රහාර වලට වගකිව යුතු බව ප්‍රකටව පවතින හෙයින් ආරක්ෂක ලේකම් ලිව්වේ කළේ මන්දැයි විමසූ විට ඔහු පැවසුවේ මෙම ප්‍රහාරවලට යුද හමුදාවේ දිගදුර විහිදුම් ඒකක වගකිව යුතු බවයි. 'මේ ප්‍රදේශයේ යුද හමුදා කොමාන්ඩෝ භටයන් මට දැන්වූවා තමන් මෙම ප්‍රහාර සිදුනොකරන බවත් ආරක්ෂක අමාත්‍යාංශයෙන් ඍජු උපදෙස් ලබන කැලෑවේ ගැවසෙන දිගදුර මෙහෙයුම් ඒකක මෙම ප්‍රහාරවලට වගකිය යුතු බවයි.'

146. රදගරුතුමා ආරක්ෂක ලේකම්ට අනතුරු ඇඟවීමෙන් පසුව වාර්තා වූ සිද්ධි තෝරා ගැනීමක් (මාධ්‍ය මූලාශ්‍ර සහ ITJP සාක්ෂි ප්‍රකාශ) :
**29 අප්‍රියෙල් 2006:** ශ්‍රී ලංකා යුද හමුදාවේ දිගදුර මෙහෙයුම් ඒකකයේ ක්ලේමෝ බෝම්බ ප්‍රහාරයකින් දමිළ තැනැත්තෙක් තුවාල ලබා මියගිය බව TamilNet වාර්තා කළේය.
**22 මැයි 2006:** ශ්‍රී ලංකා යුද හමුදාවේ දිගදුර මෙහෙයුම් ඒකකයේ ක්ලේමෝ බෝම්බ ප්‍රහාරයකින් දෙදෙනෙකු මියගිය බව TamilNet වාර්තා කළේය
**අගෝස්තු හෝ සැප්තැම්බර් 2007:** නෙදුන්කර්නි රෝහල භාර වෛද්‍යවරයා ක්ලේමෝ ප්‍රහාරයකින් මියගියේය. ඔහු ගිලන්රථයක සිටි අතර ඔහුගේ රියැදුරු, වෛද්‍ය කාර්ය මණ්ඩලයේ දෙදෙනෙක් සහ සිවිල් රෝගීහු දෙදෙනෙක් ද මියගියහ..
**29 ජනවාරි 2008:** අවුරුදු 6- 15 අතර වියෙහි පාසල් ළමයින් 50 දෙනෙකු පමණ රැගත් මන්නාරමේ ගමන් කරමින් තිබූ බස් රථයකට මඩු ආසන්නයේදී ක්ලේමෝ ප්‍රහාරයක් එල්ල විය. සෑම ළමයෙක්ම පාහේ මරණයට හෝ තුවාල ලැබීමට ගොදුරු විය. 30 දෙනෙක් පමණ මියගියහ.
**ඇමරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තුවද එම සිදුවීම වාර්තාකරයි:** ජනවාරි 28 දා පාසල් ළමයින් 9 දෙනෙකු ඇතුළු 17 දෙනෙක් එම වේලාවේදී එල්ටීටීඊ පාලනය යටතේ පැවති මඩු ප්‍රදේශයේදී පක්ලේමෝ ප්‍රහාරයකින් මියගියහ. යුද හමුදාව මෙම ප්‍රහාරය පිටුපස සිටින බව පැවසීම හමුදා ප්‍රකාශක ප්‍රතික්ෂේප කළේය.
**ආසන්න වශයෙන් ජූනි 2008:** මුලන්ගාවිල් රෝහලේ සිට පල්ලමඩම් රෝහල කරා ගමන්කරමින් සිටි රෝගියෙක් අනිත් පැත්තෙන් පැමිණි වෑන් රථයක් ක්ලේමෝ ප්‍රහාරකින් විනාශ වනු දුටු බව කීය. ජ්‍යෙෂ්ඨ එල්ටීටීඊ සාමාජිකයෙකු සහ සිවිල් වැසියන් ඇතුළු 3 දෙනෙක් මියගියහ..
**2008 අග:** තුනුක්කායි වෙල්ලම්කුලම් අතර දී, වෛද්‍යවරයෙකුගේ වාහනයක් ක්ලේමෝ පහරදීමට ලක්වීමෙන් එහි ගමන්කරමින් සිටි කතෝලික පූජකවරයෙක් සහ වෛද්‍ය කාර්ය මණ්ඩලයේ එක් අයෙක් මියගියහ. රියැදුරු සහ සහ වෛද්‍ය කාර්ය මණ්ඩලයේ එක් අයෙක් තුවාල ලැබූහ. රියදුරු කුමාර් බරපතල තුවාල ලබා ඇත.
**27 නොවම්බර් 2008:** කිලිනොච්චියේ නිරිතදිග පැත්තෙහි ඉයන්ගන්කුලම් ආසන්නයේදී ක්ලේමෝ ප්‍රහාරයක් සිදුවිය. එදින එල්ටීටීඊයේ මහවිරු දිනයයි. රාජ්‍ය නොවන සංවිධානයකින්, (Health Development Council), ප්‍රථමාධාර සේවකයන් 13 හෝ 14 ක් ප්‍රවාහනයකරමින් තිබූ ගිලන් රථයක් ; ඔවුන් එල්ටීටීඊ යට සම්බන්ධ නැති බවවාර්තා විය. ප්‍රථමාධාර සේවකයන් ඇතැම් අය පාසල් ළමයි වූහ. 11 දෙනෙක් මියගියහ. දිවි බේරුණේ එක් අයෙකුගේ හෝ දෙදෙනෙකුගේ පමණි.

147. 572 හි එම කාලයේ අණදෙන නිලධාරි කර්නල් සෙනරත් බණ්ඩාර ජනමාධ්‍යවේදියෙකුට පසුව පවසා ඇත්තේ 'අපි අප්‍රියෙල් 25 දා මේ ප්‍රදේශය මුදා ගත්තා. ඒත් එම ප්‍රදේශය සම්පූර්ණයෙන්ම ත්‍රස්තවාදීන්ගෙන් නිදහස් බව සහතික කරන ලෙස යුද හමුදාපතිගෙන් සහ වන්නි ආරක්ෂක හමුදා ආඥාපති මේජර් ජෙනරාල් ජගත් ජයසූරියගෙන් අපට උපදෙස් ලැබී තිබුණ හෙයින් එය ප්‍රකාශයට පත් කිරීමට තවත් පැය 72 ක් ගතවුණා.' - *අපගේ හමුදා නිලධාරීන් මඩු පල්ලිය ත්‍රස්තවාදීන්ගෙන් මුදාගැනීමට දුන් ප්‍රතිඥා දුන් කල්හි* - ශානිකා ශියානන්ද, Sunday Observer, 9 August 2009

148. එම.
එමෙන්ම, උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිසමේ වාර්තාව(LLRC,

කළ අතර ගෝඨාභය රාජපක්ෂට අනුව,ත්‍රිවිධ හමුදාපතිවරුන් දක්වා විධාන දාමය මනා ලෙස ක්‍රියාත්මක විය[149].

සේනාංකයේ අණදෙන නිලධාරීහු 2008 අප්‍රියෙල් 24 දා මඩු දේවස්ථානය අල්ලා ගත්හ[150]. එම දේවස්ථානයට හෝ දේවස්ථානයේ සිට වෙඩිතැබීම්වලින් මෙම ඓතිහාසික දේවස්ථානය උපද්‍රවයට ලක්වන බවට එල්ටීටීඊ ය සහ ශ්‍රී ලංකා යුද හමුදාව එකිනෙකාට චෝදනා කළහ. සටන් දේවස්ථානය ආසන්නයට ළඟාවන විට සිවිල් වැසියන් ඉවත්කරගැනීම සිදුවූ නමුත් පූජකවරු මාහැඟි මඩුමාතා පිළිරුව රැකගැනීමට එහි රැඳී සිටියහ. සටන් දරුණු වන නිසා[151] බංකර්වල සැඟවෙන ලෙසට බලකිරීම් සිදුවූ බව ඔව්හු පවසති. එසේ වුවත් පසුව ගෝඨාභය රාජපක්ෂ ජගත් ඩයස් ගත් ක්‍රියා මාර්ග අනුමත කළේය:

*'ජෙනරාල් ජගත් ඩයස් 75 බලසේනාවට නායකත්වය දුන්නේය; කිලිනොච්චිය යළි අත්කර ගැනීම ඔහුගේ වගකීම වූ හෙයින් ඔහු විශාල කාර්යභාරයක් ඉටු කළේය. මානුෂවාදී මෙහෙයුම ආරම්භයේ සිට අවසන් මිනිත්තුව දක්වා ඔහු එහි සිටියේය.'* [152]

**කොළඹ**

2007 ජූනි මාසයේදී කොළඹ ලැගුම්හල්වල සිටි ද්‍රවිඩ ජාතිකයෝ සිය ගණනක් හදිසියේ පොලිස් ආරක්ෂාව මධ්‍යයේ බස්රථවලින් දිවයිනේ උතුරු නැගෙනහිර පළාත් කරා ගෙනයන ලදහ[153]. කොළඹ දෙමළ ප්‍රදේශවල ලොජ්වලට ඇතුළු වූ සන්නද්ධ පොලිස් නිලධාරීන් 376 දෙනකු (පිරිමි 291/ගැහැනු 85 ක්) පිටමං කරන ලදී.[154] ගෝඨාභය රාජපක්ෂ මෙම ඉවත්කිරීම අනුමත කළා පමණක් ඇත්ත වශයෙන්ම ඒවාට නියෝග කළ බව නොව වාර්තාවලින් පෙන්නුම් කෙරේ[155]. උසාවියේ මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කළ නමුත් අග්‍රාමාත්‍යවරයා කණගාටුව පළකිරීම සහ කොළඹින් දෙමළ ජාතිකයන් ඉවත්කිරීමට හෝ කොළඹට ඇතුළුවීමට සහ කොළඹ ඕනෑම කොටසක නතරවී සිටීම වැළැක්වීමට කිසිම ක්‍රියාමාර්ගයක් නොගන්නා ලෙස පොලිස්පතිවරයාට නියෝග කරමින් ශ්‍රේෂ්ඨාධිකරණය ඒ වනවිටත් අතුරු තහනම් නියෝගයක් නිකුත් කර ඇති නිසාත් අර්ධ වශයෙන් ප්‍රශ්නය නිරාකරණයවී ඇති බව දක්නට ලැබිණ[156].

එසේ කණගාටුව පළකර තිබුණත්, වසරකට පසුව, 2008 සැප්තැම්බර් මාසයේදී ගෝඨාභය රාජපක්ෂ රජයේ පුවත්පතකට පවසා තිබුණේ කොළඹ ලොජ්වල සහ වෙනත් ස්ථානවල ජීවත්වන දෙමළ ජාතිකයන් දහස් ගණනක් ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නයකට හේතුවන බැවින් ශ්‍රී ලංකාවේ නැගෙනහිර ඔවුන්ගේ ගම්බිම් බලා ආපසු යා යුතු බවයි.[157]

---

2011) (a government-appointed Commission) places some of the 57 Division in Madhu. Para 3.13.

149. 'කාර්ය සාධක බලකාය 1 මන්නාරම - පූනරීන් පෙරමුණේත්, 57 බලසේනාව මඩු - තුනුක්කායි පෙරමුණේත්, කාර්ය සාධක බලකාය 2 මාන්කුලම් අක්ෂයේත්, 59 බලසේනාව වැලිඔය අක්ෂයේත් ක්‍රියාන්විතයේ යෙදී සිටියා. ඊට අමතරව සතුරාට නිරතුරුව තර්ජනය කරමින් අපි මුහමලෙයි සේනාංක දෙකක් ස්ථානගත කර තිබුණා; මෙම කාලය තුළ ත්‍රිවිධ හමුදාවේ කොමාන්ඩෝ බලකායන්ගේ කාර්යභාරය ඉතා වැදගත් විය. මෙය සිය වෘත්තියේදී ආරම්භයේ සිට සතුරාට මුහුණදී ඇති හමුදාපතිවරුන් අපට සිටි පළමු අවස්ථාව මෙයයි. ඔවුන් සියලු දෙනාම ප්‍රධාන මෙහෙයුම්වල කොටස්කරුවන් වී අත්දැකීම් සහ එම දැනුම සමීකරණය කොටගෙන තිබේ. ඔවුනට සටන නිවැරදිව කියවාගන්නට හැක විය. උපරිම විශ්වාසය සජ්ජිත ඉහළ අභිප්‍රේරණයක් ඇති ඔවුන් සියල්ලන්ම දැඩි හා සුවිශේෂී නිපුණතාවලින් යුක්ත ය. ඔවුන්ට පහළ. ඔවුන්ගේ යටත් නිලධාරීන්ගේ හැකියාවන් ගැන ඔවුන්ට මනා අවබෝධයක් තිබූ හෙයින් විශේෂිත කාර්යයන් ඉටුකිරීමට සුදුසු නිලධාරීන් තෝරා ගැනීමට හැකිවිය.' (ගෝඨාභය රාජපක්ෂ) MAN BEHIND THE COUNTRY'S DEFENCE STRATEGY" Business Today interview with Gotabaya Rajapaksa' - ගොණුගත ලේඛන

150. Madhu where the LTTE began its retreat, Shamindra Ferdinando, 14 JUNE 2011, THE ISLAND NEWSPAPER. The offensive involved 572 Brigade Commander Lt. Col. Senarath Bandara, 7 CLLI Lt. Col. Ranjith Abeywardena, 10 CLLI Lt. Col. Jagath Kodditowakku and 7SR Lt. Col Kithsiri Liyanage, according to: When four military officers vowed to free Madhu Church of terrorists, Shanika SRIYANANDA, Sunday Observer, 9 August 2009 - 57 සේනාංකය විසින් මඩු මුදා ගැනීම වන්නි පෙරමුණේ යුද හමුදා අත්කරගත් පළමුවැනි විශාල ජයග්‍රහණයයි. - එම.

151. 'Shell fire hits Madhu Shrine', Amantha Perera, Sunday Leader, - ගොණුගත ලේඛන

152. Military transformed from victor to reconciler, Dhaneshi Yatawara, 8 Sep 2013, The Sunday Observer Lanka, - http://archives.sundayobserver.lk/2013/09/08/sec03.asp Defence Secretary Gotabaya Rajapaksa Salutes The War Heroes, https://businesstoday.lk/defence-secretary-gotabaya-rajapaksa-salutes-the-war-heroes/

153. ඇමරිකාව බලාත්කාරයෙන් දෙමළ මිනිසුන් ඉවත්කිරීම හෙළාදකී, 8 ජූනි 2007, https://web.archive.org/web/20091105131731/ http://srilanka.usembassy.gov/pr-08june2007.html

154. 28.29, https://www.refworld.org/pdfid/4a55cf0d2.pdf

155. 'අපි අපම ආරක්ෂාවිය යුතුය. මම කතා කරන්නේ ත්‍රස්තවාදීන් ගැන. ඕනෑම දෙයක් සාධාරණයි' - ගෝඨාභය 2007 ජූනි මතභේදය ගැන Reuters සහ BBC ප්‍රවෘත්ති සේවාවන්ට පැවසීය. 'බාහිර පුද්ගලයන් කොළඹින් පිටව යා යුතුයි,' ආරක්ෂක ලේකම් කියයි TamilNet - 13 Sep 2008. - https://www.tamilnet.com/art.html?catid=13&artid=26933 "පසුගිය වසරේ ජූනි 4 දා කොළඹ, සමස්ත මෙහෙයුම් අණදෙන මධ්‍යස්ථානයේ පැවති රහස්‍ය සාකච්ඡාවකදී, ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ කොළඹ ලොජ්වලින් දෙමළ ජනයා ඉවත් කිරීමට පෞද්ගලිකව නියෝග කළේය....පසුගිය සතියේ ඉරිදා ලංකාදීප පුවත්පතට සම්මුඛ සාකච්ඡාවක් දුන් ගෝඨාභය රාජපක්ෂ තවදුරටත් බලවත් විරෝධය පළ කළේය. ඔහු පැවසුවේ 'කොළඹ ලක්ෂ ගණනක් දෙමළ ජනතාව වාසය කරනවා. අපි ආපසු යැව්වේ වලංගු හේතුවක් නැතිව කොළඹ සිටි 300 ක් දෙනායි.' Meet Gota - the 'Ugly American' 27 JAN 2008 - SUNDAY LEADER" ගොණුගත ලේඛන

156. එම, 28.28 ඡේදය

157. බාහිර පුද්ගලයන් කොළඹින් පිටව යා යුතුයි, ආරක්ෂක ලේකම් කියයි - TamilNet, Saturday, 13 September 2008. https://www.tamilnet.com/art.html?catid=13&artid=26933

## 1. මානුෂවාදී ආධාර

මානුෂවාදී ආධාර පිලිබඳ උපදේශක කාරක සභාව ගැටුම් පවතින ප්‍රදේශවල මානුෂවාදී තත්වය පිරිහෙමින් පවතින බව ගෝඨාභය රාජපක්ෂ හොඳින් දැනසිටියේය. ඔහු උගත් පාඩම් සහ ප්‍රතිසංධානය පිළිබඳ දේශීය කොමිසම ඉදිරියේ සාක්ෂි දෙමින් 'මානුෂවාදී ආධාර පිළිබඳ උපදේශක කාරක සභාවේ පළමුවැනි රැස්වීම ආරක්ෂක අමාත්‍යාංශයේදී[158] (2006 ඔක්තෝබර් 14 දා ) පැවැත්වූ බවත්, දෙසතියකට වරක් බැගින් මෙම රැස්වීම් පැවැත්වූ බවත්' කීවේය. ඔහු වැඩිදුරටත් පැවසුවේ 'මෙම කාරක සභාවට රජයේ පැත්තෙන් සැම අවස්ථාවකදීම ආරක්ෂක ලේකම් පැමිණ සිටියේය,' යනුවෙනි. එම රැස්වීම්වලට අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයා ඇතුළත්වූ අතර එයින් අදහස්වන්නේ මතභේදයට පාත්‍රව තිබූ මහා ආහාර අනාරක්ෂිතතාවට හා තුවාල ලැබූවන්ට හානි පැමිණවීමට තුඩුදුන් වන්නියට ඇතුළු වූ ආහාර සහ බෙහෙත් ද්‍රව්‍ය ප්‍රමාණය ගැන ඔහු හොඳින් දැනසිටි බවයි. ඊට අමතරව එක්සත් ජාතීන්ගේ සහ රාජ්‍ය නොවන සංවිධානවල පුළුල් පරාසයක නිලධාරීන් සහ රාජ්‍ය තාන්ත්‍රිකයන් ඊට සහභාගිවූ බවද ඔහු පවසයි.[159]

*මානුෂවාදී ආධාර පිළිබඳ උපදේශක කාරක සභාව ගැන තවත් වැදගත් සාධකයක් වන්නේ, කොමිසමේ සෑම රැස්වීමකම වාර්තා තබා ඇති බවයි. විමසා බැලිය හැකි ඉතා වැදගත් ලෙස ඔබට දැකිය හැකි වන්නේ, මේ දේවල් සම්බන්ධයෙන් අප කෙතරම් පුළුල් ලෙස සාකච්ඡා කර මුල් ආරම්භයේ සිටම ඒවා සපුරාලීමට අවධානය යොමු කළ ආකාරයයි. එය සති දෙකක් පමණක් නොව 2006 ආරම්භයේ සිට අවසානය දක්වා අපි ක්‍රමවත්ව හමුවී සාකච්ඡා කර නැගෙන ප්‍රශ්නය කුමක් වුවත් මෙම රැස්වීම්වලදී ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන ඇත.*

මානුෂවාදී ආධාර සඳහා ප්‍රවේශය ප්‍රතික්ෂේප කිරීමේදී මුලසිටම ගෝඨාභය රාජපක්ෂ ප්‍රමුඛ කාර්යභාරයක් ඉටුකර ඇති බව පැහැදිලිය.- විකිලීක්ස් එක්සත් ජනපද තානාපති කාර්යාලයේ ටෙලෙක්ස් පණිවුඩයකින් 2006 නොවැම්බර් ද්වි පාර්ශවික ආධාරදායකයන්ගේ රැස්වීම් පිළිබඳ සහ මානුෂවාදී ආධාර පිළිබඳ උපදේශක කරක සභාවේ රැස්වීම වාර්තා කර තිබුණි. එහි ප්‍රකාශ වූයේ:

*ද්වි පාර්ශවික ආධාරදායකයන්, එක්සත් ජාතීන්, ජාත්‍යන්තර රතු කුරුස කමිටුව, සහ යුරෝපීය සංගමය එල්ටීටීඊ අණසක පැවති ප්‍රදේශවලට සහ යාපනයට ඇති එම ප්‍රවේශය වැඩිකිරීමට පීඩනයක් ඇති කළත්, ආරක්ෂක ලේකම් අකමැත්තෙන් පසුවිය.*

ඊට අමතරව, යුද කලාපයට වැඩිපුර බෙහෙත් යවන ලෙසට ඉල්ලා එක්සත් ජාතීන් ගේ සංවිධානය යැවූ ලිපියක පිටපතක් ගෝඨාභය රාජපක්ෂ වෙතද යවා තිබුණි. එවැනි එක් ලිපියක ිප්‍රතිජීවක ඖෂධ, තුවාළවලට බෙහෙත් දැමීමට අවශ්‍ය ද්‍රව්‍ය, මැසීම්, සහ විෂබීජනාශක වල හදිසි අවශ්‍යතා හඳුනාගෙන තිබුණි[160]. වන්නියේ වෛද්‍යවරුන්ද 2009 ජනවාරියේ පමණ, ශ්‍රී ලංකා රජයට, එක්සත් ජාතීන්ට, ජාත්‍යන්තර රතු කුරුස කමිටුවට සහ ජාත්‍යන්තර ප්‍රජාවට වෛද්‍ය සැපයුම් ඉල්ලා ආයාචනය කරමින් ලිපි යවා එම සැපයුම් පැය 24 ක් තුළ එහි ළඟා නොවුවහොත් තුවාලකරුවන්ගෙන් බොහෝ දෙනකු මියයන බවට අනතුරු අඟවා තිබුණි[161]. එම සැපයුම් හිගයක් ඇතැයි නොදැන සිටි බව රජය පසුව ප්‍රකාශ කළත්, 2015 දී එක්සත් ජාතීන් ගේ සංවිධානය කළ විමර්ශනයකදී (OISL - දී994) හෙළිවී ඇත්තේ, 'ආහාර හිගය සහ යුද කලාපයේ සිවිල් ජනතාවගේ තත්වය යන ගැටළු ගැන එක්සත් ජාතීන්ගේ සංවිධානය, මානුෂවාදී සංවිධාන සහ රාජ්‍යනොවන සංවිධාන රහස්‍ය

158. ඊට පසුව ආරක්ෂක අමාත්‍යාංශයේදී , 'ආරක්ෂක අමාත්‍යාංශයේදී සෑම රැස්වීමක්ම පැවැත්වූ නිසාත්, ඒවා ඇමතිවරයාගේ මූලිකත්වයෙන් පැවති නිසාත් මම සහභාගිවුනා. එයට හේතුව බොහෝ කරුණු මිනිස්සුන්ට යන්න ඉඩදීම නැත්නම් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය යැවීමට ඉඩදීම හෝ ඉවත්කර ගැනීම ආදී ආරක්ෂක අමාත්‍යාංශයට අදාළ වීමයි'
OISL §106 තවදුරටත් පවසනවා 'එහි හමුදා මෙහෙයුම් කාර්යභාරයට අමතරව, 2006 සිට,වන්නියට අදාළ සෑම මානුෂවාදී ක්‍රියාකාරිත්වයකම ඉහළ පෙළේ සම්බන්ධීකරණ රැස්වීම් පැවැත්වූයේ ආරක්ෂක අමාත්‍යාංශයේදීය.'

159. "Representatives from the Foreign Affairs were present, all the heads of UN Agencies in Sri Lanka were present at this meeting, heads of UNHCR, ICRC, WFP, UNICEF, UNDSS, heads of all these organizations were present all the time and also the head of the delegation of the European Commission and the Ambassador for Germany and all the Ambassadors of the Co-chairs were present, the Ambassador for USA, Ambassador for UK, Japanese Ambassador, all were present at this meeting and the Chairman of the NGOs Committee were present throughout, the government agents of the districts were present at this meeting, the Secretary to the Health Ministry was present throughout." LRRC Testimony.
Reiterated by the Minister of Foreign Affairs on 26 Feb 2020 in the UN Human Rights Council where he said, "The records of the meetings of the Consultative Committee on Humanitarian Assistance (CCHA) which was attended, inter-alia, by the co-chairs of the peace process and other international partners including UN agencies, clearly indicate that the Government of Sri Lanka made every effort to provide essential supplies and protect the lives of civilians in the conflict zone during the humanitarian operation." High Level Segment Speech on file.

160. ජනාධිපති විශේෂ උපදේශක බැසිල් රාජපක්ෂට UNR/HC කාර්යාලයෙන් යැවූ ලිපිය - 26 පෙබරවාරි 2009.

161. 'වන්නියේ මානුෂවාදී ව්‍යසනය සහ වෛද්‍ය හදිසි තත්වය' ශීර්ෂයෙන් ලිපිය

සාකච්ඡාවලදී  සහ ප්‍රසිද්ධ නිවේදනවලින් රජයට දැනුම්දුන්නේය' යන්නයි. වන්නි ප්‍රදේශයේ සේවය කළ පළාත් පාලන ආයතන කාර්ය මණ්ඩල මෙන්ම මානුෂවාදී සංවිධාන මාස ගණනක් අනතුරු ඇඟවීමෙහි යෙදී සිටි අතර 2009 මාර්තු මුලදී වාර්තාවලින් පෙන්නුම් කළේ මහළු තැනැත්තන් කිහිපදෙනකු කුසගින්නේ මියගොස් ඇති බවයි[162]. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ චාල්ස් පෙට්රි වාර්තාව ද සවිස්තරාත්මකව දොස්තර ටී. වර්ධරාජාගේ මෙම ලිපිය ගෙනහැර දක්වා ඇත. පසුව එම වෛද්‍යවරයා හිරගත කොට රටින් පිටුවහල් වීමට බලකෙරිනි:

*2009 මාර්තු 2 දා මුලතිව් ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ගේ කාර්යාලය, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයාට , ජාත්‍යන්තර රතු කුරුස කමිටුවට සහ ලෝක ආහාර වැඩසටහනට පිටපත් යවමින් මුලතිව් දිසාපතිවරයාට ලියූ ලිපියක සඳහන් කළේ "ඊළඟ යුද්ධයෙන් මිනිසුන් සාගින්නනෙන් මියයාමේ තත්වයක පසුවන බව ඔබ දැනටමත් දැනගෙන සිටින අතර...බොහෝ දෙනෙකු ආහාරයට ගන්නේ කොළ වර්ග .. නොදන්නා කොළ උයා ආහාරයට ගත් එකම පවුලේ 6 දෙනකු වමනය යාමෙන් පසුව සිහිනැතිව රෝහලට ගෙනවිත් ඇත.*[163]

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ චාල්ස් පෙට්රි වාර්තාවේ ඇමුණුමක ගෙනහැර දක්වා ඇති වන්නියේ මුලතිව් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ගේ කාර්යාලය 2009 මාර්තු 5 දා නිකුත් කළ ප්‍රසිද්ධ ප්‍රකාශයක සඳහන් කර තිබුණේ 'මානුෂවාදී ව්‍යසනයක්' ගැනය: 'මෙම ප්‍රකාශයෙන් දක්වා තිබුණේ නිර්වින්දන ඖෂධ, ශල්‍යකර්ම වලට අවශ්‍ය අයිතම, ප්‍රතිජීවක, එන්නත් සහ සේලයින් දියර ඇතුළු බෙහෙත් හිඟය ගැනයි. එහි වැසිකිළි ඉදිකිරීමට ද්‍රව්‍ය නොමැති හෙයින් මිනිසුන්ගෙන් බහුතරය එළිමහනේ වැසිකිලියාම සාමාන්‍ය දෙයක් බවට පත්වී තිබූ බවයි.'

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ චාල්ස් පෙට්රි වාර්තාවේ  ඇමුණුමක (දී104) 2009 මාර්තු 16 දා මුලතිව් සහ කිලිනොච්චි ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා වෙත යැවූ විවෘත ලිපියක ප්‍රකාශකර තිබුණේ 'පසුගිය වසරේ අවසන් කාර්තුවට සහ  මේ වසරේ පළමුවැනි කාර්තුවට අදාළ ඖෂධ සහ තුවාලවලට බෙහෙත් දැමීමට අවශ්‍ය දේවල ඒකාබද්ධ කෝටාවෙන් අපට මේ දක්වා එවා ඇත්තේ සියයට පහකට අඩු ප්‍රමාණයකි. අපි නැවත නැවතත් අපගේ ඉල්ලීම් ගැන ඔබට මතක් කළත් ආරක්ෂක අමාත්‍යාංශයේ නිෂ්කාශනය ලැබෙන තුරු වව්නියාවේ රඳවා තබාගැනීමට සිදුවී ඇති හෙයින් ඉතිරි තොගයට අත්වී ඇති ඉරණම ගැන ඔබට හොඳ අවබෝධයක් ඇත.'  මෙම ලිපියෙන් තර්ක කර තිබුණේ 2009 ජනවාරි සිට මාර්තු දක්වා රෝහල්වල දී සිදුවූ මරණ 500 න් බොහොමයක්' මූලික යටිතළ පහසුකම් සහ අත්‍යවශ්‍ය බොහෙත් ලබාදී තිබුණේ නම් වළක්වාගත හැකිව තිබූ බවයි. ...අපට ප්‍රතිජීවක, නිර්වින්දන ඖෂධ සහ සේලයින් එක බෝතලයක් වත් සපයා නොතිබුණි'.

සැපයුම් ගෙනඒමට නියමිත ජාත්‍යන්තර රතු කුරුස කම්ටු නැව්වලට ඒවා ආසන්නයේ ෂෙල් ප්‍රහාර සිදුවූ බැවින් ඉවත් කරගැනීමට සිද්ධ වී ඇත. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ චාල්ස් පෙට්රි වාර්තාවේ ඇමුණුමක (දී105) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ජාත්‍යන්තර කාර්ය මණ්ඩල සාමාජිකයකු තමාට වන්නියේ වෛද්‍යවරුන් 2009 මාර්තු අප්‍රියෙල් සහ මැයි මාසවලදී මධ්‍යම රාත්‍රියේ දී කිහිපවරක් කතාකර 'බලාපොරොත්තු නැති තත්වයට පත් වී, තමන්ට රෝගීන්ට ප්‍රතිකාර කිරීමට ක්‍රමයක් නොමැති නිසා ඔවුන්ගේ රෝගීන් මියයන' බව පවසා ඇත. චාල්ස් පෙට්රි වාර්තාවේ එම කාලයේ යුද කලාපයේ සිටි එක්සත් ජාතීන්ගේ කාර්ය මණ්ඩලය ඖෂධ හිඟය සම්බන්ධයෙන් එවූ කෙටි පණිවුඩද අඩංගු විය.

එක්සත් ජාතීන්ගේ විමර්ශනය OISL (§1169) නිගමනයවන්නේ පහත දැක්වෙන තත්වය එහි තිබූ බවයි:

*අදාළ ප්‍රදේශවල සිවිල් වැසියන් ගේ සැබෑ මානුෂවාදී අවශ්‍යතා ගැටුම් ඇති ප්‍රදේශවල ආධාර සැපයීම සංවිධානය කළ ආණ්ඩුවේමැ දිසාපතිවරුන් මගින් රජය දැනසිටි බව හෝ දැනසිටීමට හේතු තිබූ බව විශ්වාස කිරීමට සාධාරණ හේතු පවතී. එසේ වෙතත්,  සහන යැවීම සහ මානුෂවාදී සේවකයන්ගේ යාම්ඊම් නිදහස මත දැඩි සීමා පනවා තිබුණි.. ..පෙනෙන හැටියට නම්  . මෙය වන්නි ප්‍රදේශයේ සිවිල් ජනතාවට ඔවුන්ගේ දිවිපැවැත්මට අත්‍යවශ්‍ය*

162. 'OISL §992 උපුටා දැක්වීම : ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ ලිපිය, 2 මාර්තු 2009. දෙමළ සහ ඉංග්‍රිසි ලිපිය  ITJP ගොනුවේද ඇත. ලිපියේ සඳහන් වින්දිතයන්ගේ නම් සහ මරණ ගැන විස්තර:

| | | |
|---|---|---|
| 1. පොන්නයියා ධර්මලිංගම් | පුරුෂ | වයස 65 |
| 2. පොන්නයියා රත්නේස්වරී | ස්ත්‍රී | වයස 65 |
| 3. එස්. ජෙයන්තිනී | ස්ත්‍රී | වයස 17 |
| 4. සන්තානම් විසාලක්ෂ්මි | ස්ත්‍රී | වයස 72 |
| 5. ආරුමුගම් රාසයියා | පුරුෂ | වයස 66 |

නොදන්නා කොළ වර්ගයක් ආහාරයට ගෙන දිරවා නැති අයගේ විස්තර

| | | |
|---|---|---|
| 1. සින්නතම්බි වසන්තබාලන් | පුරුෂ | වයස 46 |
| 2. වී. පත්මාදේවි | ස්ත්‍රී | වයස 38 |
| 3. වී. පවිත්‍රන් | පුරුෂ | වයස 14 |
| 4. වී. සත්‍යා | ස්ත්‍රී | වයස 13 |
| 5. වී. සමර්වේන්දන් | පුරුෂ | වයස 06 |
| 6. වී. කීර්තිකා | ස්ත්‍රී | වයස 06 |

*මූලික ආහාර ද්‍රව්‍ය හා වෛද්‍ය සැපයුම් ප්‍රමාණවත් ලෙස ලබා නොදීමට හේතු වී ඇත. ඒ බව මනාව ලේඛනගත කර ඇත.*

ආහාර සහ ඖෂධ හිඟයෙන් සිවිල් ජනතාවගේ ජීවිත දැඩිලෙස අනතුරෙහි හෙළීමක් සිදුවිය. OISL (1169) න් කතාකරන්නේ 'කුසගින්න නිසා සිදුවූ බවට චෝදනා කෙරෙන මරණ'ගැන ය.[164] ගෝඨාභය රාජපක්ෂ මෙම හිඟයන් ගැන මෙන්ම ඔහු සහභාගී වූ මානුෂවාදී රැස්වීම්වලින් ඒ ගැන දැනගෙන සිටින්ට ඇති බව සහතික කරමින් ආරක්ෂක අමාත්‍යාංශ ඇතුළු ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට වරින්වර හිඟයන් සහ ඒවායින් ඇති වන බලපෑම දැනුම් දී තිබුණි. එම කාලයේදී සිවිල් ජනතාවට තවත් සැපයුම් යැවීමට අවසරදීමට ඔහුට අධිකාරය, බලතල සහ ධාරිතාව තිබූ නමුත් ඒ සඳහා ක්‍රියාකිරීමට හිතාමතා අසමත් විය.

## 2008 සැප්තැම්බර් මාසයේදී එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ රාජ්‍ය නොවන සංවිධාන ඉවත් කිරීම

### ගෝඨාභයගේ නියෝගය මත

ශ්‍රී ලංකාව සාක්ෂි නොමැති යුද්ධයක් බව බාගවිට සඳහන් කරන අතර එයට හේතුව අන්තර් ජාතික මාධ්‍යයට සහ ආධාර සැපයීමේ යෙදෙන සේවකයන්ට 2008 සැප්තැම්බර් සිට 2009 දක්වා කාලයේදී ගැටුම් පැවති ප්‍රදේශවලට යාම හිතාමතා ප්‍රතික්ෂේප කර තිබිමයි. යුද කලාපයේ පිහිටි කිලිනොච්චියෙන් ඉවත්ව යන ලෙස 2008 සැප්තැම්බර් මාසයේදී ආධාර සැපයීමේ යෙදෙන අන්තර් ජාතික සේවකයන්ට නියෝග කළ අවස්ථාවේදී බොහෝ සේවකයන් අකමැත්තෙන් යාමත් සමඟ මෙය ආරම්භවිය. මෙම නියෝගයට තුඩුදුන් මූලකාරණය ආධාර ලබාදෙන සේවකයන්ට වන්නියේ රැඳීසිටිම සුරක්ෂිත නොවන බවයි. මුලතිවුහි සිටි the Action Contre le Faim (ACF) කාර්ය මණ්ඩලයට සිදුවූ දෙය උදාහරණයක් ලෙස ගෙනහැර දැක්වූ යේ වසර දෙකකට පෙර ACF සංවිධානයේ ආධාර සේවකයන් 17 දෙනෙකු ඝාතනය සම්බන්ධයන් ආරක්ෂක හමුදා වගකිවයුතුව[165] ඇතැයි චෝදනා ලබා තිබියදීය. ACF සංවිධානයේ ආධාර සේවකයන් ඝාතනය සම්බන්ධයෙන් වගවිය යුත්තන් නොමැතිවීම කණගාටුදායකය. වන්නියේ ආධාර සේවකයන් අනාරක්ෂිකවීමට එක් හේතුවක් වූයේ රැකවරණ සැලසීමට අවශ්‍ය ආරක්ෂිත උපකරණ ගෙනයාමට ආරක්ෂක අමාත්‍යාංශය එක්සත් ජාතීන්ට අවසරදීම ප්‍රතික්ෂේප කිරීමයි.[166]

ක්‍රියාන්විත ප්‍රදේශයෙහි රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධයෙන් තමන්ට පාලනයක් ඇති බව ආරක්ෂක අමාත්‍යාංශයේ වෙබ් අඩවියෙහි පළකළ සම්මුඛ සාකච්ඡාවකදී ගෝඨාභය රාජපක්ෂ සනාථ කර ඇත[167].

2008 සැප්තැම්බර් මාසයේදී යුද කලාපයෙන් ආධාර සංවිධාන සේවකයන් සහ එක්සත් ජාතීන්ගේ සේවකයන් ඉවත් කර ගතයුතු බවට වන රජයේ විධානයට ආරක්ෂක ලේකම් ලෙස ගෝඨාභය

163. පෙට්රි ඇමිණුම iii B c §103, අසංශෝධිත පිටපත, ගොණුගත ලේඛන

164. OISL (§982) පැවසුවේ, 'ෂෙල් ප්‍රහාර සහ වෙඩිතැබීම්වලින් මියයනවාට අමතරව හාමතින් බෙහෝ දෙනෙකු මියයන බව හෝ වෛද්‍ය සත්කාර නැතිව අධික විඩාවට පත්වන බව සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශවල සහ වෙනත් ලේඛනවල සඳහන්ව ඇත'.

165. මුතුර්හිදී ආධාර සේවකයන් ඝාතනය වන්නියෙන් ජාත්‍යන්තර ආධාර සපයන සේවකයන් ඉවත්කිරීම පිණිස පසුබිම සැකසීමට නිදසුනක් ලෙස 2008 සැප්තැම්බර් මාසයේ ආරක්ෂක අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළකළ සම්මුඛ සාකච්ඡාවකින් ගෝඨාභය රාජපක්ෂ ගෙනහැර දැක්වීය.ඔහු පැවසුවේ 'ඊ ළඟට ඉතා වැදගත්වන්නේ ආරක්ෂක තර්ජනයයි. මුතූර්හිදී සිදුවූ දෙය ගැන බලන විට මෙය මහත්සේ අදාළවෙනවා. https://web.archive.org/web/20080923065349/http://www.defence.lk/new.asp?fname=20080919_05
මේ වන විටත් IIGEP වාර්තාව ප්‍රසිද්ධියට පත්කර ඇති හෙයින් මුතූර් ACF සේවකයන් මරාදැමීම ඔහුගේ රජය විසින් කරන ලද්දක්වීමට බොහෝ සෙයින් හැකියාව ඇ ති බව ඔහු දැනසිටි බව නොසලකා කරන ලද්දකි. IIGEP වාර්තාවපවසා ඇත්තේ ACF සිද්ධියේදී, ත්‍රිකුණාමලය සිද්ධියේදී, සහ පොතුවිල් සිද්ධියේදී, ඝාතන සිදුකරන විට ආරක්ෂක හමුදාවල සාමාජිකයන් අපරාධය ස්ථානයේ හෝ අසළ සිටි බවට සෑහෙන සහ විවාදාත්මක නොවන සාක්ෂි ඇත' P6, IIGEP report to Donors, ගොණුගත ලේඛන

'2007 මැයි 14 දා මහජන විමසීමේ දී ආරම්භක ප්‍රකාශය කළ නියෝජ්‍ය සොලිසිටර් ජනරල් , එමෙන්ම කොමිසමේ නීති නිදේශකයන්ගේ මණ්ඩලයේ ප්‍රධානත්වය දැරූ යසන්ත කෝදාගොඩ ප්‍රකාශ කළේ යම් නිශ්චිත දිනයකදී සහ වේලාවකදී මූතූර් සුළු නගර මධ්‍යස්ථානය කවුරු පාලනය කළත් -මෙම ඝාතනයේ ඉතා අඩුවෙන් එල්ටීටීඊය සැකකරන දිනයක් සහ ඝාතකයන් විය හැකිය. කොමිෂන් සභාවේ විමර්ශනවල සංවෘත සැසිවලදී ඔහු විසින් සාක්ෂිකරුවන්ගෙන් කරන ලද ප්‍රශ්නකිරීම් බොහොමයක් සැලසුම් කර තිබුණේ අදාල වේලාවේදී එල්ටීටීඊයේ පාලනය යටතේ මූතූර් පැවති බවට ඔවුන්ට ඇඟිල්ල දිගුකිරීමට සහ එනිසා අපරාධකරුවන් බව පෙන්නාදීමටය.වැදගත් අවධියේ ශ්‍රී ලංකා රජයේ කොමාන්ඩෝ භට පිරිස් සහ වෙනත් ආරක්ෂක හමුදා මූතූර් පාලනය කළ බව තහවුරු කිරීමට ඔහු දන්නා බොහෝ සාක්ෂි කොටස් ඔහුට තිබුණි. ඒවාට සත්‍ය වශයෙන් යුද හමුදාව වැදගත් අවධියේ පාලනය කළ බව පවසමින් ශ්‍රී ලංකා රජය නිකුත් කළ නිල ප්‍රවෘත්ත නිවේදනයද ඇතුළත් ය.

166. 'ආරක්ෂක අමාත්‍යාංශය පැනවූ සීමාවන් නිසා එක්සත් ජාතීන්ට වන්නියට ආරක්ෂක සහ සන්නිවේදන උපකරණ ගෙනයාමට දුෂ්කර විය. ඒ ආකාරයෙන්ම, 2008 ජූලි සහ අගෝස්තු මාසවලදීද දුෂ්කරතා ඇතිව පමණක් එක්සත් ජාතීන්ට බංකර් සීමිත සංඛ්‍යාවක් සහ කාර්ය මණ්ඩලයට ආරක්ෂිත කාමර ඉදිකරගැනීමට ද්‍රව්‍ය ගෙනයාමට සහ හදිසි සංචිත සැපයුම් ලබාදීමට අතිරේක ඉන්ධන ගෙනයාමට හැකිවිය.' - පිටුව 14, චාල්ස් පෙට්රි වාර්තාව, ඇමිණුම්

167. "Again NGOs are not my subject except those in operational areas". 19 Sept. 2008, These are the best years of our forces - Secretary Defence, MOD, https://web.archive.org/web/20080923065349/http://www.defence.lk/new.asp?fname=20080919_05

රාජපක්ෂ අත්සන් කර ඇති බව හියුමන් රයිට්ස් වොච් පවසයි[168].

මානුෂවාදී සේවා සපයන නියෝජිතායතන ඇතුළත් මානුෂවාදී ආධාර පිළිබඳ උපදේශක කාරක සභාව (ඉහත සඳහන බලන්න) ගෝඨාභයගේ කාර්යාලයේදී දෙසතියකට වරක් රැස්වූ අතර, ඔහු සියලු රැස්වීම්වලට සහභාගි විය. සිවිල් ජනතාව හාමතින් සහ වෛද්‍ය සැපයුම් සහ ප්‍රතිකාර ලබාගත හොනැකිව මිය ගිය 2008-9 වන්නියේ බලාපොරොත්තු විරහිත, උග්‍රවෙමින් පැවති මානුෂවාදී තත්වය ගැන ඔහුට හොඳින් කරුණු දක්වා තිබිය හැකි ය. කෙසේ වෙතත්, ඔහුගේ නියෝගය සන්නිවේදනය කිරීම පිණිස රාජ්‍ය නොවන සංවිධාන සහ ආරක්ෂක ලේකම්වරයා අතර මුහුණට මුහුණ හමුවක් පැවති බව රොයිටර් ප්‍රවෘත්ති සේවය වාර්තා කළේය:

*ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ විසින්ම සඳුදා සවස මානුෂවාදී ආධාර සපයන කාරක සභාවක නායකයන්ට දැනුම් දී තිබේ.*

ආධාර සපයන නියෝජ්‍යාතන ගෝඨාභය රාජපක්ෂ ගෙන් ලැබුණු රජයේ ලිඛිත විධානයක් ගැනද සඳහන් කරයි:

*ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය අමාත්‍යාංශයේ ලේකම් ඔහුගේ 05/09/2008 දාතම සහ අංක "එධෘඍ320ඍෘැඑඍයිෑැහඃ45* ලිපියෙන් මෙම කාර්යාලයේ ලියා පදිංචි සියලුර රාජ්‍ය නොවන සංවිධානවලට විදේශික/සේවක හෝ රාජ්‍ය නොවන සංවිධානයක් විසින් සේවයේ යොදවා සිටින සහ වන්නියේ වැඩකරමින් සිටින වෙනත් තැනැත්තකුට, පවතින ආරක්ෂක තත්වය සැලකිල්ලට ගෙන, ඕමන්ත මුරපලෙන් ඔබ්බට ගමන් කිරීමට අවසර නොදෙන බවට දැනුම් දී ඇත.*[169].

වන්නියේ කාර්ය මණ්ඩලයටද කෙළින්ම යුද හමුදාවෙන් දැනුම්දීම ලැබුණි:

*එදිනම රාත්‍රියේ ,එක්සත් ජාතීන්ගේ සරණාගතයන් පිළිබඳ මහ ලේකම් කාර්යාලයට සහ ලෝක ආහාර වැඩසටහනට වන්නි ප්‍රදේශය ඇතුළත දී ආධාර සේවකයන්ගේ සුරක්ෂිතතාව සහ ආරක්ෂාව ගැන රජයට සහතිකවිය නොහැකි බවත් යම් යාමක් ඊමක් කෙරෙන්නේ නම් අවදානම ඔවුන් දැරිය යුතු බවත් දන්වමින් ශ්‍රී ලංකා යුදහමුදාවෙන් ලිඛිත සන්නිවේදන ලැබුණි.*[170]"

ඉවත්වන ලෙස දැනුම්දීමත් සමඟ එක්සත් ජාතීන් සහ රජය අතර ගිවිසුමක් ප්‍රකාරව "ගැටුම් මුක්ත" බව කියන "කොටුකරන ලද කිලිනොච්චි'' (Kilinochchi box) ප්‍රදේශයේ එක්සත් ජාතීන්ගේ භූමි ප්‍රදේශවලට ගුවනින් බෝම්බ දැමීමක් විය. පහත දැක්වෙන්නේ එක්සත් ජාතීන්ගේ අභ්‍යන්තර සමාලෝචන වාර්තාවේ (පෙට්රී) එකතුකර තිබූ 'කිලිනොච්චි බොක්ස්' හි එක්සත් ජාතීන්ගේ භූමි ප්‍රදේශවලට එල්ල වූ ප්‍රහාර වල ලැයිස්තුව යඃ

*2007 නොවැම්බර් 27 දා, කිලිනොච්චි බොක්ස් ඇතුළත තිබූ උසජ සහ ඍඍඍඔ, යන රාජ්‍ය නොවන සංවිධාන කාර්යාලවලට රජයේ ගුවන් ප්‍රහාරවලින් හානිසිදුවීම. එල්ටීටීඊ දේශපාලන අංශයේ කාර්යාල ඉලක්ක කර මෙම ප්‍රහාර කළ බවක් පෙනෙන්නට ඇත්*[171].

*2008 සැප්තැම්බර් 3, කාලතුවක්කු වෙඩි කිහිපයක් එක්සත් ජාතීන්ගේ අංගණ සමීපයේ 'කිලිනොච්චි බොක්ස්' ඇතුළතට වැදුණු අතර එක්සත් ජාතීන්ගේ කාර්ය මණ්ඩලය විශ්වාස කරන්නේ එය රජයේ හමුදා වලින් එල්ල කළ කාලතුවක්කු වෙඩි ප්‍රහාර බවය'*[172].

*2008 සැප්තැම්බර් 9, තවත් කාලතුවක්කු වෙඩිල්ලක් බොක්ස් හි ලෝක ආහාර වැඩසටහනේ අංගණයක වැදී බිම පතිතවිය*[173].

*2008 සැප්තැම්බර් 10, - කිලිනොච්චියට රජයේ ගුවන් හමුදා ප්‍රහාරයක් සිදුවිය*[174].

---

168. '2008 සැප්තැම්බර් මාසයේදී ,ශ්‍රී ලංකාවේ ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ වන්නියෙන් ඉවත්ව යන ලෙස එක්සත් ජාතීන්ට සහ ජාත්‍යන්තර මානුෂවාදී සේවා නියෝජිතායතනවලට නියෝග කළේය.' Besieged, Displaced, and Detained, The Plight of Civilians in Sri Lanka's Vanni Region, 23 Dec 2008, https://www.hrw.org/report/2008/12/23/besieged-displaced-and-detained/plight-civilians-sri-lankas-vanni-region
Also actually from the Minister of Human Rights and Disaster Management too.

169. https://reliefweb.int/report/sri-lanka/sri-lanka-un-ngos-pull-out-north

170. චාල්ස් පෙට්රි වාර්තාව, ඇමිණුම්, 14 පිටුව

171. චාල්ස් පෙට්රි වාර්තාව, ඇමිණුම්

172. චාල්ස් පෙට්රි වාර්තාව, ඇමිණුම්, 14 පිටුව

173. 'සෑම පාර්ශවකටම ඇති ජාත්‍යන්තර මානුෂවාදී නීතිය පිළිපැදීමේ වගකීම සඳහෙන් කරමින් ,එක්සත් ජාතීන්ගේ මානුෂවාදී සේවා කාර්ය මණ්ඩලය වෙනත් ස්ථානයක ස්ථානගතකිරීමට රජය කළ ඉල්ලීම සම්බන්ධයෙන් එම දිනයේ පසුභාගයේදී මහලේකම්වරයාගේ ලේකම් නිවේදනයක් නිතුක් කළ නමුත් ෂෙල් ප්‍රහාර එල්ලකිරීමේ මූලාශ්‍රය රජයේ ආරක්ෂක හමුදාවිය හැකි බවට සඳහනක් එහි නොවීය" - චාල්ස් පෙට්රි වාර්තාව, ඇමිණුම්, 15 පිටුව
එක්සත් ජාතීන් පවසන්නේ 'ඒකාබද්ධ මෙහෙයුම් මූලස්ථානය ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානිගේ විධානය යටතේ ඇති බවයි. ඔහු ආරක්ෂක ලේකම්ට වගකියයි' යනුවෙන් බව අවධානයට ගන්න.

174. චාල්ස් පෙට්රි වාර්තාව, ඇමිණුම්, 15 පිටුව

*2008 ඔක්තෝබර් 3, - රජය විසින් ගුවනින් බෝම්බ හෙලීමකදී  කිලිනොච්චියේ එක්සත් ජාතීන්ගේ කාර්යාලවලට හානි සිදුවිය[175], අතර සැළකිය යුතු අතුරු හානි සිදුවිය.'*

*කිලිනොච්චියේ එක්සත් ජාතීන්ගේ වැඩබිම්වල පිහිටීම දැක්වෙන ඛ්ෂී දත්ත ගැන ආරක්ෂක ලේකම්ගේ විධානය සහ පාලනය යටතේ පැවති ගුවන් හමුදාව මනාලෙස දැනසිටියේය. ගෝඨාභය රාජපක්ෂ නොදැන මෙතරම් ප්‍රහාර සංඛ්‍යාවක් සිදු වන්නට ඇතැයි සිතාගැනීමටත් නොහැකි අතර -ඇත්ත වශයෙන්ම එත්සත් ජාතීන් ඒවා ලිඛිතව රජයට වාර්තා කළ අතර ඒවා මාධ්‍යයේද වාර්තා කර තිබුණි[176]. සිදුවී ඇති දෙය සම්බන්ධයෙන් ගෝඨාභය රාජපක්ෂ යම් විමර්ශනයක් ආරම්භ කළේදැයි හෝඩුවාවක් නැත*

2010 උගත් පාඩම් සහ ප්‍රතිසංධානය පිළිබඳ කොමිසම හමුවේ සාක්ෂි දෙමින්, ගුවන් හමුදාව බෝම්බ හෙලා ඇත්තේ කුමකටදැයි චෝදනා ඇතැයි තමා දන්නා බව  ගෝඨාභය රාජපක්ෂ පැවසීය. 'ගුවන් හමුදාව විසින් බෝම්බ හෙලීම සහ ප්‍රහාර එල්ල කිරීම සම්බන්ධයෙන් බොහෝ අවසථාවලදී අපට දෝෂාරෝපනය කරනු ලැබේ,' යි ඔහු පැවසීය. රජයේ ඉලක්ක කිරීම් හරියටම නිවැරැදි බව විස්තර කළ ඔහු ඉලක්කයකට ප්‍රහාරයකට අනුමැතියදීමේ ක්‍රියාවලිය ගුවන් හමුදාපතිවරයා දක්වා ඉහළට සිදුවන අතර සහ එයට ඩිජිටල් සිතියම්, ගුවන් ඡායාරූප, සහ නියමුවන් රහිත යානා සහ ආවේක්ෂණ ගුවන්යානාවලින් ලබාගන්නා දර්ශනවලින් ලැබෙන තොරතුරු සම්භාරයක් පදනම් වන බව කීවේය. විශේෂයෙන් සියලු ගුවන් ප්‍රහාර ජාතික ආරක්ෂක කවුන්සිලය විසින් සමාලෝචනය කළ බව පැවසූ ඔහු එහි මුලසුන නිතරම තමා දැරූ බවත් එය තත්වාකාරයෙන් තමාගේ පාලනය යටතේ වූ බවත් පැවසීය:

*'අපට ඉතා පැහැදිලි ක්‍රියාවලියක් පැවතුනා. යම් ගුවන් ප්‍රහාරයක් කරන්නේ ගුවන් හමුදාපතිගෙ අනුමැතියෙන් පසුවයි. ඉල්ලීමක් එනවිට එය නිසි මාර්ගය ඔස්සේ ගුවන් හමුදාපති දක්වා එනවා. අප ඉලක්කය සැලසුම්කරන විට  අපට ඉතා පැහැදිලි පටිපාටියක් තියෙනවා...එහෙම නිසා එම ඉලක්ක සියල්ල ගත්තේ  එම ප්‍රදේශය ගැන පුළුල් ආවේක්ෂණයක් මාර්ගයෙන්. සියලු ප්‍රහාර මෙම යානා මගින් රූගත කළ අතර  අප ආරක්ෂක කවුන්සිලයේදී පවා මෙම සියලු ප්‍රහාර සමාලෝචනය කළා. ඒ නිසයි අපගේ නියමුවන් ඉතා හොඳින් පුහුණු කරල තිබුණෙ. ඉතා සියුම්ව ඉලක්කය ගැනීමට ඔවුනට සමර්ථය තිබුණා.'*
*...*

එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ ආධාර ආයතන වන්නියෙන් ඉවත්ව කිරීමට ගත් තීරණයෙන් ඉදිරියේදී පැමිණෙන ජාත්‍යන්තර මානුෂවාදී නීතිය සහ ජාත්‍යන්තර අපරාධ නීතිය උල්ලංඝනය කිරීම් පිළිබඳ අන්තර්ජාතික සාක්ෂි සාර්ථකව ඉවත්කිරීමක් විය. එය  යුද කලාපයෙන් බැහැරට තොරතුරු ගලායාමට බාධා පැමිණවීමට දැඩි ලෙස හේතු කාරක විය. ගෝඨාභය රාජපක්ෂ ඔහුගේ ක්‍රියාවේ පලය මෙය විය හැකි බවට දැනසිටින්නට ඇත. මාස තුනකට පසු හියුමන් රයිට්ස් වොච් වාර්තාවක් ප්‍රකාශ කළේ:

'මෑත මාසවලදී ශ්‍රී ලංකාවේ නිලධාරීන් ද බාහිර නියෝජිතායතන සහ මානුෂවාදී සේවාවල සේවකයන්ද කෙරෙහි දක්වන  ප්‍රකට එදිරිවාදිකම දැක ඇත. එයින් අදහස් වන්නේ දේශපාලන තැකීම් හෝ අදාළ ප්‍රදේශයෙන් ස්වාධීන නිරීක්ෂකයන් ඉවත්කිරීමේ අභිලාෂය ඉවත්කිරීම පිටුපස තිබෙන්නට ඇති බවයි.'[177]

2008-9 ප්‍රහාරයට එක්වූ යුද හමුදා නිලධාරියෙක් මෙය සහතික කළ අතර ඔහු සාක්ෂි දුන්නේ:

*'ගෝඨාභයට අවශ්‍යවූයේ ඔවුන් වන්නියෙන් පිටකිරීම වන අතර එවිට ඔවුන්ට යුද කලාපයේ වන්නේ කුමක්දැයි වාර්තා කිරීමට හැකිවන්නෙ නැහැ. ගෝඨාභය, මූලික වශයෙන් ඔහුගේ නියෝගවූයේ ජාත්‍යන්තර කාර්ය මණ්ඩල යට ඉවත්යාමට ඉල්ලීම වන අතර ඔහුගේ ආඥාපතිවරුන් ඔහුගේ නියෝගය ක්‍රියාත්මක කළ යුතු බවයි.'*

පසුව ගෝඨාභය උගත් පාඩම් සහ ප්‍රතිසංධානය කොමිසම හමුවේ සාක්ෂි දෙමින් පැවසුවේ 'මට අවශ්‍ය වූයේ එම ප්‍රදේශවල අපට සගවන්නට කිසිම දෙයක් නැතිබව පෙන්වීම සහ සෑම අවස්ථාවකදීම අපට විනිවිදභාවයෙන් යුක්තවීමට අවශ්‍ය බවයි.' ඔහු යුද කලාපයට ජනමාධ්‍යවේදීන්ට සහ ආධාර සේවකයන්ට යාම ඔහු පාලනය කළ විට එය සිරිතක්

175. චාල්ස් පෙට්රි වාර්තාව, ඇමිණුම්, 17 පිටුව

176. 'ඔක්තෝබරයේ සිට දෙසැම්බර් මාසය දක්වා, සැපයුම් කණ්ඩායම් පිළිබඳව රතු කුරුසය විසින් ආරක්ෂක ඇමතිවරයා, හමුදා මාණ්ඩලික ප්‍රධානී, භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් සහ අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජෙනරාල් මෙන්ම ආපදා කළමනාකරණ හා මානව හිමිකම් පිළිබඳ ඇමතිවරයා ඇතුළු රජයේ පාර්ශ්වයන්ට ලිපි මාලාවක් යවන ලදී.' - පෙට්රී වාර්තාව ඇමිණුම්, පිටුව 21

177. Besieged, Displaced, and Detained, The Plight of Civilians in Sri Lanka's Vanni Region, 23 Dec 2008, https://www.hrw.org/report/2008/12/23/besieged-displaced-and-detained/plight-civilians-sri-lankas-vanni-region

වශයෙන් එසේ නොවීය. 2009 දී පෙරමුණට යාමට අවසර ලැබුණ ජනමාධ්‍යවේදීන් පැවසුවේ ඔවුන්ගේ එම ගමන් පවා ගෝඨාභය රාජපක්ෂ විසින් අනුමත කළ බවය'[178].

තවද ඉවත්කිරීමට ගත් තීරණයෙන් යුද කලාපයේ සිවිල් වැසියන්ගේ විඳි ගැහැට විශාල ලෙස තීව්‍ර කිරීමට හේතුවිය. හියුමන් රයිට්ස් වොච් 2008 වාර්තාවක සඳහන් කළේ:

> *'මෙම ප්‍රතිපත්තිය විපතට පත් පුද්ගලයන්ට අත්‍යවශ්‍ය ආහාර,ජලය, වාසස්ථාන, සනීපාරක්ෂක පහසුකම් සහ සෞඛ්‍ය සේවාවන් ලැබීමේ අපේක්ෂා විශාල ලෙස අඩුකරමින් සිවිල් ජනතාවගේ තත්වය දැඩිව අහිතකර තත්වයකට පත්කිරීමට හේතුවිය.'*[179]

ආධාර ආයතන ඉවත්කිරීමට ශ්‍රී ලංකාවේ ආණ්ඩුව ගත් තීරණය ඉදිරි මාස 8 තුළ (2008 ඔක්තෝබර්-2009 මැයි) යුදකලාපයේ ලක්ෂ සංඛ්‍යාත සිවිල් වැසියන්ට මානුෂීය ආධාර - ආහාර සහ බෙහෙත්-ලබානොදීමට ඉවහල් විය. එක්සත් ජාතීන්ගේ විමර්ශනය (OISL, §983 on) රජයේ අමාත්‍යාංශ විසින් ආහාර නොසැපයීමෙන් කුසගින්නේ පසුවන්නන් සහ ප්‍රමාණවත් ලෙස බෙහෙත් සැපයුම් නොමැතිකමින් සිදුවන මරණ පිලිබඳ සිද්ධි වාර්තා කර තිබුණි. යුද කලාපයේ රැඳී සිටින්නේදැයි තීරණය කිරීමට එක්සත් ජාතීන්ගේ සහ ආධාර ආයතනවල සේවකයන්ට තීරණය කිරීමට ඉඩදී තිබුණේ නම් සිවිල් වැසියන්ගේ මානුෂවාදී තත්වය පුළුල් අන්දමින් දේශීය සහ විදේශීය වශයෙන් වාර්තාකිරීමට තිබුණු අතර රජයට ජනසංඛ්‍යාව[180] විකෘති කිරීමට හා ආහාර සහ බෙහෙත් සිවිල් වැසියන්ට නොසපයා සිටීම දුෂ්කර වනු ඇත. මාස 2කට පසුව,2008 නොවැම්බර් මාසයේදී විදේශ ලේකම් පාලිත කොහොන වන්නියේ 100,000 ක් දෙනා රැඳී සිටින බව කීවත් අතරතුර කාලයේදී මියයන්නට ඇති අය හැර 2009 දී 282.000 ක් පණපිටින් පිටතට පැමිණීමෙන් කලින් කියූ ගණන ඉතා විශාල ලෙස අඩුවෙන් තක්සේරු කිරීමකි[181].

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ වන්නියට ඇතුළුවීමට මානුෂවාදී ආහාර රැගෙන ගිය රථ පෙළවල්වලට 2008-9 රජයේ හමුදා සහ එල්ටීටීඊය එල්ල කළ ප්‍රහාර මාලාවක් OISL (§961 on) වැනි එක්සත් ජාතීන්ගේ වාර්තාවල සහ චාල්ස් පෙට්රි විසින් සකසන ලද එක්සත් ජාතීන්ගේ අභ්‍යන්තර සමාලෝචනයේ විස්තර කරයි. එක්සත් ජාතීන්ගේ සංවිධානය මෙම ප්‍රහාර ගැන ගෝඨාභයගේ පහළින් නිලධාරී ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි ඩොනල්ඩ් පෙරේරාට වාර්තා කළේය[182].

**යුද මුක්ත කලාප**

ශ්‍රී ලංකා රජය විසින් යුද මුක්ත කලාප තුනක් ඒක පාර්ශවිකව නිවේදනය කළේය. එම සියල්ලටම රජයේ හමුදා විසින් බර අවිවලින් ප්‍රහාර එල්ල කරන ලදී. පෙනෙන හැටියට නම් ආරක්ෂිතයැයි කියන මෙම කලාපවලට ආරක්ෂාව පිණිස යන්නැයි යුද හමුදාව විසින් උපදෙස් දෙන ලද නමුත් ඊළඟට විශ්වාස කළ නොහැකි ලෙස ප්‍රහාර එල්ල කිරීමට පමණයි.

පළමු යුද මුක්ත කලාපය පිහිටි ස්ථානය ගැන එම අවස්ථාවේ එක්සත් ජාතීන්ගේ කාර්ය මණ්ඩලය[183] එය ඉදිරි පෙරමුණුවලට මෙතරම් ආසන්නව පිහිටුවීම ගැටළු සහගත බව දැනසිටි අතර පසුව පැවැත්වූ එක්සත් ජාතීන්ගේ විමර්ශනවලින් ප්‍රකාශ වූයේ මෙමගින් සිවිල් ජනතාවට පැනයාමට මාර්ග කිහිපයක් සලසාදුන් බවයි. (§803 UN OISL):

*යුද මුක්ත තැබීම් කලාප පිහිටුවීමේ ස්ථාන පිළිබඳ*

178. 'මෙම සංචාරයට ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ පහසුකම් සැලසීය. ඔහු ජනාධිපති මහින්ද රාජපක්ෂගේ බාල සහෝදරයා වන අතර හතරවැනි ඊළම් යුද්ධයේදී රජයේ ජයග්‍රහණය නිර්මාණය කළ එක් අයෙකි'. - 2 November 2007,
Reuters On the killing of Tamilselvan https://frontline.thehindu.com/cover-story/article30187255.ece.

179. Besieged, Displaced, and Detained, The Plight of Civilians in Sri Lanka's Vanni Region, 23 Dec 2008, https://www.hrw.org/report/2008/12/23/besieged-displaced-and-detained/plight-civilians-sri-lankas-vanni-region

180. මේ සම්බන්ධයෙන් තවත් තොරතුරු දැනගැනීමට චාල්ස් පෙට්රිගේ වාර්තාව බලන්න. 'ජනගහනය අඩු සංඛ්‍යාවයක් රැසිටින බව කීම, සපයන ආහාර සහ මානුෂවාදී ආධාර ප්‍රමාණවත් බවට තර්ක කිරීමටය; යුද්ධය කාලයේදී සහ පසුවත් අඩු ජන සංඛ්‍යාව සිවිල් මරණ සිදුවන බවට වූ කියාපෑම් බොරු බව ඔප්පු කිරීමට යොදා ගනු ලැබීය.; ඇමිණුම II. ඔහු තවදුරටත් පවසන්නේ, 2008 දී අල්ලා ගත් පසු වන්නියේ 70,000 ක් සිටින බව රජය කීවේය. ඇත්ත වශයෙන්ම එහි 360,000 ක් සිටි බව පෙනෙන්ට ඇත.'

181. 'ජන සංගණනයක් පවත්වා නැති හෙයින් අවතැන් ජනතාව ගැන ඇස්තමේන්තුවක් නැති බව විදේශ ලේකම් පාලිත කොහොන පැවසීය. "විවිධ ආයතන ගණන් බලා ඇති 230,000 ක් සහ 300,000 අවතැන්ව සිටින බවට දක්වන ඇස්තමේන්තුව අධික අතිශයෝක්තියක් ලෙස අපි විශ්වාස කරමු.' රජයේ ඇස්තමේන්තුව එම සංඛ්‍යාව 100,000 ක් පමණ විය හැකි බවයි.' https://www.thehindu.com/todays-paper/tp-international/Aid-distribution-Red-Cross-India-differ-with-Sri-Lanka/article15377058.ece, Aid distribution: Red Cross, India differ with Sri Lanka, The Hindu, 21 Nov 2008

182. එක්සත් ජාතීන්ගෙන් ඉදිරිපත් කෙරුණු දැඩි ලිපියකින්, නේවාසික සම්බන්ධීකාරකට යළි යළිත් ආරක්ෂාව සහතික කිරීමක් දී ඇති නමුත් දෙසැම්බර් 9 සහ 10 දෙදින තුළ,පැයකට වැඩි කාලයක් එක්සත් ජාතීන්ගේ රථ පෙළක් ආසන්නයට ෂෙල් ප්‍රහාර එල්ල කළ බවට රජයේ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානිට පැමිණිලි කළේය: ෂෙල් ප්‍රහාර ගැන විස්තර දක්වා ඇති එම ලිපිය මගින් විශේෂයෙන් පවසා ඇත්තේ 'රජයේ ආරක්ෂක හමුදා විසින් ෂෙල් ප්‍රහාර සිදු කෙරී ඇති බව සහ එක්සත් ජාතීන්ගේ කාර්ය මණ්ඩලයද ප්‍රහාරයට ලක්විය හැකිව තිබූ බවයි. වන්නියේ එක්සත් ජාතීන්ගේ කාර්ය මණ්ඩලයට බලපාන සීමාවන් සහ නිතර වැඩිවෙමින් පවතින පිරික්සුම් සම්බන්ධයෙන් නේවාසික සම්බන්ධීකාරක දෙවැනි ලිපියක් දෙසැම්බර් 16 දා ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානිට යැවීය.' (ඇමිණුම්, පිටු 33)

183. සාක්ෂි ප්‍රකාශය, පසුව OISL

*තර්කය විශාල වශයෙන් ප්‍රශ්නකාරී ය. ඒවා කලින් තිබූ එල්ටීටීඊ තැන්ම වූ අතර, නම්කළ ප්‍රදේශය බාරදීමට පෙර ඉවත් නොකළ ඒවා විය.[184] පළමුවැනි යුද මුක්ත කලාපය කෙළින්ම පිහිටා තිබුණේ ශ්‍රී ලංකා යුද හමුදාව ඒ 35 මහා මාර්ගයේ කිලිනොච්චියේ සිට පුතුක්කුඩිඉරප්පු සහ මුලතිව් දෙසට ඉදිරියට යන ප්‍රධාන රේඛාවේය. තම පුතුක්කුඩිඉරප්පු බලකොටුව රැකගැනීම පිණිස එල්ටීටීඊයට පළමුවැනි යුද මුක්ත කලාපය ප්‍රදේශයේදී ශ්‍රී ලංකා යුද හමුදාව සමග සටන් කිරීමක යෙදෙන්නට සිදුවිය හැකිව ඇත. ආරක්ෂක කලාපයක් එදිරිවාදිකම් සිදුවන ප්‍රදේශයක කොටසක් බවට පත්වීමේ සැලකිය යුතු හැකියාවක් ඇති කොටසක පිහිටුවීම ප්‍රශ්න මතුකරයි. (§756 UN OISL)*

ඇතැම් සිවිල් වැසියන් මරණයට පත්කිරීමක් පිළිගත් නමුත් , 2011 දී ගෝඨාභය ඔහුගේ ආරක්ෂාව උදෙසා යුද මුක්ත කලාප යොදා ගත් අතර ඔහු දැක්වූ අදහසක් වාර්තා කළේ මෙසේය ඃ

*ජනාධිපති මහින්ද රාජපක්ෂගේ සහෝදර ,ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ සුරක්ෂිත කොරිඩෝර සහ යුද මුක්ත කලාප පිහිටුවීම මාර්ගයෙන් ගැටුම් ප්‍රදේශවල සිවිල් ජනතාව ආරක්ෂා කිරීමට සෑම උත්සාහයක්ම දැරූ බව පවසමින් හමුදාවේ මතභේදයට තුඩුදුන් ක්‍රියා මාර්ගය සාධාරණිකරණයක් නිකුත් කර ඇත.[185] "*

යුද මුක්ත කලාප සුරක්ෂිතබව සහතික ලෙස ප්‍රකාශකිරීමක් සිදුවුවද, ඒවාට නැවත නැවත ෂෙල් ප්‍රහාර එල්ල වූ බව එක්සත් ජාතීන්ගේ විමර්ශනය පෙන්වාදෙයිඃ

රජය කාලතුවක්කු බර අවි පාවිච්චි නොකරන බව පැවසූ අතර, 2009 ජනවාරි සිට මැයි දක්වා ගැටුමේ අවසන් අදියරේදී යුදමුක්ත කලාප තුන අවට ඉතා සමීපයේ ශ්‍රී ලංකා යුද හමුදාව එම අවි ස්ථානගත කළේය. එක්සත් ජාතීන්ගේ විශේෂඥ කණ්ඩායමට සැපයූ චන්ද්‍රිකා රූ දර්ශන විශ්ලේෂණයේ නිගමනයවන්නේ ශ්‍රි ලංකා යුද හමුදාව ගැටුමේ අවසන් මාස පහ තුළ අභ්‍යන්තරව අවතැන් ජනගහනය රැඳි සිටි සහ විශේෂයෙන් යුදමුක්ත ප්‍රදේශවලට කාලතුවක්කු වෙඩි තැබීම් සැලකිය යුතු ප්‍රමාණයක් කිරීමට ක්‍රියාත්විත හමුදා ධාරිතාවක් ගොඩනගා පවත්වාගෙන යමින් යාවත්කිරීමක් කළ බවට මූලික සාක්ෂි ඇති අතර එහි ශ්‍රි ලංකා යුද හමුදාව යුදමුක්ත කලාප සක්‍රියව සහ දිගටම ඉලක්කකිරීමක් විය. (OISL §762)

## ගුවන් ප්‍රහාර ගැන දැනුම්දීම

ඉහතදී ගෙනහැර දැක්වූ එක්සත් ජාතීන්ගේ මුලතිව්හි ස්ථානවලට ගුවන් ප්‍රහාර එල්ල කිරීම හැරුණු විට, එක්සත් ජාතීන් විසින් විසින් ජනතාවට පහරදෙමින් සිදුවූ ගුවන් ප්‍රහාර ගණනාවක් ගැන කනස්සල්ල පළ කිරීම් රජයට වාර්තා කළේයඃ

*බාහිර රෝගී අංශයේ ප්‍රතිකාර ලබාගැනීමට සිය ගණනක් රැඳී සිටියදී කුඩා ළමයින් දෙදෙනෙකු මරණයට පත් කළ සහ සිවිල් වැසියන් 13 දෙනෙකුට තුවාල කළ සිදුකළ වඩ්ඩකච්චි රෝහල ආසන්නයට ගුවනින් බෝම්බ දැමීම් දෙකක් දෙසැම්බර් 17 දා (2008) ලිපියකින් වාර්තා කළේය. එම ලිපියෙන් රජයේ ජාත්‍යන්තර මානුෂවාදී නීතියේ බැඳීම කෙරෙහි සිහිකැඳවීමක් කරන ලදී...[186]*

*විසුවමඩුහිදී සිවිල් වැසියන් 4 දෙනෙකු ඝාතනය කරමින් හා 18 දෙනෙකුට තුවාලකිරීම සහ පුතුක්කුඩිරිප්පු රෝහලේදී එක් පුද්ගලයකු මරණයට පත් කර හය දෙනෙකුට තුවාල සිදුකිරීම සහ රෝහලට සිදුවූ දැඩි හානි ගෙනහැර දක්වමින් 'ෂෙල් ප්‍රහාරවල සහ ගුවනින් බෝම්බ හෙළීම්වල ප්‍රතිඵල වශයෙන් සිවිල් වැසියන්ගේ මරණ සහ ඔවුන්ට තුවාල සිදුවීම් ගැන ඇති වාර්තා සම්බන්ධයෙන් ජනවාරි 13 දා එක්සත් ජාතීන්ගේ නේවාසික සම්බන්ධීකාරක රජයට ලියා දන්වා ඇත.[187] "*

එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් ලැබුණු මෙම පැමිණිලි ගැන ගෝඨාභය රාජපක්ෂ හෝ රජය හෝ පරීක්ෂා කිරීමක් කළ බවට තොරතුරක් දැනගන්නට නැති අතර ඔවුන් සහ රජය යන දෙදෙනාම මේ ගැන දැනසිටිය යුතුවෙයි.

## රථ පෙළ 11

2009 ජනවාරි 11 දා එක්සත් ජාතීන්ගේ කාර්ය මණ්ඩලය සහ වන්නියට එක්සත් ජාතීන්ගේ සංවිධානය යැවූ ආහාර රැගත් අවසන් රථ පෙළ පුතුක්කුඩිරිප්පු බලා ගමන් කර ඇත. එයට ආහාර පැටවූ ට්‍රක් රථ 58 ක් සහ ඒ කැටුව ගිය දුරදිග ගුවන් විදුලි පණිවුඩ පහසුකම් ඇති 4x4 සැහැල්ලු වාහන 5ක් ඇතුළත් විය..ට්‍රක්රථ රියදුරන්ට අමතරව, ජාත්‍යන්තර කාර්ය මණ්ඩලයේ 6 දෙනෙකු සහ

184. OISL විසින් දක්නා ලද හි UNOSAT චන්ද්‍රිකා ඡායාරූප

185. https://www.smh.com.au/world/sri-lankan-civilian-deaths-unavoidable-20110802-1i9t9.html

186. පෙට්රි ඇම්ණුම්, විදේශ අමාත්‍යාංශයට යැවූ ලිපිය, පිටු 33

187. එම

ජාතික කාර්ය මණ්ඩලයේ 5 දෙනෙකු වූ අතර නැවත නැවත එල්ල කෙරුණු රජයේ කාලතුවක්කු ප්‍රහාරවලින් (මිමී 130 ෂෙල්) සිවිල් වැසියන්ට බරපතල හානි ගෙන දුන්නේය. ශ්‍රී ලංකාවේ බලධාරීහු රථපෙළ පිටත්වීම ප්‍රමාද කර ඊළඟට එල්ටීටීඊ අල්ලා ගෙන සිටි භූමි ප්‍රදේශයට එහි හමුදා භටයන් ඉදිරියට යැවීමට මෙම රථපෙළේ ආවරණය යොදා ගත්හ[188]. රථපෙළ පිටත්ව යාමට උත්සාහ කළ අවස්ථාවේදී එල්ටීටීඊය දේශීය කාර්ය මණ්ඩලයට වන්නියෙන් පිටවයාමට ඉඩදීම ප්‍රතික්ෂේප කළ නිසා එක්සත් ජාතීන්ගේ ලොරි රථ 7 ක් සහ ජාත්‍යන්තර කාර්ය මණ්ඩලයේ දෙදෙනෙකුට එහි නතරවීමට සිදුවිය. තමා පදවාගෙන පැමිණ 4x4 වාහන ය. (දෙවැනි 4x4 වාහනය) එහි දමා දැන් පිටව යන රථ පෙළේ ට්‍රක් රථයකට ගොඩවන ලෙස ජාත්‍යන්තර කාර්ය මණ්ඩලයේ එක් සාමාජිකයෙකුට දන්වනු ලැබීය. එසේවුවත් එසේ කිරීම ප්‍රතික්ෂේප කළ ඔහු ඉතිරි කාර්ය මණ්ඩලයේ බඩුබාහිරාදිය ඉවතට විසිකර පිටව යන ට්‍රක්රථ පසුපසින් සිය 4x4 වාහනය පදවාගෙන ගියේය. ඉතිරි එක්සත් ජාතීන්ගේ ජාතික සහ ජාත්‍යන්තර කාර්ය මණ්ඩලයට දුර දිග ගුවන් විදුලි පණිවුඩ පහසුකම් ඇති එක් සැහැල්ලු වාහනයක් පමණක් සමග එහි දමා ගියේය.

ජනවාරි 25 දින රාත්‍රියේදී, 'ජනගඟක්' ලෙස එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර කාර්ය මණ්ඩලය හැඳින්වූ ප්‍රදේශයක පහරදීමෙන් බරපතල ලෙස තුවාල සිදුකිරීමක් ගැන විස්තර කර ඇත.:

> *'22.00 පැය වන විට මිමී 130 බර කාලතුවක්කු ප්‍රහාරයක් නොකඩවා සිදුවූ අතර අපගේ බංකරවලට නොවූවත් දිසාපති කාර්යාලයේ භූමියට සහ අවට ප්‍රදේශයට ඒවා පතිත විය. එයින් මා කලින් සඳහන් කළ මිනිසුන් රැඳී සිටි පෙදෙසේ අවට ආරක්ෂක හමුදාවලට යජී සම්බන්ධිකරණවලින් සලකුණු කරනු ලබන ප්‍රදේශයට බලපෑමක් ඇතිවිය.' - W168*

තමා අවස්ථා ගණනාවකදී ඕස්ට්‍රලියානු මහ කොමසාරිස්වරියට දුරකථනයෙන් ඇමතූ බවත් මහ කොමසාරිස් කැත් ක්ලුග්මාන් මහත්මිය, තමා පෞද්ගලිකව දුරකථනයෙන් ගෝඨාභය රාජපක්ෂට, ජනාධිපතිට මෙන්ම පාලිත කොහොනට යුද මුක්ත කලාපවලට ප්‍රහාර එල්ල කිරීම වහාම නවත්වන ලෙස ඉල්ලා සිටීමට කතා කළ බවත් එක්සත් ජාතීන්ගේ එක් කාර්ය මණ්ඩල සාමාජිකයෙක් පැවසීය[189].

ක්ෂේත්‍ර ආරක්ෂක සම්බන්ධීකරණ නිලධාරි, අඛණ්ඩව තත්වය අස්ථිර බව දන්වමින්, සහ සහන රථ පෙළෙහි ජීපීඑස් ස්ථානවලට ඔවුන් සැපයුම් සිදුකරමින් සිටින බැවින් එම ප්‍රදේශය ඉලක්ක නොකරන ලෙසත් ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් ඉල්ලා සිටින ලෙස සුරක්ෂාව සහ ආරක්ෂාව පිළිබඳ වව්නියාව කාර්යාලයෙන් ඉල්ලා සිටිමින් එක්සත් ජාතීන්ගේ සුරක්ෂාව සහ ආරක්ෂාව පිළිබඳ දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධව සිටියේය[190]. ෂෙල් ප්‍රහාරවල ඊළඟ දැඩි ප්‍රහාරයෙන් රථ පෙළට ගැලවීමට හැකියාවක් නැති බව, සහ රථ පෙළට පුදුක්කුඩියිරුප්පු හෝ ඉදිරි සති කිහිපය තුළ සංග්‍රාම පෙරමුණ ළඟා නොවෙනු ඇති වෙරළබඩ ප්‍රදේශයේ නැගෙනහිර යම් තැනකක් කරා යාමට අවසරදීමට වෙනත් සුරක්ෂිත කොරිඩෝවක් අවශ්‍යව ඇති බවත් සුරක්ෂාව සහ ආරක්ෂාව පිළිබඳ වව්නියාව කාර්යාලයට ක්ෂේත්‍ර ආරක්ෂක සම්බන්ධීකරණ කාර්යාලය පැහැදිලි කර ඇත. ක්ෂේත්‍ර ආරක්ෂක සම්බන්ධීකරණ කාර්යාලයට සුරක්ෂාව සහ ආරක්ෂාව පිළිබඳ දෙපාර්තමේන්තුව විසින්, ක්ෂේත්‍ර ආරක්ෂක සම්බන්ධීකරණ කාර්යාලයේ සහ ඖහඩෂී හි කාර්ය මණ්ඩල සාමාජිකයා ඇතුළු ජාත්‍යන්තර සේවකයන් දෙදෙනා තනි සැහැල්ලු වාහනයෙන් ආපසු පුතුක්කුඩෙයි ඉරප්පු කරා පිටත්ව යාම සහ දෙවැනි විකල්පයක් වශයෙන් ජාත්‍යන්තර කාර්ය මණ්ඩලය සමඟ සැමදෙනෙකුම ගෙනයායුතු බව දක්වමින් විකල්ප දෙකක් දී ඇත. ක්ෂේත්‍ර ආරක්ෂක සම්බන්ධීකරණ කාර්යාලය විසින් පළමුවැනි විකල්පය විකල්පයක් නොවන බව සහ සමස්ත කාර්ය මණ්ඩලයට එකට ඉවත්වයාමට අවශ්‍ය වන අතර ඊට කොරිඩෝවක්දෙන ලෙසත් සුරක්ෂාව සහ ආරක්ෂාව පිළිබඳ දෙපාර්තමේන්තුවට දන්වා ඇත. මූලස්ථානයේ එක්සත් ජාතීන්ගේ කාර්ය මණ්ඩලය තමන්ට පහර නොදෙන ලෙස ඉල්ලා සිටීමට ආරක්ෂක හමුදාවලට නැවත නැවතත් කතාකරමින් සිටියත්, ප්‍රයෝජනයක් නොවීය. තමන්ගේ කාලතුවක්කු ප්‍රහාර අභ්‍යන්තරව අවතැන්ව සිටින ජනතාවට හානිකර බව දැනසිටි අතර එසේ වූයේ ඔවුන්ට ඒ බව රාජ්‍ය තාන්ත්‍රිකයන් සහ එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ඔවුන්ට දැනුම් දී තිබීම නිසාය.

ඔවුන්ට ආසන්න ප්‍රදේශයේ වූ විනාශය :

> *'....එල්ල වූ ෂෙල් වෙඩි අපගේ බංකරයේ සිට මීටර් 8 ක් දුරින් පවුල් දෙකක් මරමින් අපගේ*

188. W168 ගොණුගත ලේඛන, §89

189. W168

190. පෙට්රි වාර්තාව

*ආසන්න ප්‍රදේශයට පතිත වූ අතර ඉන් 7 දෙනෙකු මියගිය අතර 15 දෙනෙක් තුවාල ලැබූහ. වේලාසනින් සන්ධ්‍යාවේ අප කතා කර තිබූ 18 හැවරදි ගැහැනු ළමයෙකුගේ හිස කඳින් වෙන්වූ සිරුර අපගේ බංකරයේ පිවිසුමේ බිම වැටී තිබුණි. ලෝක ආහාර වැඩසටහනේ එක් රියැදුරෙකුගේ හිසෙහි පිටුපසට උණ්ඩ වැදී තිබුණි. හිරු උදාවත් සමඟ විනාශකාරී දර්ශනය දක්නට ලැබුනි; අපේ ස්ථානයේ සිට මීටර් 20 ක් ඇතුළත 7 දෙනෙකු මියගොස් සිටි අතර 15 දෙනෙක් බරපතල ලෙස තුවාල ලබා සිටියහ. මියගිය බිළිරෑදකුගේ සිරුර ගසක තිබුණි.එම පවුලේ අය වාසය කළේ එම ගස යටය. කඳින් හිස වෙන්වූ දෙවැනි බිළිඳු මළසිරුර උඩෙයියාර්කඩ්ඩු- සුතන්තිරපුරම් මංසන්ධියේ වැටක කම්බියක එල්ලී තිබුණි. 'තනි ලාම්පුවේ වාහනයේ' ලේ තැවරී මිනිසුන්ගේ සිරුරුවල කොටස් රැඳී තිබුණි. අපගේ බංකරයේ පිවිසුමෙන් තරුණ කාන්තාවකගේ සිරුරු ඉවතට ගෙන අපි එය පන් පැදුරකින් වැසීමු. පිපිරීම සිදුවූ ස්ථානයට මීටර් 51 ක් දුරින් ගාල්කර තිබූ සුරක්ෂාව සහ ආරක්ෂාව පිළිබඳ දෙපාර්තමේන්තුවේ වාහනය පවුල් දෙකේ මියගිය අයගේ සිරුරුවල කොටස්වලින් සහ වෙනත් සුන්බුන්වලින් වැසී තිබුණි.'*

වඩාත් නරක දේ සිදුවූ රාත්‍රිය :

*ආරක්ෂාව සලසා ගැනීමට ඉතා කුඩා නිමේෂයක් දුන් මෝටාර් ප්‍රහාර මෙන් නොව , අපගේ ප්‍රදේශයට ඍජු ප්‍රවේගකින් පැමිණි මෙම ෂෙල්වෙඩි මට මනසට මහත් පීඩාවක් විය. ෂෙල් වෙඩි ඉතා සමීපයට ලංවී තිබූ අතර ඒවායේ වේගවත් කම්පනය බංකරයේ බිත්ති අතරින් මට වටහා ගන්න හැකිවූවා. එළිමහනේදී හසුවුනා නම් ඔබට බේරෙන්න අවස්ථාවක් නැහැ. ඒක අදහාගත නොහැකි තරමට භයංකරයි. මෙය මේ දක්වා අප අත්දුටු නරකම කාල පරිච්ඡේදයයි. මේ වගේ ෂෙල්වෙඩි අපගේ බංකරයට එල්ලවුවහොත් අපට දිවිගලවා ගැනීමට නොහැකි වන බව මම දැනසිටියා. ජනවාරි 25 දා මධ්‍යම රාත්‍රියේ සිට 0600 පැය දක්වා නොකඩවා සහ නොනවත්වාම පාහේ දකුණ සහ ගිනිකොන දිසාවලින් අප සිටි ස්ථානයට සාමාන්‍යයෙන් විනාඩියකට ෂෙල් තුනකට වඩා ශ්‍රී ලංකා හමුදාවන්ගෙන් මිමී 130 කාලතුවක්කු ප්‍රහාර එල්ල විය. බොහෝ ෂෙල්වෙඩි මීටර් 500 ක් ඇතුළත පතිත විය.*

'යුද මුක්ත කලාපයෙන්' අවසානයේදී රටපෙළට මිදෙන්න හැකිවූ අවස්ථාවේදී ඔවුහු විනාශය දුටහ:

කිලෝමීටර් අටක දුර ප්‍රමාණයක අතර සහ පුතුක්කුඩෙයිඉරිප්පු පාර දිගේ ඇති ප්‍රදේශය විනාශ කර තිබුණි. උඩයියාර්කඩ්ඩු, වල්ලිපුනම් සහ කයිවේලි සිට ප්‍රදේශය දක්නට ලැබුණේ නොකඩවා තබන කාලතුවක්කු ප්‍රහාරවල වේගයට නතුවී ඇති බවයි.පාරේ දකුණු සහ වම යන දෙපැත්තේම මියගොස් සහ තුවාල ලැබ සිටි සිවිල් වැසියන් ගණනාවක් අපට දක්නට හැකිවිය. පාර අයිනේ මියගොස් සිටි අයගෙන් පිරිසක් කාන්තාවෝය. ඔවුන් සියලුරැදෙනාම සාරි ඇඳගෙන සිටි අතර නිසැකවම එල්ටීටීඊ සාමාජිකයන් නොවේ. - (W168)

පෙට්රි වාර්තාව පවසන්නේ 'ජනවාරි 26 දා කලින් දිනවල සිදුවීම් ගැන එක්සත් ජාතීන්ගේ නේවාසික සම්බන්ධීකාරක ආණ්ඩුවට ලියා දන්වා ඇත. කාලතුවක්කු යොදාගෙන පහරදීම සහ එක්සත් ජාතීන්ගේ පිරිස්වලට සිදුවූ මරණ සහ තුවාලවීම් විස්තර කළ එම ලිපියෙන් ප්‍රකාශ වූයේ සෑම අවස්ථාවකදීම ෂෙල් ප්‍රහාර රජයේ පෙරමුණුවලින් ආරම්භ වූ බවයි...'[191]

**(A) පුදුක්කුඩියිරුප්පු සටන් : 2009 පෙබරවාරි මුල :**

පුදුක්කුඩියිරුප්පු කුඩා නගරය පිහිටා තිබුණේ යුද මුක්ත කලාප 1 න් පොඩ්ඩක් පිටතිනි. එහෙත් එය මධ්‍යස්ථ වශයෙන් හොඳ පහසුකම් සහිත රෝහල් පිහිටා තිබුණු භූමි ප්‍රදේශයකි. (පුදුක්කුඩියිරුප්පු රෝහල සහ පෞද්ගලික පොන්නම්බලම් රෝහල 2009 පෙබරවාරි මුල ගුවන් ප්‍රහාරවලින් විනාශ කෙරිණ.) ප්‍රහාර එල්ල කිරීමෙන් පසුව අවසානයේ පුදුක්කුඩියිරුප්පු හි රජයේ රෝහල ඉවත් කරගත් විට එක්ස්රේ යන්ත්‍ර වැනි වැදගත් උපකරණ දමා යාමට සිදුවිය. පුදුක්කුඩියිරුප්පුවලින් ඉවත්ව යාමෙන් පසුව සේවයේ යෙදීමෙන් ඉවත් වූ වෛද්‍යවරුන් සුළු පිරිසට පාසල් ගොඩනැගිලිවල හදිසියේ තනාගෙන අත්‍යවශ්‍ය ශල්‍යකර්ම සඳහා අත්‍යවශ්‍ය කිසිම මූලික පහසුකමක් නැතිව තාවකාලික සායනවල සේවය කිරීමට සිදුවිය.

ආරක්ෂක අමාත්‍යාංශයේ ගෝඨාභය රාජපක්ෂට කෙළින්ම වාර්තා කළ ඒකාබද්ධ මෙහෙයුම් මූලස්ථානය, පුදුක්කුඩියිරුප්පුහි එක්සත් ජාතීන්ගේ

191. 64 ඡේදය

ආධාර කේන්ද්‍රය පිහිටා තිබූ ස්ථානය දැනසිටියේයැයි එක්සත් ජාතීන්ගේ පෙට්රි වාර්තාව (පිටුව 18) පවසයිඃ

> *එක්සත් ජාතීන්ගේ සුරක්ෂාව සහ ආරක්ෂාව පිළිබඳ දෙපාර්තමේන්තුව විසින් මෙම කේන්ද්‍රය සඳහා GPS ඛණ්ඩාංක ආරක්ෂක අමාත්‍යාංශයේ කොළඹ ඒකාබද්ධ මෙහෙයුම් මූලස්ථානයට සහ වවුනියාවේ ආරක්ෂක හමුදා මූලස්ථානයට මෙන්ම එල්ටීටීඊ සංවිධානයට ලබාදී ඇත.*

එය 2010 ජාත්‍යන්තර අර්බුද කණ්ඩායමේ යුද අපරාධ වාර්තාව (International Crisis Group, War Crimes report 2010) විසින් ස්ථිර කරන ලද අතර එම වාර්තාව පවසන්නේ කේන්ද්‍රය සම්බන්ධීකරණයන් ඒකාබද්ධ මෙහෙයුම් මූලස්ථානයට යවන ලද බවයි.[192]

OISL වාර්තාවද පවසන්නේ පුදුක්කුඩියිරුප්පුවල එක්සත් ජාතීන් ගේ ස්ථාන සහ රෝහල පිහිටා ඇති බව ආණ්ඩුව දැනසිටි බවයි[193]. එසේවුවත් එක්සත් ජාතීන්[194] පැවසුවේ පුතුක්කුඩිඉරුප්පු රෝහල බරපතල ලෙස ප්‍රහාරවලට ලක්වූ වෛද්‍ය පහසුකම් වලින් එකක් බවයි. අඩු වශයෙන් 2009 ජනවාරි 10 දා ආරම්භ වී ගොඩනැගිල්ල ඉවත්කර ගැනීම අවසන්වූ විට පෙබරවාරි 6 දා දක්වා පැවැත්විණ. පුදුක්කුඩියිරුප්පු රෝහල ප්‍රධාන ගොඩනැගිලි 10 කින් සහ සහායක ගොඩනැගිලි 20කට වැඩි සංඛ්‍යාවකින් සමන්විත වූ සංකීර්ණයක් වන අතර එහි ගුවනින් සහ චන්ද්‍රිකා සේයා රූ පැහැදිලිව පෙනෙන ලෙස රතු කුරුස ලාංඡනය සටහන් කර තිබුණි. රෝහල ක්‍රියාත්මකව පවතින බව සහ ඊට පහර දෙන බව රජයද දැන සිටියේය එක්සත් ජාතීන්ගේ සහ ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ දූත මණ්ඩල සාමාජිකයන් නොබෝදා එය බැලීමට ගොස් ඇති අතර මහා මාර්ගයෙන් තුවාලකරුවන් වව්නියාවට ඉවත් කරගෙන යනු ලැබේ[195]. රෝහලට එල්ලවූ ප්‍රහාරයේදී බර අවි යොදාගැනීමක් සිදුවී ඇති බව පසුව පිළිගත් එවකට යුද හමුදාපතිවරයා වූ සරත් ෆොන්සේකා එය අත්වැරදීමක් බවත් එය සිදු වන්නේ එක්වරක් පමණක් බවත් කීවේය.[196]

**2009 පෙබරවාර් 2 දා ගෝඨාභය රාජපක්ෂ සමග ස්කයි ටීවී සම්මුඛ සාකච්ඡාව**

සරත් ෆෝන්සේකා මෙම ප්‍රකාශ කළ නමුත්, 2009 පෙබරවාර් 2දා , රූපවාහිනි ප්‍රවෘත්ති සම්මුඛ සාකච්ඡාවකදී ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ පුදුක්කුඩියිරුප්පු රෝහල රජය ඒකපාර්ශවිකව ප්‍රකාශයට පත්කළ යුදමුක්ත කලාපයෙන් බැහැර ස්ථානයක පිහිටා තිබූ හෙයින් එය සුජාත ඉලක්කයක් බව ප්‍රකාශ කළේය[197]. ඔහු පැවසුවේඃ 'යුදමුක්ත කලාපයෙන් ඔබ්බෙහි කිසිවක් නොපැවතිය යුතුයි'

'ඔබ කියන්නේ එය යුදමුක්ත කලාපයෙන් බාහිරව පිහිටියේ නම් එය සුජාත ඉලක්කයක්' බව දැයි සම්මුඛ සාකච්ඡාකරු විමසූ අවස්ථාවේදී ඔහු තරයේ පිළිතුරු දුන්නේ 'ඔව්, එම ප්‍රදේශයේ රෝහලක් ක්‍රියාත්මකව නොපැවතිය යුතුයි' යනුවෙනි.[198]"

**පුදුක්කුඩියිරුප්පු රෝහලට පහරදුන් බව ආරක්ෂක ලේකම් ප්‍රතික්ෂේප නොකරයි.**

එම කාලයේදී ජාත්‍යන්තර රතු කුරුස කමිටුව නිකුත් කළ ප්‍රකාශවලින්ද ඔහු රෝහලට කළ ප්‍රහාර ගැන දැන සිටින්නට ඇති අතර එම ප්‍රකාශවලින් හෙළිවූයේ සිද්ධිය ගැන කනස්සල්ල වැඩෙමින් පවතින බවයි. 2009 පෙබරවාරි 1 දා , ජාත්‍යන්තර රතු කුරුස කමිටුව ප්‍රකාශයක් මගින් (ICRC Ref' 09/26) පුදුක්කුඩියිරුප්පු රෝහලට සෘජු ප්‍රහාර දෙකක් සිදුවී ඇතැයි පැමිණිලි කළේය; 2009 පෙබරවාරි 4 දා 'වෛද්‍ය පහසුකමකට නැවතත් සෘජු ප්‍රහාර සිදුවී තිබීම ගැන අපි කම්පාවට පත්ව සිටිමු' යනුවෙන් පවසමින් පුදුක්කුඩියිරුප්පු රෝහල ගැන තවත් ප්‍රකාශයක් (ICRC Ref 09/21) නිකුත් කර ඇත. මෙම ප්‍රකාශවලට ජාත්‍යන්තර මාධ්‍ය මගින් පුළුල් ප්‍රචාරයක් දෙන ලද අතර[199] ඉන් අදහස්වන්නේ යුද්ධය සම්බන්ධයෙන් ජාත්‍යන්තර වශයෙන් පළවන අදහස් ගැන විමසිල්ලෙන් පසුවූ ආරක්ෂක ලේකම්ගේ

192. https://www.crisisgroup.org/asia/south-asia/sri-lanka/war-crimes-sri-lanka

193. පළමුවැනි වෙඩිමුක්ත කලාපය ඇතුළත දැඩි ලෙස ෂෙල් ප්‍රහාර සිදුවන බැවින් තවත් එක්සත් ජාතීන්ගේ කාර්ය මණ්ඩල සාමාජිකයන් ජනවාරි 25 දා පුතුක්කුඩෙයිඉරුප්පු හි එක්සත් ජාතීන්ගේ කේන්ද්‍රය ඇතුළු තැන්වල යළි ස්ථානගත කරන ලදී. (ඉහත බලන්න). රෝහල සහ එක්සත් ජාතීන්ගේ පහසුකම් යන දෙකම සම්බන්ධීකරණය කරන GPS ඛණ්ඩාංක ගැන රජය හොඳින් දැනසිටියේය. ආරක්ෂක හමුදා නියමුවන් රහිත නියමුවන් රහිත යානා යොදා ගනිමින් මෙම ප්‍රදේශය නිරතුරුව ආවේක්ෂණය කළ බව සාක්ෂිකරු ප්‍රකාශවලින් පෙන්නුම් කරයි. එහෙයින් ශ්‍රී ලංකා ගුවන් හමුදාව පුදුක්කුඩියිරුප්පු හි රෝහල සහ යාබද එක්සත් ජාතීන්ගේ පහසුකම් ඇති ස්ථාන නිවැරදිව දැනසිටින්නට ඇත.' (OISL §823)

194. OISL §822 සිට ඉදිරියට

195. 'පුදුක්කුඩියිරුප්පුහි රෝහල සහ යාබද එක්සත් ජාතීන්ගේ පහසුකම් ඇති ස්ථානවලි සිටි එක්සත් ජාතීන් සහ වෙනත් සංවිධාන අවස්ථා ගණනාවකදී රෝහලට ප්‍රහාර එල්ල වන බව රජයට සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාවටද දැනුම්දී ඇත' (OISL §832).

196. බර අවිවලින් යුද මුක්ත කලාපයකට පහරදී ඇතැයි ෆොන්සේකා පිළිගනී. (වීඩියෝ), 15 නොවැ. 2015.

197. Sky News - 2 පෙබරවාරි 2009, 'තදබද ශ්‍රී ලංකා රෝහලට ෂෙල් ප්‍රහාර - ගොණුගත ලේඛන
'පුදුක්කුඩියිරුප්පුහි රෝහල සුජාත ඉලක්කයක්', ගෝඨාභය - වීඩියෝ
PTK Hospital legitimate target, GOTA VIDEO: https://www.youtube.com/watch?v=pKmM2qg95R0

198. OISL §832

199. Sri Lanka hospital 'attacked again', 3 Feb 2009, BBC http://news.bbc.co.uk/1/hi/world/south_asia/7866342.stm

අවධානයට ඒවා ලක්වන්නට ඇති බවයි.

2009 පෙබරවාරි 1 දා  දිනය පුරාම කාලතුවක්කු උණ්ඩ යොදා ගනිමින්, ඉතිරෙන පිරීයමින් තිබූ, ඇඳන් 30 ක් ඇති ළමා වාට්ටුවට පහරදෙමින් අවස්ථා ගණනාවකදී  රෝහලට පහරදීම් සිදුවී ඇතැයි එක්සත් ජාතීන් සනාථ කර ඇතැයි ඇසෝසියේටඩ් ප්‍රෙස් සේවය වාර්තා කළේය"[201]. මෙම වාර්තා ගැන ගෝඨාභය රාජපක්ෂ ප්‍රතිචාර දක්වා ඇති බවක් දක්නට තිබිණි; සති අන්තයේ දී ඔහු රජයේ ප්‍රවෘත්ති සේවයට , , (31 ජනවාරි / 1 පෙබරවාරි 2009). 'අපි එල්ටීටීඊ (කැරලි කණ්ඩායමේ) පාලනයෙන් ඉතිරි ප්‍රදේශ මුදා ගන්නා තුරු අපගේ හමුදා ප්‍රහාර ඉදිරියට සිදුකර ගෙන යන්නෙමු" යනුවෙන් පවසා ඇතැයි සහ  වාර්තා කළේය'. මුල් වාර්තාව ලැබුණේ දි සන්ඩේ අයිලන්ඩ් පුවත්පතෙන් වන අතර 'මෙම වීඩියෝවලින් බෝම්බ දැමීමක් හෝ පිපිරීම් පෙන්වන්නේ නැහැ' යනුවෙන් පවසමින් වන්නියේ ප්‍රහාර පිළිබඳ රූපවාහිනී දර්ශන ගෝඨාභය රාජපක්ෂ ප්‍රතික්ෂේප කිරීම එම වාර්තාවේ උපුටා දක්වා තිබුණි.[202] ප්‍රහාර වාර්තා කළ මාධ්‍යවේදීන්ට ඔහු තර්ජනය කිරීමට ගිය බව එම කතාවේ සඳහන් විය.

එක්සත් ජාතීන් පසුව ප්‍රකාශ කළේය :

> *2009 පෙබරවාරි  1 දා, තුන් වතාවක් කෙළින්ම පුදුක්කුඩියිරුප්පු රෝහල ට ෂෙල් වෙඩි වැදුණු අතර වාර්තා වූයේ ඔඩ්ඩිසුඩාන් අවට ස්ථානවල ශ්‍රී ලංකා යුද හමුදාවේ වෙඩි තැබීම්වලින් බව වන අතර ඉන් අඩු වශයෙන් පස් දෙනෙකු මියගිය අතර ළමයින් ඇතුළු තවත් පිරිසක් තුවාල ලැබූහ. පස්වරු 3 ත් 4 ත් අතර රෝහලට ෂෙල්වෙඩි දෙකක් වැදුණු අතර දෙවැන්නෙන් අඩු වශයෙන් එක් තැනැත්තෙක් මරණයට පත්විය. සන්ධ්‍යාවේ තුන්වැනි ප්‍රහාරයෙන් කාන්තාවන් සහ ළමයින් සිටි වාට්ටුවකට වැදී අඩු වශයෙන් සිව් දෙනෙකු මියගොස් තවත් 14 දෙනෙක් තුවාල ලැබූහ.[203]*

රෝහලට ප්‍රහාර එල්ල කිරීම දෛනිකව සිදුවන අවස්ථාවේ පෙබරවාරි මුලදී පුදුක්කුඩියිරුප්පු කරා අතිරේක භට පිරිස් යැවීමට ගෝඨාභය රාජපක්ෂ සම්බන්ධ ය.

ඔහුගේ ලිඛිත චරිතාපදානයේ, ගෝඨාභය යටතේ සිටි එක් ආඥාපතිවරයෙකු- එවකට 53 වැනි සේනාංකයේ ආඥාපති, කමල් ගුණරත්න ලියා ඇත්තේ, තමා නිවාඩු ලබා කොළඹ සිටියදී, එවකට යුද හමුදාපති සරත් ෆොන්සේකා තමාට කතාකර පාලනය කරගත නොහැකි තත්වයට සටන් පවතින අතර 'ඔබ වහාම එහි ගොස් තත්වය පාලනය කළ යුතු බව ආරක්ෂක ලේකම්වරයාද පවසනවා'. යනුවෙන් පැවසූ බවයි[204]. ගුවන් තොටුපලට යමින් සිටියදී ගෝඨාභය තමාගේ ජංගම දුරකථනයට පළමු නමින් ඔහුගේ ක්ෂේත්‍ර ආඥාපති සමග කතා කළ බව ඔහු තවදුරටත් පවසා ඇත. :

> *ආරක්ෂක ලේකම් , ගෝඨාභය රාජපක්ෂ වහාම දුරථන ඇමතුමක් ගනිමින් ඇසුවේ 'කමල් ඔබ පිටත් වුනාද?' යන්න විමසීය. මුලතිව්හි තත්වය බරපතල බව ... විස්තර කළ ඔහු තමා කෙරෙහි ඔහු මහත් විශ්වාසයක් තබා ඇති බවත් තත්වය පාලනය කිරීමට මට හැකියාව ඇති බව විශ්වාස කරන බවත් කීවේය.*

2009  පෙබරවාරි 4 දි වන විට, නිදහස් දිනය, වාර්ෂික හමුදා පෙලපාලියේ සිටීම වෙනුවට, කමල් ගුණරත්න පවසන්නේ, ගෝඨාභය රාජපක්ෂ ප්‍රහාර දැනගත් විනාඩියේ කොළඹ හමුදා මූලස්ථානයේ මෙහෙයුම් මැදිරියේ සිට ඇති බවයි:

> *'මම පසුව දැනගත්තා ආරක්ෂක ලේකම් රාත්‍රිය පුරා  නිදි නැතිව  තත්වය සමීපව නිරීක්ෂණය කරමින් යුද හමුදාපති සමග මෙහෙයුම් මැදිරියේ සිටි බව'.[205]*

මෙයින් අදහස්වන්නේ පෙබරවාරි 3 දා රාත්‍රියේ පුදුක්කුඩියිරුප්පුවලට එල්ල කළ ප්‍රහාර ගෝඨාභය නිරීක්ෂණය කරමින් සිටි බවයි. මෙහිදී වැදගත්

---

Deadly strike on S Lanka hospital, 2 feb 2009, BBC, http://news.bbc.co.uk/1/hi/world/south_asia/7863538.stm
Reuters - https://www.reuters.com/article/us-srilanka-war/sri-lanka-hospital-shelled-at-least-9-dead-icrc-idUSTRE5111ZK20090202
Patients killed in cluster bomb attack on Sri Lankan hospital, 4 feb 2009,
https://www.theguardian.com/weather/2009/feb/04/srilanka-terrorism
CNN, Sri Lanka hospital shelled for fourth time
https://edition.cnn.com/2009/WORLD/asiapcf/02/03/sri.lanka.fighting/

200. ශ්‍රී ලංකාවේ යුද කලාපයේ රෝහලකට එල්ල කළ ප්‍රහාරයකින් රෝගීහු නවදෙනෙක් මියයති., Ap. 1 පෙබ. 2009.
https://www.cbc.ca/news/world/artillery-attack-on-hospital-in-sri-lanka-s-war-zone-kills-9-patients-1.835526

201. CNN https://edition.cnn.com/2009/WORLD/asiapcf/02/03/sri.lanka.fighting/
සහ http://www.asianews.it/news-en/Vanni-hospital-hit:-at-least-nine-dead-and-dozens-wounded-14366.html

202. 'Act responsibly or be chased out,' Gota tells BBC & envoys
ගොණුගත ලේඛන
https://sunandadeshapriya.wordpress.com/2009/02/01/act-responsibly-or-be-chased-out-gota-tells-bbc-envoys/,

203. §827

204. කමල් ගුණරත්න 'Road to Nandikadal' - පිටු 661

205. ඔහුගේ කතාවේ මේ ගැන දැක්වේ: ' රාත්‍රිය දක්වා සටන් දිගටම යන විට ගෝඨාභය රාජපක්ෂ සරත් ෆොන්සේකා සමග යුද හමුදා මූලස්ථානයේ සිට ඇත'

කරුණක් වන්නේ රෝහලට ෂෙල් ප්‍රහාර එල්ල කිරීමේ උච්ඡ අවස්ථාව එම රාත්‍රිය බව එක්සත් ජාතීන්ගේ වාර්තාවෙහි (OISL, §828) දක්වා තිබීමයි;

*'2009 පෙබරවාරි 3 දා රාත්‍රිය මුළුල්ලේම ප්‍රහාර සිදුකෙරුණු අතර ෂෙල් ප්‍රහාර තීව්‍රකිරීමක් පෙබරවාරි 4 දා උදේ සිදුවිය. මරණ,තුවාලවීම් සහ රෝහල් ගොඩනැගිලිවලට දැඩි හානි ගෙනදුන් ෂෙල් වෙඩි අඩුවශයෙන් 50 ක් රෝහල් භූමියට පතිත විය. . රෝහලේ පිවිසුම ආසන්නයට ෂෙල් වෙඩි වැටීමෙන් පස් දෙනෙක් මියගියහ. පෙබරවාරි 4 දා වන විට රෝහලේ තත්වය සංහාරයකී වගේයැයි බව පැවසූ රෝහල් සේවිකාවක් එවැනි තත්වයක් තමන් දැක නැති බව කීවාය. තුවාල ලැබූ දිගටම රෝහල කරා පැමිණෙමින් සිටි සිය ගණනකට ප්‍රතිකාර කිරීමේ අරගලයක වෛද්‍ය කාර්ය මණ්ඩල සාමාජිකයන් රැයෙදී අතර වෛද්‍ය පහසුකම් විනාශවී තිබූ අතර ෂෙල් ප්‍රහාර සිදුවෙමින් පැවති නිසා රෝහල් සේවකයන්ට බංකර්වල සැඟවීමට සිදුවිය.'*

මුළු රාත්‍රියම ගෝඨාභය මෙහෙයුම් මැදිරිය තුළ ගතකළ බව සැළකිල්ලට ගන්නා විට, තුවාලකරුවන්ගෙන් පිරී ඇති බව ඔහු දැනසිටි රෝහලට යළි යළිත් ප්‍රහාර එල්ල කරන බව, කලින් ජාත්‍යන්තර රතු කුරුස කමිටුව නිකුත් කළ ප්‍රකාශයෙන් පමණක් නොව, ලැබුණු ක්ෂේත්‍ර වාර්තාවලින් සහ එම ප්‍රදේශය පිළිබඳ ආවේක්ෂණ දර්ශනවලින්ද ඔහුට පැහැදිලි අවබෝධයක් තිබෙන්නට ඇත.[206]

තවද හමුදාව සමඟ වූ ඇසින් දුටුවකු කියාපාන්නේ පුතුක්කුඩිඉරුප්පු රෝහලට වෙඩි ප්‍රහාර එල්ලකිරීමට ගෝඨාභය පෞද්ගලිකව නියෝග කළ බවයිඃ

*'ඒවා රෝහල් බව අප මේවන විටත් දැන නොසිටියේ නම්, ජාත්‍යන්තර රතු කුරුස කමිටුව සහ එක්සත් ජාතීන්ගේ සංවිධානය නිතරම එම සංවිධානවල රෝහල්, ආහාර බෙදාහැරීමේ සහ තාවකාලික රෝහල් සම්බන්ධීකරණයන්ට ගුවන් විදුලි පණිවුඩ යවන බැවින් අවසානයේ එහි රෝහල් තිබුණු බවට සැකයක් නැත . ඒ අනුව ගෝඨාභය වෙඩි තැබීමට නියෝගය දෙන විට කාලතුවක්කු රෝහල්වලට පමණක් නොව ප්‍රදේශයේ ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ සහ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ කාර්ය මණ්ඩලයටද යොමු කරනු ලබන බව ඔහු දැන සිටියේය.'*[207]

මෙම පරිශ්‍ර යුදමුක්ත කලාපය තුළ පිහිටා නොතිබුණත් රෝගීන් එහි ගලාඑන බව තමන් සෞඛ්‍ය අමාත්‍යාංශයට දැන්වූ බව පුතුක්කුඩිඉරුප්පු රෝහලේ වෛද්‍යවරු පැවසූහ. 'මම ශ්‍රී ලංකා රජයේ සෞඛ්‍ය පරිපාලනයට ජනතාවට යුද මුක්ත කලාපයේ පහසුකම් නැති නිසා ඔවුන් ප්‍රතිකාර සඳහා මෙහි පැමිණෙන බව දැන්වූවා.' වෛද්‍ය වර්ධරාජා පැවසීය (W143). ශ්‍රි ලංකා යුද හමුදාව රෝහල වටා මීටර් 500 ක ආරක්ෂිත කලාපයක් සඳහා එකඟ වූ බව ඔහු පැවසූ අතර ජාත්‍යන්තර රතු කුරුස කමිටුව නිතරම එම මීටර් 500 ඇතුළත එල්ටීටීඊ සාමාජිකයන් නැති බව ස්ථිර කළේය. අවසානයේදී වෛද්‍ය කාර්ය මණ්ඩලය අනූනවයෙන් සිය ජීවිත බේරා ගත්තේය.

තුවාල ලබා රෝහලේ ඉඳුම් හිටුම් ලබාසිටි අය මරා දැමීමක් හෝ යළි තුවාලවීමකට ලක්වීමක් සිදුවිය. 2009 පෙබරවාරි මස මුලදී පුදුක්කුඩියිරුප්පු රෝහලේ සිටින විට එය ප්‍රහාරයට ලක්වූ බව සාක්ෂිකරු W372 ප්‍රකාශ කළේය.

*'මගේ නැන්දම්මා නතරකර සිටි වාට්ටුවට මුළුමනින්ම හානි සිදුවී තිබූ බවත් නැන්දාගේ අනික් පැත්තේ සිටි තරුණ පිරිමි ළමයෙකු සහ මවක මරණයට පත් වෙනත් බොහෝ දෙනෙකු අතර වූ බවත් මම දැක්ක. වෙනතක් බලා යාමට ඇයට නොහැකි නිසා මගේ නැන්දම්මා ඇගේ දියණිය සමඟ ඇඳයට සැඟවී සිටි ඇයට දුෂ්කරතා අසන්නට ලැබී ඇත. තාප්පයට පිටපැත්තෙන් හානි සිදුකර තිබූ අතර කෑ මොර ගසමින් මිනිස්සු බියට පත්ව හැම පැත්තටම දුවමින් සිටියා. එය සම්පූර්ණ ව්‍යාකූලභාවයක්. එය රෝහලක් බව ඔවුන් දැනසිටියත්, ඔවුන් හිතමතා එය ඉලක්ක කර එයට පහරදී ඇත.'*

**පුදුමාත්තලන්**

*මාස ගණනක් බෝම්බ හෙළීම*

වෙරළ භූමියේ දිග වැලි තීරුවක් වන යුද මුක්ත කලාපය 2 ට 2009 අප්‍රියෙල් මාසයේ ඇතුළුවීම සිදුවූයේ, ප්‍රධාන වශයෙන් පුදුමාතලන් සහ

206. ගෝඨාභය රාජපක්ෂ දුරස්ථව යුද්ධය බලාසිටි එදින රාත්‍රියේ පුදුක්කුඩියිරුප්පු රෝහලේදී කීදෙනෙකුට ජීවිත අහිමිවූයේදැයි සමස්තයක් ලෙස ප්‍රකාශකිරීමට දුෂ්කර නමුත් එක් වාර්තාවක් (War without Witness) 2009 පෙබරවාරි 3 දා මැරුණු සංඛ්‍යාව 100 ක් බවත් පසුදින පුදුක්කුඩියිරුප්පුහි 51 ක් බවත් ගණන් බලා ඇත. වෛද්‍ය කාර්ය මණ්ඩලය සම්පාදනය කළ හානි සිදුවූවන් ගැන වාර්තාවේ පෙබරවාරි මාසයේ පළමුවැනි 12 දින තුළ පරතරයක් පවතින අතර එයට බොහෝ සෙයින් ගොඩනැගිලි විනාශ කෙරුණු ප්‍රහාරවලින් වාර්තා විනාශවී යාම සහ කාර්ය මණ්ඩලය තම දිවි බේරා ගැනීමට පලායාමට උත්සාහ දැරීමෙන් සහ තාවකාලික ස්ථානයක් ඉදිකිරීමට යාම හේතුවන්නට ඇත. අතිශයෙන් නිවැරදි පැතුරුම්පත් යළි 2009 පෙබරවාරි 12 දා ආරම්භ විය.

207. ගොණුගත ලේඛන, W70

මුල්ලිවයික්කාල් හි තාවකාලික රෝහල්වල නවාතැන්ගෙන සිටි දහස් ගණන් සිවිල් වැසියන් සිටි ප්‍රදේශයට මාස ගණනාවක් බෝම්බ හෙළීම්වලින් පසුවය . පුදුමාතලන් වෙත එල්ල කෙරුණු මෙම ප්‍රහාර සම්බන්ධයෙන් ශ්‍රී ලංකා හමුදා ආයතනයට මනා දැනුමක් තිබුණ: එයට හේතු වූයේ (අ) ඔවුන්ට නියමුවන් රහිත යානා සහ ආවේක්ෂණ දර්ශන තිබීම (ආ) ඇතුළට රිංගාගත් අය භූමියේ සිටීම (ඇ) චන්ද්‍රිකා ඡායාරූප (ඈ) තාවකාලික රෝහල්වල ස්ථාන නිර්ණයන ඛණ්ඩාංක (ඉ) කලපුව හරහා පියවි ඇසින් එම භූමි ප්‍රදේශ බැලීමට ඔවුන්ට හැකියාව තිබීම (ඊ) පූජ්‍ය පක්ෂය, එක්සත් ජාතීන්, ජාත්‍යන්තර රතු කුරුස කමිටුව, වෛද්‍ය කාර්ය මණ්ඩලය සහ කොටුවී සිටි වෙනත් අය එවූ බලාපොරොත්තු සුන්වූ වාර්තාවලට ඔවුන්ට ප්‍රවේශය තිබීම.

### අප්‍රියෙල් 18 දා ඇතුළුවීම

රජයේ පුවත්පතක පළ කෙරුණු පහත දැක්වෙන වාර්තාව ප්‍රකාශ කර ඇත්තේ පුදුමාත්තලන් සහ පොක්කනෙයි හි 'දෙවැනි යුද මුක්ත කලාපයට' ශවේන්ද්‍ර සිල්වාගේ හමුදා (58 සේනාංකය) ඇතුළුවීමට යෝජනා කළේ ගෝඨාභය රාජපක්ෂ බවයි. එය 2009 අප්‍රියෙල් 18-21 අතර සිදුවිය.

> *සිකුරාදා අලුයම් කාලය වන විට යුද මුක්ත කලාපයේ පැවති අවසන් පස් බැම්ම 58 වැනි සේනාංකය විසින් අල්ලා ගනු ලැබීමෙන් පසුව ,එල්ටීටීඊ අණසක යටතේ පැවති ප්‍රදේශය ඇතුළත සිටින සිවිල් ජනතාව කෙරෙහි සැලකිලිමත් වෙමින් අලුතින් මායිම් නියම කරන ලද යුද මුක්ත කලාපය[208] සිකුරාදා ප්‍රකාශයට පත් කරන ලදී. කෙසේවුවත්, යුද මුක්ත කලාපය ප්‍රතිනිර්මාණය කරන ලද්දේ කලින් ප්‍රකාශයට පත්කර තිබූ යුද මුක්ත කලාපයේ බහුතර කොටසක් ආරක්ෂක හමුදා විසින් අප්‍රියෙල් 20 දාට පසුව මේ වන විටත් අල්ලාගෙන ඇති හෙයින් ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ ආරක්ෂක කවුන්සිලයට යෝජනාවක් ඉදිරිපත් කිරීමෙන් පසුව ආරක්ෂක කවුන්සිලය විසිනි. කෙසේ වෙතත් ජනාධිපති මහින්ද රාජපක්ෂට සහ ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂට ආරක්ෂක හමුදා විසින් එල්ටීටීඊ නායක වේළුපිල්ලේ ප්‍රභාකරන් නැසී හෝ පණපිටින් අල්ලා ගන්නා තුරු කිසිම තත්වයක් යටතේ හමුදා ක්‍රියාන්විත නිමාවක් නොකිරීමේ ඔවුන්ගේ තීරණයෙහි එල්බ සිටීමට හැකිවූහ.[209] "*

පසුව ගෝඨාභය, ශවේන්ද්‍ර සිල්වා උදාර කාර්යයක් ඉටුකළ බව පවසමින් ඔහු යුද්ධය මෙහෙයවූ ආකාරය පැසසීය.[210] 2009 අප්‍රියෙල් මාසයේ පුදුමාත්තලන් ප්‍රහාරයේ සාර්ථකත්වය ආරක්ෂක ලේකම් සහ ඔහුගේ හමුදාපතිවරුන් දිවා රාත්‍රිය මුළුල්ලේ ඉටු කළ මහඟු මෙහෙය නිසා අත්වූ බව මාධ්‍ය වාර්තා පවසයි.[211] තවද, උගත් පාඩම් සහ ප්‍රතිසංධාන කොමිසමට සාක්ෂි දුන් ශවේන්ද්‍ර සිල්වා විසින් 'මානුෂීය මුදාගැනීමේ මෙහෙයුමක්' ලෙස වංක ලෙස හැඳින්වූ ප්‍රහාරයට අණදෙමින් ඉදිරියට යාමේදී තමාට ඩ්‍රෝන දර්ශනවලට ප්‍රවේශයක් පැවති බව පැවසීය.[212]

### සිවිල් ජනතාවට වූ හානි

උන් හිටි තැන් අහිමිව හාමත්ව පුදුමාත්තලන්හි සරණ සොයා ආ සිවිල් ජනතාව සිටි ප්‍රදේශවලට මාස කිහිපයක් දරුණු බෝම්බ හෙලීම් හා ප්‍රහාරවලින් පසුව එයට ඇතුළුවීම සිදුවිය. ආරක්ෂක හමුදා 2009 අප්‍රියෙල් 20 සහ ආසන්න දිනවල මෙම වැලි බිම් තීරුව දක්වා සටන් කරගෙන ගියේය. එය ප්‍රධාන වශයෙන් සිවිල් ජනතාවට එරෙහි ආක්‍රමණයක් වූ අතර එයින් ජීවිත රැසක් අහිමි විය.

මෙම කඩා වැදීමෙන් 'විශාල සිවිල් ජන පිරිසකට හානි සිදු වූ' බව එක්සත් ජාතීන්ගේ විශේෂඥ කමිටු වාර්තාව (§109) තහවුරු කළේය. ජාත්‍යන්තර රතු

208. මෙය 3 වැනි යුද මුක්ත කලාපයයි.

209. පෙරමුණු තුනකින් හට පිරිස් කොටි භූමිය දෙසට ඉදිරියට යති - 10 මැයි 2009, Daily News

210. '258 සේනාංකයේ බ්‍රිගේඩියර් ශවේන්ද්‍ර සිල්වා අසිරිමත් කාර්භාරයක් ඉටු කළේය. ඔහුගේ සේනාංකය උතුර ආපසු අල්ලා ගැනීමේ ව්‍යාපාරයට මන්නාරමෙන් එක්විය. පූනරීන්. සිට පරන්තන් දක්වා සම්පූර්ණයෙන්ම ද ඊළඟට පරන්තන් සිට විසුවමඩු, පුදුක්කුඩියිරුප්පු සහ අවසානයේ යුද මුක්ත කලාපයේ අවසානය වූ පුදුමාත්තලන් අල්ලා ගැනීමද ඔවුන්ගේ වගකීම විය. ඔහුගේ සේනාංකයද වන්නි මෙහෙයුම ආරම්භයේ සිට අවසානය දක්වා සම්බන්ධ වූ අතර ඔවුහු ඉතා වැදගත් ප්‍රදේශ ආවරණය කරමින් අල්ලා ගත්හ. බ්‍රිගේඩියර් ශවේන්ද්‍ර සිල්වා ඔහුගේ සේනාංකයට මනාව කාර්යක්ෂමව සහ සාර්ථකව නායකත්වය දුන්නේයි.' - Business Today ජූනි 2009 - 'ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ රණවිරුවන්ට ආචාරය පුදකරයි'

211. 'ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ, යුද හමුදාපති ලුතිතන් ජෙනරාල් සරත් ෆොන්සේකා, නාවික සහ ගුවන් හමුදාපතිවරුන්, ඉරිදා (19) රාත්‍රියේ වෙනම රටක් සඳහා එල්ටීටීඊ ලේ වැගුරූ යුද්ධය අවසන් අදියර සාර්ථක කරගැනීමෙන් පසුව මානුෂවාදී මුදාගැනීමේ ක්‍රියාන්විතය ගැන දවස මුළුල්ලලේම සම්බන්ධවී සිටි බව වාර්තා වෙයි.' https://www.army.lk/news/worlds-biggest-rescue-operation-full-swing-president-personally-monitors

212. 'මෙම සිවිල් ජනයා බේරා ගැනීමේ විශාලතම මෙහෙවර ඉටුකිරීමට මට හමුදාපතිවරයා දැනුම් දුන්නා. ලෝකයේ විශාලතම මුදාගැනීමේ මෙහෙයුම ලෙස ප්‍රකට වන එය පුදුමාත්තලන්හිදී නියමුවන් රහිත යානා මගින් ලබාගත් සේයා රූ මගින් පෙන්වන ලදී. … සති තුනකට වැඩි කාලයක් පුරා එල්ටීටීඊ ස්ථාන මගේ හට පිරිස් විසින් හඳුනාගනිමින්, එල්ටීටීඊ අගල් හඳුනාගනිමින් පුදුමාත්තලන් හා කිලෝ මීටරයක පමණ පරතරයක් බිඳදැමීමට අපට හැකිවූණා, කොමාන්ඩෝ හට පිරිස් සහ විශේෂ බලකායේ හට පිරිස් සමඟ මෙම කාර්ය ඉටුකිරීම ඇත්ත වශයෙන්ම මගේ බලසේනාවට පැවරුවා'. ශ්‍රී ලංකා යුද හමුදාවේ 58 බලසේනාවේ ආඥාපති මේජර් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා 2010 සැප්තැම්බර් 8 දා - උගත් පාඩම් සහ ප්‍රතිසංධානය පිළිබඳ කොමිසමට කළ කරුණු දැක්වීම.

කුරුස කමිටුව එය විස්තර කළේ 'ව්‍යසනයක් මිස ඊට අඩුදෙයක් නොවන බවයි'.[213] එක්සත් ජාතීන්ගේ OISL වාර්තාව (§848) පෙන්වා දුන් පරිදි, 'කාලතුවක්කු වැනි අවි භාවිතයෙන් සිවිල් ජනතාවට වන බලපෑම ගැන විශේෂයෙන් කනස්සල්ල පළ කළ ජාත්‍යන්තර රතු කුරුස කමිටුව විශාල ජන ඝනත්වයකින් යුත් ප්‍රදේශයක සටන් කෙරෙන විශේෂිත තත්වයක්' පවතින සන්දර්භයක දැඩි ලෙස පූර්ව ආරක්ෂක ක්‍රම යොදා ගන්න ලෙස දෙපාර්ශවයෙන්ම ඉල්ලීමක් කර ඇත'. පුදුමාත්තලන් රෝහලට සහ එක්සත් ජාතීන්ගේ මධ්‍යස්ථානයට යුද හමුදාව සහ ගුවන් හමුදාව ප්‍රහාර සිදුකළ බවට ඇති සාක්ෂි විශාල ප්‍රමාණයක් සනාථ කෙරෙන චන්ද්‍රිකා ඡායාරූපද එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් පරීක්ෂා කර බලන ලදී. පොකුරු බෝම්බ සහ ආර්පීජී ඔවුන්ගේ ඉලක්කවලදී යොදා ගෙන ඇති බවත් එවන් සමීප පරාසයක සිට එසේ කිරීම හිතුමතේ ඉලක්ක කිරීමක් බවත් එක්සත් ජාතීන් විසින් වාර්තා කර ඇත. 2009 අප්‍රියෙල් 21 දා, 'කාල තුවක්කු වෙඩි තැබීම සමඟ ගුවනින් බෝම්බ හෙළීමෙන් රෝහලේ රෝගීන් සහ ඔවුන්ගේ ඥාතීන් සිටි කූඩාරම්වල ගිනිගැනීමක් වූ අතර හැකි අයට මුහුද ලඟ වැලි බංකර් කරා පලා යාමට සිදුවූ බව ජාතීන්ගේ සංවිධානය විසින් තවදුරටත් පවසයි.' (§847).

ජාත්‍යන්තර අර්බුද කණ්ඩායමේ (ICG) හි 2010 යුද අපරාධ වාර්තාව මෙසේද ප්‍රකාශ කොට ඇතඃ

> *'ඉදින් අප්‍රියෙල් 19 දින සිට -ආරක්ෂක හමුදා කලපුව තරණය කර යුද මුක්ත කලාපයට ඇතුළුවීමට සූදානම් වෙමින් සිටින විට - පුදුමාත්තලන් සහ අම්පලවන්පොක්කනෙයි අතර උග්‍ර ලෙස ෂෙල් ප්‍රහාර නිසා සිවිල් වැසියන් ගණනාවකට හානි පැමිණ ඇත. 20 දා උදේ ෂෙල් ප්‍රහාරවලින් රෝහලට දැඩි හානි සිදුවිය. රෝහල ඉදිරිපිට ආරක්ෂක හමුදා සහ එල්ටීටීඊය අතර සටන් ඇවිලී තිබුණි. ආරක්ෂක හමුදා විසින් එල්ටීටීඊය පසුබස්සවා යුද මුක්ත කලාපය ඉඳුරාම දෙකට බෙදීම සමග බොහෝ දෙනකු මියගිය අතර මියැදෙමින් සිටි අය රෝහලෙහි හෝ අවට හෝ අතහැර දමන ලදී. පසුදිනවලදී ලක්ෂයක් පමණ දෙනා රජයේ පාලනය යටතේ පැවති ප්‍රදේශයට කළපුව හරහා පැමිණියත් ඒ වෙනුවෙන් විශාල මිලක් ගෙවන්නට සිදුවී තිබුණි. රෝහලේදී සහ පිටතදී සිවිල් වැසියන්ට බරපතල ලෙස හානි සිදුවූ අතර වෛද්‍ය කාර්ය මණ්ඩලයට යළිත් ඉවත්ව යාමට සිදුවීමෙන් වෛද්‍ය සැපයුම් සහ උපකරණ නැතිවීම හෝ අතහැරදමා යාම සිදුවිය.'*

**විධාන දාමය**

'දෙවැනි යුද මුක්ත කලාපයට' ඇතුළුවීමෙන් සිවිල් වැසියන්ට සිදුවිය හැකි හානිය අතිවිශාල බව ඉඳුරාම කල්තියා දැනගත හැකි වුවකි. සහකාර රජයේ ඒජන්තවරයාගේ සංඛ්‍යාලේඛන අනුව 2009 මාර්තුවල යුද කලාපයේ ජනගහණය 300000 යකි (පෙට්රි ඇමුණුම). පෙබරවාරි මාසයේදී එම කලාපය වර්ග කිලෝ මීටර් 14 ක් විශාල වූවත් එම විශාලත්වය අඩුවෙමින් පැවතුනි. සිවිල් වැසියන් රොක්කරනු ලැබ සිටි පුදුමාතලන් තාවකාලික රෝහල ප්‍රහාරයට ලක්වූවකි[214]. එම රෝහල සති කිහිපයක්ම අඛණ්ඩ ප්‍රහාරවල ඉලක්කය වූ අතර ලෙයින් තෙත්වූ වෙළුම්පටි ඇතිව තුවාල ලැබූවන් බිම වැතිරී සිටි එහි තත්වය තැති ගන්වන සුළු විය. 2009 අප්‍රියෙල් 21 දා ගත් වීඩියෝ දර්ශනයකින් පෙන්නුම් කළේ තවාළ ලැබූ සහ ෂෙල් වෙඩිවලින් කම්පනයට පත් මහළු කාන්තාවන්, බිළිඳුන් සහ ළමයින් විශාල වශයෙන් මුල්ලිවයික්කාල්වලට ට්‍රැක්ටර්වලින් ප්‍රවාහනය කරමින් සිටින ආකාරයයි[215].

රජයේ මාධ්‍යට අනුව, 2009 අප්‍රියෙල් 18 වැනිදා පුදුමාත්තලන්වලට පහරදීමේ නියෝගය ජනාධිපතිවරයා විසින් පමණක් නොව ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ විසින්ද අනුමත කළ යුතුව තිබුණිඃ

> *'යුද මුක්ත කලාපයේ කොටුවී සිටි 120,000 කට වැඩි සිවිල් ජනතාව බේරා ගැනීමේ විශාලතම මානුෂීය මෙහෙයුම ඉදිරියට කරගෙන යාමට යුද හමුදාපති ලුතිතන් ජෙනරාල් සරත් ෆොන්සේකාට ජනාධිපති රාජපක්ෂගේ සහ ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂගේ පූර්ණ ආශිර්වාදය ලැබුණේ එම නිසා ය.'[216]*

පුදුමාත්තලන් සහ පොක්කනෙයි මතභේදාත්මක ප්‍රහාරය දෙස ආපසු බැලීමඃ

රාජපක්ෂ සහෝදරයන් දෙදෙනාගෙන්ම ඔහුට අවසර ලැබීමෙන් පසුව පමණක් යුද හමුදාපති ලුතිතන් ජෙනරාල් සරත් ෆොන්සේකා 'යුද මුක්ත කලාපය' යැයි හැඳින්වූ කලාපයට එරෙහිව ආක්‍රමණය ආරම්භ කරන ලෙස 58 සේනාංකයේ ආඥාපති ශවේන්ද්‍ර සිල්වාට එම නියෝගය දැනුම් දුන්නේය.[217] මෙය ශ්‍රී

213. ICRC, 21 April 2009, News Release 09/81, ' ජාත්‍යන්තර රතු කුරුස කමිටුව' යුද මුක්ත කලාපයේ තවත් ලේ වැගිරීම් අවම කිරීමට විශේෂ පූර්වාරක්ෂක ක්‍රියාමාර්ග ගන්නැයි ඉල්ලීමක් කරයි.

214. https://groundviews.org/2012/09/12/the-end-of-war-in-sri-lanka-captured-for-posterity-by-google-earth/

215. ගොණුගත ලේඛන

216. Daily News, 26 April 2009

217. 'වව්නියාවේ ක්ෂේත්‍ර මූලස්ථානයේ සිට ජෙනරාල් සරත් ෆොන්සේකා හමුදා සන්නිවේදන මාර්ගයෙන් සහ කීර්තිමත්

ලංකාවේ රාජ්‍ය පුවත්පතක් සනාථ කළේය:

*'අප්‍රියෙල් 18 දා පැය ගණනක් ඔවුන් සමඟ පැවති සාකච්ඡාවලින් පසුව , ජනාධිපති මහින්ද රාජපක්ෂ සහ ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ යන දෙදෙනාගෙන් අවසන් අණ ලැබී සිටි යුද ප්‍රවීණ ලුතිතන් ජෙනරාල් ෆොන්සේකා සැලසුම් කළ පරිදි ඉදිරියට යාමට අවසරය දුන්නේය. යුද මුක්ත කලාපය ආසන්න පරාසයේ සිටි 58 වැනි සේනාංකයේ භට පිරිස්වලට මෙම කාර්ය පවරන ලදී.'* [218]

## මුල්ලිවයික්කාල් ප්‍රහාරය (යුද මුක්ත කලාපය 3)

### *සිවිල් වැසියන්ට ප්‍රහාර දිගටම*

පසුගිය මාසවල මෙන් ම තුන්වැනි 'යුද මුක්ත කලාපයට' කළ ප්‍රහාර ක්‍රියාත්මකව පැවති ඉතිරි රෝහල්වලට නැවත නැවතත් ෂෙල් ප්‍රහාර සිදු කරමින් සිවිල් වැසියන් එකදිගට සිදු වූ වෙඩි ප්‍රහාරයට ගොදුරු කරගන්නා කලින් මාසවල පැවති රටාවම අනුගමනය කළේය. සංහාරය සහ දුක වේදනාව ගැන විවිධ රාජ්‍ය නොවන සංවිධාන සහ එක්සත් ජාතීන් විසින් ඔවුන්ගේ වාර්තාවල ගතවූ දශකය තුළ මනාව ලේඛනගත කර ඇති අතර එම සාක්ෂි මෙහි නැවත ඉදිරිපත් කිරීමක් සිදු නොවේ.

උදාහරණයක් ලෙස OISL ප්‍රකාශ කළේ:

තුන්වැනි 'යුද මුක්ත කලාපයට' දෛනිකව උග්‍ර ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ කාලතුවක්කුවලින්, ගුවන් හමුදාවෙන් සහ නාවික හමුදාවෙන් ප්‍රහාර එල්ලවෙමින් තිබියදී, මැයි 8 සහ 12 අතර මෙම පහසුකමට අවස්ථා කිහිපයකදී ෂෙල් ප්‍රහාර එල්ලවිය (§878)…. යුද මුක්ත කලාපය ඇතුළත ප්‍රදේශය පුරා ෂෙල් ප්‍රහාරවලින් මියගිය සිය ගණනකගේ සිරුරු විසිරී තිබුණු විනාශකාරී ස්වභාවය විවිධ සාක්ෂිකරුවෝ විස්තර කළහ. (§885)'

සිවිල් වැසියන් නොමඟ යවන උපදෙස්

මෙම අවස්ථාවේ මරණයට පත්නොවී මිනිසුන්ට පිටවයාමට නියත වශයෙන් නොහැකි බව සම්පූර්ණයෙන් හොඳින් දැන සිටිමින්, 2009 මැයි මාසයේ මුලදී, යුද හමුදාව යුද කලාපයේ සිටි දෙමළ ජනතාවට ඉවත්ව යන ලෙස උපදෙස් දෙමින් පත්‍රිකා හෙළූ බව වාර්තාවෙයි[219].

සටකපට අයුරින්, ඊළඟට හමුදාව දෙමළ ජනතාව වෙත 2009 මැයි 8 සහ 9 දිනවල පත්‍රිකා හෙළමින් 'යුද මුක්ත කලාපයේ' වෙඩිතැබීම් පැවතියත් එහිම නතර වී සිටින ලෙස උපදෙස් දුන්නේය. මෙමගින් හමුදාව විසින් පිළිගෙන ඉදිරි කටයුතු කළ හැකිව තිබූ වඩ්ඩුවාක්කල් පාලම කරා ගමන්කිරීමට උපදෙස් දී ඔවුන්ට රැකවරණය සැලසීම වෙනුවට හිතාමතා සිවිල් වැසියන් වෙඩි තබන ප්‍රදේශයට දැමීමක් විය.[220]

**මහජනතාවට කෙරෙන විශේෂ නිවේදනයයි**

ඔබ දැනට සිටින ස්ථානවලම නතරවී සිටින
ලෙසත්
උතුරු නැගෙනහිර හෝ බටහිර යන කිසිම
ප්‍රදේශයක වේවා, කිසිම
තැනකට නොයන ලෙසත් ආරක්ෂක හමුදා
ඔබගෙන් ඉල්ලා සිටී. (විශේෂයෙන්
වෙල්ලයි මුල්ලිවයික්කාල් කරා නොයන ලෙස
ඉල්ලා සිටිනු ලැබේ).
මෙම පියවර ගනු ලබන්නේ ඔබගේ ආරක්ෂාව
සහතික කරනු පිණිස ය.
ඔබට නතරවී සිටීමට ඉඩදෙන ප්‍රදේශය
ගුවන්යානයක් මාර්ගයෙන්
ලබාගත් පින්තූරයකින් පෙන්නුම් කරයි.

**සිවිල් වැසියන්ට එරෙහිව බර අවි යොදා ගැනීම**

අවසන් සතිය තුළ යුද කලාපය ඇතුළත සිවිල් වැසියන් දස දහස් ගණනක් සිටින බව දැනගෙන ඒ සම්බන්ධයෙන් සම්පූර්ණ අවබෝධක් ඇතිව සිටි රජය, යුද කලාපයෙන් බේරී පලා ආ සියල්ලන් දැඩි පරීක්ෂාවට ලක්කොට ගණන් ගැනීමක් කළේය.[221]

---

ආඥාපතිවරයෙකු වන බ්‍රිගේඩියර් ශවේන්ද්‍ර සිල්වා ඇමතීය. ලෝකයේ විශාලතම ප්‍රාණ ඇපකරුවන් මුදාගැනීමේ මෙහෙයුම දියත්කිරීමට සැලසුම නිමකර ඇති බවත් එය ක්‍රියාත්මක කරන ලෙස ඔහුට දැනුම් දුන්නේය. 2009 අප්‍රියෙල් 18. http://www.indiandefencereview.com/spotlights/lessons-from-the-war-in-sri-lanka/
- එම - '9වැනි ගැමුණු හේවා බලඇණිය, 8වැනි ගජබා බලඇණිය, 11වැනි ශ්‍රී ලංකා පාබල බලඇණිය, කර්නල් රැල්ෆ් නුගේරාගේ අණ යටතේ ක්‍රියාත්මක 2වැනි කොමාන්ඩෝ බලඇණිය සහ කර්නල් අතුල කොඩිප්පිලිගේ අණ යටතේ කි්‍යාත්මක වූ 1වැනි විශේෂ බලකා බලඇණිය 'මුදාගැනීමේ මෙහියුම' සඳහා විශේෂයෙන් තෝරාගත් බව' ද එයින් පෙන්වා දෙයි. - 'එක ලේ බිඳුවක්වත් නොසලා විශාලතම මානව නාටකය අවසන්වෙයි. ප්‍රාණ ඇපකරුවන් 120.000 නිදහස්' 3 මැයි 2009, Daily News

218. එම

219. "සමූලඝාතනයෙන් බලාපොරොත්තු වන්නේ සිවිල් වැසියන් ප්‍රරෝධනය කිරීමට බව සිවිල් වැසියන්ට ශ්‍රී ලංකා යුද හමුදාව පැත්තට එන ලෙස ඉල්ලීමක් කරන ජනාධිපති මහින්ද රාජපක්ෂගේ පණිවුඩයක් අඩංගු ගුවනින් හෙලූ පත්‍රිකාවක් ගෙනහැර දක්වමින් බේරා ගැනීමේ සේවාවේ සේවකයෙක් පැවසීය. ශ්‍රී ලංකා යුද හමුදාව ඉලක්කගත ෂෙල් ප්‍රහාර මගින් රෝහලේදී 64 දෙනෙකු 2009 මැයි 2 දා ඝාතනය කළේය' 2009, https://www.tamilnet.com/art.html?catid=13&artid=29240

220. අදාළ දිනයේදී ආරක්ෂක හමුදා විසින් සිංහල සහ දෙමළ බසින් හෙළන ලද අත් පත්‍රිකා (එල්.එල්.ආර්.සී. ඇමිණුම් ii)

221. 'පසුගිය දින තුන තුළ 50,000 කට වැඩි පිරිසක් යුද කලාපයෙන් ඉවත්ව ගොස් ඇති බව මැයි 17 දා යුද හමුදා ප්‍රකාශයෙක් පැවසීය' https://www.refworld.org/docid/4a1d3e1023.html - Sri Lanka military says all civilians escape war zone

දිවිබේරා ගෙන පැමිණි අය (ITJP විසින් සම්මුඛ සාකච්ඡා පැවැත්වූ) යුද්ධයේ අවසන් සතියේදී ජනතාව බහුලව රැඳීසිටි ප්‍රදේශවලට මැයි 16 දා දක්වා, ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදා විසින් විශාල වශයෙන් ෂෙල් ප්‍රහාර එල්ල කළ බවත් ඒවා සාපරාධී ක්‍රියා හා යුද අපරාධ ලෙස සැලකිය හැකි බවත් විස්තර කරමින් එයට හේතුව ලෙස දැක්වූයේ එම ප්‍රදේශය තුළ තුවාල ලබා සහ මියැදෙමින් කාන්තාවන්, ළමයින්, මහල්ලන් සහ සිවිල් වැසියන් දස දහස් ගණනක් සිටින බව රජය දැන සිටීම බවයි. තවමත් එහි කොටුවී සිටි අයගෙන් සහ මැයි 17 දා වන විට තවමත් එහි සිවිල් වැසියන් 30-80,000 ක් කොටුවී එහි සිටින බව විශ්වාස කළ, එක්සත් ජාතීන් ගෙන් අපේක්ෂා භංගත්වයෙන් යුතු දුරකතන ඇමතුම් ලැබුණි.[222]

දිවා ආහාර වේලාවේදී බෙදා දෙන ආහාර සලාකය ලබාගැනීමට දිග පෝලිමක රැඳී සිටියදි 2009 මැයි 12 හෝ 13 වෙල්ලියාමුල්ලිවයික්කාල් හි සිවිල් වැසියන්ට එල්ල කෙරුණු ප්‍රහාරයක් දුටු බව සාක්ෂිකරු W374 විස්තර කළේය:

> *'ශ්‍රී ලංකා හෙලිකොප්ටර් යුද යානාවක් මෙම මිනිස්සුන්ට පහර දුන්නා. මමත් සිටියෙ එහි පොලිමේ. මම දැක්කා හෙලිකොප්ටරය පහලින් පියාසර කරලා ප්‍රහාරය සිදු කරනවා. හෙලිකොප්ටරයේ සිට වෙඩි තබන මිනිස්සු මම දැක්කෙ නැහැ. මම හිතන්නෙ ඔවුන් මැෂින් තුවක්කුවක් යොදා ගත්ත කියල. බොහෝ දෙනෙකුට තුවාල වුනා. අපි බේරෙන්න බිම වැතිරුනා. MI24 ප්‍රහාරක හෙලිකොප්ටරය ගිය පසු මිනිස්සු ඔවුන්ගේ ඇඳුම් ඉරලා ලේ ගැලීම් නවත්වන්න තුවාල රෙදි කෑලිවලින් බැඳගත්ත. ඔවුන් යළිත් ආහාර ගන්න පෝලිමට එක්වුනා. මොකද ඔවුන් සිටියෙ හාමතින් සහ කෑම ලබාගැනීමට උවමනාවෙන්. මේ සිද්ධිය වුනෙ 2009 මැයි මාසෙ 12 හෝ 13 දා.7 දෙනකුට වඩා මැරුණා. ළමයින්, වැඩිහිටියන් ඇතුළු 25 කට වැඩි පිරිසක් තුවාල වෙලා හිටියා. ඒ සියල්ලන්ම සිවිල් වැසියන්. ආහාර බෙදල දුන්නෙ දවසක නියම කළ වෙලාවකදි පමණයි. දවසේ ඉතිරි කාලය තුළ මිනිස්සු හිටියෙ බංකරවල. පැය 24 මුළුල්ලෙ ඩ්‍රෝන ඒ පැත්තෙ රවුමේ යනවා.'*

මැයි 10-16 කාලයේදී මල්ටි බැරල් රොකට් ලෝන්චර්වලින් තුන්වැනි යුද මුක්ත කලාපයට ප්‍රහාර එල්ලකිරීම ගැන බියජනක අත්දැකීම් සාක්ෂිකරුවෝ කිහිපදෙනෙක් කරුණු දැක්වූහ. මැයි මාසයේ දෙවැනි සතියේදී මල්ටි බැරල් රොකට් ලෝන්චර්වලින් මුල්ලිවයික්කාල් රෝහලට සිදුකළ ප්‍රහාර සම්බන්ධයෙන් W374 විස්තර කළේය. කලපුවේ අනික් පැත්තේ කෙපාපුලවූ සිට එම සතියේ මල්ටි බැරල් රොකට් ලෝන්චර් ප්‍රහාර එල්ල කරනු දුටු බව දිවිබේරුණු තවත් අය පැවසූහ:

> *'මමත් රෙට්ටවයික්කාල සහ මුල්ලිවයික්කාල් අතර ප්‍රදේශයේදී මැයි මාසේ 10-15 අතරදී සිවිල් වැසියන්ට එල්ල වූ මල්ටි බැරල් රොකට් ලෝන්චර් ප්‍රහාර අත්දුටුවා. එම මල්ටි බැරල් රොකට් ලෝන්චර් ප්‍රහාර ආවේ කෙප්පාපුලවූවලින්, මුහුදින්, මුලතිව් දෙසින් හා හැම පැත්තකින්ම. අපේ පැත්තට වදින උණ්ඩවලින් හානි පැමිණි අය මම දැක්කා. කුඩා ළමයෙක් ඇතුළු පවුලක පස් දෙනෙක් 15 දා උදේ ට්‍රැක්ටරයක් යට සැඟවී සිටි සිද්ධියක් මගේ මතකයට එනවා. මල්ටි බැරල් රොකට් ලෝන්චර් ෂෙල් උණ්ඩයක් ට්‍රැක්ටරය මතට වැටුණා. මුළු පවුලම මැරුණා. මම දැක්ක භයානකම දේ මේකයි. එම උණ්ඩය ආවෙ කෙප්පාපුලවූලින්. අවසන් දවස්වල වෙඩිතැබීම් බොහොමයක් සිද්ධවුනේ කෙප්පාපුලවූවලින්. එහෙම නැත්නම් සිද්ධවෙන්නේ යුද හමුදාව ඔවුන්ගේම හමුදාවලට පහරදීමක්.' - W383*[223]

සාක්ෂිකරු W381ට[224] අනුව, 2009 මැයි 14 දා සිවිල්වැසියන්ට එරෙහි මල්ටි බැරල් රොකට් ලෝන්චර් ද යොදා ගන්නා ලදී. පච්චෙයි උන්ඩියල් පිල්ලෙයාර් කෝවිලට 2009 මැයි 15 දා එල්ලවූ තවත් මල්ටි බැරල් රොකට් ලෝන්චර් ප්‍රහාරයක්ද උ46 සහ ඔහුගේ ඥාති දියණිය වෙන වෙනම විස්තර කර තිබේ. W46 ගේ මව මරණයට පත්කිරීම සහ ඔහුගේ ඥාති දියණිය ට තුවාල සිදුවීම නිසා ඔවුන්ට එම දිනය මතකයි. මෙය එම දිනයේ එකම ප්‍රහාරය

---

222. 'අප දන්නා තරමින් බ්‍රහස්පතින්දා සිට 20,000 ක් පමණ පිටතට පැමිණ ඇති අතර එක්සත් ජාතීන්ගේ ගණන්බැලීම් අනුව, සටන් පවතින ප්‍රදේශවල තවමත් 30,000 ත් 80,000 ත් අතර සංඛ්‍යාවක් සිටිතී උැසි පැවසීය. එය ඉතා කුඩා භූමි ප්‍රදේශයක්. මධ්‍යම උද්‍යානයෙන් තුනෙන් එකක් පමණ විශාල වෙන්න පුළුවන්.මේ මොහොත වන විට ඉතා අමිහිරි සටනක් එම ප්‍රදේශයේ සිදුවෙමින් පවතින බවක් පෙනෙන්නට ඇත. විශාල පිරිසක් මියයාමට සහ තුවාල ලබනු ඇතැයි අප බලාපොරොත්තු වෙනවා' Gordon Weisz in https://www.refworld.org/docid/4a1d3e1023.html

223. මැයි 16 වැනිදා අඛණ්ඩව ෂෙල් ප්‍රහාර එල්ලවීම හා ඩ්‍රෝන යානා පියාසර කිරීම ගැනද W385 කතා කළේය.

224. '2009 මැයි 14 දා වන විට. එනම් ශ්‍රී ලංකා යුද හමුදාව වෙරළේදී හමුවීමට මොහොතකට පෙරෙ, එදිනම Seran Trade අයත් ආහාර ලොරියක් එහි විය. එහි ටින් කළ ආහාර සහ වෙනත් ආහාර තිබූ අතර ඒ වන විට සිවිල් ජනයාට සහ එල්ටීටීඊ සාමාජිකයන්ට කෑමට දෙයක් නොතිබූ නිසා මිනිස්සු ලොරියෙන් ආහාර ලබාගන්න එහි ගියා. ඒ වේලාවෙ ෂෙල් ප්‍රහාරයක් සිදුවීම නිසා එයින් සිවිල් වැසියන් බොහෝ දෙනෙකු සහ එල්ටීටීඊ සාමාජිකයන් කිහිපදෙනෙකු මියගියා. පුතුක්කුඩෙයිඉරප්පු ප්‍රදේශයේ සිට කලපුව හරහා එම උණ්ඩ ආවා. එය මල් බැරල් රොකට් ලෝන්චර් මෙන්ම ෂෙල් ප්‍රහාර. …මැයි 15 දා වන විට තත්වය ව්‍යාකූල වූ අතර එම ප්‍රදේශයේ එල්ටීටීඊ පාලනය මුළුමනින්ම පාහේ අහිමිවී ගියා.ෂෙල් ප්‍රහාර දිගටම සිදුවූ අතර සිවිල් වැසියන්ට යන්න තැනක් නැතිව විවිධ දිසාවන්ගෙන් හමුදා ප්‍රදේශයට ඇදී ගියා.. ඇතමුන් පුදුක්කුඩියිරුප්පු හරහා උතුරටත් තවත් අය කලපුව හරහාත් ගියා.'

නොවේ.

W380 මෙසේ පැවසීය:

*'15 දා රාත්‍රියේ මෙම ප්‍රදේශයට ෂෙල් ප්‍රහාරයක් එල්ල වූ අතර එකක් අපගේ බංකරයට අනික් පැත්තේ බංකරයේ පතිත වුනා.එහි එල්ටීටීඊය මානසික ආබාධවලින් පෙළෙන ළමයින් තබාගෙන සිටියා. කලින් ඔවුන් රැකබලා ගත්තේ රාජ්‍ය නොවන සංවිධානයක්. ඒත් මේ අවුල් සහගත තත්වය හින්ද එම ළමයින් බලාගැනීම එල්ටීටීඊය විසින් භාරගත්තා. ළමයින් කී දෙනෙක් මළා දැයි අපි දන්නෙ නැහැ. එතැන තිබුනේ ව්‍යාකූල තත්වයක්. හැම දෙනාම විලාප දෙමින් අඩමින් සිටියා. ඒ හින්දා අපට බංකරයෙන් ඉවත්ව යන්න වුනා. අවසන් දවස් දෙකතුනේදී , මිනිස්සුන්ට තමන්ගේ ජීවිත බේරාගන්න ක්‍රමයක් සොයාගන්න සිද්ධ වුනු නිසා ඔවුන්ට වෙනත් අය ගැන බලන්න හැකියාවක් තිබුණෙ නැහැ.ප්‍රහාරයක් සිදුවෙන කොට තුවාලකරුවන්ට උපකාර කිරීම පසෙක තබා අපට ප්‍රදේශය අතහැර යන්න උනා.. අවසන් දවස්වල තිබුණ තත්වය මේකයි. පිපිරීමේ ශබ්දය අනුව එය පුදුකුඩියිරුප්පුවලින් තැබූ කාලතුවක්කු වෙඩිල්ලක්. මට ඇතැම් විට දේවල් මතක් කර ගන්න අමාරුයි. එය ව්‍යාකුල අවුල් සහගත තත්වයක්. හැම තැනම ප්‍රහාර. යුද්ධයේ අවසන් දවස්වල සිදුවුනු දේවල් ගැන මට තවම තියෙන්නෙ බියජනක අත්දැකීම්.'*

මැයි 16 දා සිවිල් ජනයා බහුලව සිටි ප්‍රදේශයකට එල්ල වූ තවත් මල්ටි බැරල් රොකට් ලෝන්චර් ප්‍රහාරයක් W384 දුටුවේය:

*'රාත්‍රී 8 ට පමණ අපි දුටුවා '35ට අනික් පැත්තෙහි මල්ටි බැරල් රොකට් ලෝන්චර් ප්‍රහාරයක්. එක පිට එක දිගටමැ පිපිරීම් ගණනාවක් ද පසුව බෙරිහන්දීම්ද මට ඇහුණ. ඃ අප සහ ඉලක්කය අතර දුර ප්‍රමාණය මීටර් 90 කට වඩා තිබුනේ නැහැ. එම ප්‍රදේශය සිවිල් ජනයාගෙන් පිරී පැවතුනා. ඔවුන් බාරවීම පිණිස දකුණු පෙරමුණ දෙසට පලායමින් සිටියා.'*

W379 පැවසුවේ 2009 මැයි 16 දා තරම් පසු දිනක 1730 පැයේදී වඩ්ඩුවාක්කල් සහ මුල්ලිවයික්කාල් අතර ප්‍රදේශයේදී මිලිමීටර් 60 මෝටාර් වෙඩිල්ලකින් තමාට තුවාල සිදුවූ බවයි: .

*'එක පාරටම ... කුඩාරම ඉදිරිපිටට මෝටාර් එකක් වැටිල පිපුරුනා. මට නරක විදියට තුවාල වුනා. ඒ ප්‍රහාරයෙන් තුන්දෙනෙකු මියගිහින් තවත් පිරිසකට තුවාල වුනා. ඒත් මම එම ගණන හරියටම දන්නෙ නැහැ. ඒ අවස්ථාව වන කොට කුඩාරම් ඉතා ලං ලංවයි තිබුණෙ. ඒවායේ විශාල ලෙස සෙනග පිරී සිටි නිසා එක මෝටාර් එකකින් ගණනාවකට තුවාල සිදුවිය හැකිව තිබුණා. එක්කෙනෙකුට ඇස් පෙනීම අහිමි වුනා. තවත් කෙනෙකුට පාදය අහිමිවුනා. මගේ අත, මුහුණ, බඩ, පාද සහ යටිබඩ තුවාල වුනා. එහි සිටියේ වැඩිහිටියන්, ළමයින්, කාන්තාවන් සහ පිරිමි. 15 දෙනෙකුට වැඩි පිරිසකට තුවාල වුනා. මම දන්න තැනැත්තෙක් බරපතල තුවාල ලබා සිටියදී රෝහල කරා ගෙන යන කොට මියගියා.'*

තවකකුගේ උදව් ලබාගෙන පසුදින උදේ භාරවීම පිණිස වඩ්ඩුවාක්කල් පාලම කරා ඇය යනවිට හැම තැනම වෙඩි උණ්ඩ එහා මෙහා යමින් තිබුණ. එහෙයින් ඔවුන්ට ආරක්ෂාවීමට වරින් වර නතරවෙන්න සිද්ධ විය:

*'ෂෙල් ප්‍රහාරයක් එල්ලවුනත් එය අපගේ පිටුපසින් පුපුරාගියත් අප සිටියේ වෙඩිතැබීම් සිදුවන පරාසයේ. එය ආවේ '35 පාරේ මුහුද පැත්තෙන් උනත් ගොඩබිමින්. සුළු දුරක් වුනත් අපට 17 දා උදේ පාලම කරා ළඟාවීමට මුළු රාත්‍රියෙම පයින් ඇවිද ගෙන යන්න වුණා'.*

පෙරමුණේ ආරක්ෂක හමුදා සමඟ ගිය තවත් සාක්ෂිකරුවකු වන W401 පැවසුවේ අලුරූත මරාදමූ දහස් ගණනක ගේ මළසිරුරු දුටු බවයි:

*'ඒ ස්ථානයේම බිම හැමතැනම විසිරී තිබුණු සිවිල් ජනයාගේ සහ නිල ඇඳුමින් සිටි එල්ටීටීඊ සාමාජිකයන්ගේ මළසිරුරු දහස් ගණනක් එකට තියෙනවා මම දැක්කා. මට මරණයට හේතුව නිසැකවම කියන්න බැහැ. එය කාලතුවක්කු ප්‍රහාර හෝ වෙඩිතැබීම් නිසා වෙන්න ඇති. මට කියන්න බැහැ. ඒත් පැහැදිලිවම ඒවා නරක් වුන මළසිරුරු නොවෙයි. මිය ගිහින් තියෙන්නේ නොබෝ වේලාවකට පෙර. මම මෙම සිරුරුවලින් බොහොමයක් දුටුවෙ මැයි 15 දා සහ 16 දා. මම 13 සහ 14 දෙදින එහි ගිය වෙලාවෙත් මළ සිරුරු කිහිපයක් දැක්කා. ඒත් දින දෙකකට පසුව ශ්‍රී ලංකා යුද හමුදාවේ ආරක්ෂාව යටතේ ආපසු පැමිණි අවස්ථාවේ දුටු තරම් සංඛ්‍යාවක් නොවෙයි.'*

**හමුදාවේ භූමියේ මෙහෙයුම් ගැන ගෝඨාභය දැනසිටීම**

ගෝඨාභය රාජපක්ෂ ශාරීරික වශයෙන් කොළඹ අගනගරයේ සිටියත් ඩ්‍රෝන දර්ශන සඳහා තිබූ

ප්‍රවේශය සහ ඔහුගේ ආඥාපතිවරුන්ට දුරකථනයෙන් කතාකිරීම මගින් අවසන් යුද්ධයේ මුල්ලිවයික්කාල් ප්‍රදේශයේ භූමියේ සිදුවන්නේ කුමක්දැයි ඔහු දැන සිටියේය. 2009 මැයි 13 දා ආරක්ෂක මණ්ඩල රැස්වීම ඔහුගේ ප්‍රධානත්වයෙන් පැවති බවත් ආරක්ෂක අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයට පමණක් නොව වෙනත් රජයේ අමාත්‍යාංශ වලටද නියෝග නිකුත් කර ඇති බවත් ඇමරිකානු තානාපති කාර්යාලයේ මේ ටෙලෙක්ස් පණිවුඩය පෙන්වයි.

*'(2009) මැයි 13 දා උදේ, කාර්ය භාර නිලධාරී ආපදා කළමනාකරණ සහ මානව හිමිකම් ඇමති මහින්ද සමරසිංහ ට කතාකර ග්‍රීන් ඕෂන් යාත්‍රාව සේවයේ යොදාගැනීම තවත් දිනකින් පමාවුවහොත් ඇතිවන මානුෂීය විපාක ගැන බරපතල කනස්සල්ල පළකළා. යුද හමුදාව විසින් කාලතුවක්කු ප්‍රහාර එල්ලකිරීමක් නොකරන බවත් නැවෙන් ආහාර ගොඩබෑමට හැකි බවත්, මගීන් නංවා ගතහැකි බවත් ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ දූත මණ්ඩල ප්‍රධානි පෝල් කැස්ටෙලාට හමුදාවේ පූර්ණ වශයෙන් සහතිකකිරීමක් ලබාදෙන ලෙසත් ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ (ආරක්ෂක මණ්ඩල රැස්වීමේ සිටියදී) තමාට දැන්වූ බවත් අද උදේ සමරසිංහ පැවසීය...මැයි 14 දා ,හෙට, රාජපක්ෂ සහ කැස්ටෙලා අතර හමුවක් ප්‍රයෝජනවත් විය හැකි බව සමරසිංහ කාර්ය භාර නිලධාරීට යෝජනා කළේය.'*[225]

මේ මොහොත වනවිට ජාත්‍යන්තර රතු කුරුස කමිටුව යුද කලාපය තුළදී මියගිය එම සංවිධානයේ තුන්වැනි කාර්ය මණ්ඩල සාමාජිකයා සම්බන්ධයෙන් ක්‍රියා කරමින් සිටියේය.[226] 58 සේනාංකයේ සේනාංකාධිපති ශවේන්ද්‍ර සිල්වා (2019 වන විට ශ්‍රී ලංකා යුද හමුදාපති), උගත් පාඩම් සහ ප්‍රතිසංධාන කොමිසමේ දී සාක්ෂිදෙමින් ඩ්‍රෝන දර්ශනවලින් භූමියෙහි සියල්ල තමන්ට බැලීමට හැකිවූ බව කීවේය; මෙයින් හැඟෙන්නේ ප්‍රහාරයට ලක්ව සිටින අය අතර දහස් ගණනක් සිවිල් ජනයා සිටි බව ඔහු දැන සිටි බවයි:

*'ක්‍රියාන්විතයේ අවසන් අදියරවලදී අපි නිකම්ම අන්ධකාරයේ වැඩ නොකළෙමු. නියමුවන් නොමැති යානා (UAV)වලින් ලබාගත් දර්ශන මාර්ගයෙන් සියල්ල සැලසුම් කළෙමු. එහිදී හරියටම අපි දැන සිටියා සිවිල් ජනයා සහ එල්ටීටීඊ සාමාජියන් සිටින්නෙ කොහෙද කියලා. සිවිල් ජනයා එල්ටීටීඊ සාමාජිකයන්ට ආසන්නව සිටින්නේදැයි පොඩ්ඩක් හෝ ව්‍යාකූලභාවයක් ඇති වුනා නම් අපට වෙනත් ක්‍රමයක් යොදා ගන්න වුනා වගේම දෙගොල්ල වෙන් කරන්න කල් ගන්න සිදු වුනා.'*

2009 මැයි 16-19 කාලයේදී චීනය බලා ගොස් සිටි යුද හමුදාපතිවරයා මගහරිමින් යුද්ධය අවසන් වන විට ශවේන්ද්‍ර සහ ගෝඨාභය කෙළින්ම සම්බන්ධීකරණය වෙමින් සිටියහ.[227] උදාහරණයක් ලෙස 53 සේනාංකයේ ආඥාපති කමල් ගුණරත්න ඔහුගේ ලිඛිත චරිතාපදානයේ ආරක්ෂක ලේකම් ගෙන් දුරකථන ඇමතුම් ලැබුණ බව සඳහන් කර තිබීම:

*'මැයි 14 දා ,මට ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ ගෙන් දුරකථන ඇමතුමක් ලැබුණු විට ඔහු පළමුවෙන්ම සංග්‍රාම භූමියේ තත්වය විමසූ අතර ඊළඟට ඔහු පැවසුවේ අන්තර් ජාතික ප්‍රජාවගෙන්, විශේෂයෙන් ඇමරිකාවෙන්, යුද්ධය නතරකිරීමට කරන මහා පීඩනයකට තමන් මුහුණදෙමින් සිටින බවත් ඒ නිසා අවසානය ඉක්මන් කිරීමට ඔහුට අවශ්‍යව ඇති බවත් ය. සියල්ල දින හතරක් ඇතුළත අවසන් කිරීමට අපට හැකිවන බවට මම විශ්වාසයෙන් ඔහුට සහතිකව පැවසූ අතර මගේ ප්‍රතිචාරයෙන් ඔහු දැඩි සතුටට පත්වූ බවක් දක්නට ලැබුණි. ඔහු ඊට පසුව බ්‍රිගේඩියර් ශවේන්ද්‍ර සිල්වාට එම පණිවුඩයම දීමට කතාකර තිබූ අතර ඔහුද එම ප්‍රතිචාරයම දක්වා තිබුණි. ශවේන්ද්‍ර සිල්වා සහ මා අතර සමීප සබැඳියාවක් සහ කාර්ය සම්බන්ධතාවක් තිබුණ හෙයින්, යුද්ධය දින හතරකින් නිම කිරීමට අපි සැලසුම් සකස් කළෙමු.'*

### අන්තර් ජාතික නිරීක්ෂකයන්ට ප්‍රවේශය ලබා නොදීම

2009 මැයි 19 දා වන විට තුවාල ලැබූවන්ට ප්‍රතිකාර කිරීම පිණිස යුද කලාපයට ප්‍රවේශවීමට ජාත්‍යන්තර රතු කුරුස කමිටුවට අවශ්‍ය තිබූ ආකාරය සහ වෙනත් අය අතර ගෝඨාභය රාජපක්ෂ ඊට ඉඩ නොදුන් ආකාරයත් විකිලීක්ස් ටෙලෙක්ස්වලින් පෙන්වයි:

225. https://wikileaks.org/plusd/cables/09COLOMBO522_a.html

226. රතු කුරුස කමිටුවේ අංක 10/100 පුවෘත්ති නිවේදනය: ශ්‍රී ලංකාව - තුන්වැනි රතුකුරුස කාර්ය මණ්ඩල සාමාජිකයාත් ගැටුම් කලාපයේදී මියයයි.

227. See also Witness testimony regarding the conversations. Daily News, Acting Defence Minister, 15 May 2009. Mahinda Rajapaksa went to Jordan from 14-17 May. Maithri–Mahinda talk of forming caretaker grand coalition, 7 Oct 2018, Lanka Sunday Times.

ජාත්‍යන්තර රතු කුරුස කමිටු කණ්ඩායමේ ප්‍රධානි පෝල් කැස්ටෙලා (රැකවරණ) නියෝජ්‍ය කාර්ය ප්‍රධානී (DCM) ට වාර්තා කර තිබුණේ සුරක්ෂිත කලාපයේ සිටින තුවාලකරුවන් රැකබලා ගැනීමට හැකි බව අවධාරණය කරමින්, ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ, ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක බැසිල් රාජපක්ෂ සහ ක්ෂේත්‍ර ආඥාපතිවරුන් සුරක්ෂිත කලාපයේ තුවාලකරුවන්ට ප්‍රතිකාර කිරීමට සහායවීමට ඉදිරිපත් වීමට කළ යෝජනාව මේ දක්වා ප්‍රතික්ෂේප කර ඇති බවයි. පවුල්වලට දැනුම්දීම පිණිස පහසුකම් සැලසීමට මියගිය තැනැත්තන් හඳුනාගැනීමේ කටයුතු නිරීක්ෂණය කිරීමට සුරක්ෂිත කලාපයට ප්‍රවේශවීම පිණිස අවස්ථාව සලසන ලෙස ද ජාත්‍යන්තර රතු කුරුස කමිටුව ඉල්ලා ඇතැයි කැස්ටෙලා පැවසීය. එයද ප්‍රතික්ෂේප කර ඇත.[228]

**ලඝු ඝාතන**

යුද්ධයේ අවසන් දිනවලදී යටත්වූවන් යුද්ධ හමුදාව වෙත යන විට හමුදාව සමග සිටි ජනමාධ්‍යවේදීන් මෙම ක්‍රියාවලිය බලා නොසිටියේ නම් ඔවුන් මරා දමන ලද බවට ශ්‍රී ලංකාවේ සෙබලෙක් සාක්ෂි දුන්නේය:

'ඔවුන් සියල්ලන්ම මරා දමන ලෙස ගෝඨාභය ඔහුට කෙළින්ම නියෝග කරලා තිබුණා. ඇතැමුන් නිල ඇඳුමෙන් සිටිය අතර තවත් අය සිවිල් ඇඳුමෙන් සිටියා. මෙම නියෝගය සහ එය ක්‍රියාත්මක කිරීම 2009 මැයි 16-19 අතරතුර වඩ්ඩුවාක්කල් පාලම සහ වෙල්ලමුල්ලි වයික්කාල් අතර සටන් මුක්ත ප්‍රදේශයේදී සිද්ධ වුනා... යටත්වූවන්ට අවස්ථා ගණනාවකදී මෙසේ වෙඩි තැබීම මම දැක්කා. කණ්ඩායම් ගණනාවක්, එනම් පනහක පමණ, හැත්තෑපහක පමණ, 25 කට වඩා වැඩි කණ්ඩායම් ඉදිරියට පැමිණි අතර ඔවුන් සියල්ලන් මරා දමනු ලැබුවා. ළමයින්, කුඩා දරුවන්, කාන්තාවන් සහ මහලු තැනැත්තන් ද ඔවුන්ට ඇතුළත් වුණා.'

මෙම ඝාතන තමන් දුටු බව දිවි ගළවාගත් කිහිප දෙනකුම විසින් තහවුරු කරන ලදී:

**2009 මැයි 15**

'මගේ ඇස් ඉදිරිපිට වෙඩිතබා ඔවුන්ව මරා දැම්මා. කාන්තා සාමාජිකාවන් වෙඩි නොතබන ලෙස ඉල්ලා බැගෑපත් වුනත් යුද හමුදා සොල්දාදුවන් ඔවුන්ගේ 'ඍ47 රයිෆල්වලින් වෙඩි තැබුවා. පස්සහැරී නොබලන ලෙසත් පාර දෙසට පයින් ඇවිදගෙන යන ලෙසත් සොල්දාදුවන් අපට කිව්වා.'

- W282

**2009 මැයි 16**

'මේ දවසේ පමණක් ශ්‍රී ලංකා යුද හමුදාව පාලනය කළ ප්‍රදේශයට මාරුවීමට උත්සාහ කරද්දී අඩු වශයෙන් සියයක් පමණ සිවිල් ජනයාට ශ්‍රී ලංකා යුද හමුදාව කෙළින්ම වෙඩි තබනවාත්, මගේ ඉදිරිපිට මියයනවාත් මම මගේ ඇස් දෙකෙන් දැක්කා.'

- W292

'මම දැක්කා නිරායුදව පාර දෙසට දුවමින් සිටි ළමයින් ද සමග සිවිල් ජනයාට ඔවුන් වෙඩි තබනවා. ඔවුන්ට වෙඩි තිබ්බෙ ස්වයංක්‍රීය රයිෆල්වලින් සහ කැලිබර් බර මැෂින් තුවක්කු වලින්. කැලෑ නිල ඇඳුමින් සිටි හා ඔහුගේ බෙල්ල වටා කළු ස්කාෆ් එකක් දවටා ගෙන කළු රෙද්දකින් කොණ්ඩය තදකොට බැඳ සිටි එක් සොල්දාදුවෙක් මේ මිනිස්සුන්ට වෙඩිතබමින් සිටියා. T56-2 රයිෆලයක් උස්සාගෙන සිටි ඔහු සිටියේ මීටර් 25 ක පමණ දුරින්. කළු ස්කාෆ් එකක් දමාගෙන සිටි තැනැත්තාම කැලිබර් 50 තුවක්කුවෙන් වෙඩි තිබ්බේ බිම හිටවූ ට්‍රයිපොඩ් එකක රඳවලා. මම සිටියෙ ඔහුට ඉතා සමීපයේ. මිනිස්සු වෙඩි තියන්න එපා කියල අඬමින් වැළපෙමින් හයියෙන් කෑ මොර දුන්නා. නිවේදනයක් නිකුත්කිරීමෙන් පස්සෙ තමන් බාරවන බව පවසමින් තමන්ගේ කමිස ගලවා ගෙන උඩට උස්සා වනමින් ඒ මිනිස්සු පාර දෙසට ළඟාවෙමින් සිටියා. කොහොම වුණත් ඇතමෙකුට වෙඩිතියලා දැම්මා.'

- W129 පස්වරු 3 ට

**2009 මැයි 16 - 17**

'ඇඳුම් ඉවත්කිරීමට අකමැත්ත පළකළ අයට T56 බයිනෙත්තුවලින් සහ රයිෆල් බඳෙන් පහර දුන්නා. වස්ත්‍ර ඉවත්කිරීම ප්‍රතික්ෂේප කළ කාන්තාවන් එම ස්ථානයේදීම වෙඩි තබා මරා දමනු මම දැක්කා. එම ස්ථානයේ මරා දැමූ ගණන 50 ක් පමණ වෙන්න ඇති. මිනිස්සු පෝලිමේ සිටියා. එහි 400 ත් 500 ක් අතර සංඛ්‍යාවක් සිටියා. සොල්දාදුවන් සිවිල් ජනයාට පයින් ගැසුවා. පහර

228. https://wikileaks.org/plusd/cables/09COLOMBO543_a.html

*දුන්නා. පරුෂ වචනයෙන් බැණ වැදුනා. වෙඩි තැබීම එකපාරටම සිද්ධ වුණේ නැහැ. රෙදි ගැලවීම ප්‍රතික්ෂේප කළ හෝ යම් ප්‍රතිරෝධයක් දැක්වූ හෝ විට ඔවුන්ව වෙඩි තබා මැරුවා. මේක කාලයක් තිස්සේ සිදුවූ දෙයක්. මම 16 දා රාත්‍රියේ සිට 17 දා සවස් වනතුරු එහි සිටියා. එම කාලය මුළුල්ලේම එය සිද්ධ වුනා.'*

- W401

**2009 මැයි 17**

*'A35 පාරෙන් කලපුව පැත්තේ එක් සිදුවීමක් දැක්කා. ඒ තමා ට්‍රැක්ටර් ටේලරයක නැගිලා හිටිය නිල ඇඳුම් ඇඳ නොසිටිය එල්ටීටීඊ සාමාජිකයන් 8 දෙනකුට හෝ 9 දෙනකුට යුද හමුදාව වෙඩි තබනවා. ඔවුන් අඩ නිරුවත්ව, දෑත් පිටුපසට තබා බැඳ සිටියෙ.'*

- W99

**2009 මැයි 18**

*'මම හිතන්නේ ඔවුන් හමුදා මෙහෙයුම අවසානයේ ශුද්ධ කිරීමේ යෙදී සිටි බවයි. මම එසේ හිතුවේ මම A35 පාරදිගේ ඇවිදගෙන යනකොට සොල්දාදුවන් AK47 රයිෆල්වලින් වෙඩි තබමින් තුවාල ලබා පාරේ පැත්තක දමා ගොස් සිටි එල්ටීටීඊ සාමාජිකයන්ව ඝාතනය කරනව මම දැක්කා. ඒ ස්ථානයේ වැඩියෙන්ම සිටියෙ එල්ටීටීඊ සාමාජිකාවන්...එක් ගැහැනු ළමයෙක් ඇතුළු දස දෙනකු මේ ආකාරයෙන් මරනවා මම දැක්කා. එම ගැහැනු ළමයා මාත් එක්ක පුදුක්කුඩියිරුප්පු මහා විද්‍යාලයෙ ඉගෙන ගත්තෙ. ඇය එල්ටීටීඊ සාමාජිකාවක්. ඇයට එල්ටීටීඊය දුන්න නම නීලා වන අතර ඇය ඔවුන්ගේ වෛද්‍ය ඒකකයෙ සිටියෙ. ඇගේ උපන් නම සහ ගම මට මතක නැහැ. නමුත් 1995දී යාපනයෙන් අවතැන් වී ඇතැයි මම හිතනව. ඇයට වූ දේ ගැන දැනුම්දීමට මම ඇයගේ පවුල ගැන සොයා බැලුවා, නමුත් මට ඔවුන් සොයා ගන්න බැරි වුනා.'*

- W182

**සුදුකොඩි ගෙන බාරවූවෝ**

යුද්ධය නිමවීමට පෙර 2008 ඔක්තෝබර් මාසයේදී, 'නිරායුද එල්ටීටීඊ සාමාජිකයන් ත්‍රස්තවාදීන් ලෙස නොසලකන බවත් ඔවුන් සාමාන්‍ය පුරවැසියන් ලෙස පිළිගන්නා' බවත් ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ ප්‍රකාශ කළේය.[229] 2009 මැයි මාසයේදී එල්ටීටීඊ සාමාජිකයන් ලෙස සැක කෙරුණු සටන්කරුවන්ට සත්‍ය වශයෙන් සැළකූ ආකාරයෙන් මෙය එසේ නොවන බව පැහැදිලි විය.

2009 මැයි 18 දා වඩ්ඩුවාක්කල් පාලමට දකුණු ප්‍රදේශයේදී එල්ටීටීඊ දේශපාලන අංශයේ සාමාජිකයන් මරා දැමීමට නියෝග කිරීම සම්බන්ධයෙන් සිදුවී ඇතැයි චෝදනා ලබන ගෝඨාභය රාජපක්ෂගේ භූමිකාව ගැන සැලකිය යුතු පරීක්ෂණයක් කර ඇත. බාරවූවන්, සටන් කළ නොහැකි, සහ ඔවුන්ට දී තිබූ උපදෙස් පරිදි ,එවැනි කොඩියක් ඔසවාගෙන පැමිණි නිසාත් මෙම සිද්ධිය 'සුදු කොඩි සිද්ධිය' ලෙස ප්‍රකට ය.

2015 දී ප්‍රකාශයට පත් කළ එක්සත් ජාතීන්ගේ පරීක්ෂණයෙන්, විවිධ සාක්ෂි සහ මළ සිරුරුවල ඡායාරූප සම්බන්ධයෙන් කළ වෝහාරික පරීක්ෂණ පාදක කරගෙන, නිගමනය කර ඇත්තේ, 'එල්ටීටීඊයේ ජ්‍යෙෂ්ඨ දේශපාලන අංශ නායකයන් වන බාලසිංහම් නඩේසන් සහ සීවරත්නම් පුලිදේවන් මෙන්ම නඩේසන්ගේ බිරිඳ විනීතා නඩේසන් මැයි 18 දා 06.00ට පසු වෙලාවක ආරක්ෂක හමුදා විසින් මරණයට පත්කරන්න ඇතැයි විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇත' යන්නයි. මුලින් ශවේන්ද්‍ර සිල්වාගේ 58 සේනාංකය මෙම ඝාතනවල වගකීම බාරගත්තත් ආරක්ෂක අමාත්‍යාංයේ වෙබ් පිටුවෙන් එය පසුව මකා දමනු ලැබීය. 18 දා උදේ ශවේන්ද්‍ර සිල්වා වඩ්ඩුවාක්කල් පාලමේ සිටි බවත්, ඔහු බාරවන එල්ටීටීඊ නායකයන්ට අතට අතදී ඇති බවත් ඇසින් දුටුවෝ පවසති. තමා එම දවසේ එම ප්‍රදේශයේ සිටි බවත් කාර්යබාරව සිටි බවත් ඔහු ස්ථිර කර ඇත.[230] මෙම වාචික සාක්ෂ්‍යය සිද්ධි පිළිබඳ රජයේ විවිධ විස්තර දැක්වීම්වලට විරුද්ධ වන අතර එවන් එකකින් ප්‍රකාශ කෙරෙන්නේ එල්ටීටීඊ නායකයන් බාරවුන හෙයින් ඔවුන්ගේම මිනිසුන් විසින් ඔවුනට පිටුපසින් වෙඩි තැබූ බවයි.

පුලිදේවන්ගේ සහ නඩේසන්ගේ භාරවීමේ අරමුණ ගැන ගෝඨාභය රාජපක්ෂ සහ ඔහුගේ සහෝදරයන් වන මහින්ද සහ බැසිල් හොඳින් දැන සිටියහ:

*භාරවීමට අපේක්ෂා කළ එල්ටීටීඊ නායකයන්ට සුදුරෙදි කෑල්ලක් ඔසවාගෙන පයින් එන්නැයි විදේශ මැදිහත්කරුවන්ගේ මාර්ගයෙන් ඔවුන්ට දැනුම් දුන්නේ ගෝඨාභය රාජපක්ෂ සමග බැසිල්*

229. (CPA: වන්නියේ සහ වව්නියාවේ මානව හිමිකම් සහ මානුෂවාදී ගැටළුවල පැතිකඩක්, මාර්තු 2009, පිටු 31)

*රාජපක්ෂ බව ජෙනරාල් ෆොන්සේකා පැවසීය. 'ඒක ඔවුන්ගේ අදහසක්' ඔහු පැවසීය.*[231]

භාරවන්නන්ට ඉඩ දෙන ලෙස තමා දෙවරක් ඉල්ලා සිටි ආකාරය එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ඉන්දීය නියෝජිත විජේ නම්බියාර් පසුව විස්තර කළේය.[232]

'සුදු කොඩි' රැගෙන භාරවීම ගැන විදේශීය අතරමැදියන් විශාල සංඛ්‍යාවකගේ මාර්ගයෙන් දින ගණනාවක් මුළුල්ලේ සාකච්ඡා කළ බව එක්සත් ජාතීන්ගේ සංවිධානය තහවුරු කළේය:

> *'... විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් පාලිත කොහොන, ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක බැසිල් රාජපක්ෂ, ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ සහ ජනාධිපති මහින්ද රාජපක්ෂ. මෙම අදියරේ සන්නිවේදනවලට එක්සත් ජාතීන්ගේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ විදේශ මාධ්‍යවේදීන්ද ඇතුළත් විය.'*[233]

භාරවීමේ සාකච්ඡාවලට සම්බන්ධවූවන් ගැන වැඩි විස්තර ලබාගැනීමට මේ සිද්ධිය ගැන ITJP වාර්තාව http//www.white-flags.org වෙබ් අඩවියේ ඇත.

පසුව , මතභේදයට තුඩුදුන් ශ්‍රී ලංකාවේ පුවත්පතක් සමඟ කළ සම්මුඛ සාකච්ඡාවකදී ජෙනරාල් ෆොන්සේකා මෙසේ පවසා තිබුණේය:

> *'බැසිල් මෙම තොරතුර ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂට දන්වා ඇති අතර - ඔහු ඉන් අනතුරුව 58 සේනාංකයේ ආඥාපති ශවේන්ද්‍ර සිල්වාට කතා කොට, භාරවීමට උත්සාහ දරන කිසිම එල්ටීටීඊ නායකයකු භාර නොගත යුතු බවත් 'ඔවුන් මරාදැමිය යුතු' බවත් නියෝග කළ බව මට පසුව දැනගන්නට ලැබුණා.'*[234]

එසේවුවත් තමා ගෝඨාභය රාජපක්ෂට දැනුම්දීමක් කර නැති බව පැවසූ බැසිල් රාජපක්ෂ එයට හේතුව ලෙස දැක්වූයේ 2009 මැයි 15 දා නිවාඩු දිනයක් කරගෙන සිටි බවයි. යුද්ධය එහි උග්‍ර අවස්ථාවේ තිබුණ අවස්ථාවක සහ එය අවසන්කර දැමීමට උත්සුකව තමන් සිටින බව පෙර දවසේ ගෝඨාභයගෙන් තමාට සහ ශවේන්ද්‍රට ඇමතුම් ලැබුණු බවත් කමල් ගුණරත්න පවසා තිබියදී එය විකාර සහගත තීරණයකි. (පෙර සටහන බලන්න);

> *'ගෝඨාභය රාජපක්ෂ සම්බන්ධ කරගැනීමට අප දැරූ තැත අසාර්ථක වුවා. අප ආරක්ෂක අමාත්‍යාංශයට සිකුරාදා දුරකථනයෙන් ඇමතූ විට අපට පැවසුවේ දවස පුරාම රාජපක්ෂ මහතා කාර්යාලයේ නොසිටි බවයි. ඔහුගේ කාර්ය මණ්ඩලය වෙනත් දුරකථන අංකයක් දීම ප්‍රතික්ෂේප කළා.'*[235]

පෙනෙන හැටියට බැසිල් රාජපක්ෂ ළඟ ඔහුගේ සහෝදරයාගේ දුරකථන අංකයක් නොතිබීමද විහිළුවකි.

**යුද්ධයෙන් දිවිබේරාගත් අය අත්තනෝමතික ලෙස රඳවා ගැනීම**

**සිවිල් ජනයා**

යුද්ධයෙන් දිවි බේරාගෙන සිටින තැනැත්තන් රැක බලාගැනීමේ කාර්ය කළමනාකරණය පිණිස හමුදාව යෙදවීම ආරක්ෂක ලේකම් ලෙස ගෝඨාභය රාජපක්ෂ භාරව සිටියේය. භාර වූ දෙමළ ජනතාව රැක බලාගැනීමට ඔහු විසින් යොදවන ලද්දේ ඔවුන්ට එරෙහිව ආක්‍රමණයේ පෙරමුණ ගත්, බෝම්බ හෙළූ සහ 'යුද මුක්ත කලාපයේදී' ෂෙල් ප්‍රහාර එල්ල කළ එම හමුදා නිලධාරීන්ම ය. මෙම පිරිස සිවිල් ජනයා සහ සටන්කරුවන් වෙන්කර හඳුනා නොගත් අණදෙන නිලධාරීන් ය. ජයෝන්මාදයෙන් යුත් හා වරද සිදුකළ බව සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරන පශ්චාත් යුද වාතාවරණයක් තුළ තවදුරටත් මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සිදුවන බව මෙයින් කල්තියාම දැනගැනීමට හැකි වේ. යුද්ධය අවසානයේදී 282,000 ක් වූ වන්නියෙන් පැමිණි දිවිබේරුණු දෙමළ ජනයා සිටි රැඳවීම් භාර කටයුතු සඳහා හමුදාව යෙදවීමේදී ගෝඨාභය රාජපක්ෂ ගේ ප්‍රධාන කාර්යභාරය එක්සත් ජාතීන්ගේ පරීක්ෂණයෙන් (OISL §1074) පෙන්වා දී ඇත:

230. කැනේඩියානු දූත කණ්ඩායම සමග හමුව, 2014 - නිව් යෝර්ක්

231. නැවත පළ කළ 'සන්ඩේ ලීඩර්' iv - http://www.srilankaguardian.org/2009/12/gota-ordered-them-to-be-shot.html

232. 'මම කිව්වා යන්න කියල.මම දෙවරක් බොබ් බ්ලේක් (ඇමරිකන් තානාපති නිලධාරි ) ට කතා කළා. අප දෙදෙනා යන්න සැලසුම් කරමින් සිටියා. ජාත්‍යන්තර රතු කුරුස කමිටුවට මුහුදු මාර්ගයෙන් යාමට නොහැකි වුණා. රජය අපට අවසරදීම ප්‍රතික්ෂේප කළා. අපට බලෙන් යන්න ක්‍රමයක් තිබුණෙ නැහැ.' සිදුවී ඇති ඝාතන ගැන ඔහු කතා නොකරන්නේ මන්දැයි ඇසූ විට ඔහු පැවසුවේ, ඔහු ජනාධිපති මහින්ද රාජපක්ෂ සහ ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ සමග කතාකළ විට ඔහුට පැවසුවේ, භාරවීමට අවශ්‍යව සිටි අය ඔවුන්ගේම මිනිසුන් විසින් මරාදමන්නට ඇති බවයි.' Nambiar speaks up about 'White Flag Incident' - 25 Feb 2012 ගොණුගත ලේඛන

233. OISL §292

234. ගොණුගත ලේඛන

235. එම

*'අභ්‍යන්තර අවතැන්වූවන් සම්බන්ධයෙන් රජයේ හමුදාකරණ ස්වභාවයේ ප්‍රවේශය, 2009 අප්‍රියෙල් මාසයේදී, උතුරු පළාතේ අභ්‍යන්තර අවතැන්වූවන් බාර නිසි බලධාරි ලෙස මේජර් ජෙනරාල් චන්ද්‍රසිරි පත්කිරීමෙන් පෙනෙන්නට ඇත. පසුව ඔහු වෙනුවට අවසන් සටනට එක්වූ ශ්‍රී ලංකා යුද හමුදාවේ 53 සේනාංකයේ ආඥාපති මේජර් ජෙනරාල් කමල් ගුණරත්න පත්කරනු ලැබීය[236]. අභ්‍යන්තරව අවතැන්වූවන් සඳහා වූ කඳවුරුවල ගැටළු කළමනාකරණයේදී සිවිල් බලධාරීන්ද සම්බන්ධවූවත්,[237] කලාප සහ කඳවුරුවලින් යාම්ඊම් පාලනය කිරීම සම්බන්ධයෙන් ආරක්ෂක අමාත්‍යාංශය සහ ලංකා යුද හමුදාව විශාල කාර්යභාරයක් ඉටු කළේය. 'මෙම සමස්ත ක්‍රියාවලිය රැකබලා ගත්තේ යුද හමුදාව, ඇත්ත වශයෙන්ම වෙනත් රජයේ නිලධරයන් හා ආයතනත්, නමුත් වැඩවලින් බහුතරයක් (අවතැන්වූවන් සඳහා කඳවුරු පිහිටුවීම) ඉටු කළේ යුද හමුදාව'[238] යනුවෙන් උගත් පාඩම් සහ ප්‍රතිසංධානය පිළිබඳ කොමිසම හමුවේ කළ ප්‍රකාශයෙන් ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ ඒ බව තහවුරු කර තිබේ. මැණික් ෆාම්හි එක් එක් කලාපය බාරව හමුදා අණදෙන නිලධාරීන් සිටි අතර, අභ්‍යන්තර අවතැන්වූවන් දෛනික ජීවිතය නියාමනය පිණිස කඳවුරු පුරා හමුදා පිරිස් යොදවා තිබුණි.*

**'ජාතික ආරක්ෂාව' පිළිබඳ තර්කය අනතුරෙහි හෙළු දූෂණය**

අභ්‍යන්තරව අවතැන්ව සිටි පිරිසට කඳවුරුවලින් පිටටයාමට අවසර නොදීම සම්බන්ධයෙන් ප්‍රධාන නිල සාධාරණීයකරණය වූ පරීක්ෂාවට ලක්කිරීම සහ ප්‍රශ්න ඇසීමේ ක්‍රීයාවලිය 2009 සහ 2010 පුරා කඳවුරු ඇතුළත සිදුවිය. පරීක්ෂාකිරීමේ සහ එල්ටීටීඊ සාමාජිකයන් හඳුනාගැනීමේ උපාය මාර්ගයේ අංගයක් ලෙස සිවිල් ඇඳුමෙන් සිටි හමුදා බුද්ධි අංශ නිලධාරීන් සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීහු එහි සිටියහ. එල්ටීටීඊ සාමාජිකයන් සෙවීමට ආරක්ෂක හමුදා දැඩිලෙස සෝදිසි කිරිම්වල යෙදුනත්, අල්ලස් දී කඳවුරෙන් මිදී බේරීයාමට දහස් ගණනක් සමත් වූයේ ආරක්ෂක හමුදා සාමාජිකයන් අතර දූෂණය බහුලව පැවතීම නිසා ය. එම ජන්ම දූෂණය යුද්ධයෙන් දිවිගලවාගත් දෙමළ ජනයා රඳවාගෙන සිටියේ ජාතික ආරක්ෂාව මුල්කරගෙන බවට නගන තර්කය බිඳ හෙලයි. මැණික් ෆාම් කඳවුරෙන් පලායාම, මුරපලවල් හරහා කොළඹට පැමිණීම, හෝටලයක ලියාපදිංචි වීම, නව ගුවන් ගමන් බලපත්‍රයක්, වීසා, ගුවන් ටිකට්පතක්, සහ ආරක්ෂාව ඇතිව ගුවන් තොටුපලට කැඳවාගෙන යාම දක්වා කාර්යයන් ඉටුකරගැනීමට එම කාලයේ පැකේජයක් මිලදී ගැනීමේ හැකියාව තිබුණි. සමහර අවස්ථාවලදී ආරක්ෂක හමුදා විසින්ම, විශේෂයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, මෙය හසුරුවාගත් හෙයින් එය සිදුවන බව ඔවුහු දැනසිටියහ.

ඇතැම් සිද්ධිවලදී නොදැක්කා ලෙස සිටීමට ආරක්ෂක හමුදාවලට අල්ලස් ලබා දී ඇත. ඉහළ පෙළේ එල්ටීටීඊ නායකයකුගේ බිරිඳ දී ඇති සාක්ෂියකින් මිනිසුන් පිටව යන බව බුද්ධිසේවා දැනසිටි බව අප දන්නා අතර ඇය පවසා ඇත්තේ කොළඹ හරහා නූලෙන් බේරී පලා ආ බවයි. ඇයට රටින් පලායාමට උපකාර කළ බුද්ධිසේවා ඇය කවුදැයි සැබවින්ම දැනසිටි අතර ඇයට දුරකථන ඇමතුම් ලැබී තිබුනේ චෙන්නායිවලට ගොඩබැසීමෙන් පසු පමණකි.

**රැකවරණ සැලසීමට අසමත්වීම**

ආරක්ෂක ලේකම්වරයා සිවිල් ජනයා සහ සටන්කරුවන් බලාගැනීමට නිකම්ම යුද හමුදාව යෙදවූවා පමණක් නොවේ, - ඔහු කළේ ඔවුන් සමඟ නොබෝදා සටන් කළ සිවිල් ජනයා සහ සටන්කරුවන් සතුරා වශයෙන් දකින යුද හමුදා අණදෙන නිලධාරීන් භාරයට පත්කිරීමයි. අභ්‍යන්තරව අවතැන්වූවන් සඳහා සුරක්ෂාවන් සහ රැකවරණ සලසන ක්‍රියාමාර්ග නොගතහොත්, උල්ලංඝනය කිරීම් - විශේෂයෙන් ලිංගික හිංසන- සිදුවිය හැකි බව පෙනෙන්ට ඇත. 'අභ්‍යන්තරව අවතැන්වූවන් සඳහා වූ' මැණික් ෆාම් කඳවුරේදී හමුදා බුද්ධි අංශයෙන් සමූහ දූෂණයට ලක්වූ සහ අනික් කඳවුරුවලදී හමුදාව අතින් දූෂණයට ලක්වූ කාන්තාවන්ගෙන් ITJP සංවිධානය එකතුකරගත් සාක්ෂි ඇති අතර එම ITJP සංවිධානය සම්මුඛ සාකච්ඡා පැවැත්වූ ලාබාලතම වින්දිතයාගේ එකල වයස අවුරුදු 14 කි. දෙමළ ජාතිකයන්ට එරෙහිව ලිංගික හිංසන කිරීමේ හමුදාවේ අතීත වාර්තා බලන විට මෙය මුළුමනින්ම දැකිය හැකි දෙයකි. මැණික් ෆාම් හිදී සැකකාරිනියන් ගෙන් ප්‍රශ්න කිරීම පොලිස්

236. ගෝඨාභය විසින් 2019 දී ආරක්ෂක ලේකම් ලෙස පත්කරනු ලැබීය.

237. නැවත පදිංචිකිරීම්, ආපදා සහන සේවා අමාත්‍යවරයා නායකත්වය දැරූ ජාතික මෙහෙයුම්ම කමිටුවට තවත් අමාත්‍යාංශ කිහිපයක් ඇතුළත් ය. (Sri Lanka's Humanitarian Effort, Presidential Task Force for Resettlement, Development and Security in the Northern Province, 2011).

238. ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිසමට ඉදිරිපත් කළ නියෝජනය , 17 අගෝස්තු 2010.

කාන්තාවන් හෝ හමුදාවේ කාන්තා නිලධාරීන් විසින් පමණක් සිදුකළ යුතු බවට සහතික කිරීම උදෙසා නියමයක් පැනවීමට ආරක්ෂක ලේකම් වශයෙන් ගෝඨාභය රාජපක්ෂට කළ හැකිව තිබුණ හෙයින් එවැන්නකින් ස්ත්‍රී දූෂණ සහ ලිංගික හිංසන සිදුවීම් අඩුකර ගැනීමට හැකියාව තිබුණි.

ඒ වෙනුවට ගෝඨාභය රාජපක්ෂ ඇතුළු ශ්‍රී ලංකාවේ නිලධාරීන් කිහිප දෙනෙක්, සොල්දාදුවන් විසින් දෙමළ කාන්තාවන් දූෂණය කිරීම සැහැල්ලුවට ගත්හ. 2011 දී ඉන්දියාවේ රූපවාහිනි නාලිකාවක් යුද්ධයේ අවසන් අදියරේදී කොටුවූ බ්‍රිතාන්‍ය දෙමළ ආධාර සේවිකාවක විසින් නගන ලද ස්ත්‍රී දූෂණ චෝදනා ගැන විමසූ විට, ගෝඨාභය රාජපක්ෂ පුදුමාකාර පිළිතුරක් දෙමින් එවැනි ආකර්ෂණීය තරුණ කාන්තාවක් දූෂණයට ලක්නොවීම සිතාගැනීමට නොහැකි බවට බැලු බැල්මට තර්ක කරමින් එනිසා ඇගේ කතාන්තරය සාවද්‍ය බව නිගමනය කළේය[239].

### හිටපු සටන්කරුවන්

තොරතුරු සපයන්නන් මාර්ගයෙන් එල්ටීටීඊයේ කලින් සිටි සාමාජිකයන් ලෙස සැක කෙරුණු දහස් ගණනක්[240] හඳුනාගෙන අත්තනෝමතික ලෙස 'පුනරුත්ථාපන කඳවුරු' ලෙස නොමග යවන සුළු ආකාරයෙන් හැඳින්වූ ස්ථානවල ලජ්ජා සහගත ලෙස නෛතික ආධාර ලබාගැනීමට ප්‍රවේශයක් සහ අභියාචනා ඉදිරිපත් කිරීමට අයිතියක් නැතිව රඳවාගෙන සිටින ලදී. යුද්ධයට පසු මුල් අවුරුදු වලදී 'පුනරුත්ථාපන'යේදී පිරිමි සහ ස්ත්‍රී රැඳවියන් ගණනාවක් වධහිංසාවලට සහ ලිංගික හිංසනයට භාජනය වූහ. ආණ්ඩුව මෙය හැඳින්වූයේ ඔවුන්ගේ 'මානුෂවාදී මෙහෙයුම 2' ලෙස ය.

2018 දී, අත්තනෝමතික ලෙස රඳවාගැනීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරී කණ්ඩායම (A/HRC/39/45/Add.2) ශ්‍රී ලංකාවේ පුනරුත්ථාපන ක්‍රියාවලිය අත්තනෝමතික ලෙස රඳවාගැනීමකින් යුක්ත වන බව පවසා (§87 b) වත්මන් සහ අතීත රැඳවියන් 'වැරදි ලෙස සිරගතකිරීමක් කළ බව රජය පිළිගෙන ඔවුන්ට වන්දිගෙවීමක් සහ /හෝ නැවත එය සිදුනොවන බවට සහතිකයක් ලබාදීම' නිර්දේශ කළේය. ඒවා තවමත් ඉටුවී නැත.

'පුනරුත්ථාපන' ක්‍රියාවලියේ සිටි සිය ගණනක් දැන් පිටරටට පැනගොස් ඇති අතර බොහෝ දෙනකුට දේශපාලන රැකවරණ ලැබී ඇත. රැඳවියන් කඳවුරුවල සිට ඔවුන්ගේ ගම්වල නැවත පදිංචිකිරීමේ කාර්යයේදී සංක්‍රමණය පිළිබඳ අන්තර්ජාතික සංවිධානය (IOM) ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කළ අතර ඔවුන් පරීක්ෂා කර බැලීමට අදාළ ස්ථානවලට යාමට ප්‍රවේශයක්ද ඔවුන්ට තිබුණි.[241] එම සංවිධානයේ කාර්යයන් ඉටුකිරීමට එක්සත් රාජධානියේ, ඇමරිකාවේ, නෝර්වේ, නෙදර්ලන්තයේ සහ ජපානයේ ආණ්ඩුවලින් අරමුදල් සපයන ලදී. සංක්‍රමණය පිළිබඳ අන්තර්ජාතික සංවිධානයෙන් 'ප්‍රතිලාභ' අත්වූ ඇතැම් අයට 'පුනරුත්ථාපන' වැඩසටහනේදී වදහිංසාවලට ලක්වීම පදනම කරගෙන එක්සත් රාජධානියේ සහ නෙදර්ලන්තයේ රැකවරණ අනුමත කරන ලද අතර සංක්‍රමණය පිළිබඳ අන්තර්ජාතික සංවිධානය මාර්ගයෙන් එම රටවල ආණ්ඩු අරමුදල් ලබාදීමට උදව් කළේය. සංක්‍රමණය පිළිබඳ අන්තර්ජාතික සංවිධානය 2015 ශ්‍රී ලංකාවේ සංක්‍රාන්තීය යුක්තිය වැඩසටහනේ හානිපූරණය බාර ප්‍රධාන සංවිධානය ලෙස යොදන ලදී.

ගෝඨාභය රාජපක්ෂ 'පුනරුත්ථාපන කඳවුරු' බැලීමට ගියේය (පහත බලන්න). මෑතදී අවසන් වූ යුද්ධයේදී එල්ටීටීඊය විනාශකර දැමීමට සහ සිවිල් ජනයා මරණයට පත්කිරීමට උපකාරි වූ, ගෝඨාභය රාජපක්ෂට සමීප යුද හමුදා නිලධාරීන්, පුනරුත්ථාපන වැඩසටහන බාරව පත්කරන ලද නමුත් ඔවුහු අධිකරණ අමාත්‍යාංශයට වාර්තා කළ යුතු පිරිසක් වූහ.[242] පුනරුත්ථාපන වැඩසටහනේ අවුරුද්දක් ගතවූ පසු ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ක්‍රියාධරයෙක් විශ්වාස කළ පරිදි එම ක්‍රියාවලිය පාලනයේ ගෝඨාභය රාජපක්ෂ සක්‍රීයව යෙදී

239. https://www.youtube.com/watch?v=HBEqq0bGURg#t=191%20php/rajapaksa-%20promotes-instigator-of-channel-4-protests-to-cabinet/

240. රජයේ ගණන් බැලීම් 10,000 සිට 14,000 දක්වා අතර වෙනස් වෙයි. නිවැරැදි සහ වෙනස්නොවන සංඛ්‍යාවක් සකස් කර නොතිබීම ගැන කණස්සල පලවී ඇත.

241. එල්ටීටීඊ තැනැත්තන් වෙත ප්‍රවේශයක් IOM ට ඇත්දැයි විමසූ විට ඩැන්සිජර් පැවසුවේ ආරක්ෂක අමාත්‍යාංශ සහ හමුදා මූලස්ථානය මෙම ව්‍යාපෘතිය පවත්වාගෙන යන අය සමඟ සමීපව කටයුතු කරන බවයි. 'අපට මේ දක්වා 8000 කට පමණ උදව්කිරීමට හැකිවී ඇතත් ඇත්ත වශයෙන්ම පුනරුත්ථාපනය කර නිදහස්කිරීමෙන් පසුව 11000 කට වැඩි පිරිසකට අපට ප්‍රවේශයත් තියෙනවා' ඔහු පැවසීය. "යටත්වූවන් කෙරෙහි ශ්‍රී ලංකාවේ සැළකීම් නිර්ලෝභීයි". සේවය අවසන් කර යන IOM පශ්චාත්-යුද ප්‍රධානියා පවසයි. ස්ථාන ගණනාවක රඳවාගෙන සිටින හිටපු එල්ටීටීඊ සාමාජිකයන් වෙත රජය ඍජු ප්‍රවේශයක් ලබා දී ඇතැයි මෙම සංවිධානය පැවසීය. IOM clarifies role in reintegrating Tigers into society" 1 Dec 2011

242. 'අධිකරණ අමාත්‍යාංශයට අනුයුක්ත කරන ලද ,සක්‍රිය හමුදා නිලධාරියෙකු වන මේජර් ජෙනරාල් දයා රත්නායක පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් ධුරයේ වැඩබාරගන්නා බව පසුගිය සතියේදී ශ්‍රී ලංකා ආණ්ඩුව නිවේදනය කළේය. පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් සුහද ගම්ලත් මාර්ගයෙන් අධිකරණ අමාත්‍යාංශයට වාර්තා කරනු ඇත'. https://wikileaks.org/plusd/cables/09COLOMBO773_a.html

සිටියේය:


> *පුනරුත්ථාපන සඳහා ලබන සුදුසුකම තීරණය කිරීමට යොදාගත් ක්‍රියාවලිය ගැන ප්‍රසිද්ධයට පත් කළ තොරතුරක් නැත. තීරණය ගත්තේ කව්ද එසේ නැත්නම් තීරණය ගැනීමට යොදාගත් නිර්නායකය කුමක්දැයි අපි නොදනිමු. තීරණය ගැනීමට බලය ඇත්තේ ආරක්ෂක ලේකම්ට පමණද? එල්ටීටීඊ සාමාජිකයන් යැයි කියූ අයගේ දෛවය ඇත්ත වශයෙන්ම පාලනය කළේ ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය සහ ජනාධිපති බව ප්‍රවෘත්ති වාර්තා පාදක කරගනිමින් යමකුට බය නැතිව සිතා ගන්නට හැකි ය. උදාහරණයක් දක්වන්නේ නම්, 'හිටපු එල්ටීටීඊ සටන්කරුවන් රටේ සංවර්ධනය උදෙසා වැඩකිරීමට හැකි සාමකාමී සහ වැඩදායි පුරවැසියන් ලෙස ඔහු හෝ ඇය සිවිල් සමාජය සමඟ එකතුකිරීමට පෙර ඔවුන් එක් එක් කෙනා කායිකව, මානසිකව සහ ආධ්‍යාත්මකව පුනරුත්ථාපනය කළ යුතු බවට ජනාධිපති මහින්ද රාජපක්ෂ සහ ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ පැහැදිලි උපදෙස්දී තිබූ බව' වාර්තාකර තිබේ. මේ සඳහා 'ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ ගේ මගපෙන්වීම සහ අධීක්ෂණය යටතේ හිටපු සටන්කරුවන් පුනරුත්ථාපනය කිරීමට ශ්‍රී ලංකා ආණ්ඩුව යාපනයේ සහ වව්නියාවේ පුනරුත්ථාපන මධ්‍යස්ථාන පිහිටුවීමට විස්තීර්ණ වැඩසටහනක් සැලසුම් කළේය.' ආයතනික ක්‍රියාවලියක් නොතිබූ බව මෙය පෙන්වා දෙන අතර දහස් ගණනකගේ ජීවිත සම්බන්ධයෙන් තීරණ ගැනීමේ බලය පුද්ගලයන් දෙදෙනකු පමණක් සතුව පැවති බවත් සහ උපදෙස් ලබාගැනීමකින් සහ විනිවිදභාවයකින් තොරව ඔවුන් එය කරන බවත් ස්ථිර කරයි.'*[243]

තවද රජය විසින් උපුටා දැක්වූ 'පුනරුත්ථාපනය' පිණිස කඳවුරුවල සිටි සංඛ්‍යාව ගැළපීමක් වී නැත. උපුටා දක්වනු ලැබූ සංඛ්‍යාවල 3310 දෙනකුගේ වෙනසක් ඇත.

- පුනරුත්ථාපන කොමසාරිස් ජෙනරාල් කාර්යාංශය (BCGR) ආරක්ෂක සහ අධිකරණ අමාත්‍යාංශවල මඟපෙන්වීම යටතේ පිහිටුවන ලද අතර දැන් එය පුනරුත්ථාපන සහ බන්ධනාගාර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වෙයි. - ගොණුගත ලේඛන

243. ශ්‍රී ලංකාවේ හිටපු එල්ටීටීඊ සාමාජිකයන් 'පුනරුත්ථාපනය' සහ 'ප්‍රත්‍යානුකලනය' මගින් ප්‍රතිසන්ධානය: තථ්‍ය කරුණු ප්‍රබන්ධයෙන් වෙන්කරීම - අම්බිගා සට්කුණනාදන්, 10.19.2010 https://groundviews.org/2010/10/19/reconciliation-through-'rehabilitation'-'reintegration'-of-ex-ltte-members-in-sri-lanka-separating-fact-from-fiction/#_ftn9

## පුනරුත්ථාපිතයන්: වෙනස්වන සංඛ්‍යා



1. p9, Combatant' to 'Civilian': The Psychosocial
Wellbeing of Ex-combatants in Kilinochchi and Mullaitivu, Sri Lanka, 2019,
https://www.ices.lk/publications-1/from-combatant-tocivilian-%3A-the-psychosocial-wellbeing-of-ex-combatants-in-kilinochchi-and-mullaiti citing Source: BCGR – Department of Government Information booklet (2013)
'රඳවාගෙන සිටින පුනරුත්ථාපන රැඳවියන් සංඛ්‍යාවන් ගැන ආණ්ඩුවේ ප්‍රකාශ අසංගත ය. 2009දී. එවකට සිටි පුනරුත්ථාපන කොමසාරිස් ජෙනරාල් සඳහන් කරන ලද්දේ ඔහු භාරයේ සිටින රැඳවියන් සංඛ්‍යාව 10,992ක් බව ය. ෂකඨ 2010, පිටුව10, පාද සටහන උපුටා ඇති පරිදි, "පිරිමි රැඳවියන් 8,894ක් සහ ස්ත්‍රී රැඳවියන් සහ දරුවන් 2,098ක් වශයෙන් වූ මෙම සංඛ්‍යාව පුනරුත්ථාපන කොමසාරිස් ජෙනරාල්වරයා වූ ජෙනරාල් දයා රත්නායක විසින් 2009 නොවැම්බර් 16 වැනිදා අධිකරණ ඇමතිවරයා විසින් කැඳවන ලද රැස්වීමකදී ආධාර සපයන්නන්ට ඉදිරිපත් කරන ලදී.'

2. ICG report, 2010, page 10,.Citing Asia Tribune, 5 December 2009, "The Elders statement on IDPs in Sri Lanka – Sadly outdated and inaccurate – Dr. Kohona",
http://www.asiantribune.com/news/2009/12/05/elders-statement-idps-sri-lanka-sadly-outdated-and- inaccurate-%E2%80%93-dr-kohona (accessed on 27 July 2010).
Adding that 'Informally, the previous CGR had spoken of a figure of 12,000 detainees, most recently on 2 February 2010.'

3. Satkunanathan, Ambika, 2018/12/01 - The treatment of former combatants in post-war Sri Lanka: A form of arbitrary detention or rehabilitationention_or_rehabilitation
https://www.researchgate.net/publication/343046809_The_treatment_of_former_combatants_in_post-war_Sri_Lanka_A_form_of_arbitrary_detention_or_rehabilitation

4. http://news.bbc.co.uk/2/hi/south_asia/8450914.stm, 10 Jan 2010, BBC, Sri Lanka's Tamil Tiger suspects 'won't be freed soon'

5. p8 http://ices.lk/wp-content/uploads/2019/12/From-Combatant.pdf, citing BCGR.

6. http://news.bbc.co.uk/1/hi/world/south_asia/8450914.stm

7. Interviews with humanitarian aid workers, July 2010
cited by ICG report, P10.

8. http://news.bbc.co.uk/1/hi/world/south_asia/8450914.stm

9. http://archives.sundayobserver.lk/2010/02/28/fea03.asp
,Businessmen, Tamil diaspora should help rehabilitation,by Shanika SRIYANANDA, 28 Feb 2010, Sunday Observer.

10. A/HRC/34/54/Add.2, 2016

11. https://ihl-databases.icrc.org/fr/customary-ihl/v2/rule128?country=lk

12. එම

13. Reconciliation In Sri Lanka: Harder Than Ever, Asia Report No 209, 18 Jul 2011
"ශ්‍රී ලංකා හමුදාවන් විසින් එල්ටීටීඊ සංවිධානය යුදමය වශයෙන් පරාජය කර වසරකට වඩා වැඩි කාලයකට පසු, 2010 ජූලි අග වනවිට, එල්ටීටීඊ සංවිධානය සමග සම්බන්ධතා තිබූ බවට වන චෝදනා යටතේ දොළහකට වැඩි 'පුනරුත්ථාපන මධ්‍යස්ථාන'වල රඳවා සිටි වැඩිහිටියන් සංඛ්‍යාව 8,000ක් පමණ වෙතැයි ඇස්තමේන්තු කර තිබුණි. ඒයින්, අවම වශයෙන් 1300ක් අපරාධ නඩු පැවරිය යුතු 'උග්‍ර සාමාජිකයන්' වශයෙන් ශ්‍රී ලංකා රජය විසින් හඳුනාගෙන තිබුණි; මෙයින් ආසන්න වශයෙන් 700ක් දෙනා ඕමන්තෙ විශේෂ රැඳවුම් මධ්‍යස්ථානයේ රඳවා සිටියහ; ආසන්න වශයෙන් 3000ක් රැඳවියන් පසුගිය වසර තුළ නිදහස් කර තිබුණි."

14. https://www.army.lk/news/former-ltte-cadres-rehabilitation-last-stage

15. https://www.bbc.co.uk/news/world-south-asia-12108479
Tamil Tiger releases hit by rehabilitation problems, 3 Jan 2011, BBC

16. https://ihl-databases.icrc.org/fr/customary-ihl/v2/rule128?country=lk

17. https://www.lankaweb.com/news/items/2011/01/02/of-11696-ltte-personnel-taken-into-custody-5586-have-left-rehabilitation-centres-since-the-end-of-the-war/
https://ihl-databases.icrc.org/fr/customary-ihl/v2/rule128?country=lk

18. https://timesofindia.indiatimes.com/world/south-asia/lanka-releases-1800-ex-ltte-guerrillas-after-rehabilitation/articleshow/10185260.cms
30 Sep 2011,
Lanka releases 1,800 ex-LTTE guerrillas after rehabilitation

Read more at:
http://timesofindia.indiatimes.com/articleshow/10185260.cms?utm_source=contentofinterest&utm_medium=text&utm_campaign=cppst

19. https://reliefweb.int/report/sri-lanka/rehabilitation
ex-ltte-cadres-final-stages

20. https://www.businesstoday.lk/article.php?article=3488,
ගොනුගත ලේඛන

21. From Vanni to Cinnamon Grand : Ex-fighters display dancing skills at IOM reception, 2011, available at https://realsrilankanman.blogspot.com/2011/05/from-vanni-to-cinnamon-grand-ex.html

22. Turning Former LTTE Personnel into Sri Lankan Citizens?https://groundviews.org/2011/10/28/turning-former-ltte-personnel-into-sri-lankan-citizens/
Footnote 1

23. https://ihl-databases.icrc.org/fr/customary-ihl/v2/rule128?country=lk

24. එම

25. Post-Conflict Reconciliation in Sri Lanka: A Time for Reflection Author(s): Rohan Gunaratna Source: Counter Terrorist Trends and Analyses, Vol 4, No 4 (Apr 2012), -pp2-7, International Centre for Political Violence and Terrorism Research

26. https://m.reliefweb.int/report/472295/sri-lanka/ex-cadres-reintegration-accelerated

27. p8, http://ices.lk/wp-content/uploads/2019/12/From Combatant.pdf, citing BCGR. ගොණුගත ලේඛන

28. http://news.bbc.co.uk/1/hi/world/south_asia/8450914.stm

29. https://reliefweb.int/report/sri-lanka/rehabilitation-ex-ltte-cadres-nearing-completion

30. p9, From 'Combatant' to 'Civilian': The Psychosocial Wellbeing of Ex-combatants in Kilinochchi and Mullaitivu, Sri Lanka, 2019. ICES on file:
"රජයේ මූලාශ්‍ර විසින් සපයා ඇති 'පුනරුත්ථාපනය කොට යළි අන්තර්ග්‍රහණය කරන ලද' බව කියන හිටපු සටන්කරුවන්ගේ සංඛ්‍යාවන් පිළිබඳ පැහැදිලි අසංගතියක් තිබේ. මෑතකදී පැවති ප්‍රවෘත්ති හමුවකදී, පළමු පුනරුත්ථාපන කොමසාරිස් ජෙනරාල්වරයා වශයෙන් (2009 ජූලි සිට 2010 පෙබරවාරි දක්වා) ක්‍රියාකළ හිටපු හමුදාපති දයා රත්නායකකියා සිටියේ, 'මිනිස් ඝාතනවලට හා ඝාතන ප්‍රයත්නයන්ට හවුල් වූ හෝ දායක වූද, ආගමික සිද්ධස්ථාන ඉලක්ක කොට බෝම්බ පිපිරීම් සිදුකළා වුද අයද ඇතුළු 14,000ක් දෙනා ශ්‍රී ලංකා රජය විසින් පුනරුත්ථාපනය කර තිබේ. මෙම පුද්ගලයන්ට රජය විසින් පොදු සමාවක් ලබා දී තිබේ. ජනාධිපතිවරයා ඝාතනය කිරීමට තැත්කළ එල්ටීටීඊ සාමාජිකයන්ට ජනාධිපති සමාව ප්‍රදානය කරනු ලැබුණි. (Pothmulla and Sanjeewa 2019). හිටපු පුනරුත්ථාපන කොමසාරිස්වරයාගේ ප්‍රකාශය අනුව, යටත් වූ සහ අල්ලාගන්නා ලද සම්පූර්ණ හිටපු සටන්කරුවන් සංඛ්‍යාව 14,000ක් වන අතර ඔවුන් සියළු දෙනාම සමාවක් ලබා දී පුනරුත්ථාපනය කර තිබේ. මෙම ප්‍රකාශයන්, එල්ටීටීඊ සංවිධානය සමග දැඩි සබඳතා තිබූ බවට වන චෝදනා යටතේ නඩු පවරන ලදැයි කියන හිටපු සටන්කරුවන්ගේ සංඛ්‍යාවන් පිළිබඳව, පුනරුත්ථාපන කොමසාරිස් ජෙනරාල් කාර්යාංශය මගින් ගොණුකරන ලද තොරතුරු සහ එළිදැක්වූ ප්‍රකාශනයන් සමග පරස්පරතාවක් පෙන්නුම් කරයි. මෙම අසංගතභාවයන් හේතුවෙන්, සත්‍යය සේ පිළිගත යුත්තේ කවර තොරතුරුද යන්න තීරණය කිරීම දුෂ්කර කොට තිබේ.'

31. Satkunanathan, Ambika, 2018/12/01, The treatment of former combatants in post-war Sri Lanka: A form of arbitrary detention or rehabilitation? https://www.researchgate.net/publication/343046809_The_treatment_of_former_combatants_in_post-war_Sri_Lanka_A_form_of_arbitrary_detention_or_rehabilitation

32. https://www.indiatvnews.com/news/world-594-child-soldiers-among-12-000-lttes-rehabilitated-by-sri-lanka-govt-454452

33. https://www.ices.lk/_files/ugd/fba0ea_7c56089ec9fe4c649c5f38c3764f52a6.pdf

34. https://www.un.int/srilanka/sites/www.un.int/files/Sri %20Lanka/2021/July/book.pdf

## දෙමළ අතුරු හමුදා කල්ලි මෙහෙයවීම සහ පාලනය

**මෙම කොටසින් පෙන්නුම් කරන්නේ ගෝඨාභය රාජපක්ෂ සහ ඔහුගේ සොහොයුරු බැසිල් එල්ටීටීඊයෙන් කැඩී ගිය කරුණා සහ ඔහුගේ ආශ්‍රිතයන් විසින් මෙහෙයවන ලද කණ්ඩායම් පාලනය කරන ලද ආකාරය ගැනයි.**

එල්ටීටීඊය අතහැර ගිය පිරිස් සහ ඊළම් ජනතා ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය (EPDP) විසින් පිහිටුවා ගන්නා ලද දෙමළ අතුරු හමුදා කල්ලි 2004 දී ශ්‍රී ලංකාවේ නැගෙනහිර සිදුකළ මානව හිමිකම් උල්ලංඝන එක්සත් ජාතීන් විසින් මනා ලෙස ලේඛනගත කර ඇත[244]. මෙම හමුදා මෙහෙයවීම, පාලනය කිරීම, ඔවුන්ට නවාතැන් සපයාදීම, ආරක්ෂාකිරීම සහ ඔවුන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම සහ අරමුදල් සැපයීම සහ සන්නද්ධ කිරීම ශ්‍රී ලංකා රජය විසින් කරන ලද අතර එම හමුදා රහසිගත ප්‍රහාර සහ අන්‍යයන්ට වරද පැවරෙන මෙහෙයුම් සඳහා යොදා ගත හැකිවිය[245]. දේශීය පරීක්ෂණ කොමිසමේදී ගෝඨාභය රාජපක්ෂ සාක්ෂි දෙමින් පැවසුවේ 'කරුණා කණ්ඩායම සහ ඊළඟට පිල්ලෙයාන් කණ්ඩායම යන මේ හිටපු එල්ටීටීඊ සාමාජිකයන් , EPDP, PLOTE, EPRLF පවා මේ සියල්ලන් දීර්ඝ කාලයක් මුළුල්ලේ රජයට ආධාර කළ අතර' ඔවුන්ට 'ස්වකීය ආරක්ෂාව උදෙසා' […] 'අවිදැරීමට' සිදුවිය'[246] යනුවෙනි.

2004ට පසු එල්ටීටීඊය දෙදරූ විට, කැඩීගිය කණ්ඩායම අතුරු සන්නද්ධ කල්ලියක් බවට පත්වූ අතර, සටන් විරාම ගිවිසුමේ කොන්දේසි අනුව ඔවුන් නිරායුධ කළ යුතු වූවත්, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හිතාමතා ඔවුන් දිරිගන්වා ඔවුන්ට පහසුකම් සලසන ලදී. කරුණා කාණ්ඩායම සමඟ ශ්‍රී ලංකා ආණ්ඩුවේ සහයෝගීත්වය එල්ටීටීඊය සමඟ වූ සටන් විරාමය බිඳවැටීම 2005 සිට එකවිට සිදුවිය[247]. මෙම ආණ්ඩුවට ලැදි සන්නද්ධ කල්ලි නිරන්තරයෙන් ළමා සොල්දාදුවන් බඳවා ගෙන යොදාගත් අතර ශ්‍රී ලංකා හමුදාව විසින් පහසුකම් සලසන ලද ළමා සොල්දාදුවන් හමුදා කඳවුරු තුළ සිටිනු දැකගන්නට ලැබිණි[248]. 2006 අප්‍රියෙල් මාසයේදී, සටන් විරාමය උල්ලංඝනය කිරීම් නිරීක්ෂණය අනතුරෙහි හෙළීමට ගෝඨාභය රාජපක්ෂ උත්සාහ කරන බව ඇමරිකානු ආණ්ඩුව කී අතර එයට රජයේ උල්ලංඝනය කිරීම් ද්‍රවිඩ කණ්ඩායම් නිරායුධ කිරීමට අසමත්වීම මෙන්ම ස්කැන්ඩිනේවියානු නිරීක්ෂකයන් ඔවුන්ගේ සාක්ෂි ගොතන බව කියාපෑම ඇතුළත් විය[249]. 2006 මැයි මාසයේදී ඇමරිකානු රාජ්‍ය තාන්ත්‍රිකයන් විසින් සන්නද්ධ හමුදා කරුණා සමඟ වැඩකරන බව ගෝඨාභය රාජපක්ෂ හමුවේ මතු කළ අවස්ථාවේදී , එය ඒත්තු ගත් ඔහු එය නතර කළ යුතු බවට එකඟ විය.[250] මෙය අවංකකමින් තොර වුවත්, ඇමරිකානු තානාපති කාර්යාලය එය විශ්වාස කළ බවක් පෙනෙන්ට තිබුණි.:

*'ගෝඨාභය රාජපක්ෂගේ වෙනස විශේෂයෙන් අප හිතට වැදුණා. කලින් ඔහු ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සහ කරුණාගේ කණ්ඩායම අතර කිසියම් සම්බන්ධයක් ඇතැයි යන්න තදින්ම ප්‍රතික්ෂේප කළා. දැන් ඔහු පෙනෙන විදියට එහෙම දෙයක් සිදුවෙමින් පැවතිය හැකි බව පිළිගන්නවා.'*

---

244. ඡේදය 49, OISL 2015, 'අතුරු හමුදා ද, බරපතල මානව හිමිකම් අපයෝජන, විශේෂයෙන් අත්තනෝමතික ලෙස රඳවා ගැනීම, වදහිංසාව සහ දහස් ගණනක් බලාත්කාරයෙන් අතුරුදහන්කිරීම ගැන වගකිව යුතුය.' තවද ..
143 ඡේදය පෙන්වන්නේ උපක්‍රමික සහාය දක්වමින් EPDP හමුදා කඳවුරුවලින් බැහැරව ක්‍රියාකරන බවයි. සිදුකළැයි කියන විවිධ මානව හිමිකම් උල්ලංඝනයකිරීම්වලදී ඔවුන්ගේ කාර්යභාරය ගැන මෙම වාර්තාවේ සඳහන් කිරීම් ගණනාවක් ඇත.

245. 'මෙම කොටස් තවදුරටත් සත්‍යවශයෙන්ම ස්වාධීන සන්නද්ධ කණ්ඩායම්වලින් යුක්ත නොවන බවට ප්‍රබල පෙන්නුම් කිරීම් ඇති නමුත් ඒ වෙනුවට ආරක්ෂක හමුදාවලින් නියෝග සහ ආධාර ලබයි'. A/HRC/8/3/Add.3 - 50 ඡේදය, 2008
UN OISL 'මිලිටරි බුද්ධිසේවා සහ කරුණා කණ්ඩායම සහ EPDP අතර සමීප සම්බන්ධතා ඇති බව සාක්ෂිකරුවන් ගණනාවක් පෙන්වා ඇත - 130 ඡේදය - යුද්ධයෙන් පසු සන්නද්ධ කණ්ඩායම්' කප්පම් ලබාගැනීම, පැහැරගෙන යාම සහ වෙනත් සාපරාධී ක්‍රියාවල අඛණ්ඩව යෙදෙන බව' උගත් පාඩම් සහ ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසම් වාර්තාවේ සඳහන් බව එක්සත් ජාතීන් පෙන්වා දෙයි'.
LLRC අවසන් වාර්තාව, ඡේදය - ඡේදය 9.73, ඡේදය 9.74
http://www.priu.gov.lk/news_update/Current_Affairs/ca201112/FINAL%20LLRC%20REPORT.pdf

246. "මෙම කොටස් තවදුරටත් සත්‍යවශයෙන්ම ස්වාධීන සන්නද්ධ කණ්ඩායම්වලින් යුක්ත නොවන බවට ප්‍රබල පෙන්නුම් කිරීම් ඇති නමුත් ඒ වෙනුවට ආරක්ෂක හමුදාවලින් නියෝග සහ ආධාර ලබයි'. A/HRC/8/3/Add.3 50 ඡේදය. 2008
UN OISL "A number of witnesses point to close links between Military Intelligence and both the Karuna Group and EPDP." Para 130. UN also cites the domestic commission the LLRC regarding armed groups post war "continuing acts of extortion, abduction and other criminal acts". LLRC අවසන් වාර්තාව, ඡේදය - ඡේදය 9.73, ඡේදය 9.74
http://www.priu.gov.lk/news_update/Current_Affairs/ca201112/FINAL%20LLRC%20REPORT.pdf

247. W250

248. සාක්ෂි ප්‍රකාශය. W141.

249. පෙබරවාරි සාකච්ඡාවල සටන් විරාම නිරීක්ෂණ කමිටුව (SLMM) ප්‍රධානි Hagrup Haukland දර්ශනගතකිරීම් වාර්තා ප්‍රබන්ධකර සටන් විරාම උල්ලංඝනය කිරීම් ගැන පෞද්ගලික සතිපතා ප්‍රගති වාර්තා පාර්ශව දෙකටම බාරදී ඇති අතර එහි පාලනය යටතේ සිටින කණ්ඩායම් නිරායුධ කිරීමට රජය අසමත්වී ඇති බව පැවසීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය නිරීක්ෂණ කමිටුවේ තක්සේරුව කෙරෙහි කිපී ඇත.ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ (ජනාධිපති මහින්ද රාජපකෂගේ බාල සොහොයුරු) සැර වචන යෙදු සටහනකින් මාධ්‍යයට නිකුත් කළ අතර හා අප්‍රියෙල් 2 දා 'වාර්තා කළ ඉවත්ව යන SLMM ප්‍රධානී Hagrup Haukland දර්ශනගතකිරීම් වාර්තා ප්‍රබන්ධ කරන බවටද, 'නැගෙනහිර' සන්නද්ධ කණ්ඩායම් ආශ්‍රය කරන' බවටද චෝදනා කළේය.
https://wikileaks.org/plusd/cables/06COLOMBO592_a.html

250. https://wikileaks.org/plusd/cables/06COLOMBO872_a.html

2006 ඔක්තෝබර් මාසයේදී බැසිල් රාජපක්ෂ දෙමළ කණ්ඩායම් විසින් (ඊපීඩීපී සහ කරුණා කණ්ඩායම) සිදුකරනු ලබන පැහැරගැනීම් ගැන ඇමරිකානු රාජ්‍ය තාන්ත්‍රිකයන්ට කතා කළේය. මේ, ටෙලෙක්ස් පණිවිඩය එම කතාබහ වාර්තා කළ ආකාරයයි:

*'සිය සාමාජිකයන් පාලනය කරගන්නැයි දේවානන්ද ගෙන් සහ ටැමිල් මක්කල් විඩුදලෙයි පුලිකල් (TMVP - කරුණා පාර්ශවය) පක්ෂයෙන් ඉල්ලා ඇතැයි රාජපක්ෂ පැවසීය. TMVP සම්බන්ධයෙන් ගත්විට ඔවුන්ට 'ආපසු මඩකලපුවට' යන ලෙස ඉල්ලා තිබෙන බව ප්‍රකාශ කළා. ඔවුන්ගේ සාමාජිකයන්ගේ ක්‍රියාකලාපය ගැන ඔවුන් පෞද්ගලිකව වගකිවයුතු බව අපි ඉතා පැහැදිලිව ඩග්ලස්ට සහ කරුණාට දැනුම්දී තිබෙනවා[251].'*

උගත් පාඩම් සහ ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසමේදී සාක්ෂි දෙමින් ගෝඨාභය රාජපක්ෂ දෙමළ සන්නද්ධ කල්ලි නිරායුධ කර ඇති නමුත් ඔවුන්ගේ ආක්ෂාව උදෙසා ඔවුන්ට අවිදැරීමට සිදුව ඇති බවත් පවසා ඇතැයි එක්සත් ජාතීන් පසුව පවසා ඇත. එක්සත් ජාතීන් ගේ OISL වාර්තාව එල්ටීටීඊ සාමාජිකයන් සහ මළ සිරුරු හඳුනාගැනීමට යුද හමුදාව, නාවික හමුදාව සහ විශේෂ කාර්ය බලකාය වෙනුවෙන් 'කරුණා කණ්ඩායම' ඉටු කළ ඔත්තු සේවා කාර්යභාරය ගෙනහැර දක්වා ඇත[252].

කෙසේ වෙතත් අනාවරණය වූ ඇමරිකානු ටෙලෙක්ස් [COLOMBO 00000728] පණිවිඩවලින් හෙළිවන පරිදි දෙමළ අතුරු හමුදා කල්ලි වලට බුද්ධි කාර්යභාරයට වැඩි දෙයක් තිබුණි; මෙය 2007 පණිවිඩයකි:

*'එල්ටීටීඊය සමඟ වැඩකරන බවට සැකරන අය පැහැරගෙන යමින් සහ සමහර අවස්ථාවලදී මරාදමමින් මෙම කණ්ඩායම් කොළඹ ආරක්ෂාව තර කළහ. අතුරු හමුදා කල්ලි වරින්වර සිදුකරන පැහැරගැනීම් නිසා ආණ්ඩුවේ විවේචකයන් තැතිගන්වා නිහඬ කොට තැබිණ.*[253]

ටෙලෙක්ස් පණිවුඩයේ නම මකා දමා තිබූ හමුදා නිලධාරියකු තානාපති කාර්යාලයට පවසා තිබුණේ ඔවුන්ට් අන්තර්ජාතික සුපරීක්ෂාවට ලක්වන නිසා හමුදාවට කළ නොහැකි 'වැඩකී' අතුරු සන්නද්ධ හමුදා සිදුකරන බැවින් භූමියේදී ඔවුන්ගේ කටයුතුවලට බාධා නොකරන ලෙසටි ඔවුන්ට ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂගෙන් නියෝග ලැබී තිබුණු අතර,'හමුදා බුද්ධි මෙහෙයුම්වලට මැදිහත් නොවන ලෙස' ආරක්ෂක අමාත්‍යාංශයෙන් උපදෙස් ලැබී තිබුණ බවයි[254]. එම මූලාශ්‍රම කියා පෑ තවත් කරුණක් වන්නේ 'දමිල ව්‍යාපාරිකයන්ගෙන් මුදල් එකතුකිරීමට ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ EPDP ට සහ කරුණාට බලය දී තිබූ බවයි... *මෙය වව්නියාවේ සහ කොළඹ බොහෝදෙනා මැනවින් ලේඛනගතකර තිබෙන නොපනත්කම්වල, විශේෂයෙන් කප්පම් ගැනීම් සහ පැහැරගෙනයාම්වල දැඩි වැඩිවීමට' හේතුවන්නට ඇත. මන්ත්‍රීවරුන් කිහිපදෙනකු උපුටා දක්වමින් එම පණිවුඩය පවසන්නේ කරුණා කණ්ඩාම නිසා තම ජීවිත ගැන බියෙන් පසුවන බවයි. එය තවදුරටත් පවසන්නේ් කරුණාට ආධාර නොකරන බව ශ්‍රී ලංකා රජය දිගින් දිගටම පවසන නමුත් ගෝඨාභය සමඟ ඔහු පැවැත්වූ සම්මුඛ සාකච්ඡාව ඇති පටිවලට ට සවන්දීමට XXXXXXXXXXX දේශපාලන නිලධාරියාට ඉඩදුන්නේය. ආරක්ෂක ලේකම්වරයා කරුණා හැඟීම්බරව වර්ණනා කළේය..."*

ඇමරිකානු තානාපති කාර්යාලයේ අවධානය පිළිබඳව ගෝඨාභය රාජපක්ෂට ඒත්තු ගැන්වූ බව නිසැක වන අතර[255] ඇමරිකානු තානාපති කාර්යාල විශ්වාස කළ පරිදි:

*විවිධ තලවලදී අතුරු හමුදා කල්ලි සමඟ ශ්‍රී*

251. https://wikileaks.org/plusd/cables/06COLOMBO1622_a.html 06COLOMBO1622_a

252. OISL §142. Eg *'ඕමන්තේදී මාව අත්අඩංගුවට ගත්ත. මම දන්නෙ නැහැ මාව සොයා ගත්ත තැනැත්තා කව්ද කියලා. ඒත් මම හිතනව තොරතුරුකරු කරුණාගෙ පැත්තේ කෙනෙක් කියල.එහිදී එල්ටීටීඊයෙ අයට එක් පැත්තකට යන්න කියා සහ ඉතිරි අයට අනික් පැත්තට යන්න කියල නිවේදන කියෙව්වා. මම එල්ටීටීඊයෙ පැත්තට ගියෙ නැහැ. කෙනෙක් මා වෙත පැමිණ ඇඟිල්ල දිගුකර (නම සංස්කරණය කර ඇත) අනික් පැත්තට යන්න කිව්වා. ඔහු එය කීවේ හොඳ දෙමළ භාෂාවෙන්.'* W129-

253. https://www.tamilnet.com/img/publish/2010/12/WikiLeaks-Blake-01.pdf, 06 COLOMBO 000728

254. ටෙලෙක්ස් එකේ මෙම අනුවාදයෙන් කියන්නේ 'මේජර් ජෙනරාල් චන්ද්‍රසිරි ඇතුළු යාපනයේ ඇතැම් අණදෙන නිලධාරීන්ට අතුරු හමුදා මැඩ පැවැත්වීමට අවශ්‍ය නමුත් ජාත්‍යන්තර නිරීක්ෂණය නිසා හමුදාවලට කළ නොහැකි 'වැඩ' ඔවුන් කරන නිසා භූමියේදී අතුරු හමුදාවලට බාධා නොකරන ලෙස ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂගෙන් නියෝග ලැබී ඇති බව යාපනයේ දිසාපති කේ. ගනේෂ් මහතා අප සමඟ පැවසීය." https://wikileaks.org/plusd/cables/07COLOMBO728_a.html

255. මෙම අතුරු හමුදාවල ක්‍රියාකාරකම් ආමන්ත්‍රණයකිරීම සහ ඔවුන් පවිටු ලෙස මානව හිමිකම් නොසැලකීම මෙම තානාපති කාර්යාලයේ ඉහළ ප්‍රමුඛතාව හිමිවන කරුණකි.. තානාපති, DCM and Pol Chief මෙම කණ්ඩායම් හසුරුවීමේ සහ පැහැරගෙනයාම්, මිනීමැරුම් සහ වෙනත් මානව හිමිකම් අපහරණය අවසන් කිරීමේ වැදගත්කම අවධාරණය කිරීමට නැවත නැවත ජනාධිපති, විදේශ කටයුතු ඇමති, ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ, මානව හිමිකම් ඇමති මහින්ද සමරසිංහ සහ වෙනත් අය හමුවූහ. සංචාරයේ යෙදී සිටින ඇමරිකානු රජයේ දකුණු සහ මධ්‍යම ආසියානු කටයුතු පිළිබඳ සහකාර ලේකම් රිචඩ් බවුචර් සහ ප්‍රධාන නියෝජ්‍ය සහකාර ලේකම් ස්ටීවන් මාන් ඇතුව නිලධාරීන් දිගටම සිදුවන අපහරණයන් ආරක්ෂක සහයෝගිතාවයට බලපෑ හැකි බවට දැඩි පණිවුඩයක් දී ඇත'. -එම -

*ලංකා රජයේ ඇති දුස්සහායන් රටාවක් මේ සියල්ලෙන් පෙන්නුම් කරයි. මෙම සම්බන්ධවීම හුදෙක් මෙම සංවිධානවල අප්‍රසන්න ක්‍රියාකාරකම් නොදැක්කා මෙන් ඉවත බලාගැනීම ඉක්මවා යන බව දක්නට ඇත.නරකම දෙය නම්, මෙම ප්‍රකාශන මගින් ඇඟවෙන්නේ ආරක්ෂක ආයතනවල ඉහළ නායකයන් මෙම අතුරු හමුදාවලට විධාන කරන්නට ඇති බවයි.* [256]'

රැඳවුම් ස්ථාන රැසකට ප්‍රවේශයක් මෙම අතුරු හමුදා කල්ලි වලට තිබී ඇති බව වාර්තාවී ඇත; W76 සාක්ෂිකරු නෙල්ලිකුලම් 'පුනරුත්ථාපන කඳවුරේ' සිටි රැඳවියකු වන අතර එහිදී කරුණාගේ සාමාජිකයන්ට රැඳවියන්ගෙන් ප්‍රශ්න කිරීමට හැකි වී තිබේ. ඒ ආකාරයෙන්ම ITJP සාක්ෂිකරු W111 වව්නියාව අවට කඳවුරු බැලීමට ඉහළ පෙළේ හමුදා නිලධාරීන් සමඟ එල්ටීටීඊයෙන් කැඩුණු අතුරු හමුදා කල්ලි නායක කර්නල් කරුණා පැමිණි බව විස්තර කළේය.

නැගෙනහිර පළාතේ දෙමළ අතුරු හමුදා ගෝඨාභය රාජපක්ෂ යටතේ වූ පොලීසියේ විශේෂ කාර්ය බලකාය සමඟ සමීපව ක්‍රියාත්මක විය. විශේෂ කාර්ය බලකායේ සිටි එක් සිංහල නිලධාරියෙක් (W251) තමාගේ ඉහළින් සිටි නිලධාරියා දෙමළ අතුරු හමුදාවලට හෝ ඔවුන්ගේ දේශපාලන පක්ෂයට (TMVP) අත නොපෙවීමට ගෝඨාභය රාජපක්ෂගෙන් ලැබුණු නියෝග සන්නිවේදනය කළ බව පවසයි:

*'කරුණාගේ මිනිස්සු නතර කරන්න හෝ පරීක්ෂා නොකරන්නත්, ඔවුන් කරන කිසිම දෙයකට මැදිහත් නොවන්නත් කාර්යභාර නිලධාරි (නම මකා දමා ඇත) අපට පැවසුවා. කාර්යභාර නිලධාරිට අනුව එම උපදෙස් ලැබී ඇත්තෙ ආරක්ෂක ඇමති ගෝඨාභය රාජපක්ෂගෙන්. මම දැක්කා ඔවුන් බය නැතිව, අවි ඇතිව සන්නද්ධව බයික්වල නැගිලා එහෙ මෙහෙ යනවා. වෙනත් කිසිවෙක් විවෘතව අවි උස්සාගෙනයාමට බිය නැතිව හිටියෙ නැහැ. පිරික්සුම් මෙහෙයුම්වලදී TMVP සහ යුද හමුදා සොල්දාදුවන් කෙළින්ම ගෝඨාභය රාජපක්ෂට කතා කරනවා. ගෝඨාභය පොලිස් අධිකාරිට කතාකර TMVP සාමාජිකයන්ගේ කටයුතුවලට බාධා නොකරන ලෙස උපදෙස් දුන්නා. එක් අවස්ථාවකදී අප විසින් බාධා නොකිරීම ගැන දුරකථනයෙන් බහින් බස් වීමක් සිද්ධ වුනා.. මෙය සිද්ධවුනේ ම එහි සේවයට යෙදවූ මුලදී. අපි TMVP සාමාජිකයන් ටික දෙනකු පරීක්ෂා කිරීමට අපගේ කඳවුරට ගෙනවිත් තිබුණා. ඒත් ගෝඨාභය පොලිස් අධිකාරිට කතා කරලා ඔවුන්ට යන්න දෙන ලෙසත් බාධා නොකරන ලෙසත් පැවසුවා. මගේ පොලිස් අධිකාරි මෙම TMVP සාමාජික කුඩා කොල්ලන්ට බයවී හිටියා ඒකට හේතුව උන්ට ගෝඨාභය සමඟ කෙළින්ම සම්බන්ධතා තිබීමයි.'*

*TMVP* කඳවුරේ පුද්ගලයන් රඳවාගෙන සිටීම මෙන්ම අඩු වයසේ සාමාජිකයන් අවි තබාගෙන සිටීම තමා දුටු බව ඔහු කීය.

2007 දී *TMVP* බෙදුණු අතර ජ්‍යෙෂ්ඨතම පුද්ගලයා වූ කර්නල් කරුණා වෙනුවට පිල්ලෙයාන් ලෙස වඩාත් ප්‍රසිද්ධියට පත් එල්ටීටීයේ ළමා සොල්දාදුවකුව සිටි සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් නායකත්වයට පත්විය. ඔහු 2008 දී නැගෙනහිර පළාතේ මහ ඇමති ධුරයට පත්විය. ගෝඨාභය රාජපක්ෂ හෙලිකොප්ටරයකින් මඩකලපුවේ හමුදා කඳවුරට පැමිණ පිල්ලෙයාන් හමුවීමට ඔහුගේ ගෙදර ගිය බව එදින මාර්ගයේ සේවයේ යෙදී සිටි විශේෂ කාර්ය බලකායේ සාමාජිකයෙක් සිහිපත් කරයි. ITJP තවත් සාක්ෂිකරුවකුවූ W72 විස්තර කරන්නේ ගෝඨාභයගේ සොහොයුරු බැසිල් රාජපක්ෂ පිල්ලෙයාන්ගේ තත්වාකාර භාරකරු වූ බවයි.

හමුදා කඳවුරු ඇතුළත දෙමළ අතුරු හමුදා විසින් ළමා සොල්දාදුවන්[257] යොදා ගැනීම දැක ඇති පුවත්පත් කලාවේදියකුට මරණ තර්ජන මාලාවක් ලැබී ඇති අතර ප්‍රදේශයේ හමුදා අණදෙන නිලධාරීන් මෙම සිද්ධිය (W141) ගැන දැනුම්දීමට ගෝඨාභය රාජපක්ෂට කතාකර ඇති බව ඔහුගේ මූලාශ්‍රවලින් ඔහුට දැනගැනීමට ලැබී ඇත. ඔහුගේ මිත්‍ර කණ්ඩායම් ළමා සොල්දාදුවන් බඳවාගැනීම සහ යොදාගැනීම හා ඔවුන් හමුදා කඳවුරුවල තබාගැනීමෙන් හමුදාව විසින් මෙය අනුමත කරන බව - එම කාලයේ මෙම ගැටළුව සම්බන්ධයෙන් පුළුල් අන්දමින් වූ මානව හිමිකම් වාර්තාකරණයට අමතර වශයෙන්- ගෝඨාභය රාජපක්ෂ දැන සිටින්ට ඇති බව මෙයින් අදහස් කෙරෙයි.

අමතරව දෙමළ අතුරු සන්නද්ධ කල්ලි විසින්

---

256. එම

257. 'ළමයින් නිදහස්කිරීමට කරුණා කණ්ඩායම දැඩි සැලකිල්ලෙන් කටයුතු කරන්නෙ නැහැ'
UNICEF, 27 Apr 2007, https://reliefweb.int/report/sri-lanka/sri-lanka-unicef-says-karuna-faction-not-serious-about-child-releases
'ශ්‍රී ලංකාවේ කැරලිකාර කැඩීගිය කණ්ඩායම තවම ළමා සොල්දාදුවන් බඳවා ගන්නවා' Ban Ki-moon, 28 Dec 2007, UN, https://news.un.org/en/story/2007/12/244632-sri-lankan-rebels-breakaway-faction-still-recruiting-child-soldiers-ban-ki-moon

බලාත්කාරයෙන් බඳවාගැනීම් සිදුකරන බවට පැමිණිලි ඉදිරිපත් වී ඇත. ඉනියභාරතීගේ සාමාජිකයන් විසින් 2008 දෙසැම්බර් මාසයේදී ඔවුන්ගේ (වැඩිහිටි) දරුවන් හෝ ස්වාමිපුරුෂයන් පැහැරගෙන යන ලද බවත් පසුව ඔවුන් අතුරුදහන්වූ බවත් පවසමින් පවුලේ සාමාජිකයන් ඉදිරිපත් කළ පැමිණිලි 6 ක් ITJP සංවිධානය සන්තකයෙහි ඇත.

2007 පිටවූ ඇමරිකානු ටෙලෙක්ස් පණිවුඩයක කර්නල් කරුණා 14 වැනි වියේ ළමයින් පවා යොදා ගන්නා බව සඳහන්ව තිබුණි[258]. අභ්‍යන්තරව අවතැන් ජනයා වෙත යවන සැපයුම් හොරාගැනීමට කරුණාගේ රජයට පක්ෂ අතුරු හමුදා කල්ලිවලට ඉඩදෙන බවත් ඔහුගේ සාමාජිකයන් කඳවුරුවලින් පිට ගණිකා කල්ලි පවත්වාගෙන ගියේයැයි කියන සිද්ධිද එයින් විස්තර කෙරේ. අසළ පිහිටි ගම්මානවල වැන්දඹුවන් සහ තරුණ ගැහැනු ළමයින් ගොදුරු කරගැනීමට ඊපීඩීපී ය උත්සාහ කළේයැයිද විකිලීක්ස් කියාපායි. මුලදී ආර්ථික වශයෙන් රැකවරණ සලසන බව පවසා ඔවුන් නොමඟයවමින්, එම දරුවන් බලෙන් ගෙන ගොස් වහල් මෙහෙයට විකුණූ බවට ඊපීඩීපී ය ට චෝදනා කරන බවද එහි දැක්වෙයි[259]. තරුණ කාන්තාවන් බලාත්කාරයෙන් ලිංගික වහල් මෙහෙයට යොමු කර එක් වේලාවකදී සොල්දාදුවන් පස් දෙනෙකු - දස දෙනකු අතර සංඛ්‍යාවක් සමඟ ලිංගික සේවනයේ යෙදීමට බල කෙරිණ. කාන්තාවන් ඊපීඩීපී ජාල මගින් ඉන්දියාවේ සහ මැලේසියාවේ ගණිකා කල්ලිවලට ද අලෙවි කෙරිණ. කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ දූෂිත රේගු සහ ආගමන විගමන නිලධාරීන්ගේ උපකාරයෙන් නිතරම දරුවන් නීති විරෝධි ලෙස පිටරට යැවීම ගැනද චෝදනා ගණනාවක් ඇත.

මේ අතර කර්නල් කරුණා ව්‍යාජ නමකින් නිකුත් කරන ලද නිර්ව්‍යාජ රාජ්‍ය තාන්ත්‍රික ගුවන් ගමන් බලපත්‍රයකින් එක්සත් රාජධානිය බලා පිටත්ව ගියේය. 2007 නොවැම්බර් මාසයේදී එක්සත් රාජධානියේදී ඔහු අත්අඩංගුවට ගන්නා ලද ඔහු[260] පසුව සිරගත කරන ලදී. ලන්ඩනයේ උසාවියකදී කියවූ ප්‍රකාශයකින් කරුණා පවසා ඇත්තේ ගෝඨාභය රාජපක්ෂ තමාට ගුවන් ගමන් බලපත්‍රය ලබාදුන් බවයි.

බීබීසීය මෙසේ වාර්තා කළේය:

*'ශ්‍රී ලංකාවෙ බලසම්පන්න ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ, රාජ්‍ය තාන්ත්‍රික ගුවන් ගමන් බලපත්‍රයකින් එක්සත් රාජධානියට ඒමට තමාට 'සියල්ල සංවිධානය' කරදුන් බව කරුණා බ්‍රිතාන්‍ය ආගමන නිලධාරීන්ට පැවසීය. විවෘත අධිකරණයේදී කරුණා ගේ ප්‍රකාශය කියවූ අභිචෝදකයන් පැවසුවේ ජනාධිපති රාජපක්ෂගේ බාල සොහොයුරා ඔහු එල්ටීටීඊය පැරද වූදා සිටම දැනසිටි බවයි. එම ප්‍රකාශයට අනුව, ඔහුට ගුවන්ගමන් බලපත්‍රය දී ඇත්තේ එක්සත් රාජධානිය බලා පිටත්වන ගුවන් යානය තුළදී ය[261].'*

කොළඹ ගුවන් තොටුපලේ වැඩකරන ෂඔනජ සාක්ෂිකරුවෙක් වන W303, පැවසුවේ එවකට පාලක ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ දුමින්ද සිල්වාට (පසුව දේශපාලන ප්‍රතිවාදියෙකු මැරීම සම්බන්ධයෙන් වරදකරුවූ[262]) ගුවන් තොටුපලේ ආරක්ෂක අංශයට විශාල බලපෑමක් කිරීමට සහ යම් පුද්ගලයකු පරීක්ෂා නොකරන්නැයි ගුවන් තොටුපලේ ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරීන්ට නියෝග කිරීමටත් හැකි බලයක් තිබ බව ය.

*'මූලික වශයෙන් ඔවුන්ට යම් පුද්ගලයෙකු ගුවන්යානයකට ගොඩකිරීමට අවශ්‍යවන්නේ නම්, ඔවුන්ට එයට පහසුකම් සැලසිය හැකිය. ඒ වෙනුවෙන් ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලයට අල්ලසක් ගෙවනු ලැබීය. මගේ මට්ටමේ අපව බොහෝසෙයින් දැනුවත් කිරීමක් වන්නේ නැහැ. අපට අල්ලස් ලැබුනෙත් නැහැ. ව්‍යාජ විදේශ ගමන් බලපත්‍රයකින් රටින් පිටවයාමට කරුණාට ගෝඨාභය රාජපක්ෂ අවසරය දුන්නා. ඔහු විශේෂ පුද්ගලයන්ගේ කුටියේ නතර වී සිටි අතර අවසන් මොහොතේදී ගුවන් යානයට ගොඩවිය.'*

තහනම් කර තිබූ ත්‍රස්තවාදී සංවිධානයක හිටපු සාමාජිකයකු වූ, ප්‍රකට අතුරු හමුදා කල්ලි නායකයෙකු, යුද්ධයේ උච්ජ අවස්ථාවේදී ආරක්ෂාව තරකර තිබියදී ගුවන් තොටුපළේ ආරක්ෂක සහ විගමන සහ ගුවන්යානා පරීක්ෂාකිරීම්වලින් තොරව යාමට හැකිවූයේ කෙසේදැයි මෙයින් ප්‍රශ්න ඇතිකරයි. එසේවුවත් ආරක්ෂක නිලධාරි W224 පැවසුවේ ආගමන අසාදු ලේඛනය සම්බන්ධයෙන් පාලනයක් ගෝඨාභයට තිබූ බවයි:

---

258. https://www.tamilnet.com/img/publish/2010/12/WikiLeaks-Blake-01.pdf COLOMBO 00000728

259. https://www.colombotelegraph.com/index.php/wikileaks-epdp-sold-jaffna-children-girls-to-prostitution-rings-and-boys-to-slavery/

260. ශ්‍රී ලංකාවේ කැරලිකාර කැඩී ගිය කණ්ඩායමේ නායකයා එක්සත් රාජධානියේදී රඳවා ගනී 3 Nov 2007, Reuters, https://www.reuters.com/article/idINIndia-30304420071103

261. 'ගෝඨාභය මට පාස්පෝට් එක දුන්නේ,' BBC, 25 Jan 2008, https://www.bbc.com/sinhala/news/story/2008/01/080125_karunajail.shtml

262. Courtroom drama as Duminda Silva faces death row, 14 Oct 2018, https://www.sundayobserver.lk/2018/10/14/news-features/courtroom-drama-duminda-silva-faces-death-row

*'යුද්ධය කාලයේදී එම ලැයිස්තුව පාලනය කළේ ආගමන දෙපාර්තමේන්තුව විසින් වුවත් එය ත්‍රස්ත විමර්ශන කොට්ඨාසය (TID) සහ රාජ්‍ය බුද්ධි සේවය (SIS) සමඟ හුවමාරු කරගැනීමට ගෝඨාභය නියෝග කර තිබුණි.'*

කරුණා ලන්ඩනයේ සිටියදී, ඔහු යටතේ සිටි වීරා ඔහුගේ කාර්යයන් ඉටු කළේය. W245 පැවසුවේ වීරා කරුණාට වාර්තා කළත් ඔහු නොමැති අවස්ථාවලදී ගෝඨාභය සමඟ ඍජු සම්බන්ධතා පවත්වනු තමා දැක ඇති බව ය. W245 තවදුරටත් පැවසුවේ 'ගෝඨාගේ කාර් එක' ලෙස හැඳින්වූ මෝටර් රථය පැමිණෙනු දුටු බවයි. අනීතික මෙහෙයුකදී පොලීසිය පැමිණි අතර 'ටික වෙලාවකට පසුව සිංහල පුද්ගලයන් කිහිපදෙනකු පැමිණ හැඳුනුම්පත් පෙන්වා' 'ගෝඨාභය සර් යන වචන දුරකථනයෙන් කියනු මට ඇසුණා' යැයි W245 ප්‍රකාශ කළේය.

ලන්ඩන්වල සිට කරුණා අපසු ශ්‍රී ලංකාවට පැමිණ, යුද්ධය නිම වීමෙන් පසු එල්ටීටීඊ හිටපු සාමාජිකයෝ දහස් ගණනක් රැඳවුම් භාරයේ සිටියහ. රැඳවුම් ස්ථාන කරා යාමට අවසරය තිබු කරුණා, පැරණි සගයන් මුණගැසුණේය. කරුණා රැඳවුම් මධ්‍යස්ථානවලදී හමුවූ අයගෙන් ලබාගත් මේ සම්බන්ධයෙන් වූ සාක්ෂි ITJP සතුව ඇත. W319 පැවසුවේ තමා දිනක් මාංචු දමා සිටියදී ප්‍රශ්න කරන කාමරයට ගිය විට ඒ වන විට රජයේ ඇමතිවරයකුව සිටි කරුණා ඔහුගේ පෞද්ගලික ආරක්ෂකයන් ලෙස පෙනීගිය දෙදෙනකු සමඟ එහි සිටි බව ය. W319 සාක්ෂිකරු කීවේ තමා දණගසාගෙන සිටින විට කරුණා ඔහුට, ඔහුගේ බිරිඳට සහ ළමයින්ට තර්ජනය කළ බවයි:

*'මා පිටස්තර කිසිවකුත් සමඟ සම්බන්ධයක් නැතිව රඳවාගෙන සිටින බව මතක් කර දුන් ඔහු මාව මැරුවත් කිසිවකු නොදන්නා බව පැවසීය...ගෝඨාභය රාජපක්ෂගේ බලය යටතේ මා ත්‍රස්ත විමර්ශන කොට්ඨාසය (TID) රඳවාගෙන සිටින බව ඔහු දැන්වීය.'*

දෙමළ අතුරු හමුදා කල්ලි විශේෂ කාර්ය බලකාය සමඟ පමණක් වැඩ නොකළ අතර ඔවුහු බුද්ධි සේවාවක් ගොඩබිමෙහි පවත්වාගෙන ගිය ශ්‍රී ලංකාවේ නැගෙනහිර නාවික හමුදාව සමඟ ද සහයෝගයෙන් කටයුතු කළහ. 2005 න් පසුව නැගෙනහිර සිටියදී කරුණාගේ සාමාජිකයන් ඔහුගේ නාවික කඳවුරට යනු එනු දුටු බව බව නාවික නිලධාරියකු වන W308 සිහිපත් කළේය:

*'මම එහි සිටින කාලෙදි, වරින් වර කඳවුර භාවිතා කළ කරුණා කණ්ඩායමේ 15-20ක කණ්ඩායමකට නාවික හමුදාව විසින් ආහාර සැපයුවා. මම XXX (මකා ඇත) වශයෙන් ඔවුන්ගේ ආහාර පිළිබඳව කෙළින්ම වග කීවා. කරුණාගෙ කොල්ලො තරුණයි; උන් 'පොඩි කොල්ලො' ඒත් උන් හොඳට පළපුරුද්ද තිබුණු අය...මෙම කරුණා කණ්ඩායම සිවිල් ඇඳුමෙන් ඔත්තු සේවාවන් කළා. ඇතැම් මෙහෙයුම්වලදී ඔවුන් නේවි කැලෑ ඇඳුම් ඇඳ සිටියා.'*

කරුණාගේ සාමාජිකයන් නාවික හමුදා නිලඇඳුම් ඇඳ සිටි බව 2006 දී දුටු බව තවත් නාවික නිලධාරියෙක් වන W250 සිහිපත් කළේය:

*'සාම්පූර් මෙහෙයුමේදී, කරුණාගේ කණ්ඩායම් නේවි බුද්ධි සේවාව සමඟ සහයෝගයෙන් ක්‍රියාකරමින් එල්ටීටීඊ ඉලක්ක හඳුනාගැනීමට උදව් කළා. කරුණාගේ කණ්ඩායම් සමඟ මෙම සහයෝගිතාව සිදුවුනේ 2005 සිට ඉදිරියට සටන් විරාමය බිඳවැටීම සමඟයි.'*

තවත් නාවික නිලධාරියකු වන W314 සඳහන් කළේ නාවික හමුදාපති තමාට කරුණාගේ කණ්ඩායම සමඟ වැඩකිරීමට නියෝග කළ බවත් තම නාවිකයන් ඊට කැමති නොවූ බවත් ය:

*'එක් අවස්ථාවක කරන්නාගොඩ මගේ කඳවුරට පැමිණි විට කරුණාට සහ ඔහුගේ මිනිස්සුන්ට නිදහසේ යාමට ඊමට ඉඩදෙන ලෙස මට කීවා. ආයුධ ගබඩාවේ බඩුද ඔහුට දෙන ලෙස කීවා. රජය නියෝග කර ඇති හෙයින් ග්‍රෙනේඩ් සහ යුද්ධෝපකරණ ඇතුළු අවි දෙන ලෙසද දැන්වූවා. මගේ විධානයේ නාවිකයන් කරුණා සහ ඔහුගේ මිනිස්සුන් නිසා මියගොස් ඇති හෙයින් මගේ මිනිස්සු තරහවෙන් සිටියෙ...මගේ ප්‍රදේශයේ කරුණා සහ ඔහුගේ මිනිස්සුන් කරන දේවල් මට ඒ ප්‍රදේශයේ මිනිස්සු දිනපතා දැන්වූවා. ඔහු මිනිස්සුන්ගෙන් මුදල් එකතුකරමින් සිටියා. එහි කඩ වගයක් තිබුණා. ඔහුගේ මිනිස්සු රෑට එම කඩවලට ඇවිත් අයිතිකරුට පිස්තෝලයක් පෙන්වා 'මට සේරම දීපන්' කියා ඔවුන්ට අවශ්‍ය දේවල් අරගෙන ගියා. කරුණාගේ ප්‍රාදේශීය අණදෙන නිලධාරීන් කැලෑවල ජීවත්වෙමින් සිටියා. ඔවුන් දිනපතා ආවා. රෝහලට ආ ඔවුන් වෛද්‍ය සැපයුම් අරන් ගියා. ඔවුන් ආහාර කොල්ල කෑවා. ළමා සොල්දාදුවන් බඳවා ගත්තා. තුවක්කුවක් ඔසවාගෙන යන්න තරම් ඔවුන් සමත් නම් ඔවුන් බඳවා ගත්තා. මරාගෙන මැරෙන කාර්ය ඉටුකිරීමට ළමයින් දිරිගැන්වීම පහසුයි. එම මැරුණු ළමයින්ගේ සිරුරු දැක්ක නිසා මම ළමා සොල්දාදුවන් බඳවා ගැනීම ගැන දැන*

*සිටියා. යුද්ධයට ගෙන යන්න තමන්ගේ ළමයින් අරගෙන ගිය බවට පැමිණිලි කරන්නත් දෙමව්පියන් මා වෙත ආවා. මම මව්පියන්ට කිව්වෙ ළමයින් ගෙවල් ඇතුළෙම තියන්න කියලා. ඒකට හේතුව ඔවුන් පිටත ඇවිදිමින් සිටිනව කරුණා දැක්කොත් ඔවුන් රැගෙන යන හින්දා. මේක දිනපතා වූ දෙයක්.'*

# 3. පරීක්ෂාකිරීමට අසමත්වීම

‘මානව හිමිකම් කියන එකේ කිසිම තේරුමක් නැහැ. අපි යුද්ධයක් කරමින් සිටින අතර ඒවා ගැන කරදර වන්න අවශ්‍ය නැහැ.අන්තර්ජාතික ව්‍යාපාරය නිසා, අපට කිසිවකු අත්අඩංගුවට ගන්න බැහැ. නමුත් මම ගණන් ගන්නේ නැහැ; මම මට ඕන දේ කරනවා’.

*ගෝඨාභය රාජපක්ෂ*[263]

**මෙම කොටසින් විමසා බලන්නේ එදා ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂගේ අවධානයට යොමු කරන ලද, පුළුල් වශයෙන් පැතිරුණු මානව හිමිකම් උල්ලංඝන චෝදනා සම්බන්ධයෙන් පියවර ගැනීම ඔහුගේ නෛතික බැඳීම වී තිබියදීත්ඃ ක්‍රියාකිරීමට ධාරිතාවක් තිබියදීත්ඃ ක්‍රියාකිරීමට ඔහු අසමත්වීමෙන් පැනනගින ඵලවිපාක සහ සිදුවිය හැකිව ඇති හානි ගැන මුළුමනින්ම හොඳින් දැනසිටියදීත්, ප්‍රතිචාර දැක්වීමට ඔහු අසමත්වීම ගැනය. මෙම අයිතිවාසිකම් කඩකිරිම් ඔහුට දන්වා සිටි විට, විමර්ශනය කිරීම ප්‍රතික්ෂේප කොට කිසිම වරදක් සිදුකර නැති බව පවසමින් ප්‍රතිඵලය කලින් නිගමනය කළ බවට චෝදනා කෙරේ; සිද්ධි ගණනාවකදී ඔහු කළේ විමර්ශනවලට ඔහු අවහිර කිරීම, හෝ දෝෂ සහිතව විමර්ශන සිදුකිරීමට ඔහුගේ මිතුරන් පත්කිරීම සහ ඔහුගේ දේශපාලන ප්‍රතිවාදීන් පමණක් විමර්ශනයට ලක්කිරීමයි. ඔහු ශ්‍රී ලංකාවේ ජනාධිපති ධුරයේ වැඩ භාරගත් පසු, එය ඔහුගේ මිතුරන් සම්බන්ධයෙන් කලින් කරන ලද විමර්ශන කණපිට පෙරළීමට මගසලසන දේශපාලන පළිගැනීම් පිළිබඳ කොමිසමක් ස්ථාපිත කළේය.**

**චෝදනාවල පරිමාණය**

ගෝඨාභය රාජපක්ෂ ආරක්ෂක ලේකම් ධුරය දැරූ මුළු කාලය පුරාම, ප්‍රධාන වශයෙන් සිවිල් ජනයාට එරෙහිව පුළුල් පරිමාණයකින් ක්‍රමානුකූලව මානව හිමිකම් උල්ලංඝනය කරන බවට නිබඳව චෝදනා නැගුණි. බලාත්කාරයෙන් අතුරුදහන් කිරීම් වැඩියෙන්ම වාර්තාවූ ලෝකයේ රටවල් අතර ශ්‍රී ලංකාව දෙවැනි ස්ථානයට පත්ව තිබුණි. එය එක්සත් රාජධානියේ ප්‍රධාන පුනරුත්ථාපන පුණ්‍යායතනය විසින් ප්‍රතිකාර කරන ලද වධහිංසාවලට ලක්වූ වින්දිතයන් පැමිණි රටවල් අතරින් ඉහළින්ම සිටි රටයි[264]. 2015 දී එක්සත් ජාතීන් කළ පරීක්ෂණයක් පවසා ඇත්තේ ගෝඨාභය රාජපක්ෂ ධුරය දැරූ කාලයේදී ආරක්ෂක හමුදා විසින් ‘ආයතනික ප්‍රතිපත්තියේ’ අංගයක් ලෙස ලිංගික හිංසනය යොදා ගෙන ඇති බවයි. (OISL 591).

මහා පරිමාණයෙන් මානව හිමිකම් උල්ලංඝනයන් සිදුවන බවට වූ චෝදනා, ගෝඨාභය රාජපක්ෂ ප්‍රධාන වගකීමක් දැරූ රජයේ අවධානයට අවස්ථා ගණනාවකදී යොමු කෙරුණු අතර, ඒවා විභාග කරන එක් එක් ලේඛනය ලැයිස්තුගත කිරීමට වෑයම් කිරීම විශාල කර්තව්‍යයක් වනු ඇත. මෙම චෝදනා සවිස්තරාත්මකව ලේඛන ගතකළ එක්සත් ජාතීන්ගේ යාන්ත්‍රණ ගණනාවක් සහ විශේෂ වරයන් දරන්නන් පැහැදිලිව දක්වා සිටියේ තත්වයන් ආමන්ත්‍රණය කිරීම පිණිස දෙන ලද නිර්දේශ නොතකා හැර ඇති බවයි. සමහර සිද්ධිවලදී වදහිංසා පැමිණවීම්, මනුෂ්‍ය ඝාතනවලට සහ අතුරුදහන් කිරීම්වලට වගකිවයුතුයැයි කියන පුද්ගලයන් නම් කර ඇත [265]. මෙම නිරන්තර චෝදනා ධාරාව ප්‍රතික්ෂේප කෙරුණු අතර ඒවා තවදුරටත් දරාගත නොහැකි තත්වයට පත් වූ විට, ඔවුන් කළේ කිසිවිටකත් වින්දිතයන්ට සත්‍ය හෝ යුක්තිය ඉටුනොකරන බව සහතික කිරීමට, පක්ෂපාතී මිතුරන්ගෙන් හෝ අපරාධකරුවන්ගෙන්ම කාර්ය මණ්ඩලය සමන්විත පරීක්ෂණ ආයතනයක් පිහිටුවීමයි. ඒ සමගම ආණ්ඩුව කියා සිටියේ යුක්තිය ඉටුකිරීම පිණිස අන්තර් ජාතික ප්‍රජාවගෙන් පුහුණු කිරීම් සහ ධාරිතා ගොඩනැගීම පිණිස තාක්ෂණික ආධාර අවශ්‍ය බවයි. එය වරින්වර බලයට පත් ආණ්ඩු නැවත නැවතත් කළ වැළකී සිටීමකි. අපරාධවලට සම්බන්ධ තැනැත්තන් දණ්ඩ මුක්තිය භුක්තිවිඳින අතර, අතුරුදහන්වීම් වාර්තාකිරීමට උත්සාහ කළ පවුල් හෝ කොමිෂන්වලදී සාක්ෂිදුන් හෝ අන්තර්ජාතික ආයතනවලට තොරතුරු සැපයූ හෝ වින්දිතයෝ ආරක්ෂක හමුදාවල හිංසාකාරී පලිගැනීම්වලට ලක්වෙති.

එතෙරදී උල්ලංඝනය කිරීම් සිදුවූ බවට චෝදනා නැගුනු විටදී පවා පරීක්ෂණ පවත්වා නීතිමය කටයුතු

263. https://www.colombotelegraph.com/index.php/wikileaksthere-will-be-no-investigation-no-one-will-be-able-to-find-out-what-happened-to-keith-gota/?platform=hootsuite

264. In 2015 for 4th successive year, Freedom from Torture, UN COMMITTEE AGAINST TORTURE, 59th SESSION submission, https://www.refworld.org/pdfid/58495d184.pdf

265. නිදසුනක් ලෙස - සංවර්ධනයට ඇති අයිතිය ඇතුළු සියලු මානව හිමිකම්, සිවිල්, දේශපාලන, ආර්ථික සහ සමාජීය හා සංස්කෘතික හිමිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීමඃ වධහිංසා වෙනත් කෲර, අමානුෂික,හෝ අවමන් සහගත ලෙස සැලකීම හෝ දඬුවම් කිරීම පිළිබඳව විශේෂ නියෝජිත වාර්තාව - මන්ෆ්‍රෙඩ් නොවැක්, 26 පෙබරවාරි 2008,

කිරීමට අසමත්වීමක් ඇත. ශ්‍රී ලාංකික සාමසාධක හමුදා භටයන් 2007 නොවැම්බර් මාසයේදී හයිටියෙන් පිටමං කරන ලද්දේ ඔවුන් ක්‍රමානුකූලව ලිංගික සූරාකෑම්වලට සහ ළමා අපයෝජනවලට සම්බන්ධ කෙරුණු එක්සත් ජාතීන්ගේ පරීක්ෂණයකින් අනතුරුවය. එවන් බරපතල අපරාධයක් සම්බන්ධයෙන් පවා කිසිවකුත් සිරගතකිරීමක් සිදුනොවීය[266]. යුද අධිකරණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් ගෝඨාභය රාජපක්ෂට පාලනයක් තිබුණි. අද දක්වා ශ්‍රී ලංකා රජය විසින් මුලපුරන ලද අධිකරණ ක්‍රියාවලියක් ගැන පැහැදිලි කමක් නැති අතර පීඩාවට පත් දරුවන්ට එරෙහිව වසර ගණනාවක් මුළුල්ලේ සිදුකරන ලද බරපතල අපරාධ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව වගවීමට පත්කිරීමට දුන් පොරොන්දුව ඉටුකිරීමට එක්සත් ජාතීන් අසමත්ව සිටී.[267]

එමෙන්ම ගෝඨාභය රාජපක්ෂ 1989 දී මිනිසුන් රැසක් ඝාතනය කෙරුණු සහ දහස් ගණනක් බලාත්කාරයෙන් පැහැරගැනීම්වලට හා වද හිංසාවලට ලක්වූ මාතලේ දිස්ත්‍රික්කයේ අණදුන් සහ පාලනය කළ පුද්ගලයා වශයෙන් ඉටු කළ කාර්යභාරය ගැන කිසිදු වගවීමක් කර නැත[268]. ශ්‍රී ලංකාවේ ආණ්ඩුව පැවැත්වූ පරීක්ෂණයකින් ලබාගත් ප්‍රකාශයට පත්කර නොතිබූ තොරතුරු පාදක කරගනිමින් ITJP සංවිධානයේ වාර්තාවක් ඉදිරිපත් කිරීමෙන් පසුව[269], 2022 නොවැම්බර් මාසයේදී, එක්සත් ජාතීන්ගේ විශේෂඥයන් ශ්‍රී ලංකා රජය ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේදැයි විමසමින් ශ්‍රී ලංකා රජයට ලියා ඇත[270]. බලයේ රැඳී සිටීමට රාජපක්ෂලාගේ දේශපාලන සහාය ලබන, ජනාධිපති රනිල් වික්‍රමසිංහ සත්‍ය විමසීමේ කොමිසමක් පිහිටුවීමට පොරොන්දු වී ඇතත් එක්සත් ජාතීන්ට ප්‍රතිචාරයක් ලැබී නැත.

**පරීක්ෂණ කිරීමේ අධිකාරය සහ බලය**

මානව හිමිකම් උල්ලංඝනයකිරීම් චෝදනා ගැන පරීක්ෂා කරන බවට 2006 තරම් මුලදී රාජපක්ෂ ආණ්ඩුව එක්සත් ජනපද රජයට පොරොන්දු විය. මානව හිමිකම් පිළිබඳ අමාත්‍යාංශ කමිටුවක් යටතේ වන ක්‍රියාකාරි කණ්ඩායමකට ගෝඨාභය රාජපක්ෂ ඇතුළත් බව ඇමරිකානු රජයට පවසා ඇතැයි විකිලීක්ස් ටෙලෙක්ස් පණිවිඩයක් විදේශ ලේකම් පාලිත කොහොන උපුටා දක්වමින් පවසයි[271].

පරීක්ෂණ සිදුකිරීම වෙනුවට, ගෝඨාභය රාජපක්ෂ සියලු පරීක්ෂණවලට අවහිර කළේය. 2007 මාර්තුවේ ඇමරිකානු ටෙලෙක්ස් එකක් දක්වා ඇත්තේ පැහැරගැනීම් සහ කප්පම්ගැනීම් චෝදනා මත පොලිස් නිලධාරීන් සහ සොල්දාදුවන් 433 දෙනෙකු අත්අඩංගුවට ගත් අවස්ථාවේදී , පරීක්ෂණවල ප්‍රගතිය සම්බන්ධයෙන් පොලිස්පති විසින් තානාපති කාර්යාලයට විස්තර දැක්වීම ගෝඨාභය රාජපක්ෂ විසින් අවහිර කරන ලද බව එක්සත් ජනපද ටෙලෙක්ස් පණිවිඩයක සඳහන් වෙයි[272]. එය අවසානයේ ඇත්තේ පහත ප්‍රකාශනයයි.

'සිදුවී ඇති සැළකිය යුතු පැහැරගැනීම් ගණනාවක් ආමන්ත්‍රණය කිරීමට උත්සාහ දරන මනා අභිප්‍රායක් ඇති රාජ්‍ය සේවකයන් නිහඬ කිරීමට රාජපක්ෂ දරන වැඩ කොටසෙහි තවත් පැහැදිලි උත්සාහයක් මෙයින් සටහන් කෙරෙයි.'

අතුරුදහන්වීම් ගැන පරීක්ෂාකිරීමට 'ඒක පුද්ගල කොමිසමක් පත්කිරීම් ගැන එම වසරේම මැයි මාසයේදී ඇමරිකානු ටෙලෙක්ස් පණිවිඩයක් කතා කරයි.[273] මෙය මනුෂ්‍ය ඝාතන, අතුරුදහන්වීම්, පැහැරගෙනයාම් සහ හඳුනානොගත් මළ සිරුරු ගැන විමර්ශනය කිරීමට ජනාධිපතිගේ මිතුරකු වන මහානාම තිලකරත්නගේ ප්‍රධානත්වයෙන් යුත් කොමිසමකි[274]. ඇමරිකානු නීතිපති කාර්යාලය මේ ගැන අදහස් පළකරමින් කීවේ 'මේ දක්වා මේ ප්‍රයත්නයන්ගෙන් ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය පිටරටවල

266. https://itjpsl.com/assets/press/haiti-FINAL.pdf
Let the Punishment Fit the Crime. - JDS සමග හවුල් වාර්තාව සහ වෙනත් වාර්තා

267. ITJP ප්‍රවෘත්ති නිවේදනයඃ Haiti: More than a decade and still hiding, https://itjpsl.com/assets/press/Press-Statement-haiti-f.pdf

268. https://itjpsl.com/assets/ITJP_1989_mass_grave_report_v6_WEB.pdf

269. https://itjpsl.com/assets/DownLoadPublicCommunicationFile.pdf

270. 1989 සමූහ අපරාධවලට අදාළ ගෝඨාභය රාජපක්ෂගේ භූමිකාව - 10 මැයි 2022, https://itjpsl.com/reports/gotabaya-rajapaksa-the-sri-lankan-presidents-role-in-1989-mass-atrocities

271. 'ආරක්ෂක හමුදා විසින් සිදු කළ හැකි මානව හිමිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳ බරපතල අන්දමින් විමර්ශන වැඩිකිරීම කෙරෙහි ජනාධිපති රාජපක්ෂ 'දැඩි උනන්දුවක්' දක්වන බව 'තානාපතිවරයා සහ DCM සමග මැයි 25 (2006) පැවති කතාවකදී, විදේශ ලේකම් එච්.ජී.එම්.එස්. පලිහක්කාර ප්‍රකාශ කළේය. ඒ සම්බන්ධයෙන් විදේශ ඇමති මංගල සමරවීර සහ ආපදා කළමනාකරණ සහ මානව හිමිකම් ඇමති මහින්ද සමරසිංහ පසුව මැයි 25 දා මානව හිමිකම් පිලිබඳ නැවත පණගන්වන ලද අන්තර් අමාත්‍යාංශ කමිටුව පවත්වන අතර එමගින් ආරක්ෂක හමුදා හැසිරීම ගැන ගැඹුරින් අවබෝධයක් ලබාගැනීමට හැකිවෙයි.' යමක් දැනටමත් සිදුවී ඇත්නම් ඒවා පරීක්ෂා කරමින් ආරක්ෂක හමුදාවල විෂමාචාරය වැළැක්වීමට අපට අවශ්‍ය බව පලිහක්කාර පැවසීය. සමරසිංහගේ සභාපතිත්වයෙන් ස්ථාවර ක්‍රියාකාරි කමිටුවක් ක්‍රියාත්මක කරන අතර එයට ත්‍රිවිධ හමුදාපතිවරු, ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ, නීතිපති සහ වෙනත් අය ඇතුළත් වෙති' - https://www.wikileaks.org/plusd/cables/06COLOMBO872_a.html

272. 06COLOMBO386_a , reproduced at https://www.colombotelegraph.com/index.php/wikileaks-stf-murdered-trinco-students-basil-to-us/

273. https://wikileaks.org/plusd/cables/07COLOMBO728_a.html

274. http://www.humanrights.asia/news/ahrc-news/AS-216-2007/ 1998 දී ඔහු අත් අඩංගුවට ගනු ලැබුණි. https://www.sundaytimes.lk/981101/frontm.html සහ https://www.tamilnet.com/art.html?catid=13&artid=2056; අසාමාන්‍ය සහ අමුතු ලක්ෂණ සහිත නඩුකරයකැයි ඔහු කියූ http://www.janasansadaya.org/uploads/files/126-%20595-1998.pdf

වර්ධනය කිරීම කෙරෙහි වඩාත් ඉලක්ක කර ඇති බව පෙනෙන අතර මානව හිමිකම් තත්වයේ නිශ්චිත වර්ධනයක් තවමත් කිරීමට ඇත' යනුවෙනි.

2006 නොවැම්බර් මාසයේදී , ජනාධිපති මහින්ද රාජපක්ෂ විසින් බරපතල මානව හිමිකම් උල්ලංඝනය කිරීම් විමර්ශනය සහ පරීක්ෂාව පිණිස පත්කරන ලද පරීක්ෂණ කොමිෂන් සභාවට සහායවීම පිණිස කීර්තිමත් පුද්ගලයන්ගේ අන්තර් ජාතික ස්වාධීන කණ්ඩායම (IIGEP) ස්ථාපිත කරන ලදී. 2007 මාර්තු අවසන් වන විට, කීර්තිමත් පුද්ගලයන්ගේ අන්තර් ජාතික ස්වාධීන කණ්ඩායම විසුරුවා හරින ලද අතර ඊට හේතුවූයේ එම කොමිසමේ ක්‍රියාකාරිත්වය ගැන කීර්තිමත් පුද්ගලයන් කණස්සල්ල පළකිරීමයි. කීර්තිමත් පුද්ගලයන්ගේ අන්තර් ජාතික ස්වාධීන කණ්ඩායම විමර්ශනය කළ එක් ප්‍රධාන සිද්ධියක් වූයේ 2006 ජනවාරි 2 දා ත්‍රිකුණාමලයේදී දෙමළ තරුණයන් පස්දෙනෙකු මරාදැමීමයි. විශේෂ කාර්ය බලකාය මෙම මිනීමැරීම ගැන වගකිවයුතු බව 2006 ඔක්තෝබර් මාසයේදී ගෝඨාභය රාජපක්ෂ දැනසිටියත් මෙම පරීක්ෂණයේ ප්‍රගතියක් අත්කර ගැනීමට ඔහුට තවත් ධාරිතා ගොඩනැගීමක් අවශ්‍ය බව පවසා තිබුණි:

ගෝඨාභයගේ සොයුරු මෙන්ම ආණ්ඩුවේ බලවත් ඇමැතියකු වූ බැසිල් රාජපක්ෂ ඒ බව දැනසිටි වග තානාපති කාර්යාල ටෙලෙක්ස් පණිවිඩ වලින් පෙනීයයි.

> *ජනවාරි මාසයේදී ත්‍රිකුණාමලයේදී විශේෂ කාර්ය බලකාය විසින් තරුණයන් පස් දෙනා මැරූ බව ඔප්පු කිරීමට ශ්‍රී ලංකා රජය විසින් දරන උත්සාහයන් බලාපොරොත්තු විය නොහැකි ලෙස අවංක භාවයකින් කතාකරමින් රාජපක්ෂ විස්තර කළේය: 'අපි දන්නවා එස්ටීඑෆ් ඒක කළ බව. ඒත් වෙඩි උණ්ඩ සහ තුවක්කු සාක්ෂි පෙන්නුම් කරන්නේ ඔවුන් ඒක නොකළ බවයි. ඔවුන්ට යම් කෙනෙකු මරන්න ඕනෑ උනාම ඔවුන්ට වෙනම තියෙන්න ඕනෑ. අපට ව්‍යවහාරික වෛද්‍ය විශේෂඥයන් අවශ්‍යයි. අපි දන්නවා කවුද ඒක කළේ කියන එක . අපට ඔවුන්ට නඩු පැවරීමට ඉදිරියට ක්‍රියාකරගෙන යන්න බැහැ.'*[275]

විමර්ශන කරන ලෙස පොලීසියට නියෝග නිකුත්කිරීමට තමාට බලතල ඇති බවත්, දේශපාලන ප්‍රතිවාදීන් ගැන විමර්ශනය කිරීමට මනස්තාපයක් නොවූ බවත් ගෝඨාභය පැහැදිලිව දක්වා ඇත. ඔහුගේ සහෝදරයාගේ ජනාධිපතිවරණ ප්‍රතිවාදියා වූ ජෙනරාල් සරත් ෆොන්සේකාගේ නඩුව (යුද්ධයෙන් පසුව) ගැන තමා පොලිස් විමර්ශන නිලධාරීන්ට නියෝග නිකුත්කිරීම සිදුකළ බව ගෝඨාභය පිලිගත්තේය;

> *'එවකට යුද හමුදාපති පසුව අනික් පැත්ත ගත්විට අප පෞද්ගලික හේතු කරණකොට ගෙන ඔහු ලුහුබැඳ ගියේ නැහැ. අප ඔහු පසුපස ගියේ නිසි චෝදනා සමගින් පමණයි. මෙම කරුණු සම්බන්ධයෙන් නිසි පරීක්ෂණ සිදුකිරීමට මම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට දැන්වූවා. ඔවුන් එවන් පරීක්ෂණ නිසි සාක්ෂි ඇතිව සිදු කරගෙන ගියා.'*[276]

2014 අළුත්ගම ඇතිවූ මුස්ලිම් විරෝධී හිංසන සම්බන්ධයෙන්ද කතා කළ ගෝඨාභය තාක්ෂණිකව එම කාලයේදී පොලීසිය තමාගේ පාලනය යටතේ නොවූවත් පොලිස්පති සහ විශේෂ කාර්ය බලකාය එම ප්‍රදේශයට යැවීමට තමාට හැකිවූ බව හෙළි කළේ ය.

> *අලි සබ්රි මහතා අළුත්ගම සිද්ධිය දැන්වූවා. එම සිද්ධිය හටගත් වහාම, පොලිස්පති එම ස්ථානයට යැවීමට මට හැකිවූවා. ඊට අමතරව එම ප්‍රදේශය බාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති මෙන්ම විශේෂ කාර්ය බලකාය යැව්වා. ඔවුන් යැවීම නිසා කෙටි කාල පරිච්ඡේදයක් තුළ එය පාලනය කිරීමට හැකිවූවා*[277].

මුක්තිය පිළිබඳ සැලැස්ම සහ විමර්ශකයන් පරීක්ෂා කිරීම

පාස්කු ඉරුදින බෝම්බ ප්‍රහාරවලින් පසුව, ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාට බාරදුන් වාර්තාවකින්, ශ්‍රී ලංකාවේ යුද හමුදාව සහ බුද්ධි සේවාවන් නඩුපවරනු ලැබීමෙන් නිදහස් කිරීමේ ප්‍රතිපාදනයක් ඇති කිරීමට යෝජනා කළේය[278].

> *'ඔවුන්ට ඒක කරන්න බැරිනම්, ඊළග රජය බලයට පත්වූ පසු මම එය කරමි' යනුවෙන් ගෝඨාභය ඔහුගේ මුක්තිය ලබාදීමේ සැලැස්ම ගැන පැවසූ බව වාර්තා වෙයි*[279]*.'*

---

275. https://wikileaks.org/plusd/cables/06COLOMBO1622_a.html

276. 2019 පෙබරවාරි 12 'ඩේලි මිරර්' පත්‍රයේ කැලුම් බණ්ඩාර සමග සම්මුඛ සාකච්ඡාව http://www.dailymirror.lk/article/How-can-there-be-freedom-without-discipline-Gotabaya-162220.html

277. 2018 අගෝස්තු 02 Gota in Forum 5 21'56"-22'32"

278. http://www.jdslanka.org/index.php/news-features/politics-a-current-affairs/882-sri-lanka-president-accepts-proposal-to-legalise-impunity-video

279. http://www.sundayobserver.lk/2019/05/19/news-features/bulathwatte-bewilderment

2019 දී ඔහු බලයට පත්වීමෙන් පසුව, ගෝඨාභය රාජපක්ෂ පසුගිය සිරිසේන රජය යටතේ සිදුවූයේ යැයි කියන අපරාධ විමර්ශන දූෂණ බවට දේශපාලනීකරණයවීම ගැන පරීක්ෂාකර බැලීමට කොමිසමක් පත් කළේය[280]. ජනාධිපතිවරයාගේ සමීපතමයන් කිහිපදෙනකු 2015-19 කාලයේදී විමර්ශනයට ලක්වුවන් වීම විශේෂයකි. විමර්ශනය කොට චෝදනා කරන ලද තැනැත්තන්ට හානිපූරණ ගෙවීමට ගෝඨාභය විසින් පත් කරන ලද කොමිසම නිර්දේශ කළේය. අතිවිශේෂ මානව හිමිකම් නඩු කිහිපයකදී එය උසාවි පටිපාටිවලට සක්‍රියව මැදිහත්වී ඇතැයි එක්සත් ජාතීන් පැමිණිලි කර ඇත[281]. එමෙන්ම 'සංකේතාත්මක' මානව හිමිකම් නඩු කිහිපයකදී උසාවි පටිපාටිවලට බාධාකිරීම් සහ මැදිහත්වීම් කළ බව එය පැවසීය[282]

**වැළැක්වීමට අසමත්වීම :**

ගෝඨාභය ආරක්ෂක අමාත්‍යාංශය බාර නිලධාරියාව සිටි දශකය පුරා, නිලධාරීන් පුහුණු කිරීම මාර්ගයෙන් මානව හිමිකම් අපයෝජන වැළැක්වීමේ වගකීම පැවරී තිබුණේ, එහි වෙබ් අඩවියට අනුව ආරක්ෂක පුහුණු වැඩසටහන් සහ ආයතන අධීක්ෂණය කළ ආරක්ෂක අමාත්‍යාංශයටම ය. පොලීසියේ සහ යුද හමුදා ව්‍යූහ මානව හිමිකම් අංශවලින් සමන්විත විය. අතිරේකව, හමුදාවට සහ පොලීසියට පුළුල් විදේශ පුහුණුවක්, -විශේෂයෙන් විධාන වගකීම් දැරූ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට- ලැබී තිබුණි[283]. ගෝඨාභයම මෙසේ පුරසාරම් දෙඩුවේය:

> *'මානව හිමිකම්, ජාත්‍යන්තර මානුෂවාදී නීතිය, සන්නද්ධ ගැටුම්වල නීතිය මෙන්ම සිවිල් ජනයා ආරක්ෂා කිරීමේ අවශ්‍යතාව ගෙනහැර දැක්වීම වසර ගණනාවක සිට ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදා පුහුණු විෂයමාලාවට සංඝටනීය වී ඇත.[284]'*

ආරක්ෂක හමුදාවලට බ්‍රිතාන්‍යයෙන්, ජාත්‍යන්තර රතු කුරුස කමිටුවෙන් සහ ඇමරිකාවෙන් පුළුල් පුහුණුවක් ලැබී ඇත. ජාත්‍යන්තර රතු කුරුස කමිටුව එහි 1997 වාර්ෂික වාර්තාවේ ප්‍රකාශ කර ඇත්තේ 1997 වන විට හමුදා ඇකඩමි ඒවායේ විෂයමාලාවට යුද්ධයේ නීතියී සංස්ථාපිත කර ඇති බවයි[285]. ශ්‍රී ලංකාවේ 'ආරක්ෂක හමුදා එහි භටපිරිස්වලට ඉගැන්වීමට මානව හිමිකම් කේන්ද්‍ර ('යමප්බ රසටයපී ජැකකි') පිහිටුවා තිබූ' බව 1998 අගෝස්තු මාසයේදී The Calgary Herald පුවත්පත වාර්තා කර තිබුණි. මෙම පුහුණුවෙන් මානව හිමිකම් සහ ජාත්‍යන්තර මානුෂවාදී නීතිය ආවරණය කෙරුණි.[286] ඉන් අදහස් කෙරුණේ ඔවුන් මානව හිමිකම් සහ ජාත්‍යන්තර මානුෂවාදී නීතිය කඩකරන බව මෙන්ම චෝදනා විභාග කිරීමේ වගකීමක් ඇති බව ආරක්ෂක නිලධාරීන් දැන සිටි බවයි.

ඇමරිකානු රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන් සමඟ සාකච්ඡා කිරීමේදී ගෝඨාභය රාජපක්ෂ විශේෂයෙන් ශ්‍රී ලංකා නාවික හමුදාවට මානව හිමිකම් ප්‍රශ්නයක් ඇති බව පිළිගෙන ඇති බව වාර්තාවන නමුත් අපරාධ විමර්ශනවලින් නොව - පුහුණුව මගින් එම ප්‍රශ්නය නිවැරදි කළහැකි බවට විශ්වාසය පළ කර තිබේ:

> *'ශ්‍රී ලංකා යුද හමුදාව සේවයේ යෙදී සිටින ප්‍රදේශවලින් අපට පැමිණිලි කිහිපයක් ලැබී තියෙනව, ඒත් නාවික හමුදාව ගැන අපට ප්‍රශ්නයක් තියෙනවා, යි රාජපක්ෂ විස්තර කළේය. 'අපි ඔවුන් සිවිල් ජනයා සමඟ සේවය කිරීමක් අපේක්ෂා කළේ නැහැ.ඔවුන් පුහුණු කර නැහැ. ජනාධිපති නාවික හමුදාවට මානව හිමිකම් පිළිබඳ පුහුණුව ලබාදීමට ප්‍රමුඛතාවයක් දී තිබෙනවා.[287]*

**2009 යුද්ධය ගැන විමර්ශනය ප්‍රතික්ෂේප කිරීම**

2010 දී බීබීසී රූපවාහිනිය සමග සම්මුඛ සාකච්ඡාවකදී, ශ්‍රී ලංකාවේ යුද්ධයේ අවසන් අදියර ගැන කිසිම පරීක්ෂණයකට ඉඩ නොදෙන බව පැවසීමට තරම් දුර ගිය ගෝඨාභය රාජපක්ෂ කිසිම වැරැද්දක් සිදුවී නැති බවට ස්ථිර ලෙස ප්‍රකාශ කළේය:

---

280. https://www.presidentsoffice.gov.lk/wp-content/uploads/2020/02/2157-44_E.pdf - ගොණුගත ලේඛන

281. 50 ඡේදය, A/HRC/51.5 2020

282. ඡේදය 12, A/ HRC/49/9

283. ශ්‍රී ලංකාව : 1997 ජනවාරියේ සිට උතුරේ සහ/හෝ කොළඹදී මානව හිමිකම් ගැන පුහුණු කිරීම්, 01 පෙබරවාරි 1999 https://www.refworld.org/docid/3ae6ac9a68.html%20[accessed%2013%20October%202023 ITJP සංවිධානයේ ' වධහිංසා පිළිබඳ වාර්තාවේ ඇමුණුම 2 බලන්න: https://itjpsl.com/assets/press/ITJP_TID_report_final-_SINGLES.pdf lists training courses

284. Defeating Terrorism: The Sri Lankan Experience සමුළුවේ ආරම්භක දේශනයේ දී දේශපාලන අධිෂ්ඨානය ශ්‍රී ලංකාවට සාමය උදාකළේ කෙසේදැයි ආරක්ෂක අමාත්‍යාංශ ලේකම් පැහැදිලි කරයි - ගොණුගත ලේඛන

285. ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ 1997 වාර්ෂික වාර්තාව, ජූලි 1, 1998 - ශ්‍රී ලංකාව

286. Calgary Herald. 22 August 1998. අවසන් සංස්කරණය - Lynne Duke, "Sri Lanka Battle Rages Far From World's Spotlight: A Bloody Stalemate Has Come to Characterize This Island Nation's Punishing 15-Year Civil War." (NEXIS)

287. 06COLOMBO1622_a, https://wikileaks.org/plusd/cables/06COLOMBO1622_a.html

'එය එක්සත් ජාතීන් වේවා, නැත්නම් වෙනත් යම් රටක් වේවා අපි - මම මේ රටේ කිසිම විමර්ශනයකට අවසර දෙන්නෙ නැහැ. ඒකට කිසිම හේතුවක් නැහැ. රට තුළ කිසිම වැරැද්දක් වෙලා නැහැ. මගෙන් අහ ගන්න. කිසිම දෙයක් ගැන මේ රටේ පරීක්ෂණ තියන්නේ නැහැ[288].'

බටහිර රටවල් ඔවුන්ගේම රටවල යුද අපරාධ පළමුවෙන් පරීක්ෂා කළ යුතු බවට ඔහු තර්ක කළේය:

*'සිවිල් ජනයාට හානි සිදුවීම් ගැන බලන කොට, ශ්‍රී ලංකාවේ යුද හමුදාව ලෝකයේ හැමතැනම තියෙන සියලු හමුදාවලට වඩා බොහෝ සෙයින් හොඳයි - ආරම්භයේ සිට අවසානය දක්වා සිවිල් ජනයාට හානි සිදුවීම් වැළැක්වීමට සියලු පූර්වාරක්ෂාවන් යෙදුවා. යමකු අපගේ හමුදාව යුද අපරාධ විනිශ්චය සභාවක් ඉදිරියට ගෙනයාමක් ගැන කතාකරනවා නම්, ඊට පෙර ඔබට ඇමරිකාව, එක්සත් රාජධානියේ හමුදා මේ සියලු භට පිරිස් සහ ඒවායේ නායකයන් යුද අපරාධවලට ගෙන යන්න තියෙනවා. මේ රටේදී යම් පරීක්ෂණයකට අප සූදානම් වීමට පෙර ඔවුන් එම රටවල පරීක්ෂණ කළ යුතුයි... ඒ හින්දා එක්සත් ජාතීන් නැත්නම් මානව හිමිකම් සංවිධාන හෝ යම් කෙනෙක් මෙහෙ පරීක්ෂණ ගැන කතාකරනවාට වඩා පළමුවෙන් එම පරීක්ෂණ කළ යුතුයි...'* [289]

## අතුරුදහන්වීම්

### රජයට දැනගැනීමට සලස්වා තිබේ

ලෝකයේ පුද්ගල අතුරුදහන්වීමේ සිද්ධි වැඩිම සංඛ්‍යාවක් ඇති රටවල් අතර ශ්‍රී ලංකාව දෙවැනි ස්ථානයට පත්වී තිබූ අතර මෙම සිද්ධිවල ඉතිහාසය ගෝඨාභය රාජපක්ෂ යුද හමුදාවේ සිටියදී ජනතා විමුක්ති පෙරමුණ කාලපරිච්ඡේදයේ සිට සහ පසුව ඔහු ආරක්ෂක ලේකම් වූ වකවානුවේදී උතුරු නැගෙනහිර යුද්ධයේදී වාර්තාවීම දක්වා දිවයයි... බලහත්කාරයෙන් සහ ස්වකැමැත්තෙන් තොරව අතුරුදහන්වීම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරි කණ්ඩායමේ (WGEID) 2007, 2008, 2009 සහ 2010 වාර්තාවලට අනුව බලාත්කාරයෙන් අතුරුදහන්කිරීමේ සිද්ධිවලින් බහුතරයකට චෝදනා ලබන්නේ ශ්‍රී ලංකාවේ යුද හමුදාව, පොලීසිය (CID, TID, STF) සහ දෙමළ අතුරු හමුදායි (OISL 412). සැළකිය යුතු කරුණක් වන්නේ බලාත්කාරයෙන් සහ ස්වකැමැත්තෙන් තොරව අතුරුදහන්වීම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරි කණ්ඩායමට රාජපක්ෂවරුන් බලයේ සිටි සම්පූර්ණ කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවට පැමිණීමට කිසිවිටෙක අවසර නොදීමයි. එක්සත් ජාතීන් පවසා ඇත්තේ '2009 දී යුද්ධය නිමවීමෙන් පසුව, එල්ටීටීඊ සංවිධානය සමඟ සබඳතා තිබුණත් නැතත් දෙමළ තරුණයන්, විශේෂයෙන් රජයේ පාලනය පැවති ප්‍රදේශවලදී බලාත්කාරයෙන් අතුරුදහන්කිරීමේ දැඩි අවදානමක සිටින' බවයි. (OISL 408). බලාත්කාරයෙන් අතුරුදහන්කිරීම්වල පරිමාණය කුමක්වුවත්, රාජපක්ෂ ආණ්ඩුව මෙම සංසිද්ධිය බොහෝ විට යටපත් කළ බව සහ එහි ආරක්ෂක හමුදාවල සම්බන්ධයක් ඇති බව ප්‍රතික්ෂේප කළ බවට පොදුවේ එක්සත් ජාතීන් ප්‍රකාශ කොට ඇත[290].

2007 දී, ලෝකයේ[291] වෙනත් කිසිම රටකට වඩා 2006 දී 'අතුරුදහන්වීම්' ගැන තමන් ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට හදිසි ආයාචනා වශයෙන් සිද්ධි දැනුම් දුන් බව බලාත්කාරයෙන් සහ ස්වකැමැත්තෙන් තොරව අතුරුදහන්වීම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරී කණ්ඩායම ප්‍රකාශ කළේය[292]. අතිරේක ප්‍රකාශ ගණනාවක් සමගින් එම වසරේදීම එය පසුවිපරමට භාජන කරනු ලැබීය. ශ්‍රී ලංකාවේ යෙදුණු චාරිකාවකදී එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමසාරිස් ලුරුවිස් ආබර් අතුරුදහන්වීමේ ගැටළුව[293] නැගූ අතර සහ නැවතත් ලිපියකින් ජනාධිපතිට එය දැන්වූවාය[294]. ඇමරිකානු කොංග්‍රස් සභිකයන් මැයි මාසයේදී මෙම ප්‍රශ්නය නැගූ අතර 2007දී[295] දකුණු සහ මධ්‍යම ආසියානු කටයුතු පිළිබඳ සහකාර රාජ්‍ය ලේකම් රිචඩ් ඒ බවුචර් , පැහැරගැනීම්

288. බීබීසී ලෝක සේවය? 'අද ආසියාව' - www.youtube.com/watch?v=1DyFQ-xdD-U. ගොණුගත ලේඛන

289. https://www.youtube.com/watch?v=Vtm54Y9USEg

290. OISL, §396.

291. A/HRC/10/9, 366 ඡේදය. https://www.ohchr.org/en/press-releases/2009/10/working-group-enforced-or-involuntary-disappear-ances-concludes-eighty-first

292. බලහත්කාරී හෝ කැමැත්තෙන් තොරව අතුරුදහන්වූවන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ කි්‍යාකාරී කණ්ඩායම ස්වකීය 82 වැනි සැසිය නිමා කළේය. - ප්‍රවෘත්ති නිවේදනය, 29 ජූනි 2007, https://www.ohchr.org/en/statements/2009/10/united-nations-working-group-enforced-or-involuntary-disappearances-concluded බලහත්කාරී හෝ කැමැත්තෙන් තොරව අතුරුදහන්වූවන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ කි්‍යාකාරී කණ්ඩායම ස්වකීය 83 වන සැසියේදී වැඩිකරන රටාව වෙනස් කිරීමත්, වාර්ෂික වාර්තාව සම්මත කරගැනීමත් සිදුකළේය. 30 නොවැම්බර් 2007, https://www.ohchr.org/en/press-releases/2009/10/un-working-group-enforced-or-involuntary-disappearances-concludes-its-83rd

293. මානව හිමිකම් පිළිබද එක්සත් ජාතීන්ගේ සංවිධානයත්, ශ්‍රී ලංකාවත් සහයෝගීව ක්‍රියා කළ යුතු බව මහ කොමසාරිස්වරයා කියයි. 15 ඔක් 2007 https://news.un.org/en/story/2007/10/235822

294. ශ්‍රී ලංකාව නැවතත් එ.ජා.ගේ නිරීක්ෂකයන් ප්‍රතික්ෂේප කරයි, 9 Dec 2007, - https://www.sundaytimes.lk/071209/News/news0003.html

295. ලංකාව පිළිබඳ ප්‍රයත්නයන් තීව්‍ර කරන මෙන් ඇකර්මාන් ඉල්ලයි - 10 ජූලි 2007 https://webharvest.gov/congress112th/20121214232604/http://democrats.foreignaffairs.house.gov/press_display.asp?sub_id=61

සහ මරණයට පත්කිරීම් ගණන වැඩිවීම ගැන ඔහුගේ කණස්සල්ල පළකළේය.[296] දේශපාලන කටයුතු පිළිබඳ සහකාර ලේකම් ආර්. නිකලස් බර්න්ස් සහ ප්‍රජාතන්ත්‍රවාදය සහ ගෝලීය කටයුතු පිළිබඳ සහකාර ලේකම් පවුලා ඩොබ්රියැන්ස්කි ද 2007 ඔක්තෝබරයේ මෙලෙසම කණස්සල්ල පළ කර තිබුණි[297]. ශ්‍රී ලංකාවේ මානව හිමිකම් වාර්තාව අසතුටුදායකවීම නිසා මිලිටරි උපකරණ සහ සේවා ශ්‍රී ලංකාවට විකිණීමට හෝ මාරුකිරීමට බලපත්‍ර නිකුත්කිරීම ඇමරිකාව විසින් අත්හිටවනු ලැබීය; 2007 නොවැම්බරයේදී ඇමරිකාවේ සෙනේට් මණ්ඩලය අමතමින් සෙනේට් සභික පැට්රික් ලීවි ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ගැටළුවේ බරපතලකම ගැන අවධාරණය කළේය[298]. යුරෝපා සංගමයද 2007 දී ශ්‍රී ලංකාවේ අතුරුදහන්වීම් ගැටළුව ගැන නැවත කීපවරක් මතු කළේය[299].

ජාතික අර්බුදයක් ලෙස සලකනු ලබන තරමට පැතිර පවතින පැහැරගැනීම් සහ 'අතුරුදහන්වීම් සම්බන්ධයෙන් ශ්‍ර ලංකාවේ ආණ්ඩුව වගකිව යුතු බව 2008 මාර්තු මාසයේදී Human Rights Watch (HRW)[300] සංවිධානය පැවසීය.[301] එහි වාර්තාවේ නිගමනයවූයේ 'ආරක්ෂක හමුදාවල සාමාජිකයන් සහ රජයට පක්ෂපාතී සන්නද්ධ කණ්ඩායම් සිදුකරන අනිසි ක්‍රියාවලට භුක්තිවිඳින ආයතනගත දණ්ඩ මුක්තිය' තීරණාත්මක සාධකයක් බවයි.

2006-2010 කාලය තුළ බලාත්කාරයෙන් සහ ස්වකැමැත්තෙන් තොරව අතුරුදහන්වීම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරී කණ්ඩායම බලාත්කාරයෙන් අතුරුදහන්වීමේ නව සිද්ධි 475 ක් ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට දන්වා තිබීම ගැන තමන්ද දැඩි අවධානය යොමු කළ බව 2011 දී වදහිංසාවලට එරෙහි එක්සත් ජාතීන්ගේ කමිටුව[302] ද ප්‍රකාශ කළ අතර ඒවායේදී යුද හමුදාව, පොලීසිය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මේවා සිදුකරන්නට ඇතැයි කියන අපරාධකරුවන් ලෙස චෝදනාවට ලක්වී තිබුණි[303].

යුද්ධය අවසානයේදී ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට බාරවී සිටි එල්ටීටීඊ සාමාජිකයන් පිරිසක් අතුරුදහන්වීමක් පිළිබඳ චෝදනා ගැන 2012 දී ශ්‍රී ලංකා රජයේම උගත් පාඩම් සහ ප්‍රතිසංධානය පිළිබඳ කොමිසම ද 'දැඩි කණස්සල්ල' පළ කළේය (ඡේදය 4.318). එය විමර්ශනය කිරීම රජයේ වගකීම බව ද එම කොමිසම යළි ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට සිහිකැඳවීමක් කර ඇත. (ඡේදය 4.319).

**අතුරුදහන්වීම් පිළිබඳ විමර්ශන නොකිරීම හෝ දූෂිත වීම**

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ විශ්ව ආවර්තක සමාලෝචනයේදී 2008 මැයි 14 දා මෙරට පිළිබඳව කළ ඉදිරිපත් කිරීමේදී එවකට නීතිපති වූ සි. ආර්. ද සිල්වා ප්‍රකාශ කළේ රජයට බාරදුන් 355 ක් වූ අතුරුදන් වූයේ යැයි කියන සිද්ධි ගැන මූලික විමර්ශන අනුව ඉන් 12 දෙනකු රටින් පිටවී ඇති බවත්, 17 දෙනකු ආපසු පැමිණ ඔවුන්ගේ පවුල් සමඟ යළි ජීවත් වන බවත් තරුණයන් 11 දෙනකු 'රහසින් පලාගොස්' ඇති බවත් හෙළි වී ඇති බවයි. ලැයිස්තුවේ ඉතිරි 315 දෙනා ගැන ගණන්දීමට ද සිල්වාට නොහැකි වූ අතර ඔවුන්ගේ අතුරුදහන්වීම පිළිගත හැකි අයුරින් පරීක්ෂා කිරීමක්ද සිදු නොවීය.[304] 'මෙම වසර තුළදී, දේශීය මානව හිමිකම් අපයෝජන සම්බන්ධයෙන් යුද හමුදාවේ, පොලීසියේ හෝ අතුරු හමුදාවල කිසිවෙකු වරදකරු කර නැතැයි' ඇමරිකාවේ රාජ්‍ය දෙපාර්තමේන්තුවේ 2008 සඳහා වූ මානව හිමිකම් වාර්තාවේ සඳහන් වෙයි.

අතුරුදහන්වීම් පිළිබඳ චෝදනා තමන් විසින් විමර්ශනය කිරීම රජයේ ඉල්ලීම පරිදි නතර කර ඇති බව දේශීය මානව හිමිකම් කොමිසම 2006 අගෝස්තු 11 දා බලහත්කාරයෙන් සහ ස්වකැමැත්තෙන් තොරව අතුරුදහන්වීම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරි කණ්ඩායමට පැවසීය[305]. මෙය කොමිසම 'බී' තත්වයට පහළ දැමීමට තුඩු

296. දකුණු සහ මධ්‍යම ආසියානු කටයුතු පිළිබඳ සහකාර ලේකම් රිචඩ් ඒ. බවුචර් ශ්‍රී ලංකාවේ කොළඹ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේදී, 10 මැයි 2007 https://2001-2009.state.gov/p/sca/rls/rm/2007/84701.htm

297. සහකාර ලේකම් බවුචර් සහ ඩොබ්‍රියැන්ස්කි මානව හිමිකම් ආරක්ෂකයන් හමුවෙති https://2001-2009.state.gov/r/pa/prs/ps/2007/oct/94376.htm

298. Congressional Record — Senate, Nov 2007, S13723, https://www.govinfo.gov/content/pkg/CREC-2007-11-02/pdf/CREC-2007-11-02-pt1-PgS13723.pdf

299. පාද සටහන් 335 සහ 336, HRW වාර්තාව, https://www.hrw.org/reports/2008/srilanka0308/8.htm#_ft n335, ගොණුගත ලේඛන

300. https://www.hrw.org/news/2008/03/06/sri-lanka-disappearances-security-forces-national-crisis

301. http://www.humanrights.asia/news/urgent-appeals/UP-157-2007/

302. CAR/C?LKA/CO/3-4 https://digitallibrary.un.org/record/719227?ln=en
වදහිංසාවන්ට එරෙහි කමිටුවේ 47වන සැසිය 25 ඔක්තෝබර් සිට 25 නොවැම්බර් 2011 - ප්‍රඥප්තියේ 19 වන වගන්ති ප්‍රකාරව පාර්ශ්වකාර රාජ්‍යයන් විසින් සම්පාදනය කරන ලද වාර්තා සළකා බැලීම-කමිටුවේ සමාප්ති නිරීක්ෂණ

303. CAR/C?LKA/CO/3-4

304. https://www.refworld.org/reference/annualreport/usdos/2009/en/66013 – මූලාශ්‍රය, http://www.lankaweb.com/news/items08/140508-2.html

305. OISL, ඡේදය 472

දුන්නේය. එම කාලයේ අත්අඩංගුවට ගැනීමක් සහ රඳවා ගැනීමක් ගැන මානව හිමිකම් කොමිසමට පැමිණිල්ලක් ලැබුණු විට ඊට වගකිවයුතුයැයි කියන ආයතනයේ විමර්ශන බාර නිලධාරීන් වෙත සියලු තොරතුරු යැවූ බව තම මූලාශ්‍ර ප්‍රකාශ කළ බව එක්සත් ජාතීන් පවසා ඇත. සාමාන්‍යයෙන් සිදුවුයේ එම ආයතන කිසිම ප්‍රතිචාරයක් නොදැක්වීමයි. එසේ නැත්නම් අත්අඩංගුවට ගනු ලැබුවේයැයි හෝ රඳවා ගනු ලැබුවේයැයි කියන තැනැත්තා ගැන තමන්ට කිසියම් දැනීමක් ඇතැයි යන්න නිතරම ප්‍රතික්ෂේප කරන අතර තවදුරටත් පසුවිපරමක් සිදු නොකිරීමයි[306].

'පැහැරගැනීම්, අතුරුදහන්වීම් සහ ඝාතන පිළිබඳ ජනාධිපති කොමිසම' නමින් පරීක්ෂණ කොමිසමක් 2006 දී පිහිටුවන ලද අතර 2007 මැයි මාසයේ දී පසුවිපරම් කොමිසමක්ද පිහිටුවන ලදී. ප්‍රසිද්ධ නොකළ සොයාගැනීම් 2015 දී සමාලෝචනය කළ එක්සත් ජාතීන් එම විමර්ශන ගැන විශ්වාසයක් සහ ස්වාධීන බවක් නොමැති බවට තීරණය කළේය. 2007 කොමිසම ගැන එක්සත් ජාතීන් පැවසුවේ 'මෙම වාර්තාව අතුරුදහන්වීම් ගැන චෝදනා බිඳහෙළීම සහ නිශ්ප්‍රභා කිරීම මූලික වශයෙන් ඉලක්ක කොට ගත් බවක් දක්නට ඇත' යනුවෙනි (OISL 490). පුදුමය නම් ඔවුන් කොහේදැයි දැනසිටියේ යැයි කීවත් නිර්දේශ ලැයිස්තුවේ ඉහළින්ම පැහැරගැනීම් සහ අතුරුදහන්වීම් ගැන පොලීසියට පැමිණිලි කළ තැනැත්තන්ට එරෙහිව නීති ක්‍රියාමාර්ග ගතයුතු බව සඳහන්වී තිබීමයි.

පැමිණිලි කෙළින්ම ආරක්ෂක අමාත්‍යාංශයට යැවූ විට, ඒවා බරපතල ලෙස ගණන් ගැනීමට කාර්ය මණ්ඩලය අසමත් විය. උදාහරණයක් දක්වන්නේ නම්, දැඩි ලෙස හමුදා පාලනය යටතේ පැවති ප්‍රදේශයකදී 2007 දී සමාජවාදී සමානතා පක්ෂයේ සාමාජිකයන් දෙදෙනකු අතුරුදහන් වූ අවස්ථාවේදී ඔවුන් පිළිබඳ සිද්ධිය වහාම ෆැක්ස් මගින් ආරක්ෂක ලේකම්ට වාර්තා කළ (එය ලැබුණු බව අමාත්‍යාංශයේ අතිරේක ලේකම් සහතික කළේයැයි වාර්තා කර තිබුණි) නමුත් ඉක්මන් පරීක්ෂණයක් ආරම්භ කර නොතිබූ බව එම දේශපාලන පක්ෂය මාධ්‍යයට පවසා තිබුණි. එම පැමිණිල්ල නිසිලෙස කියවා පවා නොතිබූ බවක් දක්නට ලැබුණි[307]. පරීක්ෂණයක් ආරම්භ කිරීමට එකඟවීමට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමට මාස ගණනක් ගතවිය. ඊළඟට එම දෙදෙනා අතුරුදහන් වූ ප්‍රදේශය බාර ප්‍රාදේශීය අණදෙන නිලධාරීන් සාක්ෂිදීමට කොමිසම හමුවේ පෙනී සිටීම ප්‍රතික්ෂේප කර ඇත[308]. මෙම සිද්ධිය මාස ගණනාවක් පුළුල් ලෙස වාර්තා කෙරුණු අතර යම් නිලධාරියකුට පරීක්ෂණය පිණිස කොමිසමට සහභාගිවන ලෙස නියෝග කිරීමට බලතල තිබූ ආරක්ෂක ලේකම් එසේ කිරීමට අසමත් විය.

2012 ජූනි මාසයේදී අතුරුදහන්වීම් ගැන විමසූ විට, එම ගැටළුව තමා පරීක්ෂාකර ඇතැයි ගෝඨාභය රාජපක්ෂ පැවසීය:

> *'ආරක්ෂක ලේකම් මමයි. මම මේක පරීක්ෂා කළා. මේ මිනිසුන්ගේ වචන බාර ගන්න එපා. මගේ වචනය බාර ගන්න...මේවා වැරදි චෝදනා. මම මේ දේවල් පරීක්ෂා කරලා තියෙනවා. මේවා නිවැරදි නැහැ... මේවා ශ්‍රී ලංකාව ගැන වැරදි රූපයක් දීමට කියන බොරු. රටින් පිට රැඳී සිටිමින් ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය කැළැල්කිරීමට උත්සාහ දරන එල්ටීටීඊයේ වල්ගා කොට විසින් ශ්‍රී ලංකාවේ වැරදි ප්‍රතිරූපයක් මැවීමේ උත්සාහයක්.'* [309]

2012 මැයි මාසයේදී ද ඔහු අතුරුදහන් බොහෝ දෙනෙකු පිටරට යාමට ශ්‍රී ලංකාවෙන් පිටව ගොස් ඇති බවත් බලහත්කාරයෙන් අතුරුදහන් කළ බවට වන චෝදනා 'ශ්‍රී ලංකාව ගැන වැරදි රූපයක් දීමට කියන බොරු .. රටින් පිට රැඳී සිටිමින් ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය කැළැල්කිරීමට උත්සාහ දරන එල්ටීටීඊයේ වල්ගා කොට විසින් ශ්‍රී ලංකාවේ වැරදි ප්‍රතිරූපයක් මැවීමේ උත්සාහයක්' බවත් පැවසීය.[310]

ආරක්ෂක හමුදාවලට බාරවූ කිසිම එල්ටීටීඊ සාමාජිකයකු බලහත්කාරයෙන් අතුරුදහන්වීමකට ලක්වී නැති බවත් 2013 දී යළිත් ගෝඨාභය රාජපක්ෂ රජයේ පුවත්පතකට පවසා තිබුණි[311]. ඔහු පැවැත්වූයේ කුමන පරීක්ෂණයක්ද යන්නත්, තොරතුරුවලට

306. OISL, ඡේදය 475

307. 'Sri Lankan defence ministry stalls on inquiry into missing SEP member', 28 March 2008
ලෝක සමාජවාදී වෙබ් අඩවිය - ගොණුගත ලේඛන

308. https://www.wsws.org/en/articles/2007/10/sril-o15.html

309. https://groundviews.org/2012/06/02/gotabaya-rajapaksa-on-disappearances-in-sri-lanka/
සහ බීබීසී
https://www.youtube.com/watch?time_continue=73&v=WUQ7L_f0WJE&feature=emb_logo

310. ගෝඨාභය රාජපක්ෂ - 'උතුරු ශ්‍රී ලංකාව 'දෙමළ අයට විතරක් නෙවෙයි' - බීබීසී. 28 මැයි 2012, http://www.bbc.com/news/world-asia-18207198

311. ආරක්ෂක ලේකම් විවේචකයන්ට පිළිතුරු දෙයි: 'යටත් වූ කිසිම එල්ටීටීඊ සටන්කරුවකු අතුරුදහන් වුණේ නැහැ - සියළු 11,800 දෙනාම යළිත් සමාජයට අනුයෝජනය වුණා. LLRC කොමිසමට හමුදාව නිර්දේශ ඉදිරිපත් කරයි. - ධර්ම ශ්‍රී අබේරත්න / 25 ජනවාරි 2013, The Daily News, ගොණුගත ලේඛන

සපුරාම පටහැනි ඔහුගේ නිගමනයට පැමිණියේ කෙසේද යන්නාත් අපැහැදිලි ය.

2014 දී ශ්‍රී ලංකාව මානව හිමිකම් කමිටුවට ඉදිරිපත් කළ 5 වැනි කාලාන්තර වාර්තාවෙන්, ආණ්ඩුව කියාසිටියේ  අතුරුදහන් කිරීමේ විධික්‍රමයක් ලෙස 'සුදු වෑන්' ගැන කරන සඳහන යථාර්ථවාදී තොරතුරු මත පදනම්වීමකට වඩා 'උද්වේගකාරීත්වය අවුලවන මාධ්‍ය වාර්තා මගින් එල්ල කෙරෙන චෝදනාවක්' බවයි. යුද හමුදාව බලහත්කාරයෙන් කෙරෙන අතුරුදහන්වීම්වලට සම්බන්ධ බවට කෙරෙන චෝදනා ශ්‍රී ලංකාව එකහෙළා ප්‍රතික්ෂේප කරයි[312].

'අතුරුදහන්වූවන්'ගෙන් දහස් ගණනක් මියගොස් ඇති බව 2020දී එක්සත් ජාතීන්ගේ නේවාසික සම්බන්ධීකාරකට පවසමින් ගෝඨාභය රාජපක්ෂ මහත් කලබැගෑනියක් ඇති කළේය. ඔහු කීවේ වැඩිදෙනකු එල්ටීටීඊය විසින් ගෙනගොස් අතුරුදහන්වී ඇති බවයි. පසුව ඔහු ඒ වන විටත් ඔහුට පූර්ව විනිශ්චයක්  තිබූ මේ කරුණ සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වන බව පැවසීය[313]. සැලකිය යුතු කරුණක් වන්නේ ශවේන්ද්‍ර සිල්වා, කමල් ගුණරත්න වැනි බලහත්කාරයෙන් අතුරුදහන්වීම්වලට වගකිවයුත්තන් බවට එක්සත් ජාතීන්ගේ චෝදනාවට ලක්වූ  ප්‍රධාන චරිත 2022 වන විට ආණ්ඩුවේ බලසම්පන්න තනතුරු දැරීමයි.

312. 2014 ඔක්තෝබර් 7-8, මානව හිමිකම් කමිටුව - ICCPR යටතේ ශ්‍රී ලංකාව ඉදිරිපත් කළ කාලාන්තර වාර්තාව පිළිබඳ සළකා බැලීම - මානව හිමිකම් කමිටුව විසින් නගන ලද ප්‍රශ්නවලට ශ්‍රී ලංකා රජය සපයන ලද තොරතුරු - 68 - 'ලැයිස්තුගත කාරණාවලට' මීට පෙර ශ්‍රී ලංකා රජය විසින් සපයන ලද ලිඛිත ප්‍රතිචාරයට අතිරේක වශයෙනි; ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිත රවිනාථ ආරියසිංහගේ හැඳින්වීමේ ප්‍රකාශය - ඔක්තෝබර් 7, 2014 (§398 OISL)

313. පළමුව https://www.presidentsoffice.gov.lk/index.php/2020/01/17/un-resident-coordinator-delighted-with-presidents-sustainable-development-programs/?lang=en
අනතුරුව : https://www.presidentsoffice.gov.lk/index.php/2020/01/24/death-certificates-for-missing-after-investigations/?lang=en
තවද, මැතිවරණයෙන් පසුවද අතුරුදහන්වූවන් පිළිබඳ ප්‍රශ්නය ගෝඨාභය විසින් අවප්‍රමාණ කරන ලදී.
http://www.ddinews.gov.in/international/minority-tamils-misled-decades-politicians-sri-lanka-president-gotabaya-rajapaksa

# 4. නෛතික විශ්ලේෂණය

'මානව හිමිකම් සහ නිදහස හොඳ මිනිසුන්ට මිස නරක මිනිසුන් සඳහා නොවේ'[314]

### ශ්‍රී ලංකාවට අදාළ වන නීති රාමුව

මෙම විශ්ලේෂණය පදනම් වන්නේ ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර-නොවන සන්නද්ධ ගැටුමට අදාළ ව්‍යවහාරික ජාත්‍යන්තර නීතිය, ජාත්‍යන්තර මානුෂවාදී නීතිය, ජාත්‍යන්තර මානව අයිතිවාසිකම් නීතිය සහ ජාත්‍යන්තර අපරාධ නීතිය මත ය[315]. මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ, යුද අපරාධ, වර්ග සංහාරය, වධ හිංසා අපරාධය (තනි අපරාධයක් ලෙසින්) වැනි ජාත්‍යන්තර අපරාධ තහනම, මෙම අපරාධවල ඇතැම් මූලාංග ව්‍යාවහාරික ජාත්‍යන්තර නීතිය යටතේ ද වර්ධනය වීම සමඟින්, ව්‍යවහාරික ජාත්‍යන්තර නීතිය තත්වයට ලඟාවී ඇත[316]. ශ්‍රී ලංකාව 1949 ජිනීවා සම්මුතිවල අතිරේක සම්මුති තුනෙහි රාජ්‍ය පාර්ශවකරුවෙක් නොවේ[317]. සන්නද්ධ ගැටුම පැවති කාලයේදී, ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මානව හිමිකම් ගිවිසුම් ගණනාවක රාජ්‍ය පාර්ශවකරුවෙක් විය[318]. 2016 දී ශ්‍රී ලංකාව ද බලාත්කාරයෙන් කෙරෙන අතුරුදහන්කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීමේ ජාත්‍යන්තර සම්මුතිය අපරානුමත කළේය.

### ජාත්‍යන්තර අපරාධ අධිකරණය (ICC)[319]

ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ රෝම ප්‍රඥප්තියට ශ්‍රී ලංකාව පාර්ශ්වකරුවකු නොවන නමුත් ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ අධිකරණ බලය පිළිගනිමින් ශ්‍රී ලංකාව විසින් කරන ප්‍රකාශයක්[320], එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යොමුකිරීමක්[321], හෝ ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ රෝම නීතියට අත්සන් කර ඇති රාජ්‍යයක පුරවැසියකු විසින්[322] අපරාධයක් සිදුකර ඇති හෝ සාමාජික රාජ්‍යයක භූමියේදී කර ඇති අපරාධයක් මාර්ගයෙන් හෝ ශ්‍රී ලංකාවේ ගැටුම පැවති කාලයේදී සිදුකර ඇති අපරාධ සම්බන්ධයෙන් අධිකරණ බලය පාවිච්චි කළ හැකි ය. ද්විත්ව පුරවැසිභාවය ඇති ශ්‍රී ලාංකිකයන් සම්බන්ධයෙන් බලන විට එම තැනැත්තාගේ දෙවැනි පුරවැසිභාවය ඇත්තේ ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ රෝම නීතියේ රාජ්‍ය පාර්ශවයක වන විට අදාළ රාජ්‍යය එම නඩුකරය ජාත්‍යන්තර අපරාධ අධිකරණයට යොමුකරන්නේ නම් හෝ ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ අභිචෝදක මූලපුරා ක්‍රියාකරන්නේ නම් හෝ ජාත්‍යන්තර අපරාධ අධිකරණය හමුවේ තවමත් නඩු විභාග කළ හැකිය[323]. තවදුරටත්, විශ්ව අධිකරණ බලය පිළිබඳ ප්‍රතිපාදන ඔවුන්ගේ ජාතික නීතියට[324] ඇතුළත්ව ඇති රාජ්‍යයන්ට අපරාධයක් සිදුකර ඇතැයි චූදිත තැනැත්තකුගේ අපරාධය පිළිබඳ වගකීම සම්බන්ධයෙන් ක්‍රියාකළ හැකි අතර එසේ

---

314. https://www.news18.com/news/world/were-back-to-square-one-man-who-helped-defeat-ltte-flays-sirisena-govt-for-turning blind-eye-to-intel-2116763.html

315. විස්තර කරන ලද ප්‍රචණ්ඩ සිද්ධිවල පැවතුම් කාලය සහ තීව්‍රතාවය, සහ එල්ටීටීඊයේ දෘෂ්‍යමාන සංවිධාන මට්ටම ශ්‍රී ලංකාවේ ගැටුම අභ්‍යන්තර ලක්ෂණයක් බව නිගමනය කිරීමට අවකාශ සලසයි. එය සරලව අභ්‍යන්තර කැලඹීමක් හෝ නොසන්සුන්තාවක් හෝ ප්‍රචණ්ඩ ක්‍රියා හෝ නොව, ආනුෂාංගිකව මෙම වාර්තාවේ ප්‍රචණ්ඩ ප්‍රහාර සහ වෙනත් සිදුවීම් සන්නද්ධ ගැටුමේ ප්‍රතිඵල වූයේය.

316. ශ්‍රී ලංකාව 1949 දී ජිනීවා සම්මුති 4 1959 දී[316] අපරානුමත කළ අතර ජාත්‍යන්තර නොවන සන්නද්ධ ගැටුමකට අදාළ ව්‍යවහාරික ජාත්‍යන්තර නීතිය ලෙස පිළිගෙන ඇති ජිනීවා සම්මුති 4හි පොදු වගන්තිය 3න්ද ශ්‍රී ලංකාව බැඳී ඇත. ශ්‍රී ලංකාවේ ගැටුමේ සියලු පාර්ශව ජාත්‍යන්තර නොවන සන්නද්ධ ගැටුම්වලට අදාළ වන ව්‍යවහාරික ජාත්‍යන්තර නීතියේ වෙනත් රීතිවලින්ද, විශේෂයෙන් වෙනස, පූර්වාරක්ෂාව සහ සමානුපාතිකතාව යන ඒවායින් බැඳී ඇත. ප්‍රචණ්ඩ සිද්ධිවල පැවතුම් කාලය සහ තීව්‍රතාවය, සහ එල්ටීටීඊයේ දෘෂ්‍යමාන සංවිධාන මට්ටම ශ්‍රී ලංකාවේ ගැටුම අභ්‍යන්තර ලක්ෂණයක් බව නිගමනය කිරීමට අවකාශ සලසයි. එය සරලව අභ්‍යන්තර කැලඹීමක් හෝ නොසන්සුන්තාවක් හෝ ප්‍රචණ්ඩ ක්‍රියා හෝ නොව, ආනුෂංගිකව මෙම වාර්තාවේ ප්‍රචණ්ඩ ප්‍රහාර සහ වෙනත් සිදුවීම් සන්නද්ධ ගැටුමේ ප්‍රතිඵල වූයේය.

317. I විශේෂයෙන් ශ්‍රී ලංකාව ,1949 අගෝස්තු 12 ජිනීවා සම්මුති වල අතිරේක මූලලේඛය සහ 1977 ජූනි ජාත්‍යන්තර සන්නද්ධ ගැටුම්වල වින්දිතයන්ට රැකවරණයට අදාළ වන (මූලලේඛය I); 1949 අගෝස්තු 12 ජිනීවා සම්මුති වල අතිරේක මූලලේඛය සහ 1977 ජූනි ජාත්‍යන්තර නොවන සන්නද්ධ ගැටුම්වල වින්දිතයන්ට රැකවරණයට අදාළ වන (මූලලේඛය I); අපරානුමත කර නැත.

318. වධය සහ වෙනත් කෲර හෝ අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ල, දඬුවම්කිරීමට එරෙහි සම්මුතිය (CAT) (accessed in 1994); සමූලඝාතන අපරාධ වැළැක්වීමේ සහ දඬුවම්කිරීම පිළිබඳ සම්මුතිය (ජජිැා සබ 1950), දේශපාලන සහ සිවිල් අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (ICCPR) (accessed in 1980); ආර්ථික සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (ICESCR) (accessed in 1980); කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කොට සැලකීම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (accessed in 1981); වාර්ගික වශයෙන් සියලු ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන්කිරීමේ ජාත්‍යන්තර සම්මුතිය (CERD) (accessed in 1982); සියලුර විගමණික සේවකයන් සහ ඔවුන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල අයිතිවාසිකම් ආරක්ෂාකිරීම පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (ICRMW) (accessed in 1996); ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය (ratified in 1991); සන්නද්ධ අරගලයට ළමයින් සම්බන්ධවීම සම්බන්ධයෙන් ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට විකල්ප මූලලේඛය (ratified in 2000) හෝ ළමා ගණිකා වෘත්තියේ සහ ළමා කාමෝද්පාදනයේ අලෙවිය පිළිබඳ ළමා අයිතිවාසිකම් පිලිබඳ සම්මුතියට විකල්ප මූලලේඛය (ratified in 2006).

319. එ.ජා. මහා සභාව, ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ රෝම ප්‍රඥප්තිය (2010දි අවසන් වරට සංශෝධිත) 17 ජූලි 1998, ISBN අංක 92 9227-227-6, https://www.refworld.org/docid/3ae6b3a84.html [accessed 27 December 2023]

320. Art 12(2) and (3) ICC Statute

321. Art 13(b) ICC Statute

322. මෙහිදී, උනන්දුවක් දක්වන රාජ්‍ය පාර්ශ්වකරුවකුට ජාත්‍යන්තර අපරාධ අධිකරණය හමුවේ නඩුවක් ගොණුකිරීමට හෝ අභිචෝදකගේ ස්ව ප්‍රාරම්භනයෙන් *(propriu motu)* එසේ කිරීමට හෝ හැකිය බලන්න, ICC ප්‍රඥප්තියේ 12(2), 13(a) සහ (c) වගන්ති

323. 12(2), 13(a) and (c) of the ICC Statute

324. බෙල්ජියම, ඩෙන්මාර්කය, ටර්මනිය, නෙදර්ලන්තය, එක්සත් රාජධානිය හෝ ස්විට්සර්ලන්තය

නැත්නම් යුද්ධය සමයේදී ශ්‍රී ලංකාවේ සිදුකර ඇති ජාත්‍යන්තර අපරාධ ගැන වගකිය යුතු තැනැත්තන්ට නඩු පැවරීම පිණිස පිහිටුවීමට ඉඩ ඇති විශේෂ හෝ දෙමුහුන් උසාවියක් හමුවේ අපරාධය පිළිබඳ වගකීම සම්බන්ධයෙන් ක්‍රියාකළ හැකි ය.

වධ හිංසාවලට එරෙහි සම්මුතියේ රාජ්‍ය පාර්ශව ද වධ හිංසා සිදුකර ඇති බවට චෝදනා ලබන තැනැත්තන් වෙනත් රාජ්‍යයකට උදර්පනය නොකරන්නේ නම් එම රාජ්‍යවල අධිකරණ බලය පවතින යම් භූමි ප්‍රදේශයකදී එම තැනැත්තන්ට එරෙහිව අභිචෝදනය කිරීම අවශ්‍යවෙයි.[325] ඒ සමානව බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමට ලක්වීමෙන් සියලු තැනැත්තන් ආරක්ෂාකිරීමේ ජාත්‍යන්තර සම්මුතියෙන් සලසා ඇති පරිදි බලාත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලට සම්බන්ධ බවට චෝදනා ලබන අපරාධකරුවන් බාරනොවන්නේ නම් හෝ ඔවුන් වෙනත් රාජ්‍යයකට හෝ ජාත්‍යන්තර විනිශ්චය සභාවකට හෝ උදර්පනය නොකරන්නේ නම් එම වරදවල් සිදුකර ඇතැයි කියන තැනැත්තන්ට එරෙහිව අවශ්‍ය පරිදි ඔවුන්ගේ අධිකරණ බලය ඇති ඕනෑම භූමි ප්‍රදේශකදී අභිචෝදනය කිරීමට පියවර සැලසිය යුත්තේය.[326]

එතෙකුදු වුවත්, ශ්‍රී ලංකාවේ සම්මුති හා ව්‍යවහාරික නීතියේ බැඳීම් මෙන්ම එහි දේශීය බැඳීම් තිබියදීත්, පසුගිය දශක තුන තුළ එහි ජාත්‍යන්තර මානව හිමිකම්, ජාත්‍යන්තර අපරාධ නීතිය සහ ජාත්‍යන්තර මානුෂවාදී නීතිය දැඩිව උල්ලංඝනය කිරීම සහ 2009 මැයි මාසයේදී අවසන්වූ සිවිල් යුද සමයේදී සහ පශ්චාත් ගැටුම් කාලපරිච්ඡේදයේදී සිදුකරන ලද අදාළ අපරාධ ගැන ශ්‍රී ලංකාවේ වග උත්තරදායකවීමක් සිදුවී නැත.

**විධාන වගකීම**

වර්ග සංහාරක අපරාධ, මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ සහ යුද අපරාධ ඍජුව හෝ ඔවුන්ගේ යටත් නිලයන් මගින් කිරීම පිළිබඳව අපරාධ වගකීම විධාන වගකීම යටතේ හමුදාවේ ඉහළ නිල දරන සාමාජිකයන්ට පැවරේ. මෙම වාර්තාවෙන් යොමුකරන යම් යම් උල්ලංඝනය කිරීම් යටත් නිලධරයකු විසින් සිදුකර ඇත්නම්, ඔහුගේ යටත් නිලධරයන් එවන් ක්‍රියා සිදුකිරීමට සූදානම්ව සිටි බව හෝ එසේ කර ඇති බව ගෝධාභය දැනසිටීමේ හෝ දැනගැනීමට හේතුවක් තිබුණේ නම් සහ ඔහු එවැනි ක්‍රියා වැළැක්වීමට හෝ අපරාධ සිදුකළ තැනැත්තන්ට දඬුවම් කිරීමට අවශ්‍ය සහ යුක්තියුක්ත පියවරගැනීමට අසමත්වී නම් ගෝඨාභය අපරාධ වගකීමෙන් මුදා නොහැරෙයි.

මෙම විධාන වගකීම වර්ධනය මගින් අපරාධවල ඍජු අපරාධකරුවන් ඉක්මවායමින් අභිචෝදනා නැඟීමට හැකිවන අතර එයට හේතුව එය නොමැතිව ඉහළ තලයේ අයට යම් වැරැද්දක් කර වරදින් ඔවුන්ටම නිදොස්වීමට හැකිවන අතර එයට නිදසුනක් ලෙස යටත් නිලධාරීන් අපරාධ කරන විට ඔවුන් නියෝග පිළිනොපදින බවට හෝ උල්ලංඝනය කිරීම් සිදුවූ ස්ථානවල කිසිම වේලාවක තමන් නොසිටි බවට තර්ක කිරීම දැක්විය හැකිය. යටත් නිලධරයකුගේ ක්‍රියා ජාත්‍යන්තර මානව හිමිකම්, ජාත්‍යන්තර අපරාධ නීතිය සහ ජාත්‍යන්තර මානුෂවාදී නීතිය උල්ලංඝනය කිරීමක් වන්නේ නම් හෝ ඉදිරියේදී එසේ වීමට ඉඩ ඇත්තේ නම්, ඒ සම්බන්ධයෙන් මැදිහත්වීමට සහ ඒවා වැළැක්වීමට හෝ යටපත්කිරීමට අණදෙන නිලධාරියෙක් රාජකාරියෙන් බැඳී ඇත.

රෝම ප්‍රඥප්තියේ 25 සහ 28 වගන්ති විසින් ජාත්‍යන්තර අපරාධ අධිකරණ ප්‍රඥප්තිය යටතේ වගකීමේ විධි අර්ථ කථනය කරයි.[327] ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ 28 වගන්තිය විධාන වගකීම යන්න 'උසාවියේ අධිකරණ බලය ඇතුළත' සිදුකරන ලද අපරාධ වශයෙන් නිර්වචනය කරයි. වගන්ති 6-8.18. හි විස්තර කර ඇති පරිදි වර්ග සංහාරක අපරාධ, මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ සහ යුද අපරාධ නම් වශයෙන් සඳහන් කර ඇත.[328]

අපරාධ අධිකරණයේ 28(a) වගන්තිය චූදිතයාගේ තත්වයට සහ හමුදා ආයතනයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ ධූරාවලි ආයතනික ව්‍යුහය හා සබැඳි අවශ්‍යතා දෙකක් ගැන විස්තර දක්වයි. පළමුවැනි අවශ්‍යතාව වන්නේ චූදිතයා 'හමුදා අණදෙන නිලධාරියකු වීම හෝ හමුදා අණදෙන නිලධාරියකු වශයෙන් බලසහිතව ක්‍රියාකරන තැනැත්තෙකු' වීමයි. වෙනත් වචනවලින් කියන්නේ නම්, එයට හමුදා අණදෙන නිලධාරියකුගේ තත්වාකාර හෝ නීතිප්‍රකාර තත්වයක් අවශ්‍යවන අතර එයින් අදහස් කරන්නේ බලතල මෙන්ම රාජකාරි කර්තව්‍යයන්, කෙසේද යත්, අපරාධකරු හමුදා අණදෙන නිලධාරියකු හෝ හමුදා අණදෙන නිලධාරියකු වශයෙන් ක්‍රියාකරන තැනැත්තෙකු විය යුතු ය.

325. Art 7(1) CAT

326. බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් රැකගැනීම පිණිස වන ජාත්‍යන්තර සම්මුතියේ වගන්තිය 9

327. එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය ජාත්‍යන්තර අපරාධ උසාවියේ රෝම ව්‍යවස්ථාව (2010දී අවසන් වරට සංශෝධිත) 17 July 1998, ISBN No. 92-9227-227-6, https://www.refworld.org/docid/3ae6b3a84.html [accessed 1 Jan 2024]

328. එම

දෙවැනි අවශ්‍යතාව වන්නේ හමුදා ආයතනය තුළ ක්‍රියාකාරිත්වය පිළිබඳ ධුරාවලි සහිත ආයතනික ව්‍යුහයක් පැවතීමයි. එහිදී හමුදා අණදෙන නිලධාරියකුගේ බලසහිත විධානය සහ පාලනය යටතේ හෝ බලසහිත අධිකාරිය සහ පාලනය යටතේ තිබීමය. මෙම අවස්ථා දෙකෙහිදීම, අණදීම සහ පාලනය සඳහා බලතල සහිත විධිමත් හමුදා අණදෙන නිලධාරියකු වන පුද්ගලයකු සහ බලසහිත අධිකාරය සහ පාලනය සහිතව හමුදා අණදෙන නිලධාරියකු වශයෙන් ක්‍රියාකරන පුද්ගලයකු අතර වෙනසක් දක්වනු ලැබේ .

නීතිය උල්ලංඝනය නොකරන බවට වගබලාගැනීම පිණිස ජාත්‍යන්තර මානුෂවාදී නීතිය සහ ජාත්‍යන්තර අපරාධ නීතිය ඉහළ නිලධරයන් මත ඔවුන්ගේ යටත් නිලධරයන්ට වඩා වැඩි වගකීමක් තබා ඇත. ධූරාවලියේ ඔවුන්ට හිමි ඉහල තරාතිරම අනුව ඉහළ නිලධරයන්ට ජාත්‍යන්තර මානුෂවාදී නීතිය ට නිසිපරිදි ගරුකරන බවට සහ කඩකිරීම් සම්බන්ධයෙන් උචිත අයුරින් ක්‍රියාකරන බවට වගබලාගැනීමේ සහතික වූ වගකීමක් ඇත. එම කර්තව්‍ය ඉටුකිරීමට අසමත්වීම තවදුරටත් කඩකිරීම් දිරිගැන්වීමක් සහ දණ්ඩමුක්ති සංස්කෘතියක් පෝෂණය කරමින් ඔවුන්ගේ යටත් නිලධාරීන්ගේ අනීතික ක්‍රියා අනුමත කිරීමක් ලෙස නිර්වචනය කළ හැකිය.

හමුදාවේ නොවන ඉහළ නිලධරයකුට විධාන වගකීම මාර්ගයෙන් නෛතික වශයෙන් වගකිවයුතු බවට පත්කිරීම සඳහා සාවද්‍ය චේතනාවක් තිබූ බව තහවුරු කිරීමට තිබිය යුතු අතිරේක අංග ජාත්‍යන්තර අපරාධ අධිකරණ නීතිය මගින් හඳුන්වා දී ඇත. යටත් නිලධරයන්ගේ ක්‍රියා සම්බන්ධ තොරතුරු ඉහළ නිලධරයා සන්තකයෙහි තිබූ බව පමණක් නොව, ඉහළ නිලධරයා දැනුවත්වම එවැනි තොරතුරු නොසළකා සිට ඇති බව එහිදී පෙන්නුම් කළ යුතුය.

## ගෝඨාභය රාජපක්ෂට වගකීම ආරෝපණය කෙරෙන ජාත්‍යන්තර අපරාධ

2009 මැයි මාසයේදී අවසන් වූ යුද්ධයේ අවසන් අදියරේදීත්, එහි පසුවිපාකයේදීත් ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය, ජාත්‍යන්තර අපරාධ නීතිය සහ ජාත්‍යන්තර මානුෂවාදී නීතිය උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් ඔහුට සමකාලීන දැනුමක් තිබූ බව විදහා දක්වමින්, යුද බිමේ ආඥාපතිවරුන්ට දෙන ලද නියෝගවලට ගෝඨාභය රාජපක්ෂ සම්බන්ධ කරන සවිස්තරාත්මක සාක්ෂි මෙම වාර්තාව ඉදිරිපත් කරයි. තනතුර දරද්දී ගෝඨාභය ට මෙම උල්ලංඝනයකිරීම් වැළැක්වීමට සහ ඒවා සම්බන්ධයෙන් විශ්වාස කළ හැකි අන්දමින් පරීක්ෂණ ආරම්භ කිරීමට අප්‍රමාණ අවස්ථා පැවතියද; ඒ වෙනුවට ගෝඨාභය එම අපරාධ සිදු කළ බවට චෝදනා ලබන තැනැත්තන්ට වරදාන ලබාදෙමින් සහ ඔවුන්ට රැකවරණ සලසමින් වගවීමේ ප්‍රයත්න වැළැක්වූ බව මෙම වාර්තාව තවදුරටත් විස්තර කරයි.

## ජාත්‍යන්තර මානුෂවාදී නීතිය උල්ලංඝනය කිරීම්

යුද අපරාධ චෝදනා නැගීමට, සන්නද්ධ ගැටුමක් පැවතීම අවශ්‍ය වන අතර, සහ ප්‍රශ්නගත හැසිරීම එම සන්නද්ධ ගැටුමට සම්බන්ධව තිබිය යුතු ය. එම අපරාධය සිදුකිරීම සඳහා එකී සන්නද්ධ ගැටුම අවම වශයෙන් 'අපරාධකරුට (එම අපරාධය) කිරීමට ඇති හැකියාවටත්, එය කිරීම සඳහා ඔහුගේ තීරණය ගැනීමටත්, එය සිදුකරන ලද ආකාරය හෝ එය සිදුකරන ලද්දේ කුමන අරමුණක් සඳහාද යන්න සම්බන්ධයෙනුත් සැලකිය යුතු කොටසක් ඉටු කළ' යුතු වෙයි.[329]

සන්නද්ධ ගැටුමට ඇති බැඳියාව තහවුරු කරන තාක් යම් තනි පුද්ගලයකු විසින්, සිවිල් වැසියකු විසින් හෝ හමුදාව විසින් යුද අපරාධ සිදුකරනු ලැබිය හැකිය[330]. යුද අපරාධ නිර්වචනය අනුව චාරිත්‍රානුගත අන්තර්ජාතික මානුෂවාදී හෝ සම්මුති නීතිය යටතේ රැකවරණ ලද මිනිසුන් කණ්ඩායමකට හෝ දේපලවලට එරෙහිව සිදුකරන අපරාධයක් විය යුතු වෙයි.[331]

## යුද අපරාධ තහනම

### *රැකවරණ ලත් තැනැත්තන්*

ජාත්‍යන්තර-නොවන සන්නද්ධ ගැටුම්වලදී, රාජ්‍යයේ, සන්නද්ධ හමුදාවල හෝ ගැටුමෙහි පාර්ශවයක සංවිධානාත්මක කණ්ඩායම්වල සාමාජිකයන් නොවන තැනැත්තන් සිවිල් ජනයා වන අතර ඔවුහු යුද සටන්වලට ඍජුව සම්බන්ධ නොවන්නේ නම්, ඍජු ප්‍රහාරවලට එදිරිව රැකවරණය බුක්ති විඳිති.[332]

329. උදා: කුනරැක් ඇතුලු අය අභියාචනාධිකරණ තීන්දුව: (n 75), 58 ඡේදය. බලන්න, රුටගන්ඩා, අභියාචනාධිකරණ තීන්දුව, (n 74), 569–570 ඡේද.

330. අකයේසුට එරෙහිව අභිචෝදක, රුවන්ඩාව පිළිබඳ ජාත්‍යන්තර අපරාධ විනිසුරු සභාව, ICTR-96-42 තීන්දුව, 2 සැප්තැම්බර් 1998, බලන්න රෝම ප්‍රඥප්තියේ 8(2) වගන්තිය

331. පොදු වගන්තිය 3 න් 'තවදුරටත් සටන්වල නොයෙදෙන, සිය අවි බිම තැබූ සන්නද්ධ හමුදාවල සාමාජිකයන්, රෝගාතුරවීම, තුවාලවීම, රඳවාගෙන සිටීම හෝ වෙනත් හේතු කරණකොටගෙන සටන් කළ නොහැකි තත්වයට පත්ව සිටින, තැනැත්තන්', ආරක්ෂා කරයි.

332. 1949 අගෝස්තු 12 ජිනීවා සම්මුතිවලට වූ ජාත්‍යන්තර සන්නද්ධ ගැටුම්වල වින්දිතයන්ට රැකවරණ සැළසීම හා සබැඳි 1977 සන්ධාන අතිරේකය Art.51(3); 1949 අගෝස්තු 12 ජිනීවා සම්මුතිවලට වූ ජාත්‍යන්තර නොවන-සන්නද්ධ ගැටුම්වල වින්දිතයන්ට රැකවරණ සැලසීම හා සබැඳි 1977 සන්ධාන අතිරේකය, Art 13(3).

අතිරේක මූලලේඛ I හි 50(3) වගන්තිය පරිදි 'සිවිල් ජනයා යන නිර්වචනය ඇතුළතට නොගැනෙන තැනැත්තන් සිවිල් ජනගහනය තුළ පැමිණ සිටීම 'එම ජනගහනයේ සිවිල් ගති ලක්ෂණ අහිමිභාවයට පත්කිරීමක් නොවන බවක් සලසයි.'[333] සිවිල් වැසියන්ට ප්‍රහාරවලින් ආරක්ෂාවට ඇති මුක්තිය ජාත්‍යන්තර මානුෂවාදී නීතියේ පාදක මූලධර්මයට, එනම් විශදතාවයේ මූලධර්මය හා සමීපව බැඳේ. නීත්‍යානුකූල සහ රැකවරණ ලද ඉලක්ක වෙනස්කොට කොට හඳුනාගැනීමට විශදතාවයේ මූලධර්මය මගින් සන්නද්ධ ගැටුමේ පාර්ශවකරුවන්ට බල කෙරේ.[334] මෙයට අවි බිම තැබූ සන්නද්ධ හමුදා සාමාජිකයන් සහ රෝගාතුරවීම, තුවාල සිදුවීම, යටත්වීම, රඳවාගෙන සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා 'සටන් කළ නොහැකි' තත්වයට පත්වූවෝ ද ඇතුළත් වෙති.[335] සුවිශේෂීයව වෛද්‍ය රාජකාරිවල යොදවා සිටින වෛද්‍ය සේවා නියුක්තිකයන්, සතුරාට හානිකර ක්‍රියාවන්හි නිරත නොවී සිටින්නේ නම්, සෑම තත්වයක් යටතේම ගරුකොට ආරක්ෂා කළ යුතුය.[336] වෛද්‍ය සහ ආගමික කටයුතු ඉටුකරන තැනැත්තන් හෝ සටන් කළ නොහැකි තත්වයට පත්වූවන් ඇතුළු සිවිල් ජනයා සහ රැකවරණ ලද තැනැත්තන් ඉලක්ක කරගත් උල්ලංඝනය කිරීම් මාලාවක් යුද අපරාධ වශයෙන් රෝම ප්‍රඥප්තිය අනුව සාපරාධී වෙයි.

**ආරක්ෂිත වස්තුː සිවිල් වස්තු සහ හමුදාවලට අයත් වස්තු අතර වෙනස**

සිවිල් වස්තු හමුදා අරමුණුවලට සම්බන්ධයක් නැති දෑ ය.[337] ජාත්‍යන්තර මානුෂවාදී නීතිය අනුව ආනුෂාංගික සිවිල් ජීවිත අහිමිවීම් සහ සිවිල් වස්තුවලට[338], හානිසිදුවීම මගහරින හෝ අවමකරන 'හැකි සෑම පූර්වාරක්ෂක පියවරක්ම' සටන්වැදි පාර්ශව විසින් ගත යුතු අතර ප්‍රහාරයට ගොදුරු කරගන්නා වස්තු ඇත්ත වශයෙන්ම හමුදාමය වස්තුදැයි සත්‍යාපනය කරගැනීමට හැකි සෑම දෙයක්ම කිරීම ඇතුළත් ය.[339] පවතින වාතාවරණය අනුව අවකාශ ඇති විට ගැටුමේ පාර්ශව ප්‍රහාර සම්බන්ධයෙන් ඵලදායී ලෙස කල් තියා අනතුරු ඇඟවීම් කළ යුතු ය.[340]

**අවිචාරවත් සහ අසමානුපාතික ප්‍රහාර තහනම**

'..(a) විශේෂිත හමුදාවට අයත් වස්තුවලට යොමු නොකරන ප්‍රහාර; (b) විශේෂිත හමුදාවට අයත් වස්තුවකට යොමු කළ නොහැකි සටන් ක්‍රමයක් හෝ විධියක් යොදාගත් ප්‍රහාරයක් හෝ (c) ප්‍රතිවිපාක ජාත්‍යන්තර මානුෂවාදී නීතියෙන් අවශ්‍ය වන පරිදි සීමා කළ නොහැකි සටන් ක්‍රමයක් හෝ විධියක් යොදාගත් ප්‍රහාරයක් සහ අනුෂංගිකව, එක් එක් සිද්ධියේදී, හමුදාවට අයත් වස්තුව හා සිවිල් ජනයාට සහ සිවිල් වස්තුවලට වෙනසකින් තොරව පහරදීමේ ස්වරූපයේ ප්‍රහාර අවිචාරවත් ප්‍රහාර වෙයි.[341] මෙම අවිචාරවත් ප්‍රහාර තහනම් කිරීමේ මූලධර්මය ව්‍යවහාරික ජාත්‍යන්තර නීතිය යටතේ ජාත්‍යන්තර නොවන සන්නද්ධ ගැටුමට (NIAC) යෙදිය හැකි බව පිළිගෙන ඇත.

සමානුපාතිකතා මූලධර්මයද චාරිත්‍රානුගත ජාත්‍යන්තර නීතිය යටතේ ජාත්‍යන්තර නොවන සන්නද්ධ ගැටුමට (NIAC)යෙදිය හැකි ප්‍රතිමානයක් වශයෙන් හඳුනාගෙන ඇති ජාත්‍යන්තර මානුෂවාදී නීතියේ මූලික මූලධර්මයකින් යුක්ත වන්නේය. මෙම මූලධර්මය මගින් ගැටුමට සම්බන්ධ සියලු පාර්ශවයන්ට 'සිවිල් ජනයාගේ ජීවිත ආනුෂංගිකව අහිමිවීම, සිවිල් ජනයාට තුවාල සිදුවීම, සිවිල් වස්තුවලට හානි සිද්ධවන හෝ ඒවායේ සංයුක්තයක් සිදුවීමට හේතුවනු ඇතැයි අපේක්ෂා කරන, එයින් අපේක්ෂිත ප්‍රත්‍යක්ෂ හා ඍජු හමුදා වාසිය ඉක්මවා යන' ප්‍රහාරයක් දියත්කිරීම තහනම් කරයි.[342]

**යුද අපරාධ**

'ජාත්‍යන්තර නොවන සන්නද්ධ ගැටුමකදී ඍජුව සටන්වලට සහභාගි නොවන සිවිල් ජනගහනය හෝ තනි සිවිල් පුද්ගලයන්' ප්‍රහාරයේ සතු වස්තු බවට පත් කිරීම'[343] ජාත්‍යන්තර මානුෂවාදී නීතිය බරපතල

333. සෑමගේ සම්මුතියෙන් කෙටුම්පත් කළ සංධාන අතිරේකය II ට මේ හා සමාන ප්‍රතිපාදනයක් ඇතුළත් කළත්, සරලතාවය සලකා අවසානයේදී අවසන් කෙටුම්පතෙන් ඉවත් කෙරිණ.

334. ICRC Customary IHL Database, Rule 1

335. උදාහරණයක් වශයෙන්, පොදු වගන්තිය 3 න් 'තවදුරටත් සටන්වල නොයෙදෙන, සිය අවි බිම තැබූ සන්නද්ධ හමුදාවල සාමාජිකයන්, රෝගාතුරවීම,තුවාලවීම, රඳවාගෙන සිටීම හෝ වෙනත් හේතු කරණකොටගෙන සටන් කළ නොහැකි තත්වයට පත්ව සිටින, තැනැත්තන්' ආරක්ෂා කරයි,

336. 1949 පළමුවැනි ,දෙවැනි සහ හතරවැනි ජිනීවා සම්මුති; අතිරේක සංධානය 1 හි 15 වගන්තිය ජිනීවා සම්මුති වල පොදු වගන්තිය 3 ට මෙම රීතිය ඇතුළත් වන අතර එය අතිරේක සංධානය II ටඇතුළත් කර තිබේ, වගන්තිය 9(1). ජාත්‍යන්තර නොවන-සන්නද්ධ ගැටුම්වල දී අදාළ වන ව්‍යාවහාරික ජාත්‍යන්තර නීතියේ ප්‍රතිමානයක් ලෙස පිළිගෙන ඇත. බලන්න, ICRC, Rule 25, https://ihl-databases.icrc.org/customary-ihl/eng/docs/v1_rul_rule25#Fn_E202BFDC_00011

337. ICRC, Rule 9

338. අතිරේක මූලලේඛනය 1, 57 වගන්තිය

339. අතිරේක මූලලේඛනය 1, 52(3) ; 57(2) වගන්ති

340. එම

341. ICRC, Rule 12, https://ihl-databases.icrc.org/customary-ihl/eng/docs/v1_rul_rule12

342. ICRC, Rule 14, https://ihl-databases.icrc.org/customary-ihl/eng/docs/v1_rul_rule14

343. සිවිල් ජනතාවට එරෙහි පහරදීමක් චේතනාන්විතදැයි නිගමනය කිරීමට වෙනත් කරුණු අතර පහත නිර්ණායක සැලකිල්ලට ගත යුතු බව ICTY විනිශ්චය සභාව තීරණය කරයිː 'ප්‍රහාර ක්‍රියා මාර්ගයේදී යොදා

උල්ලංඝනය කිරීමක් ලෙස පිළිගනු ලැබ ඇත.[344] එසේම, සිවිල් ජනයාගේ මරණ හෝ ඔවුන්ට තුවාල සිදුවන අවිචාරවත් ප්‍රහාරයක් ඇරඹීම හෝ 'විශාල වශයෙන් ආනුෂංගික සිවිල් ජීවිත හානි, තුවාල හෝ හානි' සිදුවීමට හේතුකාරක වන බව දැනගෙන ප්‍රහාරයක් ඇරඹීම හෝ 'ආරක්ෂාවක් නැති ප්‍රදේශයක් ප්‍රහාරයේ ගොදුරක් කිරීම' ජාත්‍යන්තර නොවන සන්නද්ධ ගැටුමකදී ජාත්‍යන්තර මානුෂවාදී නීතිය බරපතල උල්ලංඝනය කිරීම් ලෙස දක්වා ඇත.[345]

සිවිල් ජනයාට හෝ වෙනත් රැකවරණ ලත් තැනැත්තන්ට එරෙහිව සිදුකරන ලද්දේ නම් පහත සඳහන් ක්‍රියා ජාත්‍යන්තර නොවන සන්නද්ධ ගැටුමකදී ජාත්‍යන්තර මානුෂවාදී නීතිය බරපතල උල්ලංඝනය කිරීමකින් යුක්තවන්නේය: 'ජීවිතයට සහ පුද්ගලයාට එරෙහි ප්‍රචණ්ඩත්වය, විශේෂයෙන් සියලු ආකාරයේ මිනීමැරීම්, අංගච්ඡේදනය, කෲර ලෙස සැලකීම සහ වධහිංසාකිරීම'; පුද්ගලික ගරුත්වයට අවමාන කිරීම; ප්‍රාණ ඇපයට ගැනීම හෝ සාමාන්‍යයෙන් අත්හළ නොහැකි ලෙස පිළිගෙන ඇති නීතියේ සියළු රැකවරණ සලසමින්, නිත්‍ය ලෙස පිහිටුවන ලද උසාවියකින් කළින් ප්‍රකාශ කළ නඩු තීන්දුවක් නොමැතිව දඬුවම් පැනවීම හෝ මරණයට පත්කිරීම් ක්‍රියාත්මක කිරීම'.[346]

ගැටුමක එක් පාර්ශවයක් යුද්ධයේ නීති උල්ලංඝනය කිරීම් ප්‍රතිපක්ෂ පාර්ශවය විසින් සිදුකරනු ලබන උල්ලංඝන සාධාරණීයකරණය නොකරයි.[347]

## මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ

මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ වශයෙන් හැඳින්වෙන්නේ ජාතිකත්වය නොසලකා සිවිල් ජනයා ඉලක්ක කොට, මහාපරිමාණ ප්‍රහාරයක සන්දර්භය තුළ සිදුකරනු ලබන විශේෂිත අපරාධවලට ය. මෙම අපරාධවලට මිනීමැරුම, වද හිංසා කිරීම, ලිංගික හිංසනය, වහල්භාවයට පත්කිරීම, බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම ඇතුළත් ය. මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ නිතරම සිදුකර ඇත්තේ රාජ්‍ය ප්‍රතිපත්තිවල අංගයක් ලෙසට වන නමුත් රාජ්‍ය නොවන සන්නද්ධ කණ්ඩායම් හෝ අතුරු සන්නද්ධ හමුදා විසින්ද ඒවා සිදුකිරීමට හැකි ය. යුද අපරාධ මෙන් නොව, මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ යුද්ධ කාලවලදී හෝ සාමකාමී කාලවලදී කළ හැකි අතර ඒවා අනිවාර්යයෙන්ම නිශ්චිත ජාතික, ජනවාර්ගික, වාර්ගික හෝ ආගමික කණ්ඩායමකට එරෙහිව සිදු කරනු නොලැබේ.

මනුෂ්‍යත්වයට එරෙහි අපරාධවල සන්දර්භානුගත අංගවලට යම් සිවිල් ජගහනයකට එරෙහිව මෙහෙයවන ව්‍යාප්ත වූ හෝ සංවිධිත ප්‍රහාරයක කොටසක් ලෙස, අපරාධය සිදුකරන්නා (කරන්නන්) දැනුවත්ව, ප්‍රහාරයේ යෙදීම අවශ්‍ය වෙයි.[348] 'යම් සිවිල් ජගහනයකට එරෙහිව ප්‍රහාරයක් මෙහෙයවීම' යන්නෙන් අදහස්වන්නේ 'ඕනෑම සිවිල් ජනකායකට එරෙහිව විවිධාකර ක්‍රියා මාර්ග යොදාගනිමින් එවැනි ප්‍රහාරයක් සිදුකිරීමට රාජ්‍ය හෝ ආයතනික ප්‍රතිපත්ති අනුව හෝ එය පෙරට ගෙන යනු ලබන ක්‍රියා දාමයකි'.[349] මෙම ක්‍රියා පුළුල්ව පැතිරුණු හෝ ක්‍රමානුකූලව වීමක් අවශ්‍ය නොවන නමුත්, ඒවා පුළුල්ව පැතිරුණු හෝ ක්‍රමානුකූල ප්‍රහාරයක අංගයක් විය හැකිය.[350]

### ප්‍රතිපත්තිමය හෝ ආයතනික අවශ්‍යතාව

පැරණි යුගෝස්ලාවියාව සඳහා වන ජාත්‍යන්තර විනිශ්චය සභාව (ICTY) හා රුවන්ඩාව සඳහා වන ජාත්‍යන්තර විනිශ්චය සභාව (ICTR) නිගමනය කළ පරිදි, ව්‍යවහාරික නීතියේ විෂය ප්‍රකාර, ප්‍රතිපත්තියක හෝ සැලැස්මක කොටසක් වශයෙන් පහරදීම කළ

ගත් ක්‍රම සහ විධි, සිවිල් වැසියන් සිටි තත්වය, ඔවුන්ගේ සංඛ්‍යාව, ප්‍රහාරයේ ප්‍රචිචාරක ස්වභාවය, මෙම ක්‍රියාකලාපයේදී සිදුකළ අපරාධයේ ස්වභාවය, එම වේලාවේදී ප්‍රහාරකයන්ට දැක්වූ ප්‍රතිරෝධය, ප්‍රහාරක බලවේග යුද්ධයේ නීතිවල පූර්වාරක්ෂක අවශ්‍යතාවන් පිළිපැදි හෝ පිළිපැදීමට උත්සාහ කළැයි කියන ප්‍රමාණය. - අභිචෝදක එරෙහිව කුනරැක්, කෝවාච් සහ වුකොවිච්, අභියාචන තීන්දුව, IT-96-23-T සහ IT-96-23/1-A, 12 June 2001, 91 ඡේදය.

344. ICRC, Rule 156, https://ihl-databases.icrc.org/en/customary-ihl/v1/rule156. - තවද, ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ ව්‍යවස්ථාව යටතේ, 'එවන් සිවිල් ජනගහනයක් හෝ කෙළින්ම සටන්වල යෙදී නොසිටින තනි සිවිල් වැසියන්ට එරෙහිව චේතනාන්විතව ප්‍රහාර යොමුකිරීම ජාත්‍යන්තර සන්නද්ධ ගැටුම්වලදී යුද අපරාධයක් සංස්ථාපනය කරයි. ICC ප්‍රඥප්තියේ, Article 8(2)(b)(i), eg Article 8(2)(e)(ii) - මෙම ව්‍යවස්ථාව ජාත්‍යන්තර නොවන සන්නද්ධ ගැටුමක් තුළදී, ජාත්‍යන්තර නීතියට අනුකූලව විශේෂිත වූ ලාංඡන භාවිතා කරන 'ගොඩනැගිලි, ද්‍රව්‍ය, වෛද්‍ය ඒකක, ප්‍රවාහන සහ තැනැත්තන් ට එරෙහිව ප්‍රහාර යොමුකිරීමක් අපරාධී අරමුණෙන් සිදුකළ විට යුද අපරාධයක් සංස්ථාපනය සලසයි; අතිරේක මූලලේඛ II, හි 9 සහ 11 වගන්ති ද බලන්න.

345. එම

346. සිව්වැනි ජිනීවා සම්මුතියේ 3 පොදු වගන්තිය ව්‍යවහාරික ජාත්‍යන්තර නීතියට කැටිකර ඇත.

347. ICRC Rule 140, ජිනීවා සම්මුතියේ 2 සහ 3 පොදු වගන්ති උපුටා දක්වමින්

348. රෝම ප්‍රඥප්තිය, 7(1) වගන්තිය

349. රෝම ප්‍රඥප්තිය, 7(2) වගන්තිය

350. අභිචෝදක එරෙහිව ටඩිච් අභියාචන තීන්දුව, IT-94-1-A, 15 ජූනි 1999, n 311-248 ඡේදය, අභිචෝදක එරෙහිව මිලැක් මර්ක්සිච් යනාදීන්, නඩු විභාග 1, 'පටිපාටිමය සහ සාක්ෂි පිළිබඳ රෙගුලාසි මාලාවේ 61වන රෙගුලාසියට අනුව සිදුකළ අධිචෝදනා විවරණය' IT-95-13-R61, 1996 අප්‍රේල් 3, 30 ඡේදය, 'සිවිල් ජනගහණයට එරෙහිව පැතිරුණු හෝ ක්‍රමානුකූල ප්‍රහාරයන්ගේ සම්බන්ධයක් පවතින තාක් දුරට තනි ප්‍රහාරයක් වුව මානව වර්ගයාට එරෙහිව අපරාධයක් සේ ගිණිය හැකිය. ඒ අනුව, තනි වින්දිතයකුට හෝ සීමිත වින්දිතයන් ප්‍රමාණයකට එරෙහිව තනි පුද්ගලයකු විසින් සිදුකරන සාපරාධී ක්‍රියාවක් වේ නම්, ඔහුගේ ක්‍රියාව පූර්වයෙන් හඳුනාගත් නිශ්චිත සන්දර්භයේහි කොටසක් වේ නම්, ඔහු මානව වර්ගයාට එරෙහි අපරාධයක් සිදුකිරීම පිළිබඳ වැරදිකරු වශයෙන් පිළිගැනේ'.

බව පෙන්වීමට අවශ්‍ය නැත.[351] එසේවුවත්, 'එවැනි ප්‍රහාරයක් රාජ්‍යයක හෝ සංවිධානයක ප්‍රතිපත්තිය අනුව හෝ එය පෙරට ගෙනයාමට' සහ 'එම රාජ්‍යය හෝ සංවිධානය සිවිල් ජනගහනයකට එරෙහිව එවන් පහරදීමක් සඳහා සක්‍රීයව අනුබලදීමට හෝ දිරිගැන්වීමට' ප්‍රහාරය සිදුකල යුතුව ඇත යන්න ICC දරන මතයයි'.[352]

ආයතනික ප්‍රතිපත්ති අවශ්‍යතාව ගැන කටයුතුකිරීම සම්බන්ධයෙන් ICTY සහ ICC වෙනස් ප්‍රවේශ ගෙන තිබීමෙන් පෙන්නුම් කෙරෙන්නේ මනුෂ්‍යත්වයට එරෙහි අපරාධවලදී, එය රාජ්‍ය හෝ සංවිධාන ප්‍රතිපත්තියක් වීම අවශ්‍යතාවක් නොවන බවයි.

**සිදුවීම්**

**මන්නාරම දිස්ත්‍රික්කයේ ප්‍රහාර (උතුර)**

2005 සහ 2006 අවසානය දෙසට යන විට, නැගෙනහිර සහ උතුරේද විශේෂයෙන්, මන්නාරම දිස්ත්‍රික්කයේ සහ අවට කර්නල් කරුණාගේ 'දුරදිග විහිදුම්' යොදාගනිමින්, සටන් සහ ගැටුම් යළි ආරම්භ විය. ප්‍රහාර සිදුකරන කාලයේදී, ගෝඨාභය රාජපක්ෂ, ජාතික ආරක්ෂක කවුන්සිලය සහ ඒකාබද්ධ මෙහෙයුම් මූලස්ථානයේ ඔහුගේ නියමිත කාර්යභාරය සහ කර්තව්‍යයන් අනුව මන්නාරම දිස්ත්‍රික්කයේ සහ මඩු පල්ලියේ ආරක්ෂක හමුදා විධානය සහ පාලන බාරව සිටියේය. ආරක්ෂක හමුදා සහ අතුරු හමුදා කල්ලි 'ආරක්ෂක අමාත්‍යාංශයේ ඍජු උපදෙස් මත'කටයුතු කරන බව මඩු දේවස්ථානයේ වගකීම් පැවරී තිබුණු රදගුරුතුමා ප්‍රකාශ කළේය. රදගුරු රායප්පු ජෝශප් හිමිපාණන් 'රක්ෂිත ප්‍රදේශයේ කිසිම හමුදා ප්‍රහාරයක් සිදුනොකිරීමට වගබලා ගන්නා ලෙස තමා ආරක්ෂක ලේකම්ගෙන් ඉල්ලා සිටි බව' ප්‍රකාශ කරමින් ගෝඨාභය රාජපක්ෂට සඵල අන්දමින් අනතුරු ඇඟවීමක් කළේය.[353]

එනිසා ගෝඨාභය රාජපක්ෂට ඔහුගේ යටත් නිලධරයන් විසින් මන්නාම දිස්ත්‍රික්කයේ සිවිල් ජනයාට සහ දේවස්ථානය වැනි රක්ෂිත වස්තුවලට එදිරිව සිදුකරන ලද උල්ලංඝනයකිරීම් ගැන සම්පූර්ණයෙන්ම දැනුම්දීමක් කර ඇත. ඔහු සිදුකිරීමට නියමිතව තිබූ තවත් උල්ලංඝනයකිරීම් දැනසිටි අතර, ඔහු දැරූ තත්වය සහ ආරක්ෂක හමුදා සහ අතුරු හමුදා සම්බන්ධයෙන් පැවති සඵල බලතල හා පාලනය නිසා, අනාගතයේදී මෙවන් අපරාධ වැළැක්වීමට අවශ්‍ය පූර්වාරක්ෂාවන් යොදමින්, අවම වශයෙන් ප්‍රහාර නිමකිරීමට හෝ රදගුරු විසින් ඔහුට වාර්තාකරන ලද සිවිල් වැසියන් 6 දෙනෙකු මැරීම පිළිබඳ සිද්ධිය ගැන පරීක්ෂණයක් ආරම්භ පියවර ගත යුතුව තිබුණි. ඔහු, මෙයට වගකිවයුත්තන් නිගමනය කිරීමට පරීක්ෂණයක් ආරම්භකිරීම හෝ වගකිව යුතු අපරාධකරුවන්ට දඬුවම් කිරීමට අසමත් වෙමින් තෝරා ගත්තේ තමා සන්තකයේ තිබූ තොරතුරු නොසලකා හැරීමයි.[354]

මෙම පහරදීම්වලින් සිවිල් වැසියන් තිදෙනෙකු මියයාම සහ 16,000 ක් අවතැන්වීම සහ සිවිල් ජනගහනයේ සැහෙන පිරිසකට තුවාලවීම සිදු වූ අතර යොදා ගත් අවි (ක්ලේමෝ බෝම්බ) සහ ගුවනින් ප්‍රහාර එල්ලකිරීම, කාල තුවක්කු ප්‍රහාර, ක්‍රම සහ විධි නිසා එම සියල්ල දැනගත හැකිවූ අතර සිවිල් සහ හමුදා ඉලක්ක වෙන්කර හඳුනාගැනීමට නොහැකි බවට පත්කරමින් සහ වෙනසෙහි මූලධර්මය උල්ලංඝනය කිරීම ඊට ඇතුළත්ය. ප්‍රදේශයේ ප්‍රකාශිත ජනගණත්වය අනුව, මඩු ප්‍රකට වන්දිය ස්ථානයක්වීම හා අභය භූමියක් ලෙස සලකන විට සහ සිවිල් ජනයා නිතර ගැවසෙන සහ ගමට ආසන්නයේ පිහිටා තිබීම නිසා ප්‍රහාර යම් නිශ්චිත හමුදා වස්තුවක් ඉලක්ක නොකළ අතර මෙම ප්‍රහාර නිර්විශේෂ සහ විෂමානුපාත බව විශ්වාසකිරීමට සැළකිය යුතු පසුබිමක් ඇති අතර ජාත්‍යන්තර මානුෂවාදී නීතිය දැඩිව උල්ලංඝනය කිරීම්වලින් යුක්ත වන්නේය. සටන් සිදුවන සන්දර්භයක් තුළ ගැටුමේ පාර්ශව මෙම උල්ලංඝනය කිරීම් සිදුකර ඇති බැවින් එහි ජාත්‍යන්තර නොවන සන්නද්ධ ගැටුමක පැහැදිලි සම්බන්ධයක් ඇත.

ප්‍රතිඵල වශයෙන් මෙම ක්‍රියා යුද අපරාධවලට කේවල පුද්ගල අපරාධ වගකීම ලෙස යොදාගත හැකිය.[355]

**මානුෂවාදී නියෝජිතායතන සහ සහන හා ආධාර සපයන සංවිධාන විසින් ප්‍රවේශය**

මානුෂවාදී ක්‍රියාමාර්ග පාලනය කෙරෙන ජාත්‍යන්තර

351. Kunarac et al, AJ ¶ 98; Blaškid, AJ ¶ 100; but see Situation in the Republic of Kenya, Case No ICC-01/09- 01/1, Decision Requesting Observations on the Place of the Proceedings for the Purposes of the Confirmation of Charges Hearing, Pre-Trial Chamber II, 6 Mar,2011; William Samoei Ruto et al, Case No ICC-01/09-01/11, Dissenting Opinion by Judge Hans-Peter Kaul to Pre Trial Chamber II's 'Decision on the Prosecutor's Application for Summons to Appear for William Samoei Ruto, Henry Kiprono Kosgey and Joshua Arap Sang', 15 Mar 2011.

352. රෝම ප්‍රඥප්තිය, 7(2) වගන්තිය, අපරාධයන්ගේ මූලාංග (n 85), 7වැනි වගන්තියට හැඳින්වීම

353. 'Civilian injured in Madhu claymore attack dies', https://tamilnet.com/art.html?catid=13&artid=17964

354. 'Military transformed from victor to reconciler', ධනේශී යටවර, 8 සැප්තැම්බර් 8, 2013, Sunday Observer Lanka, http://archives.sundayobserver.lk/2013/09/08/sec03.asp 'ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ යුද විරුවන්ට ආචාර කරයි' - Business Today, - ගොණුගත ලේඛන

355. Art 8(2)(e)(i) of the ICC Statue, ICTY, Tadi? case, Case No IT-94-1-AR72, Decision on the Defence Motion for Interlocutory Appeal on Jurisdiction, Appeals Chamber, 2 Oct 1995, §§ 100–118; ICRC, Rule 156, https://ihl-databases.icrc.org/en/customary-ihl/v1/rule156.

මානුෂවාදී නීතියේ රීති යටතට ගැනෙන මානුෂවාදී සේවාවන් සඳහා ප්‍රවේශය අරමුණු කොට ඇත්තේ සන්නද්ධ ගැටුමක ප්‍රතිඵලයක් වශයෙන් ආධාර සහ/හෝ රැකවරණය අවශ්‍යව සිටින තැනැත්තන්ගේ ජීවිත සහ ආරක්ෂාව සුරැකීම හෝ ඔවුන්ගේ මානසික සහ කායික සුබසිද්ධිය ප්‍රතිස්ථාපනය හෝ පවත්වාගෙන යාමයි.[356] ආනුෂංගිකව, රාජ්‍යයට ආධාර සැපයීම සිවිල් ජනයාට පමණක් සීමා කළ නොහැකි ය - තුවාල ලැබූ සහ රෝගාතුර වී ඇති සටන්කරුවන්, යුද සිරකරුවන් එසේ නැත්නම් සන්නද්ධ ගැටුම නිසා ඔවුන්ගේ නිදහස අහිමිභාවයට පත්වූ තැනැත්තන් සහ සන්නද්ධ ගැටුම නිසා පීඩාවට පත් වෙනත් තැනැත්තෝ ද එවැනි ආධාර ලැබීමට සුදුසුකම් ලබති.

**කිලිනොච්චිය - මානුෂීය ආධාර සැපයීම අවහිර කිරීම**

ගෝඨාභය රාජපක්ෂගේ ලිඛිත දැනුම්දීමකින් 2008 සැප්තැම්බර් මාසයේදී ආධාර සපයන සංවිධානවලට සහ එක්සත් ජාතීන්ට කිලිනොච්චිය අවටින් කාර්ය මණ්ඩලය ඉවත්කර ගන්නා ලෙස නියෝග කරන ලදී. යුද කලාපයෙන් ඉවත්ව යන ලෙස ඔවුන්ට පවසමින් ගෝඨාභය රාජපක්ෂ අත්සන් කළ සවිස්තරාත්මක ලිපි ලැබුණු රොයිටර් සහ ආධාර සපයන නියෝජිතායතන ගණනාවක් මෙය සහතික කළේය.[357] මෙය සිදුවූයේ මානුෂවාදී ආධාර බෙදාදීමට කිලිනොච්චිය සුරක්ෂිත කලාපයක් වන බව රජය, එල්ටීටීඊය මෙන්ම අන්තර්ජාතික ප්‍රජාව, පිළිගනිමින් සහ වටහාගෙන තිබියදීය. 2008 ජූලි සහ ඔක්තෝබර් අතරදී සිවිල් ජනතාව එහි සිටින බව හොඳින් දැන සිටියදීත් සිවිල් වැසියන් ගණනාවකට හානි ගෙනදෙමින් එක්සත් ජාතීන්ගේ ගොඩනැගිලිවලට සහ රෝහලට විශාල ලෙස හානිකරමින් කිලිනොච්චි රෝහලට සහ එක්සත් ජාතීන්ගේ කඳවුරට (‘Kilinochchi Box’හි) ශ්‍රී ලංකා යුද හමුදාව ෂෙල් ප්‍රහාර සහ බෝම්බ හෙලීම ආදී ප්‍රහාර ගැන වගකිව යුතු බව මෙම වාර්තාවේ අඩංගු සාක්ෂිවලින් තහවුරු වෙයි.[358] කිලිනොච්චියට ප්‍රහාර එල්ලකිරීමේදී ශ්‍රී ලංකා යුද හමුදාව මල්ටි බැරල් රොකට් ලෝන්චර් පවා යොදා ගත් බව ඇසින් දුටු සාක්ෂි අනුව පෙනී යයි.[359] යළි යළිත් ගුවනින් බෝම්බ හෙලීමෙන් සහ ෂෙල් ප්‍රහාරවලින්, තවද මල්ටි බැරල් රොකට් ලෝන්චර් (බොහෝ සිද්ධිවලදී , පාලනයකින් තොරව මුදා හරිනු ලැබූ නිවැරදිව නිසි ලෙස යොමු නොකළ අවි) යොදාගැනීමෙන් සාමාන්‍ය සිද්ධි මාලාවේදී සිවිල් ජීවිත හානි සහ සිවිල් වස්තු හානි විශාල ලෙස සිදුවන බව ශ්‍රී ලංකා යුද හමුදාව දැනසිටියේය.

සිවිල් ජනයාට එරෙහිව සහ සිවිල් සහ වෛද්‍ය වස්තු ඇතුළු කිලිනොච්චියට එල්ල කළ අවිචාරවත් ප්‍රහාර සිවිල් මරණ සහ තුවාල සිදුවීම් ගණනාවකට හා සිවිල් වස්තුවල විශාල හානියයකට හේතු විය. ඩිජිටල් සිතියම්, ගුවනින් ලබාගත් ඡායාරූප, නියමුවක් රහිත යානා සහ ආවේක්ෂණ ගුවන් යානාවලින් ලබාගත් දර්ශන ඇතුළු විශාල තොරතුරු ප්‍රමාණයක් පාදක කොටගත් රජයේ සම්පූර්ණ නිවැරදි ඉලක්කගත කිරීම මෙම අවිචාරවත් ප්‍රහාර හිතාමතා කරන ලද බව පෙන්වයි. ඉලක්කයකට පහරදීම අනුමත කිරීමේ ක්‍රියාවලිය ගුවන් හමුදාපති දක්වා ගිය බවත්, තත්වාකාරයෙන් තමන්ගේ පාලනය යටතේ පැවති සහ ඔහු සාමාන්‍යයෙන් එහි රැස්වීම්වල මුලසුන දැරූ ජාතික ආරක්ෂක කවුන්සිලය එය සමාලෝචනය කළ බවත් ගෝඨාභය රාජපක්ෂ සහතික කළේය.[360] මෙම ප්‍රහාර දැඩිව තහනම් කරන ලද ජාත්‍යන්තර මානුෂවාදී නීතිය බරපතල අන්දමින් උල්ලංඝනය කිරීම්වලින් සහ විශදතාවයේ සහ සමානුපාතයේ මූලධර්මය උල්ලංඝනය කිරීමකින්ද යුක්ත වන්නේය.[361]

රෝහලට සහ එක්සත් ජාතීන්ගේ කඳවුරට එල්ල කළ ප්‍රහාර ඇතුළු කිලිනොච්චිය ඉලක්ක කළ ප්‍රහාර සහ ඔහුගේ යටත් නිලධරයන් විසින් සිදුකරන ලද අපරාධ සම්බන්ධ තොරතුරු ගෝඨාභය රාජපක්ෂගේ සන්තකයෙහි සම්පූර්ණයෙන්ම පැවති බව මෙම වාර්තාවේ අඩංගු සාක්ෂිවලින් සනාථ කෙරෙයි. සිය යටත් නිලධරයන් ක්‍රියාකාරීව මෙහෙයවමින් සහ පාලනය කරමින් සිටි ඔහු සිය යටත් නිලධරයන් සිදු කළ උල්ලංඝන පිළිගැනීම හෝ ඔවුන්ට දඬුවම් කිරීමට වඩා යොමුවුණේ කිලිනොච්චිය අල්ලා ගැනීම සම්බන්ධයෙන් ඔවුන්ට ශුභාශිංසන පිරිනැමීමට ය.[362] කිලිනොච්චියේ සිදුකළ අපරාධවලට වගවීම සහතික කිරීමට අසමත්වීම ගෝඨාභයගේ අක්‍රියතාවයේ සෘජු ප්‍රතිඵලයකි.

මෙම වාර්තාවේ අඩංගු තොරතුරු සහ සාක්ෂි

356. https://casebook.icrc.org/a_to_z/glossary/humanitarian-assistance

357. ‘Besieged, Displaced, and Detained, The Plight of Civilians in Sri Lanka’s Vanni Region’, 23 Dec 2008, https://www.hrw.org/report/2008/12/23/besieged-displaced-and-detained/plight-civilians-sri-lankas-vanni-region

358. චාල්ස් පෙට්රි වාර්තාව, ඇමිණුම්, පිටුව 14

359. එම

360. https://www.jurist.org/news/2010/08/sri-lanka-defense-minister-defends-government-conduct-during-civil-war/

361. https://casebook.icrc.org/a_to_z/glossary/distinction

362. https://www.jurist.org/news/2010/08/sri-lanka-defense-minister-defends-government-conduct-during-civil-war/

පාදකව, ගෝඨාභය රාජපක්ෂ බරපතල උල්ලංඝනය කිරීම් සඳහා විධානය පිළිබඳ වගකීම දරන බවට සාධාරණ කරුණු ඇති අතර ඔප්පු කළහොත්, ඒවා ඔහුගේ යටත් නිලධරයන් විසින් විශදතාවයේ සහ සමානුපාතයේ මූලධර්මය උල්ලංඝනය කරමින් සිදු කළ යුද අපරාධ සහ මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ ලෙස සලකනු ලැබිය හැකි අතර ඔහු ඊට සාපරාධී වගකීමෙන් බැඳෙනු ඇත.

**වධහිංසා තහනම**

සෑම වේලාවකදීත් සහ සියලු තත්වයන්හිදීත් ජිනීවා සම්මුති දැඩිව වධහිංසාව තහනම් කරයි. වධහිංසාව පිළිබඳව වන නිර්වචනයේදී, ජාත්‍යන්තර මානුෂවාදී නීතිය ජීවිතයට, සෞඛ්‍යයට, කායික හා මානසික සුබසිද්ධියට චේතනාන්විතව සිදුකරන සැහැසිකම්, මෙන්ම 'පෞද්ගලික ගරුත්වයට අවමාන කිරීම, විශේෂයෙන් සටන්වල නොයෙදෙන හෝ තවදුරටත් සටන්වලට සම්බන්ධ නොවන පුද්ගලයන්ට අවමන්කිරීම සහ ඔවුන්ගේ ආත්ම ගෞරවය කෙලෙසන ආකාරයෙන් සැලකීම' ඇතුළත්ය.[363] ජිනීවා සම්මුති V හි පොදු වගන්තිය 3 යටතේ එවන් ක්‍රියාවන් කිසිම වේලාවක කිසියම් හෝ තැනක සිදුකිරීම තහනම් කර ඇත. මෙම නිර්වචනය වධහිංසාව ශාරීරික හෝ මානසික වශයෙන් එහි සියලු ස්වරූපයන් ආවරණය කරයි. වධහිංසා කිරීමේ අපරාධය අවශ්‍ය වන චේතනාවෙන් සිදුකර ඇත්නම් එය යුද අපරාධයක් ලෙස සලකනු ලැබිය හැකි අතර එය ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ රෝම ප්‍රඥප්තිය ඇතුළු දෙමුහුන් සහ ජාත්‍යන්තර විනිශ්චය සභා නීතිවල සවිස්තරාත්මකව දක්වා තිබේ.[364] ජාත්‍යන්තර විනිශ්චය සභා සහ ආයතන කිහිපයක් ද ස්ත්‍රී දූෂණය සහ ලිංගික ප්‍රචණ්ඩත්වය වධයේ ස්වරූපයක් ලෙස පිළිගෙන ඇත.[365] වධහිංසා කිරීමේ අපරාධය මනුෂ්‍යත්වයට එරෙහි අපරාධයක් ලෙස සම්මත ජාත්‍යන්තර නීතිය යටතේ පිළිගනු ලැබ ඇත.[366]

ශ්‍රී ලංකාවේ යුද්ධය පැවති කාලයේදී සහ ඉන්පසු වකවානුවේදී වධහිංසා කිරීම් සිදුවී ඇත. ගෝඨාභය රාජපක්ෂගේ විධානය සහ පාලනය යටතේ පවත්වාගෙන ගිය අභ්‍යන්තර වශයෙන් අවතැන්වූ තැනැත්තන්ගේ කඳවුරුවලදී සහ පුනරුත්ථාපන කඳවුරුවලදීත් වධය පුළුල් ලෙස පැතිර තිබුණි. භාරවන දෙමළ ජාතිකයන්ට මෙන්ම එල්ටීටීඊය සමඟ සිටින හෝ කලින් සිටි හෝ එසේ නැත්නම් ඒ සංවිධානය සමඟ සම්බන්ධකම් පැවැත්වූ යැයි විශ්වාස කෙරෙන අයට එරෙහිව වධහිංසා සිදුකර ඇත. දෙමළ සිවිල් වැසියන්ට එරෙහිව වධ හිංසා කිරීම යුද්ධය අවසන්වීමෙන් පසුවද අඛණ්ඩව සිදු කෙරිණ.

ආරක්ෂක හමුදා සම්බන්ධයෙන් ගෝඨාභය රාජපක්ෂට තිබූ අණදීම සහ පාලනය නිසා, ආරක්ෂක හමුදා විසින් සිදුකරන ලද වධ හිසා පමුණුවීම් ගැන ඔහුගේ අපරාධ වගකීම පෙන්නුම් කිරීමට සහ ආරක්ෂක හමුදා විසින් වධ හිංසා පමුණුවීම් සිදුකරන බව සම්පූර්ණයෙන් දැනසිටි නිසා ආරක්ෂක හමුදා සාමාජිකයන්ට එරෙහිව ක්‍රියා මාර්ග ගැනීමට ඔහු අසමත්වීම පෙන්නුම් කිරීමට සැලකිය යුතු කරුණු ඇත. මෙම සිද්ධිවලදී වූ වධහිංසා කිරීම්, තහවුරු කළහොත්, යුද අපරාධ සහ මනුෂ්‍යත්යට එරෙහි අපරාධ ලෙස සලකනු ලබන අතර එයින් ඔහු ඊට සාපරාධී වගකීමෙන් බැඳෙනු ඇත.

**ස්ත්‍රී දූෂණය සහ වෙනත් ආකාරයේ ලිංගික ප්‍රචණ්ඩත්වය තහනම**

සන්දර්භය අනුව ගත්විට, ස්ත්‍රී දූෂණය සහ වෙනත් ආකාරයේ ලිංගික ප්‍රචණ්ඩත්වය යුද අපරාධ[367] හෝ මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ ලෙස සලකනු ලැබිය හැකිය.[368] එම ක්‍රියා රෝම ප්‍රඥප්තිය යටතේ පෞද්ගලික ගරුත්වයට අවමාන කිරීමක් ඇතුළු වෙනත් අපරාධ (යුද අපරාධයක් හෝ මනුෂ්‍යත්වයට එරෙහි අපරාධයක් ලෙස)[369] සහ වෙනත් අමානුෂික ක්‍රියා ද (මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ) තහවුරු කළ හැකිය.[370] ස්ත්‍රී දූෂණය සහ ලිංගික ප්‍රචණ්ඩත්වය සන්නද්ධ ගැටුමක[371] සන්දර්භය තුළ හෝ ඒ ආශ්‍රිතව

363. GIII Art 17, API Art 75.2, APII Art. 4.2

364. 8(2)(c) වගන්තිය

365. ස්ත්‍රී දූෂණය වධහිංසා ස්වරූපයන් ලෙස ජාත්‍යන්තර අපරාධ විනිශ්චය සභා,වධයට එරෙහි කමිටුව සහ ස්වාධීන විශේෂ නියෝජිතයන් ඇතුළු ජාත්‍යන්තර මානව හිමිකම් යාන්ත්‍රණ ගණනාවක් විසින් විසින් පිළිගෙන ඇත. බලන්න, Prosecutor v Akayesu, ICTR-96-4-T, Trial Judgment, 2 Sep 1998; ICTY Prosecutor v Kunarac, No IT-96-23, Trial Judgement, 22 Feb 2001; Committee Against Torture, General Comment No 2, Implementation of Article 2 by State Parties (CAT/C/GC/2), 24 Jan 2008.

366. Kaing Giiek Eav alias Duch, ECCC, para 353.

367. රෝම ප්‍රඥප්තිය, 8(2)(e)(vi) වගන්තිය

368. රෝම ප්‍රඥප්තිය, 7(1)(k) වගන්තිය (වෙනත් අමානුෂික ක්‍රියාවල මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ)

369. රෝම ප්‍රඥප්තිය, 8(2)(c)(ii) වගන්තිය

370. රෝම ප්‍රඥප්තිය, 7(1)(k) වගන්තිය

371. බලන්න, පොදු වශයෙන් 'ජාත්‍යන්තර අපරාධ අධිකරණය, 'සාපරාධී ක්‍රියාවල මූලාංග' (2011), 8 වැනි වගන්තියට හැඳින්වීම, පිටුව 13, ('සාපරාධී ක්‍රියාවල මූලාංග' සැළසුම් කර ඇත්තේ ජාත්‍යන්තර අධිකරණයට අධිකරණ බලයක් සහිත අපරාධ සම්බන්ධයෙන් නිර්වචනයට සහ ඒවා ආදේශ කිරීමට ආධාරක වනු පිණිසය - 9 වගන්තිය, රෝම ප්‍රඥප්තිය) Prosecutor v Ntaganda (No ICC-01/04-02/06), Trial Chamber VI, Judgment, 8 Jul 2019, paras 698-704, 716-717 and 726; ICTY, Prosecutor v Tadic? (No IT-94-1-A), Decision on the defence motion for interlocutory appeal on jurisdiction, 2 Oct 1995, 70 ඡේදය.

සිදුකරන ලද්දේ නම්, සැබවින්ම යුද සටන් සිදුවූ කාලයක හෝ ස්ථානයක දී මෙම ක්‍රියා සිදුකරන ලද බව පෙන්නුම් කිරීමේ අවශ්‍යතාවක් නැතත්, ඔවුන් ඒවාට සමීපව සම්බන්ධ නම්[372] සහ සන්නද්ධ ගැටුමක් පැවති බව තහවුරුකරන කරුණුමය තත්වයන් මෙම අපරාධය ඍජුව සිදුකළ පුද්ගලයා දැනසිටියේ නම්, යුද අපරාධ සනාථ කරයි.[373]

ස්ත්‍රී දූෂණයද ඇතුළත්ව, ලිංගික ප්‍රචණ්ඩත්වය ව්‍යවහාරික සහ සම්මුති පාදක ජාත්‍යන්තර මානුෂවාදී නීතිය[374] සහ ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය[375] යන දෙකම යටතේ දැඩිව තහනම් කර ඇත. පුළුල් ලෙස පැතුරුන හෝ ක්‍රමානුකූලව සිවිල් ජනගහනයකට එරෙහි ප්‍රහාරයක කොටසක් ලෙස සිදුකරන ලද විට ස්ත්‍රී දූෂණය මනුෂ්‍යත්වයට එරෙහි අපරාධයක් ලෙස ව්‍යවහාරික ජාත්‍යන්තර නීතිය යටතේ පිළිගෙන ඇත. ජාත්‍යන්තර විනිශ්චය සභා සහ ආයතන ගණනාවක් ද ස්ත්‍රී දූෂණය සහ ලිංගික ප්‍රචණ්ඩත්වය වධ හිංසාකිරීමේ ආකාරයක් ලෙස පිළිගෙන ඇත.[376]

ආරක්ෂක හමුදා විසින් වින්දිතයන් ගණනාවකගේ ගුදමාර්ගය තුළට (i) ඔවුන්ගේ ලිංගේන්ද්‍රියන් (පුරුෂ ලිංගය) සහ වීදුරු බෝතල් හා කටුකම්බි පයිප්ප ඇතුළු වෙනත් වස්තු රිංගවමින්; (ii) වින්දිතයන්ගේ මුඛයට ඔවුන්ගේ ලිංගේන්ද්‍රියන් (පුරුෂ ලිංගය) ඇතුල්කරමින් දූෂණය කිරීමේ යෙදුණු බව මෙම වාර්තාවේ සාක්ෂිවලින් තහවුරු කෙරේ.[377] ඔවුන් අන්තර් ජාතික නීතිය යටතේ පිළිගෙන ඇති වෙනත් ආකාරයේ ලිංගික ප්‍රචණ්ඩත්වයට, නම් වශයෙන් දක්වන්නේ නම්, බලහත්කාරයෙන් නිර්වස්ත්‍ර කිරීම හා සිහින් යකඩ කූරු ඔවුන්ගේ පුරුෂ ලිංග තුළට ඇතුල්කිරීම, මුගුරුවලින් ඔවුන්ගේ ලිංගේන්ද්‍රියන් තැලීම, ඔවුන්ගේ ලිංගේන්ද්‍රියන් පිළිස්සීම ඇතුළු ලිංගේන්ද්‍රියන් ඡේදනය කිරීම් ය.

ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදා විසින් බලහත්කාරයෙන්, බලහත්කාර තර්ජනයෙන්, හෝ ප්‍රරෝධනයෙන් මෙම ක්‍රියා සිදුකර ඇත්තේ වින්දිතයන් අත්තනෝමතික ලෙස සහ අන්‍යයන් සමඟ සන්නිවේදනයෙන් බැහැරකොට රඳවාගන සිටි තත්වයන්හිදී ආරක්ෂක හමුදා ප්‍රරෝධක පරිසරයක් තුළ වාසි ලබාගත් බව පෙන්නුම් කරමිනි.

ඔහුගේ අණ සහ පාලනය යටතේ සිටි යටත් නිලධරයන්, සන්නද්ධ ගැටුම තුළ සහ විශේෂයෙන් යුද්ධයේ අවසන් දිනවලදී, දෙමළ කාන්තාවන්, පුරුෂයන් සහ ළමයින් බාරවෙමින් සිටින විට, මෙන්ම යුද්ධයෙන් පසු කාලයේදී ආරක්ෂක හමුදා විසින් සිදුකරමින් සිටි ස්ත්‍රී දූෂණ සහ ලිංගික හිංසන ඇතුළත් උල්ලංඝනය කිරීම් ගැන ගෝඨාභය මුළුමනින්ම දැනසිටියේය. ඊට අතිරේකව, ආරක්ෂක ලේකම් වශයෙන් ඔහුගේ අණදීම යටතේ සිටි ආරක්ෂක හමුදා අභ්‍යන්තරව අවතැන්වූ තැනැත්තන් වෙනුවෙන් වූ කඳවුරුවලදී මෙන්ම එල්ටීටීඊ සාමාජිකයන්, දේශපාලන ප්‍රතිවාදීන් සහ එල්ටීටීඊ යට දුරස්ථව සම්බන්ධ අය ඉලක්කගත කිරීමට පිහිටුවන ලද 'පුනරුත්ථාපන කඳවුරුවල'දී සිදුවූ ස්ත්‍රී දූෂණ සහ වෙනත් ආකාරයේ ලිංගික හිංසන සම්බන්ධයෙන් වගකිව යුතුය. ගැටුමෙන් පසුවද ජාත්‍යන්තර මානුෂවාදී නීතිය සහ ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය සහ ජාත්‍යන්තර අපරාධ නීතිය උල්ලංඝනය කරමින් ආරක්ෂක හමුදා විසින් සිදුකරන ස්ත්‍රී දූෂණ සහ ලිංගික හිංසන දිගටම සිදුවිය.

372. Prosecutor v Ntaganda, ICC-01/04-02/06, Trial Judgment, 8 Jul 2019, para 731

373. ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ 'සාපරාධී ක්‍රියාවල මූලාංග', 8වැනි වගන්තියට හැඳින්වීම

374. ECtHR, M C v Bulgaria, Application no 39272/98, Judgment, 4 Dec 2003, paras 148-166; ECtHR, Aydin v Turkey, Application no. 23178/94, Judgment, 25 Sep 1997, paras 82-86; Inter-American Commission on Human Rights, Case 10.970 (Peru), Report, 1996, p185; UN Committee Against Torture, T A v Sweden, CAT/C/34/D/226/2003, 27 May 2005, paras 2.4 and 7.3; Committee on the Elimination of Discrimination against Women, 'General recommendation No 35 on gender-based violence against women, updating general recommendation No. 19', 26 Ju 2017, paras 10-20.

375. ස්ත්‍රී දූෂණය සහ ලිංගික ප්‍රචණ්ඩත්වය වධ හිංසා ස්වරූපයන් ලෙස ජාත්‍යන්තර අපරාධ විනිශ්චය සභා, වධ හිංසාවන්ට එරෙහි කමිටුව සහ ස්වාධීන විශේෂ නියෝජිතයන් ඇතුළු ජාත්‍යන්තර මානව හිමිකම් යාන්ත්‍රණ ගණනාවක් විසින් විසින් පිළිගෙන ඇත. නිදසුන් ලෙස බලන්න, Prosecutor v Akayesu, ICTR-96-4-T, Trial Judgment, 2 Sep 1998; ICTY Prosecutor v Kunarac, No IT-96-23, Trial Judgement, 22 Feb 2001; Committee Against Torture, General Comment No 2, Implementation of Article 2 by State Parties (CAT/C/GC/2), 24 Jan 2008.

376. ජාත්‍යන්තර අපරාධ විනිශ්චය සභා ඇතුළු ජාත්‍යන්තර මානව හිමිකම් යාන්ත්‍රණයන් බොහෝමයක් විසින් ස්ත්‍රී දූෂණය සහ ලිංගික ප්‍රචණ්ඩත්වය වධහිංසා පැමිණවීමේ ආකාරයන් බව පිළිගෙන තිබේ. Committee Against Torture and by independent special rapporteurs. See eg Prosecutor v Akayesu, ICTR-96-4-T, Trial Judgment, 2 Sep 1998; ICTY Prosecutor v Kunarac, No IT-96-23, Trial Judgement, 22 Feb 2001; Committee Against Torture, General Comment No 2, Implementation of Article 2 by State Parties (CAT/C/GC/2), 24 Jan 2008.

377. සාවද්‍ය ස්ත්‍රී දූෂණය නම් (යුද අපරාධයක් හෝ මනුෂ්‍යත්වයට එරෙහි අපරාධයක් ලෙස ) 'අපරාධය සිදුකරන තැනැත්තා විසින් වින්දිතයාගේ සිරුරෙහි යම් කොටසක හෝ අපරාධකරුගේ ලිංගේන්ද්‍රිය සමඟින් හෝ යම් වස්තුවකින් වින්දිතයාගේ ගුද හෝ ජනනේන්ද්‍ර සිදුරට හෝ ශරීරයේ වෙනත් කොටසකට ගාහනයක් සිදුවන හැසිරීමකින්, නින්දා සහගත, ලෙස තැනැත්තෙකුගේ සිරුර ආක්‍රමණය කිරීම; සහ කෙසේ වුවත් එම ආක්‍රමණය හිංසනයක, සංත්‍රාසයක, රඳවාගැනීමක, මානසික පීඩනයක හෝ බලය අනිසි ලෙස යොදාගැනීමක හෝ එවන් හෝ වෙනත් තැනැත්තෙකුට බිය ඇති කරන බලාත්කාරයෙන් හෝ තර්ජනයෙන් හෝ බලකිරීමෙන් හෝ බලකළ හැකි පරිසරයක ප්‍රයෝජන ගනිමින් හෝ නිර්ව්‍යාජව කැමැත්ත දිය නොහැකි තැනැත්තෙකුට එරෙහිව ආක්‍රමණය සිදුකර තිබිය යුතුය.'

ගෝඨාභය රාජපක්ෂ ආරක්ෂක හමුදාවලට අණදීම සහ පාලනය සැළකිල්ලට ගන්නා විට, ඔහුගේ විධානය සහ පාලනය යටතේ ක්‍රියා කළ ආරක්ෂක හමුදා විසින් සිදුකරන ලද ස්ත්‍රී දූෂණ සහ ලිංගික හිංසන සම්බන්ධයෙන් ඔහුගේ විධාන වගකීම පෙන්වාදීමට සහ ඔවුන් විසින් සිදුකරන ලද උල්ලංඝන ගැන ඔහු තුළ පැවති සමකාලීන දැනුම සැළකිල්ලට ගන්නා විට, ඔවුන්ට එරෙහිව ක්‍රියාකිරීමට සහ ඔවුන් ඒවාට වගඋත්තරදායකයන් කිරීමට ඔහු අසමත්වීම පෙන්නුම් කිරීමටද සැළකිය යුතු කරුණු ඇත. මෙම තත්වයන් යටතේ ස්ත්‍රී දූෂණ සහ ලිංගික හිංසන යුද අපරාධ සහ මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ ලෙස සළකන අතර ඊට ඔහු අපරාධ වගකීමෙන් බැඳේ.

### යුද මුක්ත කලාප

අනතුරෙහි සිටින ජනතාවට විශේෂ රැකවරණ සැලසීම පිණිස ප්‍රදේශ හෝ කලාප නියම කිරීමට මානුෂවාදී නීතිය විසින් විවිධ ක්‍රමවේද ඇතිකර තිබෙන අතර ඒවා තුළ කිසිදු සටන් කිරීමක් සිදු නොවිය යුතුය.[378] මෙම කලාප පිහිටුවීමෙන් අපේක්ෂා කරන්නේ ගැටුම පවතින කාලයේදී සිවිල් ජනයාට, තුවාල සිදුවූවන්ට සහ රෝගාතුර වූ තැනැත්තන්ට ඉඳුම්හිටුම් සැපයීම ය. රෝහල් සහ සුරක්ෂිත කලාප හමුදා මෙහෙයුම්වලින් බැහැර කළ යුතු අතර, මධ්‍යස්තකෘත කලාප සාමාන්‍යයෙන් පිහිටුවනු ලබන්නේ හමුදා මෙහෙයුම් සිදුවන ප්‍රදේශවල ය.[379] ව්‍යවහාරික මානුෂවාදී නීතිය පිළිබඳව ජාත්‍යන්තර රතු කුරුස කමිටුව කළ අධ්‍යයනයේදී තහවුරු කළ පරිදි, සිවිල් ජනයාට, තුවාල සිදුවූවන්ට සහ රෝගාතුර වූ තැනැත්තන්ට සටන්වලින් රැකවරණ සැපයීමට පිහිටුවන ලද කලාපයකට ප්‍රහාරයක් යොමුකිරීම ජාත්‍යන්තර මානුෂවාදී නීතිය යටතේ තහනම් වන අතර ජාත්‍යන්තර නොවන සන්නද්ධ ගැටුමකට අදාළ වන ව්‍යවහාරික ජාත්‍යන්තර නීතියේ ප්‍රතිමානයක් උල්ලංඝනය කිරීමක් සනාථ කරයි.[380]

### තහනම් සහ අවිචාරවත් අවි භාවිතය තහනම

ජාත්‍යන්තර නොවන සන්නද්ධ ගැටුමකදී ඇතැම් තහනම් අවි, වස හෝ වස සහිත අවි, හුස්ම ගැනීම අවහිර කරන, විස හෝ වෙනත් ගෑස්වර්ග, සහ සියලු සමානකම් ඇති දියර, ද්‍රව්‍ය හෝ උපකරණ , මිනිස් සිරුරෙහි පහසුවෙන් පැතිරෙන හෝ සමතලාවන පතුරම්, මධ්‍යය මුළුමනින්ම ආවරණය නොවන දෘඪ කවරයක් සහිත හෝ කැපුම් පසාරුකරගෙන යන වැනි පතුරම් භාවිතය යුද අපරාධයක් ලෙස ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ නීති යටතේ වර්ගීකරණයක් කර ඇත.[381]

### යුද මුක්ත කලාපවල සිදු කරන ලද යුද අපරාධ සහ මනුෂ්‍යත්වය එරෙහි අපරාධ

2009 ජනවාරි 21 දා, ශ්‍රී ලංකා රජය සිවිල් ජනයා උදෙසා වර්ග කිලෝ මීටර් 35 ක යුද මුක්ත කලාපය-1 මුලතිව් දිස්ත්‍රික්කයේ A35 පාරේ උතුරෙහි උඩයාර්කට්ටු හන්දිය සහ මන්ජල් පාලම් (කහ පාලම) අතර ප්‍රදේශයේ ඒකපාර්ශවිකව ප්‍රකාශයට පත් කළේය.[382] යුදමුක්ත කලාපය-1 සෘජුව පිහිටා තිබුණේ ඉදිරියට ඇදෙන ශ්‍රී ලංකා යුද හමුදාවේ ප්‍රධාන අක්ෂය වූ කිලිනොච්චියේ සිට පුදුකුඩියිරුප්පු දෙසට A35 මහා මාර්ගය පසින් වූ අතර සටන් පවතින ප්‍රදේශයට කිට්ටුව තිබීම ගැන සලකා බලන විට එය ප්‍රශ්න සහගත විය.[383] දෙවැනි යුදමුක්ත කලාපය ('NFZ-2') 2009 පෙබරවාර් 12 දා ප්‍රකාශයට පත් කළේ වර්ග කිලෝ මීටර් 14 ක් පමණ වූ, දළ වශයෙන් විශාලත්වයෙන් ලන්ඩනයේ හයිඩ්පාක් පිට්ටනිය තරම් ප්‍රදේශයක රැස්වීමට සිවිල් ජනයා දිරිගැන්වීම පිණිස රජය විසින් අත්පත්‍රිකා බෙදාහැරීම සමගිනි.[384] දෙවැනි යුදමුක්ත කලාපය තුළ සාතිශය බහුතරය සිවිල් ජනයා වූ 330,000 පමණ පිරිසක් රැස්වී සිටියහ.

2009 මැයි 8 දා ශ්‍රී ලංකා යුද හමුදාව ඒකපාර්ශවිකව තුන්වැනි යුද මුක්ත කලාපය ප්‍රකාශයට පත් කළ අතර එය වර්ග කිලෝ මීටර් 2 කටත් අඩු ය[385]. තුන්වැනි යුද මුක්ත කලාපය පිහිටුවූ විට, අවතැන් වූ සිවිල් ජනයා සඳහා වූ ඉඩකඩ ඉතා සීමිත වූ බව වාර්තා වන අතර මිනිසුන්ට මළ සිරුරු මත නිදාගැනීමට බල කෙරිණ.[386] 2009 පෙබරවාරි මුල සිට, 2009 මැයි මාසයේ යුද්ධය නිමාවන තෙක් ශ්‍රී ලංකා යුද හමුදාව ජාත්‍යන්තර මානුෂවාදී නීතියේ

378. https://guide-humanitarian-law.org/content/article/3/protected-areas-and-zones/

379. ICRC, Rule 35, https://ihl-databases.icrc.org/customary-ihl/eng/docs/v1_rul_rule35

380. එම

381. 8(2)(e) වගන්තිය

382. ශ්‍රී ලංකා හමුදාව, 'Army Declares New Safe Zone for Wanni Civilians', 2009 ජනවාරි 21, http://www.army.lk/morenews.php?id=19769 , හියුමන් රයිට්ස් වොච් සංවිධානයේ 'War on the Displaced Sri Lankan Army and LTTE Abuses against Civilians in the Vanni' (2009), මැයෙන් යුත් වාර්තාවේ උපුටා දක්වා තිබේ. https://www.hrw.org/report/2009/02/19/war-displaced/sri-lankan-army-and-ltte-abuses-against-civilians-vanni#page

383. එම

384. OISL වාර්තාවේ 874 ඡේදය

385. OISL වාර්තාවේ 873 ඡේදය

386. W288

සමානුපාතිකතාව සහ විශදතාවයේ මූලධර්ම මුළුමනින්ම උල්ලංඝනය කරමින් හිතාමතා සිවිල් ජනතාව සහ රෝහල් සහ දේවස්ථාන වැනි සිවිල් වස්තු ඉලක්ක කරමින් අඛණ්ඩව කාලතුවක්කු ප්‍රහාර ඇතුළු ප්‍රහාර මාලාවක් සිදු කළේය.[387] 2009 මැයි 8-12 කාලයේදී තුන්වැනි යුද මුක්ත කලාපය ශ්‍රී ලංකා යුද හමුදාවේ කාලතුවක්කු ප්‍රහාර, ගුවන් හමුදාවේ සහ නාවික හමුදාවේ තියුණු ප්‍රහාරවලට දෛනිකව ලක්වූ බව එක්සත් ජාතීන්ගේ සංවිධානය වාර්තා කළේය.[388] පුදුකුඩියිරුප්පු, වල්ලිපුනම්, උඩයාර්කාඩු, පුදුමාතලන් සහ වෙල්ලමුල්ලිවයිකාල් ඇතුළු රෝහල් ෂෙල් සහ බෝම්බ ප්‍රහාරවලට ලක්විය.[389]

පුදුමාත්තලන් රෝහලට එල්ල කළ ප්‍රහාර රෝහල් සහ වෙනත් සිවිල් වස්තුවලට එරෙහිව ශ්‍රී ලංකා යුද හමුදාව විසින් කරන ලද උල්ලංඝනවල සංකේත වශයෙන් සැලකිය හැකිය. 2009 පෙබරවාර් 8 සහ 2009 අප්‍රියෙල් අග අතරතුරදී එම රෝහලට නැවත නැවත ප්‍රහාර එල්ල විය.[390] 58 සේනාංකය 2009 අප්‍රේල් මුලදී පුදුමාතලන් අල්ලාගැනීමේ මෙහෙයුමේ යෙදිණ.[391]

තුන්වැනි යුද මුක්ත කලාපයට ශ්‍රී ලංකා යුද්ධ හමුදාව, නාවික හමුදාව සහ ගුවන් හමුදාව එල්ල කළ දැඩි ප්‍රහාරවලට, පොකුරු යුද්ධෝපකරණ, සුදු පොස්පරස්, හා මෝටාර් යොදාගන්නා ලද අතර විශාල ලෙස සිවිල් ජනයාට හානි සහ දුක්පීඩා ඇති කළේය. තාවකාලික රෝහලට එල්ල කළ ප්‍රහාරය එක්සත් ජාතීන්ගේ චන්ද්‍රිකා ඡායාරූපවලින්[392] සහතික කළ අතර ITJP සංවිධානය ලබාගත් සාක්ෂිවලින්ද එය තහවුරු වෙයි.[393]

ආරක්ෂක හමුදා විසින් නිර්දය ලෙස හෙලන ලද ෂෙල් හා බෝම්බවලින් සියලු රෝහල්වලට බරපතල හානි සිදුවූ හෙයින් සිවිල් ජනයාගේ ජීවිත රැකගැනීම සඳහා ප්‍රතිකාර ලබාදීමේ හැකියාව දැඩිව සීමා කරනු ලැබුයේ සිවිල් වැසියන් සිය ගණනකට මහත් දුකට හෙලමින්, සිරුරට ශාරීරික හා මානසිකව බරපතල තුවාල සිදු කරමිනි.[394] නිර්දය ලෙස ෂෙල් හා බෝම්බ ප්‍රහාර සිදුකරන ලද්දේ මෙම රෝහල මගින් තුවාල ලැබූවන්ට, රොගාතුරව පසුවන්නන්ට, සිවිල් ජනතාවට සහ සටන් කළ නොහැකි තත්වයට පත්ව සිටින තැනැත්තන් සහ කලින් සිදු වූ ප්‍රහාරවලින් දිවි ගලවාගත් අයට ප්‍රතිකාර සේවා සපයන බව මුළුමනින්ම දැන සිටියදීය. මිනීමැරීම; බලහත්කාරයෙන් ජනගහනය මාරුකර යැවීම; සිරගතකිරීම හෝ වෙනත් බරපතල ශාරීරික වධ දීමෙන් හානිකිරීම; ලිංගික දූෂණය සහ වෙනත් ආකාරයේ ලිංගික ප්‍රචණ්ඩත්වය; බලාත්කාරයෙන් අතුරුදහන්කිරීම; හිංසාකිරීම; මූලෝත්පාථනය සහ චේතනාන්විතව සුවිශාල දුක් ගැහැට ගෙන දෙන අවමන් සහගත ලෙස සැලකීම හෝ ශරීරයට හෝ මනසට හෝ කායික සෞඛ්‍යයට බරපතල තුවාල සිදුකිරීම වැනි 7 වගන්තිය යටතේ ලැයිස්තු ගත කර ඇති ක්‍රියාවන්ට සමාන ලක්ෂණ දරණ සහ සමාන කළ හැකි බැරෑරුම්කමක් වින්දිතයන් අත්දුටු හානියෙහි ඇත.

මෙම ප්‍රහාර සිවිල් ජනගහනයට එරෙහිව යොමු කළ පුළුල් ලෙස පැතිරගිය සහ ක්‍රමානුකූල පහරදීමක අංගයක් සකස්කරයි. ඉලක්ක කරන ලද කිසිම පහසුකමක් නීත්‍යානුකූල හමුදා වස්තුවක් සංස්ථාපනය නොකරයි. එම පහසුකම් ඒවා ඉලක්ක ගතකරන අවස්ථාවේදී වෛද්‍ය අරමුණු වෙනුවෙන් පාවිච්චි කරමින් තිබූ බවත්, එම පහසුකම් මගින් ළමයින් ඇතුළු තුවාල ලබා සිටි සිය ගණනකට ප්‍රතිකාර ලබාදෙමින් පැවති බවත් ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ ප්‍රකාශ සහ සාක්ෂිකරුවන් දක්වන කරුණුවලින් සහතික කෙරෙයි. එල්ටීටීඊය මෙම පහසුකම් ඇතුළත සිට හෝ ඔවුන් ආසන්නයේ සිට වෙඩි තබමින් සිටි බවට හෝ එම ප්‍රදේශයේ වෙනත් හමුදා වස්තු තිබූ බවට හෝ සාක්ෂි නොමැත.

මානව හිමිකම් උල්ලංඝන පිළිබඳ චෝදනාවලට රජය විසින් ප්‍රතිඋත්තර දෙනු ලැබුවේ එම ප්‍රදේශයේ එල්ටීටීඊය රැඳී සිටි බව සහ ඔවුන් පවසන පරිදි, සිවිල් ජනයා 'පලිහක්' ලෙස යොදා ගනිමින් විශාල ජනගහනයක් සිටි පෙදෙසක හමුදා වස්තු ස්ථාපිත කරමින් එල්ටීටීඊය බරපතල අන්දමින් ජාත්‍යන්තර මානුෂවාදී නීතිය උල්ලංඝනය කරන නිසා 'සිවිල් ජනයා මුදාගැනීමේ' අවශ්‍යතාව අනුව යුද මුක්ත කලාපවලට ප්‍රහාර එල්ල කිරීම නීත්‍යානුකූල බව පවසමිනි.[395] ICTY නීති මීමංසාවට අනුව, 'සිවිල් ජනයා යන අර්ථ නිරූපනය යටතට නොගැනෙන

387. පොක්කනෙයි ආහාර බෙදන ස්ථානයකට එල්ල කළ පහරදීම් 2ක් විස්තර කරන සාක්ෂි බලන්නඃ මෙම වාර්තාවේ පිටුව 18 ; පුදුමාත්තලන් රෝහලට එදිරිව කළ පහරදීමක් විස්තර කරන සාක්ෂි බලන්නඃ මෙම වාර්තාවේ පිටු 26-28 ; වලයන්මඩම් පල්ලියට සහ රෝහලට එදිරිව ප්‍රහාරය පිටු 37-39; මුල්ලිවයික්කාල් රෝහලට එදිරිව ප්‍රහාරය, මෙම වාර්තාවේ පිටුව 43

388. OISL වාර්තාවේ 878 ඡේදය

389. පොක්කනෙයි ආහාර බෙදන ස්ථානයකට එල්ල කළ පහරදීම් 2ක් විස්තර කරන සාක්ෂි බලන්නඃ මෙම වාර්තාවේ පිටුව 18 ; පුදුමාත්තලන් රෝහලට එදිරිව කළ පහරදීමක් විස්තර කරන සාක්ෂි බලන්නඃ මෙම වාර්තාවේ පිටු 26-28 ; වලයන්මඩම් පල්ලියට සහ රෝහලට එදිරිව ප්‍රහාරය පිටු 37-39; මුල්ලිවයික්කාල් රෝහලට එදිරිව ප්‍රහාරය, මෙම වාර්තාවේ පිටුව 43

390. ඇමුණුම 3ඃ W59

391. ඇමුණුම 2

392. මෙම වාර්තාවේ 42 පිටුව

393. උදාඃ W280, W288, W292, W289, W60 මෙම වාර්තාවේ පිටු 42-44

394. OISL වාර්තාවේ 1145-1160 ඡේද

395. එම

තැනැත්තන් සිවිල් ජනගහනය අතරට පැමිණ සිටීමෙන් එම ජනගහනයට එහි සිවිල් ජන ලක්ෂණය අහිමිවීමක් සිදු නොවෙයි'.[396]

මෙම වාර්තාවේ සාක්ෂි පාදක කරගත්විට, ආණ්ඩුව සිතාමතා අවතැන් ජනතාවට යුද මුක්ත කලාපයට රැස්වන ලෙසට නියෝග කළා පමණක් නොව, සිදුවිය හැකි ප්‍රහාර ගැන අනතුරු ඇඟවීමට අසමත් වී ඇති බව සහ ඇතැම් අවස්ථාවලදී සැබෑ ලෙස ගැටුම් සිදුවන ආකාරය පිළිබඳව ශ්‍රී ලංකා යුද හමුදාව සිතාමතා සිවිල් ජනයා නොමඟ යැවූ බව විශ්වාස කිරීමට සැලකිය යුතු තරම් කරුණු ඇත. පොක්කනෛ යුද්ධයේ අවසන් අදියරේ ඇතැම් අවස්ථාවකදී, දින දෙකකට ෂෙල් ප්‍රහාර නතරකරන බව ශ්‍රී ලංකා හමුදාව ශබ්ද විකාශන මගින් නිවේදනය කළ බවත්, එහි ප්‍රතිඵලය ලෙස ජනතාව ඔවුන්ගේ නවාතැන්වලින් පිටත්ව ගිය බවත් සාක්ෂිකරුවෙක් ප්‍රකාශ කළේය. එසේවූවත්, ෂෙල් ප්‍රහාරයක් මිනිසුන් ගණනාවක් මතට වැදී ඔවුන් සියල්ලන්ම මියයනු දුටු බව එම තැනැත්තාම පැවසීය.[397] යුද මුක්ත කලාපවලට පහරදීමට සැලසුම් කරන අතරතුරදී, ශ්‍රී ලංකා යුද හමුදාව, ඉතාම අවම වශයෙන්, තමන් ඊනියා 'ආරක්ෂිත කලාපවලට' පහරදීමට අදහස්කරන බව අවතැන් ජනතාවට අනතුරු ඇඟවීමක් කළ යුතුව තිබුණි. එවන් අනතුරු ඇඟවීමක් කිසිදා නිකුත් කර ඇති බව පෙනෙන්නට නැත.[398]

ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදා පොකුරු යුද්ධෝපකරණ සහ සුදු පොස්පරස් යොදාගැනීම ජාත්‍යන්තර මානුෂවාදී නීතිය බරපතල අන්දමින් උල්ලංඝනය කිරීමක් සනාථ කරන්නේ පමණක් නොව, මේ ආකාරයේ අවි මෙන්ම ආර්.පී.ජී. අවි අධික ලෙස ජනයා සිටින සිවිල් ප්‍රදේශයකදී යොදාගැනීම ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදා විසින් විශදතාව, පූර්වාරක්ෂාව සහ සමානුපාතිකතාව පිළිබඳ මූලධර්ම පැහැදිලි ලෙස උල්ලංඝනය කිරීමක් ද වෙයි.

යුද මුක්ත කලාප පුරා විසිරී සිටි 330,000 කින් පමණ සමන්විත මූලික වශයෙන් සිවිල් ජනයා ඉලක්ක කරමින් ශ්‍රී ලංකා යුද හමුදාව විසින් ප්‍රහාර සිදුකරන ලද්දේ පුළුල් ලෙස පැතිරුණ සහ ක්‍රමානුකූල පහරදීමක කොටසක් ලෙස බව විශ්වාස කිරීමට සැලකිය යුතු තරම් කරුණු ඇති බව මෙම වාර්තාවේ අඩංගු සාක්ෂි සහතික කරයි. ඊට අමතරව, යුද මුක්ත කලාපවල සිවිල් ජනයා විශාල පිරිසක් සිටීම සහ එම ප්‍රදේශවල ඔවුන් සිටි සහ සිවිල් වස්තු තිබූ ස්ථාන හරියටම සහතික කරගැනීමට බුද්ධි සහ ආවේක්ෂණ ප්‍රවේශය රජයට තිබූ නිසාද, යුද මුක්ත කලාපවල 330,000 ක සිවිල් ජනයා සිටින බව ආරක්ෂක හමුදා සම්පූර්ණයෙන්ම දැන සිටි බවද සැලකිල්ලට ගන්නා විට, ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදා විසින් ෂෙල් ප්‍රහාර, බෝම්බ හෙලීම්, පොකුරු යුද්ධෝපකරණ සහ සුදු පොස්පරස් සහ මෝටාර් යොදාගනිමින් පොක්කනෛ, පුදුමාත්තලන්, වලෛඥර්මඩම්, සහ ගැටුම අවසානය ආසන්නයේදී මුල්ලිවයික්කාල් හි සිදුකරන ලද ප්‍රහාර මාලාව, සම්පූර්ණයෙන්ම විසමානුපාතික වන්නේ මෙන්ම විශදතා සහ සමානුපාත මූලධර්මය උල්ලංඝනය කරන්නේද වෙයි.[399]

සිවිල් ජනගහනයට එරෙහි පහරදීම් සිදුවූයේ වන්නි ප්‍රදේශය ඇතුළත හමුදා මෙහෙයුම්වලට සම්බන්ධ යුද්ධෝපාය තීරණ ගැන වගකීම ඇති ජාතික ආරක්ෂක මණ්ඩලයේ සහ ඒකාබද්ධ මෙහෙයුම් මූලස්ථානය ඇතුළත යුද්ධෝපාය මට්ටමේදී ගන්නා ලද තීරණ ප්‍රකාරව එවන් ප්‍රහාර සිදුකිරීමේ රාජ්‍ය හෝ ආයතනික ප්‍රතිපත්තිය අනුවය. සැලැස්මක් හෝ ප්‍රතිපත්තියක් පවතින බව නිගමනය කළ හැක්කේ ප්‍රහාරයේ ක්‍රමවත් ලක්ෂණවලින් සහ උපයෝජනය කළ සුවිශේෂී සම්පත්වලින් මෙන්ම යොදා ගත් බර අවි සහ සම්බන්ධවූ සේනාංක සංඛ්‍යාවෙනි.

මුල්ලිවයික්කාල් හමුදා මෙහෙයුමෙන් විශාල ලෙස සිවිල් ජීවිත හානි (පිරිමි, ගැහැනු සහ ළමයින් 'දහසකට වැඩි පිරිසක් මියගොස් සිටි දුටු බව' එක් සාක්ෂිකරුවෙක් සිහිපත් කරයි), සහ රෝහල් වැනි සිවිල් දේපළවලට හානි සිදුවිය.[400] ඊට අමතරව, හමුදා වස්තුවක් තහවුරු නොකළ රෝහල් ඉලක්ක කර ගසන ලද ප්‍රහාර රෝම ප්‍රඥප්තියේ 8 (2) (e) (iv) වගන්තිය යටතේ රැකවරණ ලත් වස්තුවලට පහරදීමේ යුද අපරාධය වන බවට විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇත.[401]

මෙම ප්‍රහාර මනුෂ්‍යත්වයට එරෙහි අපරාධයක් සහ රෝම ප්‍රඥප්තියේ 7(1)(k) වගන්තිය යටතේ වෙනත්

396. අතිරේක සංධානය II කෙටුම්පතට සම්මුතියෙන් යුතුව ඒ හා සමාන ප්‍රතිපාදනයක් ඇතුළත් කරන ලද නමුත් අවසන් කොටුම්පතෙන් සරලතාව උදෙසා එය අවසානයේදී ඉවත් කරන ලදී. https://ihl-databases.icrc.org/customary-ihl/eng/docs/v2_rul_rule6_sectionb. Prosecutor v Pavle Strugar, Case No IT-01-42-T, Judgement (TC), 31 Jan 2005, para 282. See also Tadic, Judgment, 7 May 1997, para 638 where the ICTY Trial Chamber stated ප්‍රකාශ කර සියේ'ඉලක්කරන(මනුෂ්‍යත්වය එරෙහි අපරාධයකදී) ජනගහනය අතිප්‍රමුඛව සිවිල් ස්වභාවයේ අය විය යුතු බව පැහැදිලිය. ඔවුන් මධ්‍යයේ ඇතැම් සිවිල්-නොවන තැනැත්තන් සිටීම එම ජනගහනයේ ලක්ෂණය වෙනස් නොකරයි.

397. W247 මෙම වාර්තාවේ පිටු 19-20

398. https://ihl-databases.icrc.org/en/customary-ihl/v1/rule15

399. නියමුවන් රහිත යානා සහ ආවේක්ෂණ දර්ශන සහ පූජකවරුන්, එක්සත් ජාතීන්ගේ සංවිධානය, ජාත්‍යන්තර රතු කුරුස කමිටුව, වෛද්‍ය කාර්ය මණ්ඩලය සහ වෙඩි මුක්ත කලාපයේ කොටුවී සිටි වෙනත් අය විසින් යවන ලද සන්නිවේදනවලට තිබූ ප්‍රවේශය.

400. W158 මෙම වාර්තාවේ පිටු 44

401. EoC, පිටුව 12

'අමානුෂික ක්‍රියා' ලෙස විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇත.

පොකුරු යුද්ධෝපකරණ සහ සුදු පොස්පරස් භාවිතය ජාත්‍යන්තර මානුෂවාදී නීතියේ බරපතල උල්ලංඝනය කිබ්විබ් සනාථ කරනවා පමණක් නොව, විශදතාවයේ සහ සමානුපාතිකතාවේ මූලධර්මයද උල්ලංඝනය කරයි.

එවැනි විශාල ජනගහනයක් ඇති ප්‍රදේශවලදී බර අවි යොදා ගැනීම සැලකිල්ලට ගන්නා විට, යුද මුක්ත කලාපවලට පහරදීමේදී සිවිල් ජනයා විශාල පිරිසක් මියගොස් තවත් අය තුවාල ලබන බව කලින් දැනගත හැකි බව, ගෝඨාභයට කෙළින්ම වාර්තා කරන ශ්‍රී ලංකා යුද හමුදාවේ ආඥාපතිවරු හොඳින් දැන සිටියහ. ඔහුගේ අණදීම යටතේ සිටි ආරක්ෂක හමුදා විසින් සිවිල් ජනයා මත සහ රෝහල් වැනි ආරක්ෂිත වස්තුවලට පහරදීමෙන් ඇති වන බලපෑම ගැන ගෝඨාභය රාජපක්ෂ දැන සිටියා පමණක් නොව කල්තබා දකින්නට ද ඇති අතර, ඒවා වැළැක්වීමට සහ ඒවා සම්බන්ධයෙන් ආරක්ෂක හමුදා වගවීමට ලක්කිරීමටද ඔහු අසමත් විය. 'යුද මුක්ත කලාපවල' දී සිවිල් වැසියන් ඝාතනය කර ඇති බව ඔහු පිළිගත් අතර එතකුදු වුවත් වාර්තාවලින් පවසා තිබුණේ 'රජය සුරක්ෂිත කොරිඩෝර සහ යුද මුක්ත කලාප නිර්මාණය කිරීම මාර්ගයෙන් ගැටුම් පවතින කලාපයේ සිවිල් ජනයා ආරක්ෂා කිරීමට සෑම උත්සාහයක්ම දැරූ' බවයි.

ජාත්‍යන්තර මානුෂවාදී නීතිය උල්ලංඝනය කිරීමක් තහවුරු කරන යුද මුක්ත කලාපවල සිදු කළ ප්‍රහාර යුද අපරාධ සහ මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ ලෙස සලකනු ලැබීමට හැකි අතර, තහවුරු කළහොත්, අපරාධ වගකීමකට ගෝඨාභය රාජපක්ෂ පුද්ගලිකවම සම්බන්ධ කරයි.

### දිවිපැවැත්මට නැතිවම බැරි වස්තු අහිමිභාවයට පත්කිරීම

යුද්ධයකදී සිවිල් ජනයා චේතනාන්විතව හාමතේ තැබීමට එරෙහිව පැහැදිලි තහනමක් ඇති අතර, පහරදීම, විනාශකිරීම, ඉවත්කිරීම, හෝ නිෂ්ප්‍රයෝජන තත්වයට පත්කිරීම යන උපක්‍රම මගින්, එම අරමුණ සඳහා, සිවිල් ජනතාවගේ දිවිපැවැත්ම පිණිස අත්හළ නොහැකි වස්තු, 'සටන්කිරීමේ ක්‍රමයක් ලෙස සිවිල් ජනයා හාමතේ තැබීම'[402] ඍජුවම තහනම් වෙයි; 'ආහාර ද්‍රව්‍ය, ආහාර නිෂ්පාදනය පිණිස වන කෘෂිකාර්මික ප්‍රදේශ, බෝග, සත්ව නිෂ්පාදන, පානීය ජල සම්පාදනාගාර හා සැපයුම් සහ වාරිමාර්ග වැඩ' මේ සියල්ල ප්‍රතිපාදන යටතේ ආරක්ෂිත සිවිල් වස්තු ලෙස සුදුසුකම් ලබයි.[403] සිවිල් ජනයා ඍජුව හාමතේ තැබීමට එරෙහි තහනම සම්බන්ධයෙන් මෙන්ම, ජාත්‍යන්තර සන්නද්ධ ගැටුම්වල සහ ජාත්‍යන්තර නොවන සන්නද්ධ ගැටුම්වල සියලු පාර්ශවකරුවන් මානුෂවාදී ආධාර ප්‍රවාහනයට අවසර දීමට නෛතික බැඳීමකට යටත්ව සිටින බව නිගමනය කිරීමට අවශ්‍ය තරම් සාක්ෂි අඩු වශයෙන් 1990 ගණන්වල සිට ලැබී තිබෙන බව ජාත්‍යන්තර රතු කුරුස කමිටුව සඳහන් කර තිබේ.[404]

වන්නියේ අසරණව සිටි ජනතාව වෙත වෛද්‍යාධාර ගෙනයාමට මානුෂවාදී ආධාර සපයන සංවිධානවලට සහ මානුෂවාදී ආධාර සපයන නියෝජ්‍යායතනවලට අවසරපත්‍ර නිකුත් කිරීමට ආරක්ෂක ලේකම් ලෙස ගෝඨාභය රාජපක්ෂ අසමත් විය. ඊට අමතරව, මුලතිව් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් කිහිප වතාවක් ඉල්ලීම් කර තිබුණත් ජනගහනයට දැඩි ලෙස අවශ්‍යව පවතින වෛද්‍ය සේවා සැපයීමට ඔවුන් සතු හැකියාව පීඩාවට පත් කරමින්, ඔහුගේ ක්‍රියාකාරී පාලනය යටතේ පැවති අමාත්‍යාංශය වෛද්‍ය සැපයුම් සඳහා අවශ්‍ය ආරක්ෂක නිෂ්කාශන ලබාදීමටද අසමත් වූ බව මෙම වාර්තාවේ සාක්ෂි මගින් තහවුරු කෙරෙයි.[405] මුලතිව් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයකු විවෘත ලිපියක් ලියමින් තර්ක කර තිබුණේ 'මූලික යටිතල පහසුකම් සහ අත්‍යවශ්‍ය බෙහෙත් සපයා තිබුණේ නම්' 2009 ජනවාරි සහ මාර්තු මැද කාලයේදී රෝහල්වලදී සිදුවූ මරණ 500 න් බොහොමයක් 'වළක්වාගත හැකිව තිබූ බවයි...අපට ප්‍රතිජීවක ඖෂධ, නිර්වින්දන ඖෂධ, සහ සේලයින් (IV fluid) එක බෝතලයක්වත් සපයා තිබුණේ නැහැ.'[406] වන්නි ප්‍රදේශයට සහන සැපයුම් ලබාදීම අවහිර කිරීමෙන් සිදුවිය හැකි විපාකය වන්නේ කුසගින්නෙන් මිනිසුන් මියයාම සහ තුවාල ලැබූ දහස් ගණනකට ප්‍රතිකාර කිරීමට නොහැකිවීම බව ගෝඨාභය හොඳින් දැන සිටියේය. එපමණක්ද නොව, යුද කලාපයට තවත් බෙහෙත් යවන ලෙස ආයාචනය කරමින් එක්සත් ජාතීන් එවූ ලිපියක පිටපතක් ගෝඨාභයටද යොමුකර තිබුණි.[407] විකිලීක්ස් විසින් හෙළිදරව් කළ මානුෂික ආධාරවලට එදිරිවාදී වූ ඔහුගේ ආකල්ප පෙන්නුම්

402. https://ihl-databases.icrc.org/en/customary-ihl/v1/rule53#title-3

403. 54(2) AP I වගන්තිය

404. මෙය ව්‍යවහාරික රෙගුලාසි 55 හි (අසරණව සිටින සිවිල් ජනතාවට මානුෂවාදී සහනවලට ප්‍රවේශය) සහ 56 (මානුෂවාදී සහන සේවාවල නියුක්තිකයන්ට යාම ඊම සඳහා නිදහස) පිළිබිඹු වෙයි.

405. 'රාජ්‍ය සහ රාජ්‍ය නොවන යන හමුදා යන දෙකම සහන අහිමිකිරීමට හෝ ඇතැම් ප්‍රදේශවලට පිවිසීමට අවසරදීම ප්‍රතික්ෂේප කිරීමට ඉඩඇත.' - ක්‍රිස්ටියා රොටෙන්සයිනර්, 'The Denial of Humanitarian Assistance as a Crime under International Law', International Review of the Red Cross, අංක 845, 555-582 පිටු

406. මෙම වාර්තාවේ 37 පිටුව

407. මෙම වාර්තාවේ 36 පිටුව

කෙරෙන ටෙලෙක්ස් පණිවුඩයකින් අනාවරණය කර තිබුණේ 2006 දී ඒ වන විටත් එල්ටීටීඊ අණසක යටතේ පැවති ප්‍රදේශවලට එක්සත් ජාතීන්ට, යුරෝපීය සංගමයට සහ ජාත්‍යන්තර රතු කුරුස කමිටුවට තවදුරටත් ප්‍රවේශයක් ලබාදීමට ගෝඨාභය 'මැලිකමක්' දැක්වූ බවයි.

මානුෂවාදී නියෝජිතායතනවලට වන්නි ප්‍රදේශයට ප්‍රවේශයක් ප්‍රතික්ෂේප කිරීම සහ ඒ සමග ඇඳුණු එම ප්‍රදේශයේ ආහාර සහ ඖෂධ හිඟය සම්බන්ධයෙන් පියවර ගැනීමට ගෝඨාභය අසමත්වීම නිසා වන්නි ප්‍රදේශයේ ජනතාවට හාමතේ සිටීමට සිදුවූ බව සහ ඔවුන්ට තම දිවිපැවැත්ම සඳහා අත්හළ නොහැකි වස්තු අහිමිභාවයට පත්කිරීමක් සිදුවූ බව සැකකිරීමට මෙම වාර්තාවේ සාක්ෂි පාදක කරගත්විට සාධාරණ හේතු පවතී. ඔහුගේ සක්‍රිය අණදීම සහ පාලනය යටතේ පැවති ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් සිදුකරන ලද ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ රථ පෙළකට එල්ල කළ ගුවන් ප්‍රහාරය,[408] මානුෂවාදී නියෝජිතායතන බියගැන්වීම අරමුණු කරගත්, මේ සම්බන්ධයෙන් වූ ඔහුගේ වගකීම තවදුරටත් ඒත්තු ගන්වයි.[409] මෙම කරුණු, සනාථ කළහොත්, යුද අපරාධ සහ මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ ලෙස සලකනු ලැබීමට හැකි අතර, අපරාධ වගකීමකට ගෝඨාභය රාජපක්ෂ පුද්ගලිකව සම්බන්ධ කරයි.

**ළඝු ඝාතන, වධහිංසා, ලිංගික දූෂණ සහ වෙනත් ස්වරූපයේ ලිංගික හිංසන**

සිය අවි බිම තැබූ සන්නද්ධ හමුදා සාමාජිකයන් සහ අසනීපවීම, තුවාල ලැබීම රඳවාගැනීම හෝ වෙනත් යම් හේතුවක් නිසා සටන් කළ නොහැකි තත්වයට පත්වූවන් ඇතුළු කිසිවකු කවර තත්වයක් යටතේ වුව ළඝු ලෙස මරණයට පත්කිරීම අනීතික ය.

මෙම වාර්තාවේ සාක්ෂි පෙන්වා දෙන්නේ 2009 මැයි 18 දා උදේ එල්ටීටීඊ දේශපාලන නායකයන් සහ ඔවුන් කැටුව පැමිණි තැනැත්තන් ආරක්ෂක හමුදා භාරය වෙත භාරවීමෙන් පසුව, ජාත්‍යන්තර මානුෂවාදී නීතියට, ජාත්‍යන්තර අපරාධ නීතියට සහ ජාත්‍යන්තර මානව හිමිකම් නීතියට පටහැනිව, වන්නි ආරක්ෂක හමුදා සාමාජිකයන් විසින් අනීතිකව මරාදමන ලද බවයි. ඔවුන්ගේ මරණ සිදුවන අවස්ථාවේදී, එල්ටීටීඊ දේශපාලන නායකයෝ, සෙසු සටන්කරුවන්ද සමඟ, සටන් කළ නොහැකි තත්වයට පත්වූවන් වූ අතර, භාරවීමේ තමන්ගේ අදහස පැහැදිලිව ප්‍රකාශ කර, නිරායුධව, රජයේ උපදෙස් පිළිපදිමින් සුදුකොඩි ඔසවාගෙන, ආරක්ෂක හමුදා දෙසට සෙමින් පයින් ඇවිද යමින් අවසානයේ ආරක්ෂක හමුදා භාරයට භාර වූවෝය.

අධිකරණ වෛද්‍ය සහ සාක්ෂිකරුවන්ගේ සාක්ෂි, වීඩියෝ සාක්ෂි, සහ විවෘත මූලාශ්‍ර සාක්ෂි ඇතුළු වෙනත් රැස්කළ සාක්ෂි පදනම් කොටගෙන මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයේ ශ්‍රී ලංකාව පිළිබඳ පරීක්ෂණයේ (OISL) වාර්තාව නිගමනය කර ඇත්තේ ආරක්ෂක හමුදා විසින් නඩේසන් සහ පුලිදේවන් මැයි 18 දා පෙරවරු 6:00 ට පසු මරණයට පත්කර ඇතැයි පිළිගැනීමට 'විශ්වාස කිරීමට සාධාරණ හේතු' ඇති බවයි.[410] ශවේන්ද්‍ර සිල්වා යටතේ පැවති 58 සේනාංකය මෙම මරණ ගැන වගකීම මුලින් බාරගත් නමුත්, රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ වෙබ් අඩවියෙන් එම සඳහන මකා දමා තිබිණ.

මෙම අනීතික ඝාතන පැහැදිලිවම භාරවන්නන් සහ සිවිල් ජනයා මැරීමේ චේතනාවෙන් හිතාමතා සිදුකරන ලද හෙයින් යුද අපරාධ ගනයේ ලා සැලකේ. ඔවුන් ආරක්ෂක හමුදා භාරයට භාරවීම, නිරායුධව සිටීම, සුදුකොඩි ඔසවාගෙන සිටීම සහ ඔවුන්ගේ භාරවීම ගැන රජයේ ඉහළම මට්ටමින් සාකච්ඡා පවත්වා තිබීම නිසා ස්ථිර වශයෙන්ම ඔවුන් සටන් කළ නොහැකි තත්වයට පත්වූවන් බව ආරක්ෂක හමුදාව සම්පූර්ණයෙන්ම දැන සිටියේය.

2009 මැයි 18 දා හෝ ඒ ආසන්නයේ එල්ටීටීඊ දේශපාලන නායකත්වය ඇතුළු 'සුදුකොඩි' ඔසවා ගත් බාරවූවන් ඝාතනය කිරීම, ජාත්‍යන්තර මානුෂවාදී නීතිය උල්ලංඝනය කිරීමක් සංස්ථාපනය කරන අතර යුද අපරාධයක් ලෙස සලකනු ලැබිය හැක්කේය.

මෙම අනීතික ඝාතන, ගෝඨාභය රාජපක්ෂගේ සක්‍රීය

408. D Marcus, 'Famine Crimes in International Law', 97 AJIL 245, 258 පිටුව

409. 'මානුෂවාදී සංවිධානවල වැඩ අවහිරකිරීමේ ඉතාමත්ම ඵලදායි විධිය වන්නේ ඔවුන්ගේ ආරක්ෂාව ගැන වගකිව නොහැකි බව සරලව ප්‍රකාශ කිරීමයි. සම්බන්ධ ඕනෑම අයෙකුට- රාජ්‍ය ආයතන, කැරලි හමුදා, වෙනත් රාජ්‍ය නොවන කණ්ඩායම්, කොල්ලකරුවන් හෝ සිවිල් ජනයා- සහන සේවාවල නියුක්තිකයන් හෝ රියැදුරන්ට බියගැන්වීමෙන් හෝ ඔවුන්ගේ සහන රැගත් රථපෙළවලට, නැව්වලට හෝ ගුවන් යානාවලට හෝ සහනසේවාවල නියුක්තිකයන් ට පහරදීමෙන් ආධාර බෙදාදීමට බාධා කළ හැකිය. ඇතැම් සිද්ධිවලදී, තමන්ට ලැබෙන සහනාධාර ලබාගැනීමට පැමිණෙන තැනැත්තන්ට දුර සිට ප්‍රහාර එල්ල කිරීම් සිදුවෙයි.' ක්‍රිස්ටියා රොටන්සයිනර්, 'The Denial of Humanitarian Assistance as a Crime under International Law', International Review of the Red Cross, අංක 845, 555-582 පිටු

410. ශ්‍රී ලංකාව පිළිබඳ මානව හිමිකම් මහා කොමසාරිස් කාර්යාලයේ විමර්ශනය, (OISL), A/HRC/30/CRP.2, 2015 සැප්තැම්බර් 16, 304 ඡේදය

විධානය සහ පාලනය යටතේ පැවති ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදා විසින් දෙමළ ජනගහනයට එරෙහිව යොදන ලද පුළුල් ලෙස පැතිර ගිය සහ ක්‍රමානුකූල ප්‍රහාරවල අංගයක් ලෙස සිදුකර ඇති බැවින් ඒවා මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ තහවුරු කිරීමක්ද වන්නේය.

ලසු ඝාතනවලට ගෝඨාභය රාජපක්ෂ නියෝග කළ බවත්, ඔහුට ඒවා ගැන සමකාලීන දැනුවත්වීමක් තිබියදීත් ඒවා වැළැක්වීමට පියවර නොගත් අතර ඒවාට වගකිවයුත්තන්ට එරෙහිව ක්‍රියා කිරීමට ඔහු අසමත් වූ බවටත් චෝදනා කෙරේ. මෙම උල්ලංඝනය කිරීම්, තහවුරු කළහොත්, යුද අපරාධ සහ මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ ලෙස සැලකිය හැකි අතර, අපරාධ වගකීමකට ගෝඨාභය රාජපක්ෂ පුද්ගලිකවම සම්බන්ධ කරයි.

**බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමට එරෙහි තහනම**

ශ්‍රී ලංකාව, සියලු තැනැත්තන් බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමෙන් ආරක්ෂා කිරීමේ ජාත්‍යන්තර සම්මුතියේ 2016 සිට රාජ්‍ය පාර්ශවයක් වන බැවින්, එයින් බලහත්කාරයෙන් අතුරුදහන්කිරීම ජාත්‍යන්තර අපරාධයක් කිරීමක් බවට පත්කිරීමට ශ්‍රී ලංකාව සිය දේශීය නීති පද්ධතිය යටතේ බැඳී සිටී.[411]

ලෝකයේ දෙවැනි තැනට වැඩිම අතුරුදහන්වීමේ සිද්ධි ඇති රට ශ්‍රී ලංකාවයි. බලහත්කාරයෙන් සහ ස්වකැමැත්තෙන් නොවන අතුරුදහන්කිරීම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරි කණ්ඩායම (WGEID) 1980 -2014 අතර බලාත්කාරයෙන් අතුරුදහන්කිරීම් පිළිබඳ පැමිණිලි 12,000 ක් ලියාපදිංචි කර ඇත.[412] ශ්‍රී ලංකා යුද්ධ හමුදාව, පොලීසිය (CID,TID, STF) සහ දෙමළ අතුරු හමුදා කල්ලි කණ්ඩායම් මෙම බලහත්කාර අතුරුදහන්වීම්වලින් බහුතරයකට වගකිවයුතු බවට චෝදනා ලබයි.[413]

ෆ්‍රැන්සිස් පියතුමා සහ සිවිල් වැසියන් සහ අවි බිම තැබූ හිටපු එල්ටීටීඊ සාමාජිකයන් සියගණනක් මැයි 18 දා හෝ ආසන්නයේ ආරක්ෂක හමුදා භාරයට භාරවීමෙන් පසුව ඔවුන්ට ඔවුන්ගේ නිදහස එම හමුදා විසින් අහිමි කරන ලද බව මෙම වාර්තාවේ දක්වා ඇති සාක්ෂි විස්තරවලින් පෙන්වයි. ITJP සංවිධානයට සාක්ෂි දුන් විවිධ සාක්ෂිකරුවන් ෆ්‍රැන්සිස් පියතුමා සහ තවත් සිය ගණනක් ආරක්ෂක හමුදා විසින් බස්රථවලට නංවනු දුටු නමුත් යළි කිසිදිනක ඔවුන් ආපසු දැකගන්නට ලැබී නැත. අතුරුදහන්වූවන්ගේ ඥාතීන් හේබියස් කෝපුස් පෙත්සම් ගණනාවක් ශ්‍රී ලංකාවේ උසාවි හමුවේ ගොනුකර ඇතත් ඉන් පලක් වී නැත්තේ ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සහ ආරක්ෂක හමුදා මෙම භාරවූ තැනැත්තන් අත්අඩංගුවට ගැනීම සහ/හෝ රඳවා ගැනීමක් නොකළ බව දිගටම කියා සිටින හෙයිනි. ඇතැම් අවස්ථාවලදී, කිසිම සාක්ෂියක් ඉදිරිපත් කිරීමක් හෝ යම් පරීක්ෂණයක් සිදු නොකර ඔවුන් තරයේ ප්‍රකාශකර සිටින්නේ සටන්වලදී ඔවුන් මියගොස් ඇති බව සහ නැත්නම් රටින් පැනගොස් ඇති බවයි.

සාක්ෂිවලින් පෙන්නුම් කරන්නේ මෙම අතුරුදහන්වීම් ආරක්ෂක හමුදා සාමාජිකයන් විසින් සිදුකරන ලද බවයි. ඔවුන්ගේ අරමුණ වූයේ, භාරවන අවස්ථාව වන විට ජීවත්ව සිට ඇති බවට ලියාපදිංචි කොට නැති හෙයින් සහ කලින් හෙළිකළ ස්ථානයකට ඔවුන් ප්‍රවාහනය නොකරන ලද නිසා, මෙම තැනැත්තන්, දිගු කාල පරිච්ඡේදයකට නීතියේ රැකවරණයෙන් ඉවත්කර තැබීමයි. මෙම බලහත්කාර අතුරුදහන්කිරීම් දෙමළ ජනගහනයට එරෙහිව දියත් කළ පුළුල් ලෙස පැතිරගිය සහ/හෝ ක්‍රමානුකූල ප්‍රහාරයක කොටසක් බව විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇත.

ඔවුන් ආරක්ෂක හමුදා භාරයට භාරදුන් තම ප්‍රියාදරයන්ට අත්වී ඇති ඉරණම ගැන තොරතුරු සොයන අතුරුදහන්වූ තැනැත්තන්ගේ පවුල්වල සාමාජිකයන් ද ඊට ප්‍රතිචාර වශයෙන් පලිගැනීම්, අතවර සහ රඳවාගැනීම්වලට ලක්වී ඇත. සත්‍ය දැනගැනීමට ඇති අයිතිය ඇතුළු මෙම උල්ලංඝන සඳහා ඵලදායී ප්‍රතිකර්මයකට වින්දිතයන්ට සහ ඔවුන්ගේ ඥාතීන්ට ඇති අයිතිය ප්‍රතික්ෂේප කෙරී ඇත.

මෙම වාර්තාවේ සාක්ෂි පදනම්කරගෙන, දෙමළ සිවිල් ජනගහනයට එරෙහිව පුළුල් ලෙස පැතිරගිය සහ/හෝ ක්‍රමානුකූල ප්‍රහාරයක කොටසක් ලෙස සිදුකරන ලද, එම ජනගහනයම ඉලක්ක කරගනිමින් ඒවා සිදු කරන ලද භූගෝලීය අවකාශය සහ කාල රාමුව සැලකිල්ලට ගන්නා විට, මෙම බලාත්කාර අතුරුදහන්කිරීම්වලට ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදා වගකිවයුතු බව විශ්වාස කිරීමට සාධාරණ කරුණු ඇත.[414] ගැටුම අවසානයේදී ඔවුන් විසින්ම යුද හමුදාවට භාරවීමෙන් පසුව අතුරුදහන් වූ

411. බලාත්කාරයෙන් අතුරුදහන්කිරීම්වලින් සියලුම තැනැත්තන් ආරක්ෂා කිරීමේ ජාත්‍යන්තර සම්මුතිය - 2 වගන්තිය

412. WEGID 2007, 2008, 2009 and 2010

413. OISL 412

414. OISL A/HRC/30/CRP.2, 16 Sep 2015, paras 1127-1128

තැනැත්තන් එල්ටීටීඊ හමුදාවලට සම්බන්ධව සිටීම හෝ සිටින බවට අනුමාන කිරීම නිසා හිතාමතා ඔවුන් ඉලක්ක කළ බව විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇත.

ජවිපෙ කැරළි සමයේ මාතලේ දිස්ත්‍රික් හමුදා සම්බන්ධීකාරක ලෙසින්ද, පසුව 2009 සිවිල් යුද්ධයේදීත්, 2009 යුද්ධය අවසානයේදී සහ ඊට පසුවත් සිදුකරන ලද බලාත්කාර අතුරුදහන්කිරීම්වලට ආරක්ෂක ලේකම් වශයෙන්ද ගෝඨාභය රාජපක්ෂ වගකිව යුතු බව මෙම වාර්තාවේ අඩංගු සාක්ෂි පෙන්නුම් කරයි. පැවති ක්‍රමය ගැන සහ ඔහුගේ විධානය සහ පාලනය යටතේ ක්‍රියාකරමින් ආරක්ෂක හමුදා සිදුකළ උල්ලංඝන ගැන ගෝඨාභයට පෞද්ගලිකව දැනුමක් තිබුණි. නිදහස අහිමිභාවයට පත් පත්කිරීම පිළිගැනීම හෝ අතුරුදහන්වූවන්ට අත්වූ ඉරණම ගැන හෝ ඔවුහු කොහේ සිටිත්දැයි යන්න ගැන තොරතුරු සැපයීම හෝ ඔහු විසින් ප්‍රතික්ෂේප කරනු ලැබීම සැලකිල්ලට ගත යුතු දෙයක් වන අතර එම ප්‍රතික්ෂේප කිරීම අතුරුදහන් වූ තැනැත්තන් සම්බන්ධයෙන් මේ දක්වා ශ්‍රී ලංකාවේ ආණ්ඩු කටයුතු කර ඇති ආකාරය දක්වන ප්‍රධාන ගති ලක්ෂණයකි.

මෙම වාර්තාවේ අඩංගු තොරතුරු සහ සාක්ෂි පදනම් කරගත්විට, ගෝඨාභයට ඔහුගේ යටත් නිලධරයන් සිදුකළ උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් විධාන වගකීමක් ඇති බව පිළිගැනීමට සාධාරණ කරුණු ඇති අතර, ඒවා තහවුරු කළහොත්, යුද අපරාධ සහ මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ ලෙස සලකනු ලැබිය හැකි අතර එය අපරාධ වගකීමකට ගෝඨාභය රාජපක්ෂ පුද්ගලිකවම සම්බන්ධ කරයි.

**සිරගත කිරීම හෝ ශාරීරික නිදහස දැඩි ලෙස අහිමි කිරීම**

පෞද්ගලික නිදහස සඳහා ඇති අයිතිය දේශපාලන සහ සිවිල් අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ (ICCPR) 9 වගන්තියෙන් අර්ථනිරූපනය කර ඇත.

**අත්තනෝමතික ලෙස රඳවා ගැනීම සහ අභ්‍යන්තර අවතැන්වූ තැනැත්තන්ගේ කඳවුරුවල සහ පුනරුත්ථාපන කඳවුරුවල අවතැන්වීම**

ජාත්‍යන්තර නොවන සන්නද්ධ ගැටුම්වලදී නිදහස අත්තනෝමතික ලෙස අහිමිභාවයට පත්කිරීමට එරෙහි තහනමට පදනම් වී ඇත්තේ ජාත්‍යන්තර මානව හිමිකම් නීතියයි. නිදහස සඳහා ඇති අයිතිය සමඟ අනුරූපව, අභ්‍යන්තරව අවතැන්ව සිටින තැනැත්තන් 'කඳවුරක හිරභාරයේ හෝ කඳවුරකට සීමා නොකළ යුතු,' අතර 'පරම වශයෙන් අවශ්‍ය' තාක් කල් පමණක් 'සුවිශේෂී තත්වයන්හිදී' සීමාකර තැබීමකට අවසර දිය හැකි බව අභ්‍යන්තරව අවතැන්වීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ මඟපෙන්වීමේ මූලධර්මවලින් පෙන්වා දේ. ජාත්‍යන්තර රතු කුරුස කමිටුව සඳහන් කරන්නේ එවන් තත්වයන් පවතින බව ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් පෙන්නුම් කර නැති බවයි.[415] අභ්‍යන්තරව අවතැන්වීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ මඟපෙන්වීමේ මූලධර්ම අවතැන්වූ තැනැත්තන් පිළිබඳ ආණ්ඩුවල බැඳීම් පිළිබඳව ප්‍රාමාණික ප්‍රමිති සපයයි. මෙම මූලධර්ම යටතේ, බලධරයන් විසින් අවතැන්වූ තැනැත්තන්ට 'අවම වශයෙන්' අත්‍යවශ්‍ය ආහාර හා පානීය ජලය ලබාගැනීමට, මූලික ඉඳුම්හිටුම් හා නිවාස, සුදුසු ඇඳුම්, සහ අත්‍යාවශ්‍ය වෛද්‍ය සේවා සහ සනීපාරක්ෂක පහසුකම් සඳහා සුරක්ෂිත ප්‍රවේශයක් සැපයිය යුතු ය.[416]

ගැටුම පවතිද්දී සහ ඉන් පසුව යන අවස්ථා දෙකේදීම සැබවින්ම එල්ටීටීඊ සම්බන්ධතා ඇති හෝ එසේ ඇතැයි සැක කෙරුණු හෝ දෙමළ වාර්ගික ජනතාව ගැන ලේඛනගත කෙරුණු අත්තනෝමතික ලෙස රඳවා ගැනීම් රෝම ප්‍රඥප්තියේ 7(1) වගන්තියේ අර්ථ දැක්වීම යටතේ තහනම් ක්‍රියා ලෙස ගැනෙන කටයුත්තකට සම්බන්ධ හැසිරීම් මාර්ගයක් සංස්ථාපනය කරයි.

ශ්‍රී ලංකා යුද හමුදාව විසින් පිහිටුවන ලද කඳවුරුවලින් පිටත නිදහසේ යාම් ඊම් සඳහා ඉඩනොදීමෙන් සහ අභ්‍යන්තර වශයෙන් අවතැන්වූ පවුල් වෙන්කිරීම මගින් අමානුෂික සහ වෙනස් සැලකිලි දැක්වීමෙන් ශ්‍රී ලංකා යුද හමුදාව විසින් අභ්‍යන්තර අවතැන්වීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ මූලධර්ම උල්ලංඝනය කරන ලදී[417]. තවද සැබෑ හෝ සැක කෙරුණු හෝ වත්මන් සහ හිටපු එල්ටීටීඊ සාමාජිකයන් අත්තනෝමතික අන්දමින් රඳවා ගැනීමට, වධහිංසාකිරීමට සහ ලිංගික හිංසනයට තුඩු දුන්, 2009 මැයි මාසයෙන් පසු සිදුකළ ඒවාද ඇතුළුව කඳවුරු ඇතුළතදී කරන ලද වෙනස්කම් පැමේ

415. සරණාගතයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් (UNHCR), 'අභ්‍යන්තර අවතැන්වීම සම්බන්ධයෙන් මඟපෙන්වීමේ මූලධර්ම' 22 Jul 1998, ADM 1.1, PRL 12.1, PR00/98/109, https://www.refworld.org/docid/3c3da07f7.html [accessed 13 Oct 2023]

416. එම

417. එක්සත් ජාතීන්ගේ 'අභ්‍යන්තර අවතැන්වීම සම්බන්ධයෙන් මඟපෙන්වීමේ මූලධර්ම' 14 සහ 17

සෝදිසි කිරීමේ ක්‍රියාවලි ජිනීවා සම්මුතියේ IIV, Art 3 and PII, Art 2 (2) උල්ලංඝනය කිරීමක් වෙයි. ජාත්‍යන්තර රතු කුරුස කමිටුවට සහ සරණාගතයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස්වරයාට මෙම පරීක්ෂා කිරීමේ ක්‍රියාදාමය නිරීක්ෂණය කිරීමට අවතැන්වූ තැනැත්තන් ගේ කඳවුරුවලට ප්‍රවේශ වීම ශ්‍රී ලංකා රජය විසින් තහනම් කිරීම ජිනීවා සම්මුතියේ I-IV, Art. 3 උල්ලංඝනය කිරීමක් වන්නේය.

අත්අඩංගුවට ගැනීමේ නිශ්චිත හේතුව දැනගැනීමේ අයිතිය, ස්වාධීන අධිකරණ අධිකාරියක් හමුවේ අත්අඩංගුවට ගැනීමේ නීත්‍යානුකූලභාවය අභියෝගයට ලක්කිරීමේ අයිතිය, නීති උපදේශකයන් සහ පවුලේ සාමාජිකයන්ට ප්‍රවේශයට ඇති අයිතිය ඇතුළුව අනීතිකව සිරගතකිරීම සහ නිදහස අහිමි කිරීම, මිනීමැරීම හා අත්තනෝමතික ලෙස රඳවාගැනීම මෙන්ම රැඳවියා අත්අඩංගුවට ගැනීමේ පදනම සහ ඔවුහු කොහේ සිටිත්දැයි ඔවුන්ගේ පවුල්වලට දැනුම්දීමට අසමත්වීම මාර්ගයෙන් ගෝඨාභය රාජපක්ෂගේ විධානය යටතේ ක්‍රියා කළ ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා රැඳවියන්ගේ මූලික අයිතිවාසිකම් නිරන්තරයෙන් උල්ලංඝනය කළ බව මෙම වාර්තාවේ සාක්ෂි මගින් පෙන්නුම් කෙරේ.

නීතිය හමුවට යාමට නිසි ක්‍රියාවලියක් සහ ප්‍රවේශයක් නැති නිසා බොහෝ රැඳවියන් වධ හිංසාවල හා අමානුෂික ලෙස සැලකීමේ වින්දිතයන් වීමේ හැකියාව පිළිබඳ බරපතල ගැටළුවක් මෙම උල්ලංඝන නිසා පැන නගී. තොරතුරු නොමැති බව සැලකිල්ලට ගත්විට, බොහෝ රැඳවියන් 'අතුරුදහන්වීමේ' අවදානමක්ද එහි තිබීමේ සැලකිය යුතු සම්භාවිතාවක් පවතී .

**'පුනරුත්ථාපන' කඳවුරු**

වධහිංසාව සහ ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳව 2014 දී ITJP සංවිධානය ඉදිරිපත් කළ පළමුවැනි වාර්තාව ('An Unfinished War( Torture and Sexual Violence in Sri Lanka 2009-2014') සඳහන් කළේ හිටපු සටන්කරුවන් සඳහා වූ ශ්‍රී ලංකා රජයේ ඊනියා 'පුනරුත්ථාපන වැඩසටහන්වලට' ඇතුල්වීමට හිටපු එල්ටීටීඊ සාමාජිකයන්ට බලකරන ලද බවයි. වධහිංසාවෙන් යුත් පුනරුත්ථාපන වැඩසටහනේ පුනරුත්ථාපනයක් තිබුනේ නැති තරම් බව මෙම වාර්තාවේ සාක්ෂි තහවුරු කරයි. 2010 ජනවාරි 21 දින, සරණාගතයන් පිළිබද එක්සත් ජාතීන්ගේ මහකොමසාරිස් කාර්යාලය එල්ටීටීඊ සමඟ පැවතියේයැයි කියන සම්බන්ධකම් නිසා වෙන්කර තබා 'පුනරුත්ථාපන මධ්‍යස්ථානවල' රඳවාගෙන 'සිටීමේ නීත්‍යානුකූලභාවය' ගැන කනස්සල්ල පළකරමින් 'දැනට පවතින සංඛ්‍යා අනුව 11,000 ට වැඩිපිරිසක් ඒවායේ සිටින නමුත් සත්‍ය සංඛ්‍යාව නොදන්නා' බව පවසමින් එම මධ්‍යස්ථානවලට ඇතුළුවීමට ජාත්‍යන්තර රතු කුරුස කමිටුවට ප්‍රවේශයක් සලසන ලෙස ආණ්ඩුවෙන් ඉල්ලා සිටියේය.[418]

එතැන් පටන් රජයේ පුනරුත්ථාපන වැඩසටහන වැරදි ලෙස රඳවා ගැනීමක් ලෙස, අත්තනෝමතික රඳවාගැනීම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරී කමිටුව සහ එය වසා දමන ලෙස ඉල්ලා සිටි එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිත හුවාන් මෙන්ඩෙස් විසින් ප්‍රකාශයට පත් කරන ලදී.

භාරවූවන්ට සැලකීම සම්බන්ධයෙන් ජාත්‍යන්තර නීතිවේදීන්ගේ කොමිසම (International Commission of Jurists - ICJ) ප්‍රකාශ කළේ නිදහස සඳහා, නිසි පටිපාටිය සඳහා සහ සාධාරණ නඩු විභායකට පෙනීසිටීම සඳහා ඇති අයිතිය උවදුරෙහි හෙළමින් 'රජයේ *'භාරවූවන්'* සහ 'පුනරුත්ථාපනය' පිළිබඳ 'තන්ත්‍රය ජාත්‍යන්තර නීතිය සහ ප්‍රමිති පිළිපැදීමට අසමත්වීම ගැන තම සංවිධානය කණස්සල්ලෙන් පසුවන බවයි. වධහිංසා සහ අතුරුදහන් කිරීම් ගැන ද චෝදනා ඇත.[419]

2015 දී, ITJP සංවිධානය ත්‍රිකුණාමලයේ රහසිගත වධකාගාරයක් පිහිටි තැනක්ද හඳුනාගත් අතර දිවිගලවාගත් තැනැත්තන්ගේ සාක්ෂි පාදක කරගනිමින් ජීපීඑස් ඛණ්ඩාංකද පළ කළේය. පසුව බලහත්කාරයෙන් හෝ ස්ව-කැමැත්තෙන් නොවන අතුරුදහන්වීම් පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම එම ස්ථානයේ චාරිකාවක යෙදී එය පැවති බවත් ITJP සංවිධානය විසින් ලබාදෙන ලද විස්තරත් තහවුරු කළේය.

අත්තනෝමතික ලෙස නිදහස අහිමි කිරීම මෙන්ම පුනරුත්ථාපනයේ අනිවාර්ය හා ස්ව-කැමැත්තෙන් නොවන ස්වභාවය, වධහිංසා සහ ලිංගික ප්‍රචණ්ඩත්වය ද ඇතුළත් අභ්‍යන්තර අවතැන්වූවන් ගේ කඳවුරුවලදී සහ පුනරුත්ථාපන කඳවුරුවලදී සිදුවූ මරණවලට සහ ගොරතර මානව හිමිකම් උල්ලංඝනය කිරීම්වලට ගෝඨාභය රාජපක්ෂගේ

418. පෙට්රි වාර්තාව, ඇමිණුම

419. අන්තර්ජාතික නීතිවේදීන්ගේ කොමිසම විසින් 2010 සැප්තැම්බර් ප්‍රකාශිත 'Beyond Lawful Constraints: Sri Lanka's Mass Detention of LTTE Suspects' සංක්ෂිප්ත වාර්තාවේ විධායක සාරාංශය

විධානය යටතේ තිබූ ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා වගකිවයුතු බව මෙම වාර්තාවේ සාක්ෂි තහවුරු කරයි.

මෙම බලෙන් පුනරුත්ථාපනය කිරීමට 'පුනරුත්ථාපනලාභියාගේ' නිදහස අහිමිකිරීම ඇතුලත් වූවාක් මෙන්ම සාපරාධී දෝෂණයකින් තොරව වෙන් වෙන්ව සහ සාමූහිකව දඬුවම් දීම, නෛතික සුරක්ෂාවන් නොදීම සහ, ඇතැම් අවස්ථාවලදී චෝදනාවක් නොමැතිව, නඩු විභාගයකට ඉදිරිපත් නොකර හෝ නෛතික නියෝජනවලට ප්‍රවේශයක් නොමැතිව හෝ වසර දෙකක කාලයක් දක්වා රඳවාගෙන සිටීම ඇතුළත් විය හැකිව තිබිණි.

මෙම වාර්තාවේ අඩංගු සාක්ෂි පාදක කරගත්විට, ඔහුගේ යටත් නිලධරයන් විසින් සිදුකරන ලද මෙම උල්ලංඝනය කිරීම්වලට ගෝඨාභයට වගකීම පැවරිය යුතු බව විශ්වාසකිරීමට සාධාරණ හේතු ඇති අතර, තහවුරු කළහොත්, යුද අපරාධ සහ මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ ලෙස සැලකිය හැකි අතර ඒවා අපරාධ වගකීමකට ගෝඨාභය රාජපක්ෂ පුද්ගලිකවම සම්බන්ධ කරයි.

## මිනීමැරීමට එරෙහි තහනම

ජාත්‍යන්තර මානුෂවාදී නීතිය, ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය හා ජාත්‍යන්තර අපරාධ නීතිය ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධයේ අවසන් අදියරේදී උල්ලංඝනය කිරීමේදී ගෝඨාභය රාජපක්ෂ දැරූ කේන්ද්‍රීය භූමිකාව මෙම වාර්තාවේ එන සාක්ෂිවලින් තහවුරු කෙරේ. ඒවා යුද සමයේත්, ඉන් පසු සමයේත් ජිනීවා සම්මුති කඩකිරීම්, ජාත්‍යන්තර මානුෂවාදී නීතිය හා ජාත්‍යන්තර අපරාධ නීතිය උල්ලංඝනය කිරීම් ගණයෙහි ලා සැලකේ. මිනීමැරීම, වධ හිංසනය සහ අමානුෂික සැලකීම, ඝාතනය, වංචනික භාවය, ලිංගික දූෂණය ඇතුළු වෙනත් ආකාරයේ ලිංගික ප්‍රචණ්ඩතා, නිදහස අහිමි කිරීම, බරපතල ශාරීරික හා මානසික හානිය සහ හාමතේ තැබීම ඇතුළු ගොරතර උල්ලංඝන ඊට ඇතුළත් වේ.

## මළසිරුරුවල විකෘතිකිරීමට එරෙහි තහනම

ජාත්‍යන්තර නොවන සන්නද්ධ ගැටුමකදී මියගියවුන් කෙලෙසනු ලැබීම වැළැක්වීම සඳහා ගතහැකි සියලු පියවර ගැනීමට ඇති බැඳීම ජිනීවා සම්මුතියේ දෙවැනි අතිරේක මුලලේඛයේ දක්වා තිබේ.[420]

මළවුන්ගේ සිරුරුවල අංගච්ඡේදනයට එරෙහි තහනම ජාත්‍යන්තර නොවන සන්නද්ධ ගැටුමකට අදාළ ජාත්‍යන්තර ව්‍යවහාරික නීතියේ රීතියක් ලෙස හඳුනාගෙන තිබේ.[421] ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ නීතිය ප්‍රකාර මළසිරුරු විකෘති කිරීමට එරෙහි තහනම 'පුද්ගලික ගරුත්වයට එරෙහි සැහැසිකම් සිදුකිරීමේ' යුද අපරාධයට අනුකූල වේ. සොල්දාදුවන් විසින් ජංගම දුරකථන මගින් ගන්නා ලද සිත කළඹන වීඩියෝ සහ ඡායාරූප නැරඹූ ශ්‍රී ලංකාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ විමර්ශනය කාන්තාවන්ගේ හා එල්ටීටීඊ සටන්කරුවන්ගේ කෙලෙසන ලද සිරුරුවලට සලකන ලද අවමන් සහගත ආකාරය අවධානයට ගනිමින් දක්වා සිටියේ රැඳවියන් පණ පිටින් සිටියදී අවමානයට හා නිග්‍රහයට පත්කළ ලිංගික අපචාරයේ පුළුල් සන්දර්භයෙහි ලා මේ දර්ශන සැළකිය යුතු බවයි.[422]

ගෝඨාභය රාජපක්ෂගේ විධානය හා සක්‍රීය පාලනය යටතේ වූ ආරක්ෂක සේනා විසින් කරන ලද සාපරාධී මළ සිරුරු කෙලෙසීම සහ අංගච්ඡේදනයට ඔහුගේ විධානය හා සක්‍රීය පාලනය යටතේ වූ ආරක්ෂක සේනා වගකිව යුතු බවද, මේ සිද්ධි සිදුවෙමින් පවතින බව දැන සිටියත්, ඒවා වළක්වන්නට හෝ ඊට වගකිවයුත්තන් වගඋත්තරදායක කරන්නට හෝ කිසිවක් නොකළ බවත් මේ වාර්තාවේ එන සාක්ෂිවලින් තහවුරු කෙරේ. පුද්ගලික ගරුත්වයට එරෙහි සැහැසිකමේ යුද අපරාධයට හා මානව වර්ගයාට එරෙහි අපරාධවලට ගැලපෙන ගෝඨාභයගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් ඔහු අපරාධ වගකීම උසුලයි.

## ළමා සොල්දාදුවන් බඳවාගැනීමේ තහනම

ශ්‍රී ලංකාව ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය 1991 දීත්, ළමයින් සන්නද්ධ ගැටුම්වලට සම්බන්ධවීම පිළිබඳ ළමා අයිතිවාසිකම් සම්මුතියේ විකල්ප මුලලේඛය 2000 දීත් අපරානුමත කළේය. එහෙයින්, ගැටුම පැවති කාලය වන විට ශ්‍රී ලංකාව ඒවායේ ප්‍රතිපාදනවලින් බැඳී සිටියේය.

ජාත්‍යන්තර නීතිය යටතේ සන්නද්ධ හමුදාවලට සහ සන්නද්ධ කණ්ඩායම්වලට ළමයින් බඳවා ගැනීමට එරෙහි තහනම ව්‍යවහාරික ජාත්‍යන්තර නීතියක්

420. අතිරේක මූලලේඛය II, 8 වගන්තිය (සම්මතියෙන් ස්ථිර කර ගන්නා ලදී)

421. ICRC, Rule 113, https://ihldatabases.icrc.org/customaryihl/eng/docs/v1_rul_rule113

422. ජාත්‍යන්තර අපරාධ අධිකරණ (ICC) ව්‍යවස්ථාවේ 8(2)(c)(ii) වගන්තිය, මේ අපරාධයට අදාළ ICC 'සාපරාධී ක්‍රියාවල මූලාංග', 27 පිට n49 සමග කියවන්න

බවට පත්වී ඇති අතර එය ජාත්‍යන්තර නොවන සන්නද්ධ ගැටුම්වලට අදාළ වෙයි.[423] එය ජාත්‍යන්තර නොවන සන්නද්ධ ගැටුම්වලට අදාළ යුද අපරාධයක් ලෙස ඉතා පැහැදිලිව ජාත්‍යන්තර අපරාධ අධිකරණ ව්‍යවස්ථාවේ සඳහන් කර ඇත.[424]

ළමයින් බඳවාගැනීමට වගකිව යුතු කරුණාගේ අතුරු සන්නද්ධ කණ්ඩායමේ (Karuna TMVP) තත්වාකාර සහ නීති ප්‍රකාර අණදෙන නිලධාරී ගෝඨාභය රාජපක්ෂ වූ බව සහ ශ්‍රී ලංකා යුද හමුදාවේ මුරපොළවල් ඔස්සේ බාධාවකින් තොරව ගමන්කිරීමට පහසුකම් සලසමින් අණදෙන හා යටත් නිලධාරී සම්බන්ධතාවක් TMVP සමග පවත්වාගෙන ගිය බව මෙම වාර්තාවේ අඩංගු සාක්ෂි මගින් තහවුරු කෙරේ.

අනීතික ලෙස ළමයින් බඳවාගැනීම, ඇතුළු අතුරු සන්නද්ධ කල්ලියේ ක්‍රියාකාරකම් ගැන කරුණා ගෝඨාභය රාජපක්ෂට කෙළින්ම වාර්තා කළ අතර, බඳවාගත් ළමයින්ට ශ්‍රී ලංකා යුද හමුදාවේ මුරපොළ සහ කඳවුරු හරහා බාධාවකින් තොරව ගමන්කිරීමට පහසුකම් සලසනු ලැබීය. එසේවුවත් ළමයින් බඳවාගැනීම නතර කිරීමට හෝ වැළැක්වීමට හෝ ජාත්‍යන්තර මානුෂවාදී නීතිය, මානව හිමිකම් නීතිය සහ ජාත්‍යන්තර අපරාධ නීතිය උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් මෙම අතුරු සන්නද්ධ කණ්ඩායම සහ එහි නායකත්වය වගඋත්තරකරුවන් බවට පත්කිරීමට ගෝඨාභය කිසිදු ක්‍රියාමාර්ගයක් නොගත්තේය.

මෙම උල්ලංඝනය කිරීම් යුද අපරාධ සහ මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ ලෙස සලකනු ලැබිය හැකි අතර, තහවුරු කළහොත්, එම ක්‍රියාවන් උදෙසා අපරාධ වගකීමකට ගෝඨාභය රාජපක්ෂ පුද්ගලිකවම සම්බන්ධ කෙරෙයි.

**ජනවාර්ගිකත්වය, දේශපාලනය සහ ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගෙන හිංසාපීඩා කිරීම**

හිංසා පීඩාකිරීමේ අපරාධය රෝම ප්‍රඥප්තියෙන් අර්ථ දක්වා ඇත්තේ දේශපාලනය, වර්ගය, ජාතිය, ජනවර්ගය, සංස්කෘතිය, ආගම හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය නිසා හෝ ජාත්‍යන්තර නීතිය යටතේ අවසර දිය නොහැකි ලෙස විශ්වීය ලෙස පිළිගත් වෙනත් හේතු නිසා හෝ මෙන්ම මනුෂ්‍යත්වයට, හඳුනාගතහැකි යම් කණ්ඩායමකට හෝ සාමූහිකයකට එරෙහි ලෙස පිළිගනු ලැබූ අපරාධයක් මගින් 'කණ්ඩායමේ හෝ සාමූහිකයේ අනන්‍යතාව හේතුකොට ජාත්‍යන්තර නීතියට පටහැනිව චේතනාන්විතව සහ දැඩි ලෙස මූලික අයිතිවාසිකම් අහිමිභාවයට පත්කිරීම' ලෙස ය.[425]

ඔවුන්ගේ දෙමළ වාර්ගිකත්වය, වර්ග තාන්ත්‍රික සිංහල බෞද්ධ රාජ්‍යයක හින්දු භක්තිකයන් සහ කිතුණුවන් වශයෙන් ඔවුන්ගේ ආගම මෙන්ම ඔවුන් එල්ටීටීඊයට සහාය දක්වන බවට වූ පිළිගැනීම, ඔවුන් එල්ටීටීඊ සාමාජිකයන් වීම, ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට ඔවුන් දක්වන දේශපාලන විරුද්ධත්වය යන දේශපාලන හේතුව යනාදී හේතු පාදක කරගනිමින් ද්‍රවිඩ ජනතාව කණ්ඩායමක් හෝ සාමූහිකයක් වශයෙන් ඉලක්ක කර වින්දිතයන් කර ඔවුන්ට වෙනස්කොට සලකනු ලැබූ බව මෙම වාර්තාවේ සාක්ෂි වලින් පෙන්නුම් කෙරේ. සන්නද්ධ ගැටුම කාලයේදී අත්තනෝමතිකව රඳවාගැනීම, බලාත්කාරයෙන් අතුරුදහන්කිරීම, වධය, සාහසික ස්ත්‍රී දූෂණය හා ලිංගික ප්‍රචණ්ඩත්වය, අනීතිකව සිරගතකිරීම, අභ්‍යන්තර අවතැන් කඳවුරුවල රඳවා තැබීම සහ අනීතිකව මරණයට පත්කිරීම මෙම උල්ලංඝනවලට ඇතුළත් ය. භාරවීමේ සන්දර්භය තුළ, දිවි ගළවාගෙන සිටි දෙමළ ජනයාට අභ්‍යන්තර අවතැන් කඳවුරුවලට (වධ කඳවුරුවලට සමාන කරනු ලැබූ) ඇතුල්වීමට බලකෙරුණු අතර, හිටපු එල්ටීටීඊ සාමාජිකයන්ට පුනරුත්ථාපනය අනිවාර්ය කෙරිණ. එය 'පුනරුත්ථාපන කඳවුරේ' ස්ත්‍රී-පුරුෂ සමාජභාවය අනුව වෙනස්විය. අනීතිකව රඳවාගැනීමෙන්, වධහිංසා පැමිණවීමෙන්, දූෂණය කිරීමෙන් සහ ලිංගික ප්‍රචණ්ඩත්වයෙන් ළමයින්ට පවා ගැලවීමක් නොවීය.

තවද, යුද්ධයේ අවසන් දිනවලදී, භාරවූ හෝ සටන් කළ නොහැකි තත්වයේ සිටි හෝ හිටපු එල්ටීටීඊ සාමාජිකයන් ඇතුළු දෙමළ පිරිමි, කාන්තාවන් සහ ළමයින්ගේ ලඝු ඝාතන විසින් මිනීමැරුම මාර්ගයෙන් ද්‍රවිඩ ජනතාවට පීඩා කිරීම ගැන පැහැදිලි නිදසුනක් සංස්ථාපනය කරයි. සිවිල් යුද්ධය පැවති කාලය තුළ, දෙමළ ජනතාවට ආහාර, වෛද්‍යාධාර සහ ජලය ඇතුළු ඔවුන්ගේ දිවිපැවැත්මට අත්‍යවශ්‍ය නොහැකි අවශ්‍යතා ලබාගැනීමට ඇති ඔවුන්ගේ මූලික අයිතිවාසිකම අහිමි කරන ලදී.

ශ්‍රී ලංකා ආණ්ඩුව සහ ශ්‍රී ලංකාවේ දෙමළ ජාතිකයන් ඉලක්ක කිරීම කිරීම ගැන වගකිව යුතුයැයි චෝදනා ලබන ගෝඨාභය රාජපක්ෂගේ තත්වකාර විධානය

423. https://ihl-databases.icrc.org/customary-ihl/eng/docs/v1_rul_rule136

424. 8(2)(e)(vii) වගන්තිය

425. ජාත්‍යන්තර අපරාධ අධිකරණ ව්‍යවස්ථාවේ 7.1.h, වගන්තිය

සහ පාලනය යටතේ ක්‍රියා කළ ආරක්ෂක හමුදා ඔවුන්ට එරෙහිව දේශපාලන, වාර්ගික, ආගමික සහ ස්ත්‍රීපුරුෂ සමාජභාවය යනු කරුණු මත වෙනස් කොට සැලකීමේ චර්යාවක නිරත වූ බව මෙම වාර්තාවේ අඩංගු තොතුරු සහ සාක්ෂිවලින් පෙන්නුම් කරන අතර, තහවුරු කළහොත්, ඒවා යුද අපරාධ සහ මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ ලෙස සලකනු ලැබිය හැකි අතර, ඒවා අපරාධ වගකීමකට ගෝඨාභය රාජපක්ෂ පුද්ගලිකවම සම්බන්ධ කරයි.

**ගෝඨාභය රාජපක්ෂගේ පුද්ගලික අපරාධ වගකීම**

2005 සහ 2015 අතර ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාවූ ගෝඨාභය රාජපක්ෂ, රජයේ වඩාත් ජ්‍යෂ්ඨ සිවිල් සේවකයා සහ ආරක්ෂක උපායමාර්ග සම්පාදන සහ ක්‍රියාත්මක කිරීමේ සහ ශ්‍රී ලංකාවේ භෞමික අඛණ්ඩතාවය හා ස්වෛරීත්වය ආරක්ෂාකිරීමේ වගකීම දැරූ තැනැත්තා විය.[426] ඔහුගේ සොහොයුරු මහින්ද රාජපක්ෂ ශ්‍රී ලංකාවේ ජනාධිපති සහ සේනාධිනායක වූ හෙයින් ගෝඨාභය දේශපාලන වශයෙන්ද බලවත් විය. ඔහු සක්‍රීය අන්දමින් සන්නද්ධ හමුදා පාලනයේ යෙදුණු නිසා 2015 වන තෙක් ගෝඨාභය රාජපක්ෂ ආරක්ෂක අමාත්‍යාංශයේ සන්නද්ධ හමුදා සහ හමුදා බුද්ධි සේවයේ තත්වකාර විධාන වගකීමක් ආරෝපණය කරගෙන සිටි බව මෙම වාර්තාවේ අඩංගු සාක්ෂි පෙන්නුම් කරයි. ජනාධිපති මහින්ද රාජපක්ෂ හමුදාපතිවරුන් පත්කිරීමේ බලතල තබාගත් අතර, ගෝඨාභය රාජපක්ෂට 'පත්කිරීම්, උසස්කිරීම් සහ වැරදිකරුවන්ට යුද අධිකරණයදී නඩු පැවරීමේ (සන්නද්ධ හමුදාව ඇතුලත) බලතල ඇතුලු විනය කරුණු සම්බන්ධයෙන් අධිකාරයක්' තිබුණි.[427]

ගෝඨාභය රාජපක්ෂ 'හමුදාව සහ දේශපාලන අධිකාරය අතර සම්බන්ධකය' වූ බවත් යුද හමුදාවේ සියලු පත්වීම් පාලනය කළ බවත් ඇමැතිවරුන්ට සහ එතෙර හා මෙරට දේශපාලන නම්කිරීම් සම්බන්ධයෙන් උපදෙස්දීමේ සැලකිය යුතු බලය පැවැත්වීමක් භුක්ති විඳි බවත් මෙම වාර්තාවේ අඩංගු සාක්ෂිවලින් සහතික කෙරේ.[428]

ඔහු යුද හමුදාවේ සේවය කළ කාලයේදී පිහිටුවාගෙන තිබූ ජාලවලට ඇතුළත්ව සිටි ඔහුගේ හිටපු හමුදා සගයන් ඔහු විසින් ජ්‍යෂ්ඨ තනතුරුවලට පත්කරන ලදී. ජාත්‍යන්තර අපරාධ සිදුකිරීමේදී ගෝඨාභය රාජපක්ෂගේ කාර්යභාරය සහ වගකීම ගැන යම් තක්සේරුවක් සිදුවිය යුත්තේ මෙම පසුබිම තුළ ය.

ගෝඨාභයට යුද හමුදාවේ නව බලඇණි, හමුදාංක සහ සේනාංක පිහිටුවීම සංවිධානය කිරීමට බලය සහ අධිකාරය තිබුණි.[429] ඔහු මෙම පත්කිරීම් සිදුකිරීමට, පවතින ව්‍යුහය සහ ජ්‍යෂ්ඨත්වය නොසළකා 2009 සටන්වලට සක්‍රීයව සහභාගිවූ ජ්‍යෂ්ඨ හමුදා නිලධාරීන් පත්කළේය.[430] 2009 දී ඔහු ඇති කළ තනතුරක් වූ, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි සම්බන්ධයෙන් ඔහුට අධිකාරයක්, විධානයක්, පාලනයක් සහ අධීක්ෂණයක් ද තිබුණි.[431]

ගෝඨාභය ජාතික ආරක්ෂක මණ්ඩලයේ දෙවැනියා විය. 'ආරක්ෂක මෙහෙයුම්වලට හා ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් අණදීමේ අධිකාරය සහිතව ජාතික ආරක්ෂාව පවත්වාගෙන යාම'[432] භාර වූ ආරක්ෂක මණ්ඩලය විසින් පොලීසිය සහ සන්නද්ධ හමුදා අතර මෙහෙයුම් සම්බන්ධීකරණය සහ ජාතික ආරක්ෂක මණ්ඩලයේ තීරණ ක්‍රියාත්මක කිරීමේ වගකීම තිබූ ඒකාබද්ධ මෙහෙයුම් මූලස්ථානය මෙහෙයවන ලදී.[433]

'*... අප හමුදා මෙහෙයුම් ව්‍යාපාරය සැලසුම් කරද්දී* යනුවෙන්ද, '*අප හමුදා මෙහෙයුම සැලසුම් කළ ආකාරය පිළිබඳ කරුණු කොමිෂම හමුවේ දැක්වීමට විශේෂ උනන්දුවක් දක්වන*' බවද උගත් පාඩම් සහ ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසම හමුවේ පවසමින්, එල්ටීටීඊය පරදවා ජයග්‍රහණයට තුඩුදුන් හමුදා මෙහෙයුමේ අවසන් අදියරේ මහමොළකරු තමන් වූ බව ගෝඨාභය පිළිගත්තේය.[434] '*ආරක්ෂක ලේකම් ලෙස කටයුතු කරන අතරේ ශ්‍රී ලංකාවේ ජයග්‍රාහී සන්නද්ධ හමුදාවලට නායකත්වය දීමට, අභිප්‍රේරණය*

426. OSIL වාර්තාවේ 106 ඡේදයේ උපුටා දක්වා ඇති, http://www.defence.lk/main_abt.asp?fname=mission

427. මෙම වාර්තාවේ පාද සටහන 12

428. මෙම වාර්තාවේ පාද සටහන 46

429. 'ගෝඨාභය', කමල් ගුණරත්න - 75 පිට

430. http://www.indiandefencereview.com/spotlights/lessons-from-the-war-in-sri-lanka/2/
'ගෝඨාභය', කමල් ගුණරත්න - 78 පිට

431. Daily News, 12 Jun 2009 , on new law for CDS.

432. පරණගම වාර්තාව §179

433. OISL 112 ඡේදය: 'එමෙන්ම, 2006-9 කාලයේ ඒකාබද්ධ මෙහෙයුම් මූලස්ථානයේ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ලෙස ක්‍රියාකළ පුද්ගලයා වන ඩොනල්ඩ් පෙරේරා වගඋත්තර බැන්දේද ආරක්ෂක ලේකම්වරයා වූ ගෝඨාභය රාජපක්ෂට ය. 2015දී, ශ්‍රී ලංකාවේ මූල්‍ය වංචා විමර්ශන අංශය විසින් මිග් ප්‍රහාරක යානා පිළිබඳව ඔහුගෙන් ප්‍රශ්න කරන ලදී. - 2015 අප්‍රේල් 2 - http://www.ft.lk/article/402905/Former-Air-Chief-Marshal-Donald-Perera-questioned-over-MiG-aircraft-transaction

434. LLRC කොමිසම හමුවේ ගෝඨාභය රාජපක්ෂගේ ප්‍රකාශ පිටපත්කරය

*කිරීමට සහ ප්‍රවර්ධන සහාය ලබාදීමට මට භාග්‍ය තිබුණි'යි*[435] යනුවෙන් තමා ආරක්ෂක හමුදාවලට නායකත්වය දුන් බවද ගෝඨාභය ප්‍රසිද්ධියේ පිළිගත්තේය. *'ඔබ දන්නවා, ආරක්ෂක ලේකම් වශයෙන්, මට පළමුවෙන්ම වසර දෙක හමාරක් ඇතුළතදී ත්‍රස්තවාදය නිමකිරීමට ආරක්ෂක හමුදා සහ බුද්ධිසේවා මෙහෙයවීමට හැකිවූ බව'* යනුවෙන් ඔහු ප්‍රකාශ කළ බව සඳහන් වේ.[436]

ගෝඨාභය විශේෂිත මෙහෙයුම් ගැන දැන සිටියා පමණක් නොව, හමුදාපතිවරුන්ට නිශ්චිත මෙහෙයුම් නියෝගද දුන් බව කියනු ලැබේ. ගෝඨාභය රාජපක්ෂගේ සමීපතම පහළ නිලධරයා වූ, යුද හමුදාපති සරත් ෆොන්සේකාද පාර්ලිමේන්තුවේදී පැවසුවේ ගෝඨාභය මාවිල්ආරු ප්‍රහාරය විනාඩි දෙකක් ඇතුළත අනුමත කළ බවයි.[437] මෙම වාර්තාවේ විස්තරාත්මකව ඇති සාක්ෂි තවදුරටත් යෝජනා කරන්නේ හමුදා සහ ජාතික ආරක්ෂාවට අදාළ වර්ධනයන් ගෝඨාභයට දෛනිකව දැනුම් දී ඇති බවයි. ශ්‍රී ලංකාවේ පුවත්පතක් වාර්තා කළ පරිදි *'සේනාධිනායක සමඟ සෘජුව සම්බන්ධයක් ඇතිව සන්නද්ධ හමුදා වෙනුවෙන්, හමුදාවල පිරිස් බලය දෙගුණයකින් ඉහළ නැංවීම ඇතුළු ඉල්ලීම කිරීමට හැකියාව තිබුණේත් විදේශ පීඩනය හමුවේ නොසැලී සිටීමට ජනාධිපතිවරයා සමඟ අචලව සිටියේත් ආරක්ෂක ලේකම්වරයා ය. ආරක්ෂක ලේකම් යුද්ධය අවසන්කිරීමට හුදෙක් 'අවශ්‍ය සහාය දුන් බව' පැවසීම විශාල අසාධාරණයකි.'*[438]

යුද්ධය කාලයේදී පැවති ශ්‍රී ලංකාවේ බුද්ධි තොරතුරු ආයතන ගණනාවක් සහ පසුවද පවත්වාගෙන යනු ලැබූ අතර ඒවා නිල වශයෙන් වෙන්ව තිබුණත් ඉන් බොහොමයක් සන්නද්ධ ගැටුම කාලයේදී හමුදාමය හෝ හමුදාමය ක්‍රියාවන්ට සමාන කර්තව්‍යයන්හි යෙදී සිටීම නිසා ඔවුන්ගේ සැබෑ කාර්යභාරය නොපැහැදිලි විය. යුද හමුදා බුද්ධි බලකාය ලෙස හැඳින්වූ යුද හමුදා බුද්ධි අංශය ගෝඨාභය රාජපක්ෂගේ සක්‍රීය විධානය සහ පාලනය යටතේ ක්‍රියාත්මක විය. යුද හමුදා බුද්ධි අංශය සෘජුව යුද හමුදාපති සරත් ෆොන්සේකා යටතට වැටුණත් ෆොන්සේකා චෝදනා කර ඇත්තේ එය ගෝඨාභය රාජපක්ෂගේ සක්‍රීය විධානය යටතේ පැවති බව සහ ආරක්ෂක අමාත්‍යාංශයේ සිට ආරක්ෂක ලේකම් නොනිල වශයෙන් කොළඹ බුද්ධි මෙහෙයුම් හැසිරවූ බවයි. ගෝඨාභය සහ ඔහුට පහළින් සිටි අය *'සුදු වෑන් සංස්කෘතිය'* වැනි දුෂ්ට ක්‍රියාවලට සම්බන්ධ බවටත් ඔහු චෝදනා කරයි.

නීතිය බලාත්මක කිරීමේ ආයතනය වන පොලීසියේ අධීක්ෂණ වගකීම 2013 දී නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයට පවරන තෙක් රාජ්‍ය බුද්ධි සේවයේ සහ පොලීසියේ විධානය සහ පාලනයද ගෝඨාභය රාජපක්ෂ සිදු කළේය. මේ අනුව 2005-2013 අතර කාලයේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව (CID), ත්‍රස්ත විමර්ශන කොට්ඨාසය (TID), පොලිස් විශේෂ කාර්ය බලකාය (STF)[439], සහ කොළඹ අපරාධ කොට්ඨාසය (CCD) ඇතුළු සියලු පොලිස් බලකායන් වාර්තා කළේ ආරක්ෂක අමාත්‍යාංශයට ය. අතිරේක ආරක්ෂක ලේකම්වරුන්, පොලිස්පති, සහ නියෝජ්‍ය පොලිස්පති ඇතුළු නිත්‍ය විධාන දාමය මගහැර ගෝඨාභය කටයුතු කළේය.[440]

මෙම වාර්තාව පෙන්වන්නේ 2006 මුල සිට සිවිල් ජනයාගේ මරණ දහස් ගණනක් සිදු වූ සන්නද්ධ හමුදා මෙහෙයුම්වලට නියෝග කිරීමේදී සහ 2008 සිට 2009 මැයි මාසයේදී යුද්ධය අවසන් වන තෙක් රටේ සන්නද්ධ ගැටුම තීව්‍ර කිරීමේදී ගෝඨාභය රාජපක්ෂ සක්‍රීය කාර්යභාරයක් ඉටුකළ ආකාරයයි.

---

435. https://www.facebook.com/437355006429820/posts/1275498389282140?sfns=mo (ගෝඨාභය රාජපක්ෂගේ ෆේස්බුක් පිටුව). Gota's War 291 පිටුවෙන්ද දක්වා ඇති ආකාරයට 'සරත් ෆොන්සේකාට අවස්ථාව ලබාදීමට ගෝඨාභය තීරණ කර තිබුණේයැ'යි යන්නෙන් මෙය තහවුරු කරයි.

436. 2019 ඔක්තෝබර් 19 දා බෙලිඅත්තේ පැවති මැතිවරණ රැළිය https://www.youtube.com/watch?v=BdtQ-E5sBPw 10'47'-11'37.

437. '2006 ජූලි මාසයේදී, ත්‍රිකුණාමලයට ඊසාන දිගින් වූ මාවිල්ආරු ප්‍රදේශය එල්ටීටීඊ ය විසින් අල්ලාගෙන නැගෙනහිර පළාතට ජලය සපයන ප්‍රධාන ජලාශයේ සොරොව්ව වසන ලදී. ත්‍රිකුණාමලයේ නාවික කඳවුරටද ප්‍රහාර එල්ල කරන ලදී. මෙය නැගෙනහිර අවසන් සටනේ ආරම්භය සනිටුහන් කළේය'. §66, OISL, 2015.

438. 'From Hero to Zero: The Fonseka fallout', 18 Oct 2009, Sunday Times Lanka, http://www.sundaytimes.lk/091018/Columns/political.html

439. '2006 අගෝස්තු 1 දා සිට ක්‍රියාත්මක වන පරිදි විශේෂ කාර්ය බලකාය යළි රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය අමාත්‍යාංශයට පවරා ඇති අතර එතැන් සිට දැන් විශේෂ කාර්ය බලකායේ සියලු කරුණු මෙහෙයවනු ලබන්නේ පොලීසිය විසිනි.' - ගොණුගත ලේඛන, ආරක්ෂක අමාත්‍යාංශ වෙබ් අඩවිය, Ref MOD D.
'විශේෂ කාර්ය බලකාය ගෝඨාභයගේ අණදීම යටතේ පමණක් ක්‍රියාත්මක වෙයි..' ITJP සාක්ෂිකරුවෙක්

440. උදා: ඔත්තු සේවා ඒකක හෙන්දාවිතාරණ යටතේ ඒකාබද්ධ කළ යුතු බවව දෙන ලද ගෝඨාගේ නියෝගය
'Exclusive: Gota's Intelligence Czar Caught Red Handed As Chinese Mole',
https://www.colombotelegraph.com/index.php/exclusive-gotas-intelligence-czar-caught-red-handed-as-chinese-mole/
Millions Credited To Ex-Intelligence Chief Maj Gen Kapila Hendawitharana's Account, 25 Feb 2017
https://srilankabrief.org/millions-credited-to-ex-intelligence-chief-maj-gen-kapila-hendawitharanas-account/
2009 අප්‍රියෙල් මාසයේදී Business Today සඟරාව සමඟ සම්මුඛ සාකච්ඡාවකදී එම කාලයේ පොලිස්පති සහ අපරාධ පරීක්ෂණ කොට්ඨාසයේ නියෝජ්‍ය පොලිස්පති යන දෙදෙනාම එල්ටීටීඊ ය ගැන තොරතුරු හුවමාරුකරගැනීමට රාජ්‍ය බුද්ධි සේවය, පොලිස් බුද්ධි ඒකක, යුද හමුදා බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුළු විවිධ බුද්ධි සේවා අතර (ආරක්ෂක ලේකම් යටතේ සතිපතා රැස්වීම් ඇතුළු) පැවති සමීප සම්බන්ධතාව විස්තර කළහ. - 2009 අප්‍රේල්, ගොණුගත ලේඛන

මෙම උල්ලංඝනය කිරීම්වලට ලඝු ඝාතන, අත්තනෝමතිකව හා අනීතිකව රඳවා ගැනීම, වධහිංසාව මෙන්ම ස්ත්‍රී දූෂණය සහ ලිංගික ප්‍රචණ්ඩත්වය ඇතුළත් ය. උග්‍ර වෙමින් පැවති මානුෂවාදී අර්බුදය ගැන ගෝඨාභය සම්පූර්ණයෙන්ම දැනුවත්ව සිටි අතර, යුද කලාපය ස්වාධීන, ජාත්‍යන්තර අධීක්ෂණයෙන් සහ නිරීක්ෂණයෙන් නිදහස් බව සහතික කරමින් 2008 දී ජාත්‍යන්තර ආධාර සහ සහන සංවිධානවලට යුද කලාපයෙන් ඉවත්ව යන ලෙස නියෝග කිරීම සම්බන්ධයෙන් පෞද්ගලිකව වගකිව යුත්තේය. ආරක්ෂක අමාත්‍යාංශය සමගින් ගෝඨාභය රාජපක්ෂ හිතාමතා මානුෂවාදී සංවිධානවලට යුද කලාපවලට ප්‍රවේශවීමට බාධා කොට එහි ජනගහනයේ දිවි පැවැත්මට අත්හළ නොහැකි ආහාර, බෙහෙත් සහ වෙනත් වස්තු බෙදාහැරීම වැළැක්වීය.

ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ බෙම්බා නඩුවේ පූර්ව-නඩු විභාග තීන්දුවෙහි දී සඳහන් කර ඇත්තේ තත්වකාර ආඥාපතිවරුන් යන මතය 'සාමාන්‍යයෙන් සන්නද්ධ පොලිස් ඒකක වැනි නිත්‍ය රජයේ හමුදා සම්බන්ධයෙන් අධිකාරයක් හා පාලනයක් සහිත ඉහළ නිලධරයන් හෝ හමුදා ධූරාවලි ව්‍යුහයක් හෝ විධාන දාමයක් අනුගමනය කරන කැරලි කණ්ඩායම් ඇතුළු, අතුරු සන්නද්ධ කණ්ඩායම් යනාදී වෙනත් අය අතර සන්නද්ධ කැරලිකාරී ව්‍යාපාර සහ රාජ්‍ය නොවන හමුදා ඇතුළත්විය හැකි' බව ය.[441]

ගෝඨාභය රාජපක්ෂ කරුණාගේ අතුරු සන්නද්ධ කණ්ඩායමේ තත්වකාර අණදෙන නිලධාරි ලෙස දෙමළ ව්‍යාපාරිකයන්ගෙන් කප්පම් ගැනීමට සහ මුදල් එකතුකිරීමට නායකත්වයට අවසර දුන් අතර[442], ළමා සොල්දාදුවන් බඳවාගැනීම සහ යොදා ගැනීම නතර කිරීමට අසමත් විය.[443] 2007 අවසානයේදී ඔහු එක්සත් රාජධානියට යාමට කර්නල් කරුණාට ව්‍යාජ නමක් යටතේ රාජ්‍ය තාන්ත්‍රික ගමන් බලපත්‍රයක්ද සපයා ඇති බවට චෝදනා ලබයි.[444] ITJP සාක්ෂිකරුවකු පවසන පරිදි ආගමන අංශය සමඟ හුවමාරු කරගන්නා 'අසාදු ලේඛනය' සම්බන්ධයෙන් සක්‍රිය පාලනයක් තිබූ ගෝඨාභය විසින් පහසුකම් සැලසීමෙන් ශ්‍රී ලංකාවේ විදේශ ගමන් බලපත්‍ර ආරක්ෂක අංශය හරහා කරුණා පිටත්ව ගොස් තිබේ.[445]

එල්ටීටීඊයට සටන දිගටම පවත්වාගෙන යාමට අවි ආයුධ ලබාගැනීමට ප්‍රවේශයක් හෝ ධාරිතාවක් නැති කලක ඔවුන්ගෙන් තවදුරටත් යුද තර්ජනයක් නොමැති අවස්ථාවේදී පවා ගෝඨාභය එල්ටීටීඊයට සහ දෙමළ සිවිල් ජනයාට එරෙහිව යුද්ධය පවත්වා ගෙනයාමට සන්නිවේදන උපකරණ භාවිතය, නියමුවන් නොමැති ගුවන් යානා මගින් ලබාගත් බුද්ධි තොරතුරු හා අවිචාරවත්ව හා අසමානුපාතිකව පහරදුන් බර අවි හා කාලතුවක්කු යොදාගත්තේය. තම යටත් නිලධරයන් විසින් සිදුකරන ලද අත්තනෝමතික හා අනීතික රඳවාගැනීම්, වධය, ස්ත්‍රී දූෂණය හා ලිංගික ප්‍රචණ්ඩත්වය යන උල්ලංඝනය කිරීම් ගෝඨාභය මනාව දැනසිටි නමුත් ඔහු ඒවා වැළැක්වීමට හෝ ඔවුන්ට විරුද්ධව ක්‍රියා නොකර ඒ වෙනුවට ආරක්ෂක හමුදා ගැන ප්‍රසිද්ධියේ හුවා දක්වමින්ද, ජ්‍යෙෂ්ඨ ආඥාපතිවරුන්ට වරදාන පිරිනැමීම මාර්ගයෙන්ද මෙම ක්‍රියා ඔහු අනුමතකරන බව පැහැදිලිව දක්වීය.

බෙම්බා නඩුවෙන්[446] විධාන වගකීම සම්බන්ධ නිර්ණායක පැහැදිලිව දක්වා ඇත. නියෝග නිකුත් කිරීමට බලය තම තම ඍජු විධානය නැත්නම් පහළ මට්ටම්වලදී වුවත් සහ බෙම්බාගේ අණදීම යටතේ ආරක්ෂක හමුදාවලට හෝ ඒකකවලට සටන්වල යෙදීමට නියෝග නිකුත් කිරීමට බලය, නියෝග පිළිපදින බවට වගබලාගැනීම හා නියෝග සත්‍ය වශයෙන්ම පිළිපදින්නේදැයි සලකා බැලීම ඒවාට ඇතුළත්වෙයි.

ඒකක ප්‍රතිසංවිධානය කිරීමට අවසරදුන් ගෝඨාභය රාජපක්ෂ, නිත්‍ය විධාන දාමය නොසලකා අණදීමේ ව්‍යුහයේ වෙනස් කම් සිදුකළේය. ඔහුට ආරක්ෂක හමුදාවල ඕනෑම සාමාජිකයකු උසස්කිරීමේ, අනුයුක්ත කිරීමේ, ඉවත්කිරීමේ හෝ විනය ක්‍රියාමාර්ග ගැනීමේ සහ ගැටුම් සිදුවන විවිධ ස්ථාන කරා හමුදා යැවීමට බලතල තිබුණි.

ජාතිය, ජනවර්ගය සහ ආගම මෙන්ම ජාතික, ආගමික සහ දේශපාලන හේතු පදනම් කරගෙන ආණ්ඩුවට දේශපාලන වශයෙන් විරුද්ධවීම යන කරුණු මත සාමූහිකව දඬුවම් කිරීම මගින් වන්නියේ දෙමළ සිවිල් ජනතාවට පීඩාකිරීම සම්බන්ධයෙන් ගෝඨාභය රාජපක්ෂ වගකීම දරයි.[447]

441. https://www.icc-cpi.int/CourtRecords/CR2009_04528.PDF ඡේදය 410

442. https://wikileaks.org/plusd/cables/06COLOMBO1622_a.html 06COLOMBO1622_a

443. https://wikileaks.org/plusd/cables/07COLOMBO728_a.html

444. 'Gotabhaya "gave me passport"', BBC Sinhala, 25 Jan 2008, https://www.bbc.com/sinhala/news/story/2008/01/080125_karunajail.shtml

445. මෙම වාර්තාවේ පිට 55

446. https://casebook.icrc.org/case-study/international-criminal-court-trial-judgment-case-prosecutor-v-jean-pierre-bemba-gombo

447. UN Secretary-General (UNSG), Report of the Secretary General`s Panel of Experts on Accountability in Sri Lanka, 31 Mar 2011, https://www.refworld.org/docid/4db7b23e2.html [accessed 28 Nov 2023]

ආරක්ෂක අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරයා, ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදාවල සහ අතුරු සන්නද්ධ කණ්ඩායම්වල තත්වකාර සහ නීතිප්‍රකාර අණදෙන නිලධාරි වශයෙන් මෙම වාර්තාවේ දක්වා ඇති උල්ලංඝන සිදුකිරීමට ඔවුන්ට නියෝග කිරීම සහ සමකාලීන දැනුමක් ඇතිව ඒවා වැළැක්වීමට, නතරකිරීමට හෝ ඔවුන් වගවීමට පත්කිරීමට අසමත්වීමේ චෝදනා සම්බන්ධයෙන් වගකීම දරයි. මෙම ක්‍රියා ජාත්‍යන්තර නොවන සන්නද්ධ ගැටුම්වලට අදාළ නීති සහ ව්‍යවහාර බරපතල ලෙස උල්ලංඝනය කිරීමක් සනාථ කරන අතර, ඒවා මෙම වාර්තාවේ අඩංගු තොරතුරු සහ සාක්ෂි පදනම් කරගෙන තහවුරු කළහොත්, යුද අපරාධ සහ මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ ලෙස සැලකිය යුතු අතර ඒ සම්බන්ධයෙන් ගෝඨාභය රාජපක්ෂ විධාන වගකීමේ න්‍යාය යටතේ සාපරාධීව වගඋත්තරදායක විය යුතුය.

‘යුද්ධයකදී කරන ලද දෑ අනුව පුද්ගලයකු විනිශ්චය කළ නොහැකිය’

ගෝඨාභය රාජපක්ෂ[448]

448. http://www.dailymirror.lk/article/How-can-there-be-freedom-without-discipline-Gotabaya-162220.html

# ඇමුණුම 1: ගෝඨාභය රාජපක්ෂ වෘත්තිය ඉතිහාසය

| | |
|---|---|
| 20 ජූනි 1949 | මාතරදී උපත ලැබීය. |
| අධ්‍යාපනය | ආනන්ද විද්‍යාලය.[449] |
| 1971 අප්‍රි. 26 | කැඩෙට් නිලධාරියෙකු ලෙස ශ්‍රී ලංකා යුද හමුදාවට බැඳුනේය. |
| 1972 මැයි 25 | දෙවන ලුතිතන් ලෙස අධිකාර ලැබීම සහ දියතලාවේ යුද හමුදා පුහුණු මධ්‍යස්ථානයේදී මූලික පුහුණුව ලැබීමෙන් පසුව ලංකා සංඥා බලකායේ නිලධාරියෙකු ලෙස ඔහුගේ පළමුවැනි ආඥා ධූරය දෙන ලදී |
| 1972 | රාවල්පිණ්ඩි හි සංඥා පිළිබඳ හමුදා පාසැලේ තරුණ සංඥා නිලධාරීන්ගේ පාඨමාලාව |
| නොදනී | සිංහ රෙජිමේන්තුව සහ රජරට රයිෆල්ස් . |
| 1974 | යාපනයට අනුයුක්තකිරීම[450]. |
| 1975 | ක්වෙතා පාබල සහ උපක්‍රම යුද පාසැලේ පාබල සේනා ආඥාපති පාඨමාලාව |
| 1980 | ඉන්දියාවේ ඇසෑම් ප්‍රාන්තයේ කැරළි මර්දන සහ වනගත යුද ක්‍රියා පිළිබඳ පාසැල |
| 1982-83 | තමිල්නාඩුවේ, නිල්ගිරිහි වෙලින්ග්ටන් ආරක්ෂක සේවා මාණ්ඩලික පාසැලේ (DSSC) ආඥා සහ මාණ්ඩලික නිලධාරී පුහුණුව |
| 1983 ඔක්. 14 | ගජබා රෙජිමේන්තුව (දෙමළ විරෝධී කැරලිවලට සම්බන්ධවූ බව පවසා රජරට රයිෆල්ස් විසුරුවා හැරීමෙන් පසුව සහ විජයබාහු පාබල රෙජිමේන්තුව සමග එකාබද්ධ කිරීමෙන් පසුව) |
| 1987 මැයි සහ ජූනි. | වඩමරච්චි මෙහෙයුම, යාපනය[451]. |
| 1987 ජූලි | ඉන්දීය සාමසාධක බලකාය සම්බන්ධවීමෙන් පසුව ආපසු කොළඹට කැඳවීම සහ විද්‍යාලංකාර කඳවුරේ[452] ස්ථානගත කිරීම. |
| 1987 දෙසැම්බර් | මාණ්ඩලික තනතුර, හමුදා මූලස්ථානය.[453] |
| 1988 | ඇමරිකාවේ සංචාරය.[454] |
| 1989[455] | ඇමරිකා එක්සත් ජනපදයේ ෆෝර්ට් බෙනින්ග්හි උසස් පාබල සේනා නිලධාරී පාඨමාලාව[456] |
| 89 මැයි 1 | නිල චරිතාපදාන ලේඛක (සී.ඒ. චන්ද්‍රප්‍රේම[457]) පවසන්නේ ගෝඨාභය රාජපක්ෂ පළමුවැනි ගජබා රෙජිමේන්තුවේ සිටි බවත් අණදෙන නිලධාරි තනතුරට උසස්කිරීමත් සමග මාතලේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරි ලෙස ජනතා විමුක්ති පෙරමුණේ දෙවැනි කැරැල්ල නිමවන තෙක් (නිල වශයෙන් 1989 නොවැම්බර් 13[458]) සිටි බවත් ය. නමුත් 1990 ජනවාරි වන තෙක් එහි සිටි බවට විශ්වාස කෙරේ. |

449. වසන්ත කරන්නාගොඩ, සරත් ෆොන්සේකා, සරත් වීරසේකර, ජගත් ඩයස්, ප්‍රසන්න සිල්වා, චාගි ගාල්ලගේ සහ කමල් ගුණරත්න ද ආනන්ද විදුහලේ ආදී සිසුන් ය.

450. 'මම මගේ කාලයෙන් බොහොමයක් ගත කළේ යාපනයේ.මම පළමුවෙන් යාපනයට ගියේ 1974 දී පමණ.- සංඥා නිලධාරියෙක් වශයෙන්.' - චන්දන කාරියවසම් සමග සම්මුඛ සාකච්ඡාව, 'සිලෝන් වීක් - https://ceylonweek.com/2016/02/19/gotabaya-rajapaksa-telling-how-to-come-sarath-fonseka-lead-to-army.html

451. වඩමරච්චි ක්‍රියාන්විතය, යාපනයඃ 1987 මැයි සහ ජූනි, ඊළම් යුද්ධය II,

ගජබා රෙජිමේන්තුවේ බලඇණියක් මෙහෙයවීම භාරගත් ඔහු යාපන අර්ධද්වීපයේ වැල්වැටිතුරේ අල්ලා ගනිමින් - ගෝඨාභය රාජපක්ෂ මුල් දවස්වල සිටම උතුරේ යුද්ධයේ සක්‍රීය විය. 1980 ගණන්වල අගදී 'භයංකර ලෙස ජීවිත අහිමිවීම්' ගැන ඉන්දීය අගමැති පැමිණිලිකිරීම සමග, ඉන්දීය මැදිහත්වීම නිසා වඩමරච්චි මෙහෙයුම අතහැරදැමීමට සිදුවූ බවට, ඔහු පැමිණිලි කළේය. වඩමරච්චි මෙහෙයුම සාර්ථක කරගැනීමට ඉඩදුන්නේ නම් යුද්ධය මෙතරම් දිග්නොගැස්සෙන බවට හේ දැඩි ලෙස ඒත්තු ගෙන සිටියේය. එයින් පෙන්වන්නේ ඔහු දේශපාලන නොව, හමුදාමය විසඳුමක් කෙරෙහි දැඩි විශ්වාසයකින් පසුවූ බව ය.

*'මේ විදියට සිටීමට නොහැකි බව පවසමින් කඳවුරු පුළුල් කළ කී පුද්ගලයා ජෙනරාල් විමලරත්න ය. මෙය යුද්ධයට යාමට පෙරහුරුවකි. එය යම් මට්ටමකට ගෙන ආ විට, වඩමරච්චි මෙහෙයුම ආරම්භ කළේ එය මුළුමනින්ම ශුද්ධ කර දැමීමටයි. එම වඩමරච්චි මෙහෙයුම ඉන්දීය මැදිහත්වීම නිසා අතරමග නතරකිරීමට සිදුවූවා.'*

මූලාශ්‍රය : https://ceylonweek.com/2016/02/19/gotabaya-rajapaksa-telling-how-to-come-sarath-fonseka-lead-to-army.html

ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග - https://www.businesstoday.lk/article.php?article=7101

452. 'සිලෝන් වීක්'හි චන්දන කාරියවසම් සමග සම්මුඛ සාකච්ඡාව - https://ceylonweek.com/2016/02/19/gotabaya-rajapaksa-telling-how-to-come-sarath-fonseka-lead-to-army.html

453. Gota's War 173 පිටුව

454. Gota's War 173 පිටුව

455. Gota's War කෘතියට අනුව පාඨමාලාව නිමා වූ දින මෙයයි.

456. Gota's War 177 පිටුව

457. https://itjpsl.com/assets/press/Chandraprema-PRESS-RELEASE-english.pdf

458. රෝහණ විජේවීර ඝාතනය කළ දිනය, 'ගෝඨා මාතලේ ආරක්ෂක සම්බන්ධීකරණ නිලධාරී තනතුර දෙවැනි ජේවීපී කැරැල්ල අවසන් වන තුරු දැරීය',

| | |
|---|---|
| 1989 ජූලි 8-91 ජන 26 | පළමුවැනි ගජබා රෙජිමේන්තුවේ පළමු අණදෙන නිලධාරී[459]. |
| 1990 ජනවාරි | මාස 3 ක නිවාඩු අයදුම් කළ ගෝඨාභය රාජපක්ෂ ඇමරිකා එක්සත් ජනපදය බලා ගියේය. |
| 1990 | Strike Hard මෙහෙයුම සහ 'ත්‍රිවිධ බලය' මෙහෙයුම |
| 1990 | යාපනය කොටුව යළි අල්ලා ගැනීමට එක් බලඇණියක් මෙහෙයවීම[460]. |
| 1990 අග | කොළඹ සමුළු නිවාසවල (Summit Flats) පදිංචියට යාම[461]. |
| 1990-1991 | වැලිඔය ප්‍රදේශයේ සම්බන්ධීකරණ නිලධාරී - මානව හිමිකම් උල්ලංඝන කිරීම් සහ සිංහල ජනපද පිහිටුවීම හා සම්බන්ධ ප්‍රදේශය -. [1990 ජූලි 8 මුතූර් මුහුදට ඔබ්බෙන් සුමේධ පෙරේරා සමඟ ඔහු සිටින බව ඡායාරූපයකින් පෙන්වයි.] |
| 1990 අග | ඇමති රංජන් විජේරත්නගේ නියමයෙන් යුද හමුදා මූලස්ථානය ලුතිතන් කර්නල් රාජපක්ෂ කොතලාවල ආරක්ෂක ඇකඩමියේ නියෝජ්‍ය අණදෙන්නා ලෙස 1990 අගභාගයේදී පත්කරනු ලැබීය[462]. |
| 1991 ජූලි | අලි මංකඩ සටන. |
| 1991 නොවැම්බර් 1 | ලුතිතන් කර්නල්වරයෙකු ලෙස යුද හමුදාවෙන් විශ්‍රාම ගෙන ඇමරිකාවට[463] ගොස් එහිදී ඇමරිකානු පුරවැසිභාවය ලබාගත්තේය. ඇමරිකාවේදී 'හේ ලොස් ඇන්ජලීස් නුවර ලොයොලා නීති විද්‍යාලයේ පද්ධති මෙයෙහුම්කරුවකු සහ යුනික්ස් සහ සොලාරිස් පරිපාලකයෙකු ලෙස රැකියාවෙහි නියුතු විය.'[464] |
| 2005 | ඔහුගේ සොහොයුරු ජනාධිපති විසින් ශ්‍රී ලංකාවේ ආරක්ෂක ලේකම් ලෙස පත්කරන ලද අතර ද්විත්ව පුරවැසියෙකුව සිටියදී දස වසරක් එම ධුරය දැරීය. |
| 2006 දෙසැම්බර් 1. | කොළඹදී සිදුකළ ඝාතන තැත අසාර්ථක විය. |
| 2009 සැප්තැම්බර් 6 | 'යුද විරුවකු' පිළිගැනීම වෙනුවෙන් කොළඹ විශ්වවිද්‍යාලය ඔහුට සම්මාන ආචාර්ය උපාධියක් පිරිනැමීම |
| 2019 නොවැම්බර් 16 | ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා ලෙස තෝරාගැනීම. |
| 2022 ජූලි 12 | ඉල්ලා අස්විය යුතු බවට කළ ඉල්ලීම සමඟ මහජන විරෝධය මධ්‍යයේ මාලදිවයිනට, සිංගප්පූරුවට සහ තායිලන්තයට පලායාම.[465] |
| 2022 ජූලි 22 | ITJP සංවිධානය සිංගප්පූරුවේ අපරාධ පැමිණිල්ලක් ගොනුකිරීම[466]. |
| 2022 සැප්තැම්බර් 2 | ආපසු ශ්‍රී ලංකාවට පැමිණීම.[467] |

---

Gota's War 177 පිටුව,

459. https://alt.army.lk/gajabaregiment/1-gajaba-regiment, - අන්තර්ජාලගත ඔහුගේ නිල චරිතාපදානය දක්වන්නේ 1983-1990 බව ය..

460. 'ජෙනරාල් කොබ්බෑකඩුව සරත් ෆොන්සේකා සමඟ මා වන්නියට කැඳවූවා. අපගේ බලඇණි දෙක පහරදීම ආරම්භ කළ යුතු බව' අපට පැවසුවා. 1990 යාපනයේ කොටුව
අද යුද හමුදාවේ ඉහළ තනතුරු දරන්නන් 1990 දී යාපනයේ කොටුවේ සටන්වලට සම්බන්ධවූ ආකාරය කමල් ගුණරත්නගේ ස්වයං ලිඛිත චරිතාපදානයෙන් විස්තර කරයි. එයින් රජයේ හමුදාවලට යාපනය අර්ධද්වීපය අහිමි විය. එම පිරිසට ගෝඨාභය රාජපක්ෂ, ඔහුගේ දෙවැනියා සුමේධ පෙරේරා (ගජබා රෙජිමේන්තුව) හට කණ්ඩායම් අණදෙන නිලධාරී උදය පෙරේරා (ගජබා රෙජිමේන්තුව) සහ ශවේන්ද්‍ර සිල්වා (ගජබා රෙජිමේන්තුව) ඇතුළත් වූහ. පසුව 2019 මැතිවරණ ව්‍යාපාරයේදී සරත් ෆොන්සේකා කියා සිටියේ යාපනයේ සිදුවීම් සම්බන්ධයෙන් යුද අධිකරණය හමුවට කැඳවා යන බිය නිසා ගෝඨාභය රාජපක්ෂ යුද හමුදාවෙන් ඉවත්වූ බවයි:
http://www.dinamina.lk/2019/10/21/%E0%B6%B4%E0%B7%94%E0%B7%80%E0%B6%AD%E0%B7%8A/82709/
%E0%B6%BA%E0%B7%94%E0%B6%AF-%E0%B6%B6%E0%B7%92%E0%B6%B8%E0%B6%A7-
%E0%B7%80%E0%B6%A9%E0%B7%8F-%E0%B7%80%E0%B7%90%E0%B6%A9%E0%B7%92-
%E0%B6%9A%E0%B7%8F%E0%B6%BD%E0%B6%BA%E0%B6%9A%E0%B7%8A-
%E0%B6%9C%E0%B7%9D%E0%B6%A8%E0%B7%8F%E0%B6%B7%E0%B6%BA-%E0%B6%9C%E0%B6%AD-
%E0%B6%9A%E0%B7%85%E0%B7%9A-%E0%B6%9A%E0%B7%9C%E0%B7%85%E0%B6%B9%E0%B6%BA%E0%B7%92
- 21 October 2019 Dinamina.

461. 'Ayoma wins the day', 30 Jun 2013 - 'දි අයිලන්ඩ්' *War on terror revisited : 151 කොටස

462. එම

463. එම

464. http://gotabaya.info/about, - ගොණුගත ලේඛන

465. https://www.theguardian.com/world/2022/jul/12/sri-lanka-president-gotabaya-rajapaksa-fails-attempt-flee-airport

466. https://www.aljazeera.com/news/2022/7/24/rights-group-seeks-arrest-of-former-sri-lanka-president
https://itjpsl.com/press-releases/itjp-files-criminal-complaint-against-gotabaya-rajapaksa-in-singapore

467. https://www.aljazeera.com/news/2022/9/2/sri-lankas-gotabaya-rajapaksa-returns-weeks-after-fleeing-island

# ඇමුණුම 2: මාධ්‍ය වාර්තා

**2005 දෙසැම්බර් 22 යාපනයේදී**

'ශ්‍රී ලංකා ජනාධිපති රාජපක්ෂගේ සොහොයුරු සහ ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී වයිස් අද්මිරාල් දයා සඳගිරි යන මහත්වරුද මෙම රැස්වීමට පැමිණ සිටියහ.'[468]

## LLRP බ්ලොග් අඩවිය[469] - 2006 මැයි 31

මන්නාරම රදගුරු රායප්පු ජෝශප් මඩු ප්‍රදේශයේ සිදුවෙමින් පවතින මනුෂ්‍ය ඝාතන සම්බන්ධයෙන් කණස්සල්ල පළ කර ඇත. ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා වෙත ලිපියක් ලියා ඇති රදගුරු රායප්පු ජෝශප් සිවිල් ජනයා මරා දමමින් කැලෑ ප්‍රදේශයේ සිට ක්ලේමෝ බෝම්බ ප්‍රහාර සිදුකර ඇති බව පවසයි. පසුගිය සති කිහිපය තුළ ක්ලේමෝ බෝම්බ ප්‍රහාරවලින් සිවිල් වැසියන් හය දෙනෙකු මියගොස් ඇතැයි රදගරු හිමිපාණන් පවසා තිබේ. 'ප්‍රදේශය තුළ කිසිම හමුදා ප්‍රහාරයක් සිදු නොවීමට වගබලා ගන්නා ලෙස මම ආරක්ෂක ලේකම්ගෙන් ඉල්ලීමක් කළා'.

## LLRP බ්ලොග් අඩවිය[470] - 31 අගෝස්තු 2008

'සිවිල් වැසියන්ට වන්නියේ සිට රජයේ පාලනය ඇති ප්‍රදේශ කරා පිවිසීමට හැකියාව සලසා දීමට පිටවීමේ මාර්ග විවෘත කරන බව ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ පසුගිය සතියේදී ප්‍රකාශ කළේය..වත්මන් හමුදා ක්‍රියාන්විතයේ අරමුණක් වන්නේ 'සිවිල් වැසියන්ට කිසිම හානියක් නොකිරීම' බව ආරක්ෂක ලේකම් ගෝඨාභය 'රාජපක්ෂ ප්‍රවෘත්ති සාකච්ඡාවකදී ප්‍රකාශ කළේය. එල්ටීටීඊයෙන් නැගෙනහිර පළාතේ වාකරේ ප්‍රදේශය අල්ලා ගැනීමේ ක්‍රියාන්විතයේදී තරමක මිශ්‍ර සාර්ථකත්වයක් ඇති වුවද මෙම පිලිවෙත අනුගමනය කළේය.'

**2008 අගෝස්තු 31 ආරක්ෂක අමාත්‍යාංශයේ තත්ව වාර්තාව**

ප්‍රදේශයේ පවතින ආරක්ෂක තත්වය තක්සේරුකිරීම පිණිස ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා ප්‍රධාන ආරක්ෂක මාණ්ඩලික එයාර් මාර්ෂල් ඩොනල්ඩ් පෙරේරා, නාවික හමුදාපති වයිස් අද්මිරාල් වසන්ත කරන්නාගොඩ සමගින් ඊයේ -2008 අගෝස්තු 30 - මන්නාරමේ චාරිකාවක නිරත විය. මෙම සංචාරයේ වැඩසටහනට උතුරු මැද නාවික විධානයට අයත් වන ප්‍රදේශයේ සංචාරය කරමින් ආරක්ෂක තත්වය ඇගයීම ඇතුළත් විය.

**දි අයිලන්ඩ්[471], 2012 සැප්තැම්බර් 23**

'නාවුක මෙහෙයුම්වල අවසාන අදියර තුළ (2009 ජනවාරි-මැයි) කුඩා බෝට්ටු ඒකකය අධිවේගී ප්‍රහාරක යාත්‍රා (FAC) සමග එක්ව මෙහෙයුම් සිදුකළේය. නාවික හමුදාවේ කුඩා බෝට්ටු ඒකකය, ඉන්දියාව ඇතුළු රටවල් බොහොමයක අවධානයට ලක්ව ඇත. මෙම ඒකකයට ගත වූ වසර කිහිපය තුළ ඇමරිකානු නිලධාරීන් සමඟ පුහුණුව ලබාගැනීමට අවස්ථාව ලැබුණු හෙයින් ඉහළ අන්තර්ජාතික පිළිගැනුමක්ද ඇත. මෙම සංකල්පය වැදගත් කොට පෙන්වීම පිණිස ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා 2008 සැප්තැම්බර් 11 දා නාවික හමුදාවේ වැලිසර නිෂ්පාදන මධ්‍යස්ථානයේ චාරිකාවක යෙදුණේය.'

**සැප්තැම්බර් 2008 : එක්සත් ජාතීන් සහ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන යුද කලාපයෙන් ඉවත්කිරීම - ලිපිය ලැබුණේ ගෝඨාභයගෙන්[472]**

මෙය යුද්ධය තීව්‍ර කිරීමට පූර්විකාවක් සහ එහි ජාත්‍යන්තර සාක්ෂි නොමැති බව සහතික කිරීමට මාර්ගය විය. එමෙන්ම එක්සත් ජාතීන්ගේ සංවිධාන

468. https://lrrp2.wordpress.com/2005/12/22/sla-attacks-on-jaffna protesters-justified-says-fonseka/

469. https://lrrp2.wordpress.com/2006/05/31/stop-madhu-attacks-mannar-bishop/

470. https://lrrp2.wordpress.com/2008/08/31/human-suffering-looms-large-in-the-wanni/

471. http://slwaronterror.blogspot.com/2012/09/fac-role-in-battle-off-mullaitivu.html

472. 'දි අයිලන්ඩ්' - 2012 නොවැම්බර් 20
'ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ ජාත්‍යන්තර රාජ්‍ය-නොවන සංවිධානවල රහසිගතව ක්‍රියාත්මකවීම ගැන දැඩි ස්ථාවරයක පසුවිය.සිවිල් වැසියන්ගේ දුක නැතිකිරීම පිණිස එක්සත් ජාතීන්ට සහ ජාත්‍යන්තර රාජ්‍ය-නොවන සංවිධානවලට වැදගත් කාර්යභාරයක් ඉටුකිරීමට ඇති බව පිළිගනිමින් ලේකම් ගෝඨාභය රාජපක්ෂ අවධාරණය කළේ මානුෂවාදී කාර්යන්හි යෙදෙන අයගෙන් අයුතු ප්‍රයෝජන ලබාගැනීමට එල්ටීටීඊයට ඉඩදිය නොහැකි බවයි.' http://slwaronterror.blogspot.com/2012/11/earth-bunds-on-vanni-front-and-ingo.html
'ජාත්‍යන්තර රාජ්‍ය-නොවන සංවිධානවල සහ රාජ්‍ය-නොවන සංවිධානවල සහාය එල්ටීටීඊයට අහිමිකිරීම ත්‍රස්තවාදය පරාජය කිරීමට පූර්ව අවශ්‍යතාවයක් බව ආරක්ෂක ලේකම් රාජපක්ෂ ප්‍රකාශ කළේය. බටහිර සහ මධ්‍යම පෙරමුණුවලින් ඉදිරියට යමින් සිටින පිළිවෙළින් කාර්ය සාධක බලකායට සහ 57 බල සේනාවට විවෘත භූමියේ සහ ජල මාර්ග හරහා ඉදිකළ අගල් සහ බැම්වලින් සමන්විත ශක්තිමත්ව සැකසූ ආරක්ෂක පවුරක් හමුවී ඇතැයි කිපී සිටි රාජපක්ෂ පැවසීය. බටහිර වෙරළ තීරය සම්බන්ධකරමින් අක්කරායන්කුලම් හරහා තිරිමුරුක්කණ්ඩි දක්වා නාච්චිකුඩා හි එල්ටීටීඊය ඉදිකර තිබූ ගල් හා පස්බැම්, ඉදිරියට යන ආරක්ෂක හමුදාවලට මහත් අභියෝගයක් ඇති කළේය. ආරක්ෂක ලේකම් ස්ථිර ලෙස ප්‍රකාශ කළේ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන ලබාදුන් උපකරණ යොදා නොගෙන එල්ටීටීඊයට මෙවැනි ආරක්ෂක සැකසුම් ඉදිකිරීමට නොහැකි බවයි.' The Island Aug 8, 2008).

වලට ඉවත්වයාමට බලකිරීමට එක්සත් ජාතීන්ගේ සංවිධාන රැඳී සිටි භූමි ප්‍රදේශවලට කිහිප අවස්ථාවකදීම බෝම්බ හෙළනු ලැබීය.

'වන්නියේ මුදා නොගත් ප්‍රදේශවල සිට ඉටුකරන සිය මානුෂවාදී සේවාවන් වව්නියාව කේන්ද්‍රයට ගෙනවිත් එහි සිට ක්‍රියාත්මක කරන ලෙස, 2008 සැප්තැම්බර් 08 දා පැවති රැස්වීමකදී, ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් එක්සත් ජාතීන්ගෙන් සහ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානවලින් ඉල්ලීමක් කරන ලදැයි ඇමති සමරසිංහ මාධ්‍යයට දැන්වීය.'[473]

**2008 නොවැම්බර් 19, රජයේ 'ඩේලි නිවුස්' පුවත්පත**

'විශේෂයෙන් සියලුම ජාත්‍යන්තර සංවිධාන සහ රාජ්‍ය නොවන සංවිධාන වන්නියෙන් ඉවත්විය යුතු බවට ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂගේ දැඩි ස්ථාවරය නිසා අවසානයේදී සියලුම ජාත්‍යන්තර හා රාජ්‍ය නොවන සංවිධාන රජයේ ඉල්ලීමට සවන් දුන්නේය."

**ජාත්‍යන්තර රතු කුරුස කමිටුව වන්නි පිවිසුමට**

***2008 නොවැම්බර් 18, රජයේ 'ඩේලි නිවුස්' පුවත්පත***

'යුද හමුදාවට අනුව, කොමාන්ඩෝ භට පිරිස් සහ විශේෂ බලකා භට පිරිස් සේවයේ යෙදවීමෙන් පසුව ඕමන්තේ නැගෙනහිර ප්‍රදේශය මුදාගෙන ඇති හෙයින් ඕමන්ත ආරක්ෂක තීරයේ ක්‍රියාත්මක වන භට පිරිස්වලට මාන්කුලම් දක්වා සම්බන්ධවීමට ද හැකියාව ඇත. මෙම පිවිසීම සහ පිටවීමේ පිහිටුවීම සඳහා සුදුසු ස්ථානයක් සොයන ලෙස ජාත්‍යන්තර රතු කුරුස කමිටුවට දැනුම්දීමෙන් පසුව, ආරක්ෂක අමාත්‍යාංශය දැනටමත් ඕමන්තෙ පිවිසුම් සහ පිටවීමේ ස්ථානය ඔඩ්ඩුසුඩ්ඩාන් ප්‍රදේශයෙන් දකුණට ගෙනයාමට මුලපුරා ඇතැයි ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ පසුගිය සතියේ 'ඩේලි නිවුස්' පුවත්පතට පැවසීය. මාන්කුලම අල්ලා ගැනීම පිවිසුම් සහ පිටවීමේ ස්ථානය ඔඩ්ඩුසුඩානවලින් දකුණට ගෙනයාමට ප්‍රබල පදනමක් දමන බව, හමුදා ආරංචි මාර්ග තවදුරටත් පැවසීය.'

**2009 පෙබරවාරි 22**

'මරාගෙන මැරෙන ප්‍රහාරයක යොදවා තිබියදී එල්ල කෙරුණු ගුවන් යානා නාශක වෙඩි ප්‍රහාරයකින් එල්ටීටීඊයේ ගුවන් යානා දෙකම විනාශ කෙරුණු බව සහතික කිරීමෙන් පසු ආරක්ෂක බලධාරීහු සැනසුම් සුසුම් හෙලූහ. ආරක්ෂක ප්‍රකාශක ඇමති කෙහෙලිය රඹුක්වැල්ල, ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ සහ ගුවන් හමුදාපති එයාර් මාර්ෂල් රොෂාන් ගුණතිලක පිපිරීම සිදු වූ දේශීය ආදායම් දෙපාර්තමේන්තු ගොඩනැගිල්ලට ගොස් තත්වය සියැසින් නිරීක්ෂණය කළහ.'[474]

**2009 අප්‍රියෙල් 17 කිලිනොච්චි සංචාරය**

'ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී එයාර් චීෆ් මාර්ෂල් ඩොනල්ඩ් පෙරේරා, යුද හමුදාපති ලුතිතන් ජෙනරාල් සරත් ෆොන්සේකා, නාවික හමුදාපති වයිස් අද්මිරාල් වසන්ත කරන්නාගොඩ, පොලිස්පති ජයන්ත වික්‍රමරත්න ද ජනාධිපති සමග ගියහ.'[475]



*ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ, නාවුක හමුදාපති වසන්ත කරන්නාගොඩ සහ පොලිස්පති ජයන්ත වික්‍රමරත්න තේ පැන් සාදයට එකවෙමින්.*

*සේයා: සුදත් සිල්වා*[476]

**යුද මුක්ත කලාප පිහිටි ස්ථාන**

ඒවා ශ්‍රී ලංකා රජය විසින් ඒකපාර්ශවිකව නිවේදනය

---

473. ආපදා කළමනාකරණ සහ මානව හිමිකම් අමාත්‍යාංශය නිකුත් කළ ප්‍රවෘත්ති නිවේදනය , 2008 ඔක්. 8, - ගොණුගත ලේඛන

474. Sunday Observer "Air Force proves its mettle".

475. රාජ්‍ය නායකයෙකුගේ පළමු සංචාරය; ජනාධිපති කිලිනොච්චියේ, Daily News, 2009 අප්‍රේල් 17
බලන්නː 'මේ අතර ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ සිකුරාදා (11) වන්නියේ සංචාරයක යෙදුණේය. යුද හමුදාපති ජෙනරාල් ජගත් ජයසූරිය ද ඔහු සමග මෙම සංචාරයට එක්ව සිටියේය. මුලතිව් කරා පැමිණි අවස්ථාවේදී 9 වැනි ගජබා රෙජිමේන්තුව ආරක්ෂක ලේකම් වෙනුවෙන් ආචාර පෙළපාළියක් පැවැත්වීය.අහම්බෙන් වුවත් ගජබා ඔහුගේ පැරණි රෙජිමේන්තුව විය.ඉන් අනතුරුව ඔහු අවසන් සටන පැවති පුදුමාතලන් ප්‍රදේශයේ චාරිකාවක යෙදුණේය.එහිදී ඔහු 59 බලසේනාවේ, කාර්ය සාධක බලසේනාව ඪෂෂෂ හි සහ කාර්ය සාධක බලසේනාව ෂෂ හි භට පිරිස් අමතමින් තමා හැම මොහොතකදීම ඔවුන්ගේ සුබසාධනය සොයා බලන බවත් ආබාධිත තත්වයට පත් වීරෝදාර සෙබළුන්ගේ ජීවිත යළි ගොඩනැංවීමට සෑම උත්සාහයක්ම දරන බවත් පැවසීය.' - https://lrrp.wordpress.com/category/six-tiger-stragglers-gunned-down-in-kovilladdi-jungles/

476. https://web.archive.org/web/20090420032756/http://www.dailynews.lk/2009/04/17/news01.asp - ගොණුගත සේයා රූ

කළ අතර පිහිටා තිබුණේ ඉරිදි ආරක්ෂක වළල්ලේය. මෙම ප්‍රශ්නය විශ්ලේෂණ කිරීම පිණිස OISL වාර්තාව බලන්න. යුද මුක්ත කලාපවලට නැවත නැවත බෝම්බ හෙළීම සඳහන් කිරීමට අවශ්‍ය නොවේ.

**2009 පෙබරවාරි 7, රජයේ 'ඩේලි නිවුස්' - ගෝඨාභය සමග සම්මුඛ සාකච්ඡාව - යුද මුක්ත කලාපය 2 සම්බන්ධව**

'තවමත් මුදාගැනීමට ඉතිරිව ඇති සමස්ත ප්‍රදේශයෙන් අඩකට සමාන ප්‍රදේශයක් යුද මුක්ත කලාපයක් ලෙස ආණ්ඩුව සීමා නිර්ණය කර ඇති අතර එම කලාපයට සිවිල් ජනයාට ඇතුළුවීමට නොදෙමින් එල්ටීටීඊය ඔවුන් බලාත්කාරයෙන් තියාගෙන ඉන්නවා. ඔය ප්‍රකාශිකාව සඟවන ප්‍රධාන සාධකය මේකයි' ආරක්ෂක ලේකම් තවදුරටත් කීවේය.

'කාලයක් මුළුල්ලේ ජත්‍යන්තර සංවිධානවලට සහ මාධ්‍ය ආයතනවලට රිංගාගත් එල්ටීටීඊ ඒජන්තයන් විසින් ආණ්ඩුව සහ ආරක්ෂක හමුදා අවමානයට ලක්කිරීමට සහ ඒ මත සටන් විරාමයක් ප්‍රකාශයට පත්කරගැනීමට පීඩනයක් ඇතිකරන සැලසුම් සහගත වැඩපිළිවෙක් කරගෙනයනවා.'

ආහාර සැපයීම පිණිස යුද කලාපයේ සිටින ජන සංඛ්‍යාව (282,000ක් දිවි බේරාගෙන ආ තැනක ඇත්තේ 140,000ක් යැයි ඔහු කීය) ලබා නොදෙන ඔහු, පොකුරු බෝම්බ භාවිත කර නැති බව (ඇත්ත නොවේ) පවසමින්, අනීතික රඳවාගැනීමක් ලෙස අවමන් කරන හෙයින් පුනරුත්ථාපන වැඩසටහන ආරක්ෂාකිරීමට වෙරදරයි.

**2009 මැයි 10 රජයේ 'ඩේලි නිවුස්' - යුද මුක්ත කලාපය 3 පිළිබඳව**

'එසේ වුවත්, මෙම යුද මුක්ත කලාපය නැවත සැලසුම් කිරීමේ තීරණය ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ විසින් ආරක්ෂක මණ්ඩලයට ඉදිරිපත් කරන ලද යෝජනාවක් අනුව බදාදා පැවති ආරක්ෂක මණ්ඩල රැස්වීමේදී ගන්නා ලද්දේ කලින් ප්‍රකාශයට පත්කර තිබූ යුද මුක්ත කලාපයෙන් බහුතර කොටසක් ආරක්ෂක හමුදා විසින් අප්‍රේල් 20 දා යින් පසුව දැනටමත් අල්ලා ගෙන ඇති නිසා ය.'

**2009 සැප්තැම්බර් 14 දා LLRP බ්ලොග් අඩවිය[477]**

මේ අතර ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ සිකුරාදා (11) වන්නියේ සංචාරයක යෙදුණේය. යුද හමුදාපති ජෙනරාල් ජගත් ජයසූරියද ඔහු සමග මෙම සංචාරයට එක්ව සිටියේය. මුලතිවු කරා පැමිණි අවස්ථාවේදී 9 වැනි ගජබා රෙජිමේන්තුව ආරක්ෂක ලේකම් වෙනුවෙන් ආචාර පෙළපාළියක් පැවැත්වීය. අහම්බයක් වුවද, ගජබා රෙජිමේන්තුව ඔහුගේ පැරණි රෙජිමේන්තුව විය. ඉන් අනතුරුව ඔහු අවසන් සටන පැවති පුදුමාත්තලන් ප්‍රදේශයේ චාරිකාවක යෙදුණේය.'

477. https://lrrp.wordpress.com/2009/09/14/six-tiger-stragglers-gunned-down-in-kovilladdi-jungles/

INTERNATIONAL TRUTH AND JUSTICE PROJECT